# අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව සඳහා පර්යේෂණාත්මක ප්‍රවේශයක්...

කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය

**2021**

## අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව සඳහා පර්යේෂණාත්මක ප්‍රවේශයක්

**මගපෙන්වීම**

**එච්.යූ.ප්‍රේමතිලක මයා, අතිරේක ලේකම්, අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන අංශය**

**මෙහෙයවීම හා උපදේශකත්වය**

**එස්.එම්.එල්.කේ.සෙනෙවිරත්න මිය, අධ්‍යාපන අධ්‍යක්ෂ, කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව**

**උපදේශක මණ්ඩලය**

**එන්.වංශවතී මිය, විශ්‍රාමික පීඨාධිපති, වයඹ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය**

**ආචාර්ය එස්.පී.ඩබ්.වාකිෂ්ඨ මයා, පර්යේෂණ උපදේශක, දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**සම්බන්ධීකරණය**

**විනෝෂි දිසානායක මිය, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන අමාත්‍යාංශය**

**සංස්කරණය**

**ඩී.එච්.එස්.ඩී.සෝමරත්න මයා, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන අමාත්‍යාංශය**

**සෝදුපත් බැලීම**

**ජී.ඒ.කේ.පෙරේරා මයා, අනුලා විද්‍යාලය, නුගේගොඩ**

**ප්‍රකාශනය**

**කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය**

## පෙරවදන

අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව (Education Quality Assurance) ප්‍රශස්ත අධ්‍යාපන පද්ධතියක සඵලතාව නිර්ණය කෙරෙන වැදගත් ම සංරචකය යි. අපේක්ෂිත ඉලක්ක කරා අධ්‍යාපනය මෙහෙයවීම සඳහා විවිධ භූමිකාවල කටයුතු කරනු ලබන නිලධාරීන් තම විෂය පථය තුළ පුළුල් අත්දැකීම් ලබා ගැනීම සඳහා අධ්‍යාපනය හා සම්බන්ධ විවිධ ක්ෂේත්‍රයන්හි අධ්‍යයනයන් සිදු කිරීම වැදගත් වේ. මෙ මඟින් එම නිලධාරීන්ට විවිධ අධ්‍යයන ක්ෂේත්‍ර ස්පර්ෂ කිරීමට හැකියාව ලැබෙන අතර එවැනි අධ්‍යයන අනාවරණ පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක බව සම්බන්ධ තීරණ ගැනිමේ ක්‍රියාවලිය සඳහා යොදා ගැනීමට ද අවස්ථාව ලැබේ.

අධ්‍යාපන නිලධාරීන් පර්යේෂකයින් ලෙස සංවර්ධනය කිරීම සඳහාත්, අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුවට අවැසි වැදගත් නිගමනවලට ප්‍රවේශ වීමට මාවත විවර කර ගැනීම සඳහාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව මඟින් පර්යේෂණ දිරිමත් කිරීමේ වැඩසටහනක් 2019 වසරේ දී ආරම්භ කරන ලදී. අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු සහ කලාප අධ්‍යාපන කාර්යාලවල නිලධාරීන්ට මේ යටතේ පර්යේෂණ සිදු කිරීමට අවස්ථා සළසා ඇති අතර සම්පූර්ණ කරන ලද පර්යේෂණ 13ක් මෙම ප්‍රකාශනයට ඇතුලත් කර ඇත. මෙයින් පර්යේෂණ නවයක් කාර්ය මූලික අධ්‍යයන ඇසුරෙන් සිදු කරන ලද ඒවා වන අතර ඉතිරි පර්යේෂණ ප්‍රමාණාත්මක හා ගුණාත්මක අධ්‍යයන ලෙස සිදු කර ඇත.

ගුරුවරුන්, විදුහල්පතිවරුන් මෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයට ඇතුලත් වන නවක නිලධාරින්ට මෙම පර්යේෂණ කෘතිය තම කාර්යය තුළ දැනුම හා කුසලතා සංවර්ධනය කර ගැනීමේ දී ඉවහල් වන අතර අධ්‍යාපන ගුණාත්මක සංවර්ධනය පිළිබඳ පවතින තත්ත්වයන් හඳුනාගෙන පාසල බලගැන්වීම සඳහා අවශ්‍ය යෝජනා ලබාගැනිමට ද වැදගත් වන බව මගේ හැඟීමයි.

මහාචාර්ය කේ.කපිල සී.කේ.පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

## පටුන


| | පටුන | පිටුව |
|---|---|---|
| | විධායක සාරාංශය | 06 |
| 1. | ඇඹි/කාවන්තිස්සපුර විද්‍යාලයේ 6-11 ශ්‍රේණිවල ශිෂ්‍ය ප්‍රතිපෝෂණ වැඩසටහන් සඳහා වාර විභාග ලකුණු විශ්ලේෂණ භාවිත කිරීම තුළින් ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නැංවීම (එම්.කේ.රංජිත් කුමාරණ, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, ඇඹිලිපිටිය කලාප අධ්‍යාපන කාර්යාලය, ගර්ට් විජේරත්න, ගුරු උපදේශක, ඇඹිලිපිටිය කලාප අධ්‍යාපන කාර්යාලය) | 09 |
| 2. | දෙහිඕවිට කලාපයේ පාසල්වල සිසුන්ගේ ශිෂ්‍ය සාධනය කෙරෙහි පාසලේ 'නායකත්වය හා කළමනාකරණය' දක්වන බලපෑම අධ්‍යයනය කිරීම (ඩී.ඩී.ආර්.රූපසිංහ, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, දෙහිඕවිට කලාප අධ්‍යාපන කාර්යාලය) | 26 |
| 3. | තෝරාගත් පාසලක 6 ශ්‍රේණියේ සිසුන්ගේ සාක්ෂරතාව හා බැඳි ලිවීමේ කුසලතාව ප්‍රවර්ධනය කිරීම (එස්.ඒ.සුධර්මා ගුණසේකර, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, මීගමුව කලාප අධ්‍යාපන කාර්යාලය) | 39 |
| 4. | බ/හාලිඇල ජාතික පාසැලෙහි බාහිර හා අභ්‍යන්තර ප්‍රමිති ක්‍රියාත්මක කිරීම හා වාර්තාකරණය ශක්තිමත් කිරීම (එස්.එන්.හෙට්ටිආරච්චි, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, බදුල්ල කලාප අධ්‍යාපන කාර්යාලය) | 49 |
| 5. | තෝරාගත් පාසල් තුනක 6 ශ්‍රේණියේ සිසුන්ගේ රචනා ලිවීමේ හැකියාව තුළින් ශිෂ්‍ය සාධනය සංවර්ධනය කිරීම (ඩබ්.එන්,විජේතුංග, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, හඟුරන්කෙත කලාප අධ්‍යාපන කාර්යාලය, ආර්.එම්.යූ.කේ.රාජනායක, ගුරු උපදේශක, දෙනුවර කලාප අධ්‍යාපන කාර්යාලය) | 63 |
| 6. | ගුණාත්මක තත්ත්වය අනුව පාසල් ශ්‍රේණිගත කිරීම සඳහා විද්‍යාත්මක ප්‍රවේශයක් (ඩී.එච්.එස්.ඩී.සෝමරත්න, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන අමාත්‍යාංශය) | 72 |
| 7. | ප්‍රමිති පාදක ඇගයීම් ක්‍රියාවලියට අදාළව පාසලක තොරතුරු වාර්තාකරණය සඳහා සරල හා ක්‍රමවත් යාන්ත්‍රණයක් හඳුන්වා දීම (කේ.ටී.ඩී. විමලසිරි, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, හොරණ කලාප අධ්‍යාපන කාර්යාලය, කේ.එස්.විජේසුන්දර, හිටපු මධ්‍යස්ථාන කළමනාකරු, ගුරු මධ්‍යස්ථානය, හොරණ) | 91 |
| 8. | ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් බව වැඩිවීමෙන් පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය ඉහළ නැංවීමක් සිදුවන්නේද යන්න පිළිබඳ අධ්‍යයනය (ඉරෝෂිනී පරණගම, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, කැළණිය කලාප අධ්‍යාපන කාර්යාලය) | 102 |
| 9. | පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක දර්ශකය 'විශිෂ්ටයි' මට්ටමට සංවර්ධනය කිරීම (පී.පී.කේ.කේ.එස්.විමලවීර, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, බණ්ඩාරවෙල කලාප අධ්‍යාපන කාර්යාලය) | 107 |

10. ප්‍රයෝගික දැනුවත් කිරීමේ වැඩමුළුව මඟින් දෙවන වර්ගයේ පාසල් තුනක අභ්‍යන්තර ප්‍රමිති ඇගයීම ඉහළ මට්ටමකට ගෙන ඒම 121
(එස්.ඒ.පී.එස්.ජයමහ, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන කාර්යාලය, කුරුණෑගල, ඩබ්.චන්ද්‍රිකා කුලදේව, කථිකාචාර්ය, ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය, කුරුණෑගල)

11. හඟුරන්කෙත කලාපයේ පාසල් 10 ක වාර්තාකරණය සඳහා පහසු ක්‍රමවේද භාවිතයෙන් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය ඉහළ නැංවීම 130
(ටී.බී.එම්.එස්.ඩී.තෝරදෙණිය, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, හඟුරන්කෙත කලාප අධ්‍යාපන කාර්යාලය)

12. ජාතික පාසල්වල නායකත්වය හා කළමනාකරණය ඇගයීම් ක්ෂේත්‍රයෙහි ගුණාත්මක තත්ත්වය සඳහා බලපාන සාධක පිළිබඳ අධ්‍යයනය කිරීම 145
(ඩී.එම්.ආර්.ඩබ්.එම්.දිවාකර, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන අමාත්‍යාංශය, වී.එන්.ඩබ්.ඩබ්.දිසානායක, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන අමාත්‍යාංශය)

13. පාසල් අධ්‍යාපනයේ තත්ත්ව සහතික කිරීමේ ව්‍යවහාර : සංසන්දනාත්මක විශ්ලේෂණය, ශ්‍රී ලංකාව හා එංගලන්තය 157
(එස්.එම්.එල්.කේ.සෙනෙවිරත්න, අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන අමාත්‍යාංශය, ටි.එම්.එස්.එස්.කේ.යටිගම්මන, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

## විධායක සාරාංශය

පාසලක ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සඳහා පරිපාලනමය වශයෙන් මැදිහත් වීමේ ක්‍රියාමාර්ගයක් ලෙස පාසල්වල පවත්නා තත්ත්වය පර්යේෂණාත්මක දෘෂ්ටියකින් ආලෝකනය කිරීම අධ්‍යාපන කළමනාකරුවන්ගේ ප්‍රතිපත්තියක් විය යුතුය. පාසල් පද්ධතිය හා සම්බන්ධව කටයුතු කරන අධ්‍යාපනඥයින් හා අධ්‍යාපන පරිපාලකයින් එම ප්‍රතිපත්තිය කරා යොමු කරවීම මෙම ප්‍රකාශනයෙන් ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ වැඩපිළිවෙලෙහි මුඛ්‍ය පරමාර්ථය වේ. පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 31/2014 චක්‍රලේඛ ප්‍රකාරව නිකුත් කර ඇති "අපේ පාසල කොතරම් ගුණාත්මකද" යන නමින් යුත් පාසල් ඇගයීම් මාර්ගෝපදේශය පදනම් කර ගනිමින් මෙහි එන සියලුම පර්යේෂණ අධ්‍යයනයන් එළිදක්වා තිබීම විශේෂත්වයකි. මෙම පර්යේෂණ එකතුවෙහි ඇතුළත් මාතෘකා දහතුනක් අතුරින් නවයක්ම පර්යේෂකයන්ගේ ඍජු මැදිහත්වීම් සහිතව පාසල්වලට බලපා ඇති ගැටලු විසඳීම සඳහා සහාය වීමක් ලෙස පෙන්වාදිය හැකිය. කෙසේ වුව ද මෙහි සඳහන් සියලුම අධ්‍යයන පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක දර්ශකය ඉහළ නැංවීමට ඍජුව හෝ වක්‍රව දායකවන බව නොඅනුමානය.

මෙම ප්‍රකාශනයෙහි ප්‍රථමයෙන්ම සඳහන් වන එම්.කේ.රංජිත් කුමාරණ මයා හා වයි.ඒ.සී.ගර්ටි විජේරත්න මිය විසින් සිදුකරන ලද අධ්‍යයනයෙහි අරමුණ වී ඇත්තේ 6 -11 ශ්‍රේණිවල ගණිතය විෂය අසමත්වීමේ ගැටලුව විසඳීමට ප්‍රවේශයක් ලබාගැනීම යි. අධ්‍යයනයෙන් ගණිතය විෂය අසමත් වීමට බලපාන හේතු රැසක් අනාවරණය කරගෙන ඇති අතර එම තත්වයන් සමනය කිරීමට අවශ්‍ය මූලික ක්‍රියාදාමය වන ප්‍රතිකාර්ය හා ප්‍රතිපෝෂණ සඳහා ගුරු දෙගුරු සබඳතා ශක්තිමත් කර ගැනීම අවශ්‍ය බව මෙම අධ්‍යයනය මගින් පෙන්වා දී ඇත.

ප්‍රමාණාත්මක පර්යේෂණයක් ලෙස විස්තරාත්මක සමීක්ෂණ ක්‍රමය භාවිතයෙන් සිදුකරන ලද අධ්‍යයනයක් ඩී.ඩී.ආර් රූපසිංහ මිය විසින් ඉදිරිපත් කර ඇත. පාසලක ශිෂ්‍ය සාධනය කෙරෙහි පාසල් නායකත්වය හා කළමනාකරණය ඍජු හෝ වක්‍ර බලපෑමක් දක්වන බව මෙම පර්යේෂණයෙන් පෙන්වා දී ඇත. නමුත් විදුහල්පති සම්බන්ධ පුද්ගල සාධක හෝ පාසල් පැතිකඩ සම්බන්ධ කරුණු ශිෂ්‍ය සාධනය කෙරෙහි විශේෂ බලපෑමක් නොකරන බවත් මෙමඟින් පැහැදිලි කර ඇත.

මිගමුව කලාපයේ පාසලක 6 ශ්‍රේණියේ සිසුන්ගේ සාක්ෂරතා ගැටලු නිරාකරණයට මැදිහත් වෙමින් ඔවුන්ගේ ලිවීමේ කුසලතා ප්‍රවර්ධනය සඳහා එස්.ඒ.සුධර්මා ගුණසේකර මිය විසින් පර්යේෂණාත්මක ප්‍රවේශයක් අනුගමනය කර ඇත. එහි දී ඉලක්ක ශිෂ්‍ය කණ්ඩායම් වෙනුවෙන් සාක්ෂරතා කඳවුරු, අඛණ්ඩ ලිඛිත අභ්‍යාස, නිර්මාණශීලි ඉගෙනුම් පරිසරය, සිසු නිර්මාණ සඳහා අවස්ථා සහ නව ඉගැන්වීම් ක්‍රම උපයෝගී කරගෙන ඇත. එවැනි ක්‍රියාකාරකම් මගින් සිසුන් වඩාත් ක්‍රියාශීලී ලෙස තම ලේඛන හැකියා දියුණු කර ගැනීමට පෙළඹී ඇති බව පෙනී යයි.

පාසලක ගුණාත්මක දර්ශකය අඩු වීම සඳහා බලපා ඇති කරුණු සම්බන්ධයෙන් පර්යේෂණයක් සිදු කර ඇති එස්.එන්.හෙට්ටිආරච්චි මිය විසින් පාසලක මෙම දර්ශකය ඉහළ නැංවීමට බාධා වී ඇති සාධක කිහිපයක් හඳුනාගෙන ඇත. එහි දී පාසල හා සම්බන්ධ සියලු තොරතුරු පවත්වා ගැනිම, වාර්තා කිරීම පිළිබඳ ගැටලු නිරාකරණය පිණිස මැදිහත් වී ඇත.

තෝරාගත් පාසල් තුනක 6 ශ්‍රේණියේ සිසුන්ගේ රචනා ලිවීමේ හැකියාව තුළින් ශිෂ්‍ය සාධනය සංවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් අධ්‍යයනයක් ඩබ්.එන්.විජේතුංග මිය හා ආර්.එම්.යු.කේ. රාජනායක මිය විසින් සිදුකර ඇත. රචනා පිළිබඳ ගුරු, සිසු ආකල්ප වෙනස් කිරීම, රචනා සැකිලි සකස් කිරීම, පොත් කියවීම, විවිධ මාතෘකා යටතේ නිරතුරුව රචනා ලිවීම, බුද්ධිකලම්බන වැනි වැනි ක්‍රියාකාකරකම්වලට සිසුන් යොමු කර ඇත. එමගින් රචනා ලිවීමේ හැකියාව මෙන්ම අනිකුත් ලිවීම හා සබැදි විෂයන්වල සාධන මට්ටම් ඉහළ නැංවීමට හැකි වී ඇත.

ලේඛන ගත සංඛ්‍යාත්මක දත්ත පමණක් උපයෝගී කර ගනිමින් ප්‍රමාණාත්මක වර්ගයේ පර්යේෂණයක් සිදුකර ඇති ඩී.එච්.එස්.ඩී.සෝමරත්න මයා විසින් ගුණාත්මක තත්ත්වය අනුව ලබා දෙන ලකුණු පදනම් කර ගනිමින් පාසල් ශ්‍රේණිගත කිරිම සඳහා විද්‍යාත්මක තර්කයක් ඉදිරිපත් කරයි. ලකුණු සම්මතකරණ සංකල්ප උපයෝගී කර ගනිමින් පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක දර්ශකය ප්‍රමිත ලකුණු ආශ්‍රයෙන් දක්වමින් අන්තර් කලාප මට්ටමින් පාසල් ශ්‍රේණිගත කිරිමට එම සම්මත ලකුණු භාවිත කළ හැකි බව සංඛ්‍යාන ගණනය කිරීම් හරහා පෙන්වා දී ඇත.

ප්‍රමිති පාදක ඇගයීම් ක්‍රියාවලියට අදාළ තොරතුරු විධිමත් හා ඵලදායී වාර්තාකරණයකට ලක්කිරීම සඳහා සරල යාන්ත්‍රණයක් හඳුන්වාදීමට කේ.ටී.ඩී.විමලසිරි මිය හා කේ.එන්.විජේසුන්දර මයා ඔවුන්ගේ අධ්‍යයනයෙන් උත්සාහ ගෙන තිබේ. පාසලෙහි කටයුතු සම්බන්ධ සාක්ෂි නිසි පරිදි ගොනුගත කිරිම සඳහා විශේෂ වැඩපිළිවෙළක් පාසලට හඳුන්වා දීමත්, ක්ෂේත්‍ර අධ්‍යයන වැඩමුළු මගින් එවැනි ආදර්ශ ලබාගැනීමට අවස්ථා සලසා දීමත් පර්යේෂකයින් විසින් සිදුකර තිබේ. මෙමගින් යම් පසුබෑමක් පැවති පාසලෙහි ඇගයීම් ක්ෂේත්‍ර සඳහා ඉහළ ඇගයිම් ලකුණු සාක්ෂාත් කරගැනීමට හැකියාව ලැබුණු ආකාරය මෙම කාර්යමූලික පර්යේෂණයෙන් නිරූපණය වේ.

පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය ඉහළ නංවා ගැනීම සඳහා පාසලක දෙවන පෙළ නායකත්වය ශක්තිමත් කිරීමේ වැදගත්කම පී.ඩී. ඉරෝෂනි පරණගම මිය විසින් සිදුකර ඇති අධ්‍යනය මගින් අවධාරණය කෙරේ. නියැදියේ පාසල්වල නියෝජ්‍ය/සහකාර විදුහල්පතිවරුන් ප්‍රායෝගිකව පාසල් බාහිර නිරීක්ෂණ ක්‍රියාකාරකම්වල යොදවා මෙම අධ්‍යයනය සිදු කර ඇත. පාසලේ ගුණාත්මක තහවුරුව පිණිස අභ්‍යන්තර ඇගයීම් ක්‍රියාවලිය මෙහෙයවීම අවශ්‍ය බවත් බාහිර ඇගයීම්වලට ඉහළ බලපෑමක් සිදුකළ හැකි බවත් මෙමගින් පෙන්වා දී ඇත.

පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක දර්ශකය “විශිෂ්ටයි” මට්ටම කරා සංවර්ධනය කිරීම සඳහා මැදිහත්වීමේ අධ්‍යයනයක් පී.පී.කේ.එස්.විමලවීර මිය විසින් මෙම පර්යේෂණ කලාපයට ඉදිරිපත් කර

ඇති අතර එහිදි තෝරාගත් පාසලෙහි ගුණාත්මක දර්ශකය ඉහළ නැංවීම සඳහා එහි ක්‍රියාකාරීතත්වය නිසි මගට ගැනීමට පෙළඹවීම් සිදුකර ඇත. එහි දී අධ්‍යාපන නිළධාරීන්ගේ සුබවාදී හා මිත්‍රශීලී සංවාදයෙහි වැදගත්කම හා නිරතුරුව මැදිහත්වීමේ අවශ්‍යතාව අවධාරණය කෙරේ.

පාසල් තුනක අභ්‍යන්තර ඇගයීම් ක්‍රියාවලිය බලගැන්වීම හරහා එකී පාසල්වල ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීම සඳහා කාර්යමූලික පර්යේෂණයක් එස්.ඒ.පුෂ්පමාලා සමන්කාන්ති ජයමහ මිය සහ ඩබ්ලිව්.චන්ද්‍රිකා කුලදේව මිය විසින් සිදු කර ඇත. පාසල් මට්ටමින් ඇගයීම් ක්ෂේත්‍රයන්හි ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීමේ දී විදුහල්පති හා ගුරුවරුන්ට ඇති සීමා හා ඇගයීම් ක්ෂේත්‍ර සම්බන්ධව පවතින ගැටලු මෙහි දී සාකච්ඡා කෙරේ.

ලිපිගොනු හා වාර්තා පවත්වා ගැනීමේ දූර්වලතා හේතුවෙන් පාසල්වල අධ්‍යාපන ගුණාත්මක දර්ශකය අඩු වීම පිළිබඳ අධ්‍යයනයක නිරත වී ඇති බී.එම්. එස්. ඩී. තෝරදෙණිය මිය විසින් එම දූර්වලතා මොනවාද යන්න අනාවරණය කර ගෙන තිබේ. එම ගැටලුවලට හේතු පාදක වූ මානව, භෞතික හා තාක්ෂණික සාධක ද මෙහිදී හඳුනාගෙන ඇති අතර මැදිහත්වීමේ ක්‍රියාකාරකම් මගින් පහසු වාර්තාකරණයක් සඳහා පාසල් යොමු කිරීමේ පර්යේෂණාත්මක ප්‍රවේශයක් අනුගමනය කර ඇත.

පාසලක් ඇගයීමේ දි ප්‍රමුඛතම ක්ෂේත්‍රයක් වන 'නායකත්වය හා කළමනාකරණය' ඇගයීම් ක්ෂේත්‍රයෙහි ඉහළ ගුණාත්මක මට්ටමක් ළඟා කර ගැනීමට වැදගත් වන නිර්ණායක කිහිපයක් සඳහා ඉහළ ඇගයීම් ලකුණක් ලබා ගැනීමට බලපාන සාධක හඳුනා ගැනීමේ අධ්‍යයනයක් ඩී.එම්.ආර්.ඩබ්.එම්.දිවාකර මිය හා වී.එන්.ඩබ්.ඩබ්.දිසානායක මිය විසින් සිදු කර ඇත. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් බාහිර ඇගයීමට ලක් කරන ලද පාසල් තෝරා ගෙන මෙම අධ්‍යයනය සිදු කර ඇති අතර විදුහල්පති අයත් වන සේවය, සේවා කාලය, ස්ත්‍රී පුරුෂ භාවය, පාසලේ පිහිටීම යන සාධක තෝරාගත් ඇගයීම් නිර්ණායක කිහිපයක් මත දක්වන බලපෑම මෙහි දි පැහැදිලි කෙරේ.

එංගලන්තයේ පාසල් පද්ධතිය තුළ ඇගයීම් සඳහා යොදා ගන්නා ව්‍යවහාර පිළිබඳ අත්දැකීම් ලබා ගෙන ශ්‍රී ලංකාවේ පාසල්වල ඇගයීම් ව්‍යවහාර වැඩි දියුණු කිරීමේ අරමුණින් ලිඛිත මූලාශ්‍ර ආශ්‍රිතව පර්යේෂණාත්මක අධ්‍යයනයක් එස්.එම්.එල්.කේ.සෙනෙවිරත්න මිය හා ටී.එම්.එස්.එස්.කේ.යටිගම්මන මිය විසින් සිදුකර මෙහි ඇතුලත් කර ඇත. පාසල් ක්‍රියාකාරීත්වය හා අවශ්‍යතා පදනම් කර ගත් ඇගයීම් ක්‍රියාවලියක් සඳහා උපායමාර්ගික සැලැස්මක් සහ ඇගයීම්කරු කාර්යසාධන ඇගයීම් ක්‍රමයක් මෙම අධ්‍යයනය මඟින් නිර්දේශ කර ඇත.

මේ අනුව මෙම ප්‍රකාශනයෙහි සඳහන් සියලු පර්යේෂණ / අධ්‍යයන මඟින් පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව සඳහා වැදගත් වන අනාවරණ සමඟ නව අදහස් අධ්‍යාපන පද්ධතිය වෙත ඉදිරිපත් කරනු ලබන අතර ඒවා ඉදිරි පර්යේෂණ සඳහා ද අදාළ කර ගැනීමේ හැකියාව ඇත.

# ඇඹි/කාවන්තිස්සපුර විද්‍යාලයේ 6-11 ශ්‍රේණිවල ශිෂ්‍ය ප්‍රතිපෝෂණ වැඩසටහන් සඳහා වාර විභාග ලකුණු විශ්ලේෂණ භාවිත කිරීම තුළින් ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නැංවීම


එම්.කේ.රංජිත් කුමාරණ (BA, Dip.Ed.)

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන කාර්යාලය, ඇඹිලිපිටිය

0714431445 / ranjithkumaranar@gmail.com

වයි.ඒ.ඩී.ගර්ට් විජේරත්න (MEd)

ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, ඇඹිලිපිටිය

0702783111 / yadgwijerathne@gmail.com



**සංක්ෂිප්තය**

ගණිතය විෂය සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය තුළ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක වුව ද අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී සිසුන් ගණිතය අසමත් වීම ප්‍රබල ගැටලුවක් බවට පත් වී තිබේ. පාසල් ඒ සඳහා අවධානය යොමු කළ ද, ගණිතය විෂය ප්‍රතිඵල හා සාධන මට්ටම ඉහළ නැංවීම දුෂ්කර කාර්යයක් බවට පත්ව ඇත. එහෙයින් මෙම පර්යේෂණයේ අරමුණ වූයේ තෝරා ගත් එක් පාසලක 6-11 ශ්‍රේණිවල වාර විභාග ලකුණු විශ්ලේෂණ පදනම්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීමය. ක්‍රියාමූලික පර්යේෂණයක් මගින් ගැටලුව විසඳීමට අවධානය යොමු කළ අතර, මේ සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොද ගැනිණි. පාසලේ ගැටලුව විසඳිම සඳහා නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා, ලිඛිත මූලාශ්‍ර යොදා ගනිමින් ගැටලුව තවදුරටත් තහවුරු කරගන්නා ලදී. මෙහි දී ගණිතය විෂය අසමත් වීම කෙරෙහි හේතු වශයෙන් කරුණු රැසක් අනාවරණය විණි. සිසු පාසල් පැමිණීම අක්‍රමවත් වීම, ගැටලුව නිරාකරණයට පාදක වන ලෙසින් ක්‍රියාකරකම් සැලසුම් කොට ක්‍රියාත්මක නොවීම, බහුතල ඉගැන්වීම් ක්‍රම භාවිතයට නොගැනීම, දෙමාපිය අවධානය අවම වීම, අධ්‍යාපන කටයුතු සඳහා පාසලෙන් ලැබෙන සහයට අමතරව නිවසෙන් ලැබෙන සහය අල්ප වීම, ලකුණු විශලේෂණ මත පදනම්ව ඵලදායී වැඩසටහන් සැලසුම් කොට ක්‍රියාත්මක නොවීම හා විශ්ලේෂණ වාර්තා කෙරෙහි විදුහල්පති අවධානය යොමු නොවීම යන කරුණු විද්‍යාමාන විය. එහෙයින් විවිධ පැතිකඩ ඔස්සේ ගැටලුව විසඳීම කෙරෙහි අවධානය යොමු කළ අතර ඒ සඳහා ගැටලුවට සමගාමී පෙර පර්යේෂණ වාර්තා ද අධ්‍යයනය කරන ලදී. ඒ අනුව විද්‍යාලයේ විදුහල්පති හා විෂයභාර ගුරුභවතුන් හා එක්ව 6-11 ශ්‍රේණිවල ගණිතය විෂය ලකුණු වාර්තා නැවතත් විශ්ලේෂණය කෙරිණි. ඒ අනුව දිගුකාලීනව සිසුන් සාධනයට දුෂ්කරතා පෙන්වූ ක්ෂේත්‍ර හඳුනා ගැනීමට හැකි විය. ගැටලුකාරී තත්වයන්ට විසඳුම් සෙවීමේ දී නිවසේ ඉගෙනුම් පරිසරයේ වැදගත්කම දෙමාපිය අවධානයට ලක් කරමින් සිසුන් විසින් ඉලක්ක තබාගත යුතු ආකාරය හා සිසුන්ගේ සාධන මට්ටම් ඇගයීමට ලක් කරමින් පසු විපරම් කටයුතු මේ සඳහා ඵලදායී වන ආකාරය දක්වා ඇත. පර්යේෂණයට භාජනය වූ ගැටලු තත්ත්වය මතු නොවීමට නම් වාර විභාග ලකුණු විශ්ලේෂණය නිවැරදිව සිදු කළ යුතු අතර, විශ්ලේෂණ වාර්තා පදනම්ව ප්‍රතිකාර්ය හා ප්‍රතිපෝෂණ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළ යුතුය. දෙමාපිය - ගුරු අධ්‍යාපනික සබඳතා ශක්තිමත් කළ යුතුය. පාසල් අධීක්ෂණය කාර්යක්ෂමව හා ඵලදායී අයුරින් පවත්වා ගත යුතුය.



**මුඛ්‍ය පද : ප්‍රතිකාර්යය, ප්‍රතිපෝෂණ**

## 1. හැඳින්වීම

සබරගමුව පළාත රත්නපුර හා කෑගල්ල යන දිස්ත්‍රික්කවලින් සමන්විත වන අතර, ඉන් රත්නපුර දිස්ත්‍රික්කය අධ්‍යාපන කලාප හතරකින් සමන්විත වේ. ඇඹිලිපිටිය, රත්නපුර, නිවිතිගල, කෑගල්ල ලෙසිනි. ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපයට පාසල් 129ක් අයත් වේ. අධ්‍යාපන කොට්ඨාස තුනක් තුළ මෙම පාසල් ස්ථාපිත වී ඇත. ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපයේ සහාකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සංවර්ධන) හා ගුරු උපදේශක වශයෙන් අප අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සඳහා විවිධ අධ්‍යාපනික වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමේ නිරතවන්නෙමු. අදාළ වෘත්තීය කාර්යයන් අතර පාසල් කටයුතු නිරීක්ෂණ වැඩසටහන් සෑම සතියකම අඟහරුවාදා සහ බ්‍රහස්පතින්දා දින ක්‍රියාත්මක වන අතර, එහිදී ශිෂ්‍ය සාධන මට්ටම නැංවීමෙහිලා විවිධ වැඩසටහන් පාසල් හා සම්බන්ධ වෙමින් ක්‍රියාවට නැංවීම කෙරෙහි ද සුවිශේෂී අවධානයක් යොමු කිරීම සිදු කෙරිණි.

ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපයේ පාසල්හි අ.පො.ස (සා. පෙළ) ප්‍රතිඵල විශ්ලේෂණයේ දී ගණිතය විෂය අසමත් වීම හේතුවෙන් අ.පො.ස (උ. පෙළ) අධ්‍යාපනය ලැබීමට ඇතැම් සිසුන්ට අවස්ථා අහිමි වී යාම සෑම වර්ෂයක දීම විද්‍යමාන වූ කරුණකි. ප්‍රතිඵල සංවර්ධනය හා සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා කිසියම් වූ වැඩසටහන් ක්‍රියාත්මක වෙමින් පැවතිය ද අපේක්ෂිත මට්ටම කරා ළඟා වීමට ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපයේ පාසල් අතරින් ඇඹිලිපිටිය අධ්‍යාපන කොට්ඨාසයේ ර/ඇඹි/කාවන්තිස්සපුර විද්‍යාලය වර්ෂ ගණනාවක් තිස්සේ අසමත් බව පෙන්වන ලදී. ප්‍රතිඵල විශ්ලේෂණයේ දී මෙම විද්‍යාලයේ අදාළ ගැටලුව සුවිශේෂී ලෙසින් දක්නට ලැබිණි. වාර විභාග ලකුණු විශ්ලේෂණය කළ ද එමගින් සාධන මට්ටම ඉහළ නැංවීම ඵලදායී ලෙසින් සිදු නොවන බව ද පැහැදිලි විය. මෙය විද්‍යාලයට ප්‍රබල ගැටලුවක්ව පවතින බව කරුණු විමසීමේ දී පැහැදිලි විය.

මෙම ගැටලුව විසඳීම සඳහා අවධානය යොමු කරමින් විවිධ වැඩ සැලසුම් සැකසෙමින් පැවතිය ද අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ හා ප්‍රමිති ඒකකය විසින් ශිෂ්‍ය සාධන මට්ටම නැංවීම සඳහා පර්යේෂණ සිදුකිරිම ආරම්භ කරනු දක්නට ලැබිණි. අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ හා ප්‍රමිති ඒකකය විසින් ඒ සඳහා අදාළ වූ දැනුවත් කිරිමේ වැඩසටහන් කිහිපයක් සිදු කළ අතර ඒ සඳහා සහභාගි වීමෙන් ලද මගපෙන්වීම මෙම පර්යේෂණය සිදුකිරීමට පාදක විය. ඒ අනුව ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපයේ "ර/ඇඹි/කාවන්තිස්සපුර විද්‍යාලයේ 6-11 ශ්‍රේණිවල ගණිතය විෂය වාර විභාග ලකුණු විශ්ලේෂණ, ශිෂ්‍ය ප්‍රතිපෝෂණ වැඩසටහන් සඳහා භාවිත නොකිරීම" යන ගැටලුව කෙරෙහි සුවිශේෂී අවධානය යොමු කරමින් ක්‍රියාමූලික පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ ගැටලුවට මැදිහත් වී විසඳුම් සෙවීමට තීරණය කළෙමු.

## 2. ගැටලුව පිළිබඳ දැක්ම

ගණිතය යනු වියුක්ත සංකල්ප රාශියකින් සැදුම්ලත් විෂයකි. ගණිතය ඉගැන්වීමේදී සංයුක්ත ද්‍රව්‍යවලින් තොරව හුදෙක් පොත්පත් ආශ්‍රිතව හෝ කළුලෑල්ල ආශ්‍රිතව ඉගැන්වීමට පෙළඹීමෙන් සිසුන්ට ගණිත සංකල්ප තහවුරු කිරීම බොහෝ සෙයින් දුෂ්කර වේ. උපන්දා සිටම පුද්ගලයෙකු සමාජගත වීමේ සෑම අවස්ථාවකදීම ගණිතය හා සම්බන්ධව කටයුතු කරයි. ගණිතයෙන් තොර සමාජගත වීමක් නැත. 6 වන ශ්‍රේණියේ සිට සිසුවෙකු විධිමත් ලෙසින් ගණිත සංකල්ප ඉගෙනීම

ආරම්භ කරයි. මෙහිදී ගණිතය විෂයභාර ගුරුවරුන් විවිධ ක්‍රමවේද භාවිත කරමින් ගණිතය ඉගැන්වීම සිදු කළද වාර විභාග ලකුණු විශ්ලේෂණය කිරීමේ දී අනෙක් විෂයන්ට සාපේක්ෂව ගණිතය සඳහා ලබා ගන්නා ලකුණු ප්‍රමාණය අවම මට්ටමක පවතින බව කරුණු විමසීමේ දී විද්‍යමාන විය. ලකුණු වාර්තා සටහන් කිරීම සහ ලකුණු විශ්ලේෂණය කළ ද ශිෂ්‍ය ප්‍රතිපෝෂණය සඳහා එම විශ්ලේෂණ සුවිශේෂී ලෙසින් භාවිතයට නොගැනීම මත මෙම ගැටලුව වාර්ෂිකව විද්‍යාලය තුළ දක්නට ලැබීම ද විශේෂත්වයක් විය. ලකුණු වාර්තා නිරීක්ෂණයේ දී විද්‍යමාන වූයේ සෑම වර්ෂයක දී ම පහත සඳහන් ලෙසින් ලකුණු විශ්ලේෂණය කර ඇති බවකි. විෂයන් අනුව එය සකසා ඇත.

වගුව 1: ලකුණු වාර්තා විශ්ලේෂණ ආකෘතිය අංක 01

| ලකුණු පරාසය | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|
| 0 - 40 | |
| 41 - 60 | |
| 61 - 80 | |
| 81 - 100 | |

ලකුණු පරාසයක් අනුව පොදුවේ ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් කළ ද එක් එක් ශිෂ්‍යාගේ සුවිශේෂී තත්වයන් විශ්ලේෂණය කිරීමක් සිදු වී නොමැත. එහෙයින් මෙම වාර විභාග ලකුණු විශ්ලේෂණ වාර්තා ශිෂ්‍ය ප්‍රතිපෝෂණය සඳහා ඵලදායී ලෙසින් යොමු වී නැති බවත්, මෙම හේතුව මත අ.පො.ස (උසස් පෙළ) හැදෑරීම සඳහා සිසුන් යොමු කිරීමේ දුෂ්කරතාවට වාර්ෂිකව ර/ඇඹි/කාවන්තිස්සපුර විද්‍යාලය මුහුණ පා සිටින බවත් නිරීක්ෂණය විය. ඒ අනුව සුවිශේෂී ලෙසින් පවතින ගැටලු විසඳී නැති බවත් කරුණු විමර්ශනයේ දී අනාවරණය විය. අදාළ ගැටලුව අධ්‍යයනය කර ඊට ඵලදායී ලෙසින් මැදිහත් වීමෙන් වාර විභාග ලකුණු විශ්ලේෂණ ශිෂ්‍ය ප්‍රතිපෝෂණය සඳහා යොදා ගත හැකි බව වටහා ගතිමු.

### 2.1 පර්යේෂණ අරමුණු

i. වාර විභාග ලකුණු විශ්ලේෂණ වාර්තා ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීම සඳහා භාවිත කරන්නේද යන්න විමසා බැලීම.
ii. වාර විභාග ලකුණු විශ්ලේෂණ වාර්තා පදනම් කරගෙන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත් වීම හා එමගින් ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීම.
iii. වාර විභාග ලකුණු විශ්ලේෂණ ශිෂ්‍ය ප්‍රතිපෝෂණය සඳහා යොදා ගැනීමේ ප්‍රගතිය විමසීම

### 2.2 පර්යේෂණ ප්‍රශ්න

i. වාර විභාග ලකුණු විශ්ලේෂණ වාර්තා ශිෂ්‍ය ප්‍රතිපෝෂණය සඳහා කොතෙක් දුරට භාවිත වේද?
ii. වාර විභාග ලකුණු විශ්ලේෂණ වාර්තා අනුව ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීම සඳහා භාවිත කරන ලද පියවර හා ක්‍රියාමාර්ගයන් මොනවාද?
iii. වාර විභාග ලකුණු විශ්ලේෂණ වාර්තා තැබීමට ඵලදායීව මැදිහත් වීමෙන් ශිෂ්‍ය සාධනය සම්බන්ධ ප්‍රගතිය කෙබඳුද?

## 1.4 ගැටලුවට අදාළ කරුණු සොයා බැලීම

"ර/ඇඹි/කාවන්තිස්සපුර විද්‍යාලයේ 6-11 ශ්‍රේණිවල ගණිතය විෂය වාර විභාග ලකුණු විශ්ලේෂණ ශිෂ්‍ය ප්‍රතිපෝෂණ සඳහා භාවිත නොකිරීම" යන ගැටලුව පිළිබඳ පර්යේෂණාත්මකව සොයා බැලීම සඳහා ගැටලුවට අදාළ කරුණු සුවිශේෂීව අධ්‍යයනය කළෙමු. දත්ත රැස් කිරීමේදී පහත ක්‍රමවේද ඔස්සේ ක්‍රියාත්මක වීමු.

- නිරීක්ෂණ ක්‍රමය
- සම්මුඛ සාකච්ඡා ක්‍රමය
- ලිඛිත මූලාශ්‍ර අධ්‍යයනය

මෙම දත්ත රැස් කිරීමේ ක්‍රම යටතේ තොරතුරු රැස් කිරීමේ උපකරණ පහත දැක්වේ.

- නිරීක්ෂණ - සැසඳුම් ලැයිස්තු, නිරීක්ෂණ නියමාවලි
- සම්මුඛ සාකච්ඡා - සම්මුඛ සාකච්ඡා නියමාවලි (විදුහල්පති, ගුරු, සිසු, දෙමාපිය)
- ලිඛිත මූලාශ්‍ර - ලකුණු වාර්තා, විශ්ලේෂණ වාර්තා, පැමිණීමේ ලේඛන, ගුරු සටහන්, අභ්‍යාස පොත්, අතිරේක පන්ති පැවැත්වීම්, ගුරු උපදේශක වාර්තා, බාහිර අධීක්ෂණ වාර්තා

ඉහත දත්ත රැස්කිරීමේ ක්‍රම මගින් රැස් කර ගත් දත්ත සංඛ්‍යාත්මක විශ්ලේෂණයක් මගින් අනාවරණවලට එළඹීම සිදු කර ඇත.

### 1.4.1 නිරීක්ෂණ ක්‍රමය

ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපයේ කණ්ඩායම් නියාමන අවස්ථා, කේවල නියාමන සහ සහය ඉගැන්වීම් අවස්ථා මේ සඳහා යොදා ගැනුණි. ගණිත සංකල්ප පිළිබඳ ගැටලු සහිත 6-11 ශ්‍රේණි සිසුන් සඳහා ක්‍රියාත්මක වන පහත අංශ පිළිබඳව නිරීක්ෂණය විය.

i. අතිරේක ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම
ii. වාර විභාග ලකුණු පදනම්ව එම ක්‍රියාකාරකම් සැලසුම් සහගත වීම
iii. කේවල මට්ටමින් සිසුන් සඳහා අවධානය යොමු කිරීම
iv. විවිධ ඉගැන්වීම් ක්‍රමවේද භාවිත කිරීම
v. සම්පත් පුද්ගල සහය ලබා ගැනීම
vi. අභ්‍යාස පොත් පරීක්ෂාව

මෙහිදී කලාපීය ගණිත ගුරු උපදේශක සහය ද ලබා ගන්නා ලදී.

නිරීක්ෂණය මගින් අනාවරණය වූයේ වාර විභාග ලකුණු මත පදනම්ව ඒ ඒ ශිෂ්‍යයන්ට සුවිශේෂී අයුරින් ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, සැලසුම් ක්‍රියාත්මක කිරීම, සුවිශේෂී සටහන් තබා ගැනීම, බහුතල ඉගැන්වීම් ක්‍රමවේද භාවිතයට යොමු වීම ආදිය පිළිබඳ ඵලදායීව ක්‍රියාකාරී වී නොමැති බවයි. නිරීක්ෂණ නියමාවලී ඇසුරින් තව දුරටත් දත්ත රැස් කිරීම සිදු කරන ලදී.

වගුව 2 : නිරීක්ෂණ නියමාවලිය ඇසුරෙන් එක් එක් කරුණ ක්‍රියාත්මක වී ඇති ආකාරය ප්‍රමාණාත්මකව **දැක්වීම**

| අවධානයට යොමු කළ කරුණු | හොඳයි (1) | සාමාන්‍යයි (2) | සංවර්ධනය විය යුතුයි (3) |
|---|---|---|---|
| ලකුණු සටහන් තැබීමේ ක්‍රමවේදය | | | |
| ලකුණු සටහන් කිරීමේ පාසලේ ක්‍රියාත්මක සැලැස්ම | | | |
| ලකුණු පිරිනැමීමේ වාර ගණනෙහි ප්‍රමාණවත් බව | | | |
| ලකුණු විශ්ලේෂණය කරන ක්‍රමවේදය | | | |
| විශ්ලේෂණ මත පදනම්ව ඉදිරි කාර්යයන් | | | |

### 1.4.2 සම්මුඛ සාකච්ඡා

සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය මගින් ද ගැටලුවට පාදක වූ කරුණු පිළිබඳව විමසා බැලුවෙමු. මෙහි දී කලාප කණ්ඩායම් අධීක්ෂණ දිනවලට අමතරව කේවල නියාමන වශයෙන් ද අදාළ කාර්යයෙහි නිරත වීය. ඒ අනුව විදුහල්පති හා පළමුව සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. එහි දී,

- ලකුණු පිරිනැමීම සඳහා යොදා ගන්නා අවස්ථා
- ලකුණු වාර්තා තැබීම පිළිබඳ නියාමනය
- විශ්ලේෂණ වාර්තා සැකසීමේ ක්‍රමවේදය
- ප්‍රතිකාර්යය සඳහා ක්‍රියාකාරකම් සැලසුම්
- එම ක්‍රියාකාරකම් විශ්ලේෂණ වාර්තා මත පදනම්ව සිදු වන/නොවන බව

ආදී අංශ කෙරෙහි සුවිශේෂී අවධානය යොමු කරමින් සම්මුඛ සාකච්ඡා පැවැත්විය. එහිදී ද සුවිශේෂීව අනාවරණය වූයේ ලකුණු වාර්තා විශ්ලේෂණය කළ ද එය ඵලදායී අයුරින් සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා භාවිත වී නොමැති බව ය.

ගණිතය විෂයභාර ගුරුවරුන් සමඟ කරන ලද සාකච්ඡාව ඇසුරින් ද තොරතුරු රැසක් අනාවරණය කරගත හැකි විය. ලකුණු විශ්ලේෂණයේ දී හඳුනාගත් සිසුන් සඳහා ප්‍රතිකාර්ය සැලසුම් කළ ද ක්‍රියාත්මක කිරීමට සුදුසු පසුබිමක් (සිසු පැමිණීම අවම වීම හා උනන්දුව අවම වීම) නොමැති බව හෙළි විය. විශ්ලේෂණ මත පදනම්ව ගුරුවරුන් සමග කරන ලද සාකච්ඡාවේ දී වැටහුණු කරුණක් නම් ඉගැන්වීම් නව ක්‍රමවේද පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තවදුරටත් සිදුකළ යුතුව ඇති බවයි.

සිසුන් සමග සම්මුඛ සාකච්ඡා කිරීමේ දී කේවල වශයෙන් මෙන්ම කණ්ඩායම් වශයෙන් ද සාකච්ඡාවට භාජනය කරන ලදී. කණ්ඩායම් සාකච්ඡාවල දී අදාළ ප්‍රශ්න කිරීම්වලට ලබා දුන් පිළිතුරු හා කේවල වශයෙන් සාකච්ඡා කිරීමේ දී ලද පිළිතුරු අතර වෙනස් තත්වයන් දක්නට

ලැබුණි. කේවල සම්මුඛ සාකච්ඡාවල දී පැහැදිලි වූ කරුණක් ලෙස සිසුන් තම ලකුණුවල වර්ධනය හෝ අවධානය යොමු කළ යුතු අංශ පිළිබඳව සුවිශේෂීව දැන නොසිටිය බව දැක්විය හැකිය. එහෙයින් වාර විභාග ලකුණු විශ්ලේෂණය කළ ද එය ශිෂ්‍ය ප්‍රතිපෝෂණය සඳහා ඵලදායී අයුරින් භාවිත නොවීම පිළිබඳ කරුණු අවධාරණය කෙරිණි. තමන්ගේ ලකුණු අවම වීම කුමන ගණිත සංකල්ප සඳහා ද යන වග සිසුන්ට පැවසීමට නොහැකි විය. එහෙයින් සංවර්ධනය සඳහා අවධානය යොමු කළ යුත්තේ කුමන අවස්ථා පිළිබඳව ද යන්න අවධානය කිරීම ඔවුන්ගෙන් ගිලිහී ඇති බව විද්‍යමාන විය.

දෙමාපියන් සමග සම්මුඛ සාකච්ඡා පොදු වශයෙන් හා කේවල වශයෙන් පවත්වන ලදී.

- දරුවාගේ ලකුණු මට්ටම පිළිබඳ අවම අවධානයක් යොමු කර ඇති බව
- ආර්ථික දුෂ්කරතා මත ජීවත් වන බව
- දරුවාගේ අධ්‍යාපනික කටයුතු පාසලට පමණක් යොමු කර ඇති බව
- අධ්‍යාපන කටයුතුවලට නිවසෙන් ලැබෙන සහය අවම බව
- ලකුණු විශ්ලේෂණ පිළිබඳව අවබෝධය අවම බව
- දරුවාගේ සුවිශේෂී ගණිතමය හැකියා පිළිබඳ අවබෝධය පහළ මට්ටමක පවතින බව

යන කරුණු මෙහිදී සුවිශේෂීව අනාවරණය විය. වාර විභාග ලකුණු සම්බන්ධයෙන් දෙමාපිය අවධානය ඉතා අඩු බව සම්මුඛ සාකච්ඡාවේ දී ඉතා පැහැදිලි විය. දෙමාපිය-ගුරු සබඳතා අධ්‍යාපනික වශයෙන් අවම වීම තුළද වාර විභාග ලකුණු විශ්ලේෂණ ශිෂ්‍ය ප්‍රතිපෝෂණ වැඩසටහන් සඳහා සුවිශේෂී ලෙසින් භාවිතයට ගැනීම අවම වීම තිබූ බව පැහැදිලි විය. ඍජු මැදිහත් වීම් අවම වී තිබූ බව දෙමාපිය සම්මුඛ සාකච්ඡා තුළින් අනාවරණය කර ගතිමු.

### 1.4.3 ලිඛිත මූලාශ්‍ර අධ්‍යයනය

මෙම ක්‍රමවේද යටතේ ද ගැටලුවට පාදක වූ කරුණු විමර්ශනය කරන ලදී. ඒ සඳහා යොදා ගත් ලේඛන වනුයේ 6 - 11 ශ්‍රේණිවල,

- වාර විභාග ලකුණු වාර්තා පොත
- වාර විභාග ලකුණු විශ්ලේෂණ වාර්තා
- සිසු පැමිණීමේ ලේඛන
- අභ්‍යාස පොත් පරීක්ෂා කිරීම්
- ගුරු වාර්තා සටහන්
- අතිරේක පන්ති පැවැත්වීමේ සටහන්
- ගුරු උපදේශක වාර්තා
- බාහිර අධීක්ෂණ සටහන් යනාදියයි.

ගණිතය විෂය සඳහා ලකුණු අවම වූ සිසුන්ගේ පාසල් පැමිණීමද තරමක් දුර්වල මට්ටමක පවතින බව දිනපතා පැමිණීමේ ලේඛන ඇසුරින් අනාවරණය විය.

වාර විභාග ලකුණු වාර්තා හා විශ්ලේෂණ වාර්තා සටහන් නිරීක්ෂණයේදී විද්‍යමාන වූ සුවිශේෂී තත්වය වනුයේ වාර්තා සටහන් නිසි පරිදි තබා ඇති බවත්, විදුහල්පති නිරීක්ෂණයට ඒවා ලක්වී ඇති බවත්ය. එහෙත් වාර විභාග ලකුණු විශ්ලේෂණ වාර්තා සුවිශේෂී ලෙසින් විමර්ශනයට භාජනය කිරීම හා ඒ මත පදනම්ව ප්‍රතිකාර්ය වැඩසටහන් ක්‍රියාත්මක වීම ඵලදායී මට්ටමක නොපැවතුණි. ප්‍රතිකාර්ය වැඩසටහන් ක්‍රියාත්මක වුවද ලකුණු විශ්ලේෂණ වාර්තා හා සමගාමීව නිසි සැලැස්මකට අනුව ක්‍රියාත්මක නොවීම මත ශිෂ්‍ය ප්‍රතිපෝෂණය සිදු වී නොමැති බව මෙමගින් අනාවරණය විය.

ගුරු උපදේශක වාර්තා සහ බාහිර අධීක්ෂණ වාර්තා පිළිබඳව නිරීක්ෂණයේ දී ද දක්නට ලැබුණු සුවිශේෂීත්වය වූයේ ගණිතය විෂය සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා ඵලදායී වැඩසටහන් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු බවයි.

සිසු අභ්‍යාස පොත් පරීක්ෂාවේ දී නිරීක්ෂණය වූයේ සමස්තයක් ලෙස පොත් පරීක්ෂා කළ ද ඇතැම් සිසුන්ගේ අභ්‍යාස පරීක්ෂාවට ලක් වී නොමැති බවකි. ඇතැම් අභ්‍යාස ලකුණු කිරීමේ දී සැකසිය යුතු තත්වයන් පිළිබඳ අවධානය යොමුවන සේ ඒවා ලකුණු කර නොමැති බවද අනාවරණය විය. කරුණු විමර්ශනයේ දී තහවුරු වූයේ අභ්‍යාස පොත් පරීක්ෂාව තව දුරටත් ඵලදායී ලෙසින් ඉටු කළ යුතු බවකි.

## 1.5 දත්ත ත්‍රිකෝණීකරණය ඇසුරින් සාධක හඳුනා ගැනීම

වගුව : විවිධ පර්යේෂණ ක්‍රමවලින් ලබා ගත් අනාවරණ ත්‍රිකෝණීකරණය

| නිරීක්ෂිත දත්ත මගින් ලබා ගත් අනාවරණ | සම්මුඛ සාකච්ඡා මගින් ලබා ගත් අනාවරණ | ලිඛිත අධ්‍යයන මගින් ලබා ගත් අනාවරණ |
|---|---|---|
| කේවල මට්ටමින් සිසුන් සඳහා අවධානය අවම බව<br>වාර විභාග ලකුණු මත ප්‍රතිකාර්ය ක්‍රියාකාරකම් සැලසුම් කිරීම ඵලදායී වී නොමැති බව<br>බහුතල ඉගැන්වීම් ක්‍රමවේද උචිත අයුරින් භාවිතයට නොගෙන ඇති බව<br>සිසු තත්වයන් පිළිබඳ සුවිශේෂී වාර්තා තබා නොමැති බව | විශ්ලේෂණ වාර්තා සකසා ඇති බව<br>විශ්ලේෂණ වාර්තා ඵලදායී අයුරින් ප්‍රතිකාර්ය වැඩසටහන් සඳහා යොදා නොමැති බව<br>දෙමාපිය අවධානය අවම බව<br>පවුලේ ඉගෙනුම් පරිසරයක් නොමැති බව<br>ගුරු-දෙමාපිය අධ්‍යාපනික සබඳතාව අවම බව<br>සිසු සුවිශේෂී ගණිතමය හැකියාවන් හඳුනා ගැනීම කෙරෙහි අඩු අවධානයක් පැවති බව<br>විශ්ලේෂණ වාර්තා මත පදනම්ව සිදු කළ වැඩසටහන් වාර්තා අවම බව | විශ්ලේෂණ වාර්තා මත පදනම්ව සිදු කළ වැඩසටහන් වාර්තා අවම බව<br>අදාළ සිසුන්ගේ පාසල් පැමිණීම දුර්වල බව<br>අභ්‍යාස පොත් පරීක්ෂා කළ ද ඵලදායී ලෙස සිදු වී නොමැති බව<br>අභ්‍යාස පරීක්ෂාවට සිසු උනන්දුව අවම බව |

### 1.6 පොදු අනාවරණ

- වාර විභාග ලකුණු වාර්තා සහ විශ්ලේෂණ වාර්තා සටහන් කර ගොනුගත කර ඇති බව
- වාර විභාග ලකුණු විශ්ලේෂණ වාර්තා ප්‍රතිකාර්ය වැඩසටහන් සඳහා සුදුසු ලෙස භාවිත කර නොමැති බව
- විශ්ලේෂණ වාර්තා සුවිශේෂී ලෙසින් අධ්‍යයනය කර නොමැති බව
- දෙමාපිය අවධානය හා මැදිහත් වීම අවම බව
- අභ්‍යන්තර ඇගයීමේ දී ගණිතය විෂය පිළිබඳ සුවිශේෂී අවධානයක් යොමු කර නොමැති බව
- අභ්‍යාස පොත් පරීක්ෂාව ඵලදායී ලෙසින් සිදු වී නොමැති බව
- විදුහල්පති හා නියෝජ්‍ය විදුහල්පති අවධානය යොමු වුවද එය නිසි ක්‍රමවේදයට ඇතුළත් වී නොමැති බව
- සිසු පැමිණීම අවම මට්ටමක පවතින බව

## 2. දෙවන පරිච්ඡේදය

වාර විභාග ලකුණු විශ්ලේෂණ වාර්තා ශිෂ්‍ය ප්‍රතිපෝෂණ වැඩසටහන් සඳහා භාවිත නොකිරීම ගැටලුක් බවට පත්වන්නේ ඇයි?

අතීතයේ සිටම ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය තුළ ශිෂ්‍ය සාධන මට්ටම මැන බැලීම සඳහා විභාග පැවැත්වීමේ ක්‍රමවේදය ස්ථාපිත වී තිබිණි. ඒ අනුව රාජ්‍ය මට්ටමින් පවත්වන විභාග සඳහා දරුවා සූදානම් කිරීම වෙනුවෙන් පසුකාලීනව වාර විභාග පැවැත්වීම කෙරෙහි අධ්‍යාපන ආයතනවල අවධානය යොමු වීම සිදු වූ බව කරුණු විමසීමේ දී පෙනී ගොස් ඇත. වර්ෂයක දී අධ්‍යයන වාර තුනක් සඳහා දිගු කලක් තිස්සේ වාර විභාග පැවැත්වීම කෙරෙහි ගුරු, විදුහල්පති අවධානය යොමු වීම ඒ අනුව සිදු විය. වාර විභාග ඇසුරෙන් ප්‍රගති වාර්තා පිරිනැමීම, දෙමාපිය දැනුවත් කිරීම ආදී අංශ කෙරෙහි අවධානය යොමු වීම ද ඒ අනුව ව්‍යාප්ත විය.

සෑම වර්ෂයකදීම වාර තුනක් අවසානයේ වාර විභාග පැවැත්වීම සම්ප්‍රදායක් බවට පත් වී තිබේ. එහෙත් ඉන් ඵලදායී ප්‍රයෝජනයක් ලබා ගැනීමට කටයුතු සම්පාදනය වී නොමැති බැවින් ප්‍රතිඵල සංවර්ධනය හා සාධන මට්ටම සංවර්ධනය ද අවම මට්ටමක පැවතුණි. විශ්ලේෂණ මත පදනම්ව ප්‍රතිකාර්ය සැලසුම් කේවලව සිදු කිරීම කෙරෙහි අධ්‍යාපනික බලධාරීන්ගේ අවධානය යොමු නොවීම ද මෙම ගැටලුව වඩාත් උද්ගත වීමට හේතුව වී තිබේ.

අදාළ ලකුණු විශ්ලේෂණ වාර්තා මත පදනම්ව එක් එක් සුවිශේෂී අවස්ථා හඳුනා ගනිමින් ඒ සඳහා සුදුසු විවිධ ක්‍රමවේද හා ක්‍රම ශිල්ප භාවිත කිරීම සිදු කළ යුතුව ඇත. නමුත් ලකුණු විශ්ලේෂණවලට අදාළව පොදුවේ සිසුන් සඳහා නැවත ක්‍රියාකාරකම් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම කෙරෙහි වැඩි වශයෙන් අවධානය යොමු වී ඇති බව නිරීක්ෂණයට ලක් විය. එය නැවතත් පොදු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හා සමගාමීව සිදු කෙරෙන අතිරේක ක්‍රියාකරකමක් ලෙසින් සම්පාදනය වී ඇති බව කිව යුතුය.

වාර විභාග ලකුණු විශ්ලේෂණ වාර්තා සකසා ලිඛිත සටහන් තබා විදුහල්පති අනුමැතිය ද ලබා ගත් පසු ඒවා බොහෝ විට පවතින්නේ අදාළ ලිපිගොනුවල පමණි. ඒවා නැවත පරීක්ෂාවට ගෙන සුවිශේෂීව සැකසිය යුතු ගණිත සංකල්පමය අවස්ථා හඳුනා නොගැනීම හා ඒ අනුව කාර්යයන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක නොකිරීම, පසු නියාමනයක් සිදු නොවීම ආදී කරුණු මීට පාදක වී තිබේ. එක් එක් සිසුවාගේ පවතින සුවිශේෂී තත්වයන් මත බහුතල ඉගැන්වීම් ක්‍රමවේද භාවිත නොකිරීම ද ගැටලුවක් බවට පත්වීමට බලපා ඇත.

එමෙන්ම සිසුන් ඉගෙන ගන්නා ආකාර විවිධ වේ. එකී විවිධ වූ ආකාරයන් සඳහා සුදුසු ක්‍රමවේද හා ක්‍රම ශිල්ප ගණිත ගුරුවරයා දැන නොසිටීම මත ලකුණු විශ්ලේෂණය කළ ද ඵලදායී ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක් නිර්මාණය නොවේ. මේ සඳහා ගණිත ක්‍රීඩා, ප්‍රහේලිකා, විවාද ආදී විවිධ ක්‍රමවේද භාවිත නොකිරීම ද ගැටලුකාරී තත්ත්වයන් නිර්මාණය කරයි.

තවද වාර විභාග ලකුණු විශ්ලේෂණ වාර්තා පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීම පොදුවේ සිදු කිරීමද ගැටලුවක් බවට පත් වී තිබේ. තම දරුවාගේ ඇති ගණිතමය හැකියා හා නොහැකියා විශ්ලේෂණාත්මකව දෙමාපියන් සමග කේවලව සාකච්ඡා නොකිරීම මීට ප්‍රධාන වශයෙන් බලපා ඇත. එහෙයින් නිවෙස් ඉගෙනුම් පරිසරය හා දෙමාපිය මැදිහත් වීම ඵලදායී නොවීමට හේතු වී තිබේ.

වාර විභාග ලකුණු විශ්ලේෂණ වාර්තා මත පදනම්ව සම්පත් දායකයන් මගින් සහයෝගය ලබා නොගැනීමද විශේෂිතව දැක්විය හැකිය. වැඩමුළු සංවිධානය කර පැවැත්වීම සිදු වුවද සිසුන්ට සුවිශේෂී වූ තත්වයන් සැකසීම කෙරේ අවධානය යොමු වීම අවම මට්ටමක පැවතීම ප්‍රතිඵල සංවර්ධනය නොවීමට හා සාධන මට්ටම ඉහළ නොයාමට සෘජුව බලපා තිබේ.

## 3. තුන්වන පරිච්ඡේදය

### 3.1 ශාස්ත්‍රීය සන්දර්භය

"වාර විභාග ලකුණු විශ්ලේෂණ ශිෂ්‍ය ප්‍රතිපෝෂණ වැඩසටහන් සඳහා භාවිත නොකිරීම" යන ගැටලුව ක්‍රියා මූලික පර්යේෂණයක් මගින් විසඳීම සඳහා යොදා ගතිමු. එය වඩාත් තහවුරු කරගැනීමට සහ එම ගැටලුව විසඳීමට අවශ්‍ය මැදිහත්වීම සඳහා සාහිත්‍ය විමර්ශනයක් සිදු කරන ලදී. ගැටලුවේ අන්තර්ගත සංකල්ප අර්ථකථනය කර ගැනීම සඳහා සාහිත්‍ය විමර්ශනයට වඩාත් යොමු වීමු. මෙහි දී පහත සඳහන් අනු මාතෘකා ඔස්සේ සාහිත්‍ය විමර්ශනය සිදු කෙරිණි.

- සිසුන් ඇගයීමට ලක් කිරීම.
- සිසුන්ගේ ගණිතමය හැකියාව වර්ධනය කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග
- සිසුන්ගේ සංකල්ප සාධනය කර ගැනීමට හා මනා ඉගැනුම් පරිසරයක් ඇති කර ගැනීමේ දී ගුරුකාර්යභාරය
- නිපුණතා සංවර්ධනයේ දී ගුරුකාර්යභාරය හා ඵලදායී ඉගෙනුම

### සිසුන් ඇගයීමට ලක් කිරීම

සිසුන් ඉගෙනුමට උනන්දු නොවන කරුණක් ලෙස ඔවුන් ඇගයීමට ලක් නොකිරීම දැක්විය හැකිය. තමන් අගය කිරීමට ලක් කිරීම මත ආශාව හෝ ප්‍රියජනක බවක් ඇතිවීම ළමුන්ගේ මෙන් ම වැඩිහිටියන්ගේ ද දැකිය හැකි ලක්ෂණයකි. එහෙයින් වාර විභාග ලකුණු මත පදනම්ව සිදු කළ විශ්ලේෂණ අනුව සිසු තත්වයන් සුදුසු ලෙසින් ඇගයීමට ලක් කරමින් කටයුතු කිරීම මත සිසු උද්යෝගය වඩවා ගත හැකි බව පැහැදිලිය. එම අවස්ථා උදාකරලීම තුළ ඉගෙනීමට උනන්දුවක් ඇති වේ. මෙය නිවස තුළ මෙන්ම පාසලේ දී ද කළ යුත්තකි. දෙමාපියන් ඉදිරියෙහි, ඥාතීන් ඉදිරියෙහි සිසුන් ඇගයීමට ලක් කළ හැකිය. වාර විභාග ලකුණු විශ්ලේෂණය මත පදනම්ව උපක්‍රමික වශයෙන් සිසු උද්යෝගය වැඩෙන සේ සිසුවා අගය කළ යුත්තේ දෙමාපියන් වෙන් වශයෙන් ගනිමින් නොව සිසුවා ඉදිරියේදීමය. දක්ෂ සිසුන් පමණක් නොව සෙමින් ඉගෙන ගන්නා සිසුන් ද ඇගයීමට ලක් කිරීම ඉතා වැදගත් ය. ගමාච්චි (2016:37) ට අනුව සෑම දරුවෙකුගේම කුමන හෝ දක්ෂතාවන් පෞද්ගලිකව සහ ප්‍රසිද්ධියේ දිරි ගැන්වීම ද නිතිපතා කරන්නට ද ගුරුවරයා අමතක නොකළ යුතුය. එහෙත් දරුවෙකුගේ කිසිම ඌණතාවයක් හෝ හැසිරීමක් ගැන ප්‍රසිද්ධියේ කතා කරන්නට පෙර සමච්චල් කරන්නට ඉදිරිපත් නොවිය යුතුය.

අධි ක්‍රියාකාරී ළමුන්ට පමණක් නොව සුහග ළමුන්, පසුබට ළමුන් ද ඇගයීමට ලක් කිරීම ඉතා වැදගත් බව ජයවර්ධන (2017:73) හි සඳහන් කරයි.

පසු ළමාවිය, කාර්යශූරත්වය හා උද්යෝගය දක්වන අවධියයි. විවිධ කුසලතා වේගයෙන් ලබාගන්නා අවධිය නිසා විවිධ ක්‍රියාකාරකම් කිරීමටත් ඒ මගින් තම දක්ෂතාවලට පිළිගැනීම හා ප්‍රශංසාව ලබා ගැනීමට සිසුවා උනන්දු වන යුගය වේ. එසේම හීනමානයට හෝ අවතක්සේරුවට අකමැත්ත හා බිය මෙකළ විද්‍යමාන වේ. කණ්ඩායම් වැඩවලට හා සමූහ ක්‍රියාකාරකම්වලට කැමැත්තක් දක්වයි. ක්‍රියාකාරකම් මගින් මෙම දක්ෂතා ඔප්නංවා ගැනීමට මෙම අවධියේ දී අවස්ථා සැපයිය යුතුය. ඒ අනුව වාර විභාග ලකුණු මත පදනම්ව සිදු කළ විශ්ලේෂණ ඇසුරින් සුදුසු අභියෝග සහිත ගණිතමය ක්‍රියාකාරකම් සැලසුම් කොට ඊට සිසුවා යොමු කළ යුතුය.

අතුකෝරළ (2015:104) ට අනුව දරුවන්ගේ ආත්ම ශක්තිය පෞරුෂය ගොඩනැගෙන බව පැහැදිලි වේ. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දරුවාගේ පෞරුෂය සංවර්ධනය කර ගැනීම ඉතාමත් අවශ්‍ය කරුණකි. දරුවාගේ ඉදිරි ක්‍රියාවලිය සඳහා ඔහුගේ පෞරුෂය බලපානු ඇත. පාසල් පද්ධතිය එයට අනුව කටයුතු කළ යුතුය. එහෙයින් වාර විභාග ලකුණු විශ්ලේෂණය මත සිසු ඇගයීමේ ක්‍රියාවලිය ධනාත්මක ලෙසින් පන්ති කාමරය හෝ පාසල තුළ නිර්මාණය කර ගැනීම ගුරුවරයාට පැවරෙන සුවිශේෂී කාර්යභාරයක් වන අතර එමගින් සිසු ප්‍රතිපෝෂණය සඳහා ඉඩප්‍රස්ථා උදාකරගත හැකි වේ.

### සිසුන්ගේ ගණිතමය හැකියාව වැඩිදියුණු කරගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග :-

වාර විභාග ලකුණු මත පදනම්ව සිදු කළ විශ්ලේෂණ ශිෂ්‍ය ප්‍රතිපෝෂණය සඳහා භාවිත කිරීමේ දී විවිධ අංශ ඔස්සේ ක්‍රියාකාරකම් සැලසුම් කළ යුතු බව පෙනේ. ක්‍රීඩා මගින් ගණිත සංකල්ප සාධනය කිරීමට යොමු වීම එක් ක්‍රමවේදයකි. ඇතැම් සිසුන් ක්‍රිඩාවට ලැදි ය. එහෙයින් ඔවුන්ගේ රුචි අරුචිකම් මත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීම කෙරෙහි ගුරුවරයා සුවිශේෂී අවධානය

යොමු කළ යුතුය. ගණිතමය සංකල්ප අතර සම්බන්ධතා වැඩෙන සේ ගණිතමය ක්‍රීඩා සැලසුම් කළ යුතුය. සිසුවාගේ රුචිය මත ක්‍රියාත්මක ක්‍රියාකාරකම් මගින් ඉගෙනීමට ඔහු පෙළඹේ. අතුකෝරළ (2002:77) හි සඳහන් පරිදි ක්‍රීඩා මගින් ලබන ඉගෙනුම ගණිත සංකල්ප දරුවාට තහවුරු කිරීමට වඩාත් ඉවහල් වන බව පෙනී යයි.

ගණිතමය සංකල්ප සාධනයේදී මූලික ගණිත හැකියාව සංවර්ධනය කිරීම අතිශයින් වැදගත් ය. මූලික ගණිත හැකියාව මිනිසාගේ මොළය පරිණාමනය වන විට වර්ධනය වේ. එහෙයින් මූලික ගණිත හැකියාව සෑම මනුෂ්‍යයෙකුට ම පොදු ය. මූලික ගණිත හැකියාව වැඩි වන තරමට බුද්ධි මට්ටම ද උසස් වේ. හපුආරච්චි හා චන්ද්‍රසේන (2013:72) මේ බව වඩාත් තහවුරු කරමින් කරුණු දක්වා ඇත. වාර විභාග ලකුණු විශ්ලේෂණ මත ශිෂ්‍ය ප්‍රතිපෝෂණ වැඩසටහන් සැලසුම් කිරීමේ දි වඩාත් ඵලදායී ලෙසින් සාධන මට්ටම ඉහළ නංවා ගැනීමට අවධානය යොමු කළ යුතු අංශ මෙමගින් ද පැහැදිලි වේ.

**සිසුන්ගේ සංකල්ප සාධනය කර ගැනීමට හා මනා ඉගැනුම් පරිසරයක් ඇති කර ගැනීමට ගුරු කාර්යභාරය :**

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී වැඩි වශයෙන් සිදු වන්නේ සංකල්ප ඉගෙනීම යි. සංකල්ප නිසි පරිදි ලැබුණහොත් ඉගෙනීම මෙන්ම ඉගැන්වීම ද වඩා පහසු වේ. සංකල්ප ඉබේ හට නොගනී. සිසුවා බාහිර පරිසරය සමග අන්තර් ක්‍රියාකාරකම්වල යෙදීම මගින්ද, විවිධ භාෂා සන්නිවේදන අවස්ථාවන්ට මුහුණ දීම මගින් ද ක්‍රමයෙන් සංකල්ප වටහා ගනී. එහෙයින් ගුරුවරයා විසින් සිසුන්ගේ ඒ ඒ වයසට සරිලන පරිදි හා ප්‍රමාණවත් පරිදි සංකල්ප සාධනය කරගත හැකි මට්ටමට සංකල්ප ගොඩනංවා ගැනීමට සුදුසු පරිසරයක් සපයා දිය යුතුය. එහෙයින් වාර විභාග ලකුණු මත සිදු කළ විශ්ලේෂණ අනුව ලබා ගන්නා දත්ත ශිෂ්‍ය ප්‍රතිපෝෂණ වැඩසටහන් සඳහා යොදවා ගැනීමේදී මේ සියලු අංශ ගුරුවරයා විසින් අවධානයට ගත යුතුය. මේ බව අතුකෝරල (2015:413) මගින් ද ඉදිරිපත් කර ඇත. දරුවාට සංකල්ප සාධනය කරගැනීමට වඩා පහසුවන ආකාරයේ පරිසරයක් හා අවශ්‍ය මගපෙන්වීම සිදුකළ යුතු බවත්, එමගින් වඩාත් ප්‍රියජනක ඉගනුම් පරිසරයක් නිර්මාණය වන බව අතුකෝරල (2015:413) සඳහන් කරයි.

එහෙයින් වාර විභාග ලකුණු විශ්ලේෂණ මත මදනම්ව සිදු කළ විශ්ලේෂණ මගින් ශිෂ්‍ය ප්‍රතිපෝෂණ වැඩසටහන් සැලසුම් කිරීම කෙරෙහි ගුරු අවධානය කොතෙක් යොමු කළ යුතු දැයි මනාව පැහැදිලිය. ඉහළ ඵලදායීතාවක් ලබා ගත හැකි පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි යෙදීමට නම් මෙම ක්‍රියාපිළිවෙල ගුරුවරයා අවබෝධ කරගත යුතුය.

ගුරුවරයා සිසුන්ගේ මට්ටම් සුවිශේෂි ලෙසින් අවබෝධ කරගත් තරමට ධනාත්මක සමාජ අන්තර් ක්‍රියාවලියකින් යුත් ඉගෙනුම් පරිසරයක් සහිත පන්ති කාමරයක් නිර්මාණය කිරීමට හැකි බවත් එමෙන්ම, ගුරුවරයා, ශිෂ්‍යයා ඉගෙන ගන්නා ආකාරය අවබෝධ කර ගත යුතු බවත්, සිසු අභිප්‍රේරණ උපායමාර්ග තුලින් පන්ති කාමර ඉගෙනුම් අවස්ථා ගොඩනැංවිය යුතු බවත් අබේපාල (2006:92) මගින් පෙන්වා දෙයි. ශිෂය ගණිතමය සාධන මට්ටම ඉහළ නැංවීමේ දි වාර විභාග ලකුණු විශ්ලේෂණ ඵලදායී ලෙස යොදා ගැනීමේ වැදගත්කම මෙමගින් ද තහවුරු වේ.

**නිපුණතා සංවර්ධනයේ දී ගුරුවරයාගේ කාර්යභාරය හා ඵලදායී ඉගෙනුම :-**

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමේ දි එහි ප්‍රතිඵලයක් ලෙස නිපුණතාවන්ට අදාළ සාධන මට්ටම් වැඩි දියුණු කර ගැනීම සඳහා කාණ්ඩ 04ක ක්‍රියාමාර්ග ගත හැකි බව පස් අවුරුදු සැලැස්ම (2000 -2004) පෙන්වා දෙයි.

- විෂය මාලාව
- ගුරු අධ්‍යාපනය හා සහය
- නිවසේ සහය
- පන්ති කාමරවල භෞතික පරිසරය

ලෙසිනි. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව (1992) පෙන්වා දෙන ආකාරයට ගුරුවරයා වැඩ කරනුයේ සියුම් හැඟීම් ඇති, ඉක්මනින් සතුටු කල හැකි, එමෙන්ම ඉක්මනින් කණස්සල්ලට පත්වන දරුවන් සමඟ ය. සියුම් කුසලතාවන් හා සංකීර්ණ සංකල්ප දියුණු කර ගැනීමට ගුරුවරයා සමත් විය යුතු අතර සිසුවාට සහය විය යුතු ය.

මෙහි දී සිසු විශ්ලේෂණ වාර්තා බෙහෙවින් වැදගත් වේ. සම්ප්‍රදායික ශාස්ත්‍රීය අධ්‍යාපනයෙන් බැහැරව අධ්‍යාපනයේ නව ප්‍රවණතාවක් වූ නිපුණතා සංවර්ධන ව්‍යුහය ගුරුවරයා අධ්‍යයනය කළ යුතු ය. ගුරුවරයාට තම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මනා ලෙස සැලසුම් කිරීමට නිපුණතා පිළිබඳ අවබෝධය වඩාත් වැදගත් බව අබේපාල (2006:29) මගින් ද පෙන්වා දෙයි. ඵලදායී ඉගැන්වීමක් යනු ශිෂ්‍යයන් මුහුණ දෙන දුෂ්කරතා හා වරදවා වටහා ගැනීම් අවබෝධ කර ගනිමින් එබඳු දුර්වලතා මඟහරවා ගැනීමට ශිෂයන්ට උදව් කරමින් කරනු ලබන ඉගැන්වීම යි.

මෙහි දී වාර විභාග ලකුණු විශ්ලේෂණය ඉතා වැදගත් බව පැහැදිලිය. වාර විභාග ලකුණු විශ්ලේෂණය ශිෂ්‍ය ප්‍රතිපෝෂණ වැඩසටහන් සඳහා යොදා නොගැනීම පිළිබඳ ගැටලුව විසඳීමේ දි මෙම පර්යේෂණයට අනුව සාහිත්‍ය විමර්ශනයේ යෙදීමෙන් පර්යේෂණයක් ලෙස අපගේ වෘත්තීමය තත්ත්වයන් ද තව දුරටත් සංවර්ධනය කර ගැනීමට මහත් පිටිවහලක් ලැබිණි. විවිධ තේමා ඔස්සේ ඒ පිළිබඳ විමර්ශනයේ යෙදෙන්නට ඒ අනුව අවස්ථා සම්පාදනය වීම වෘත්තිය ජීවිතයට වටිනාකමක් ලබා දුන් බව ද කිව යුතු ය.

## 3.2 මැදිහත් වීමේ ක්‍රියාවලිය

"ර/ඇඹි/කාවන්තිස්සපුර විද්‍යාලයේ 06-11 ශ්‍රේණි වාර විභාග ලකුණු විශ්ලේෂණ වාර්තා ශිෂ්‍ය ප්‍රතිපෝෂණ වැඩසටහන් සඳහා ඵලදායී ලෙසින් යොදා නොගැනීම" යන ගැටලුව විසඳීම සඳහා ක්‍රියාමූලික පර්යේෂණයක් මඟින් මැදිහත් වීමේ දි ආරම්භක පියවර ලෙසින් පහත පරිදි මූලික මැදිහත් වීමේ ක්‍රියාකාරි සැලැස්මක් සකසන ලදී.

වගුව : පළමු මැදිහත් වීමේ ක්‍රියාකාරි සැලැස්ම

| අපේක්ෂිත ඉලක්කය | ක්‍රියාකාරකම | යොදා ගත් සම්පත් | අපේක්ෂිත වෙනස්කම් | යෝජිත කාලය |
|---|---|---|---|---|
| පියවර 01<br>විදුහල්පති සහය ලබා ගැනීම. | විදුහල්පති දැනුවත් කිරීමේ සාකච්ඡාව | වාර විභාග ලකුණු විශ්ලේෂණ | වාර විභාග ලකුණු විශ්ලේෂණ ඵලදායී කර ගැනීම | 2018 නොවැ. 30 |
| පියවර 02<br>6-11 ශ්‍රේණි අංශභාර ගුරු සහය ලබා ගැනීම | අංශභාර ගුරු දැනුවත් කිරීමේ සාකච්ඡාව | වාර විභාග ලකුණු විශ්ලේෂණ | වාර විභාග ලකුණු විශ්ලේෂණ ඵලදායී කර ගැනීම | 2018 නොවැ. 30 |
| පියවර 03<br>වාර විභාග ලකුණු වාර්තා තැබීම පිළිබඳ සුවිශේෂී අධ්‍යයනය | කලාප කණ්ඩායම් නියාමන හා සුවිශේෂී සාකච්ඡාව | වාර විභාග ලකුණු පොත කෙටි සටහන් අභ්‍යාස පොත් | අදාළ කාර්යය කෙරෙහි ගුරු අවධානය යොමු කරවා ගැනීම. | 2019 ජනවා. 31 |
| පියවර 04<br>6-11 ශ්‍රේණි සිසුන්ගේ දෙමාපිය සහය ලබා ගැනීම. | නිවසේ ඉගෙනුම් පරිසරයක් බවට පත් කිරීම පිළිබඳ දෙමාපිය සාකච්ඡාව | පාසල විසින් තබා ඇති පොදු වාර්තා (ගණිතය) | දෙමාපිය අධ්‍යාපනික සහය සංවර්ධනය කර ගැනීම | 2019 ජූලි 31 |
| පියවර 05<br>ලකුණු විශ්ලේෂණය කිරීමේ ඵලදායී ක්‍රමවේද හඳුන්වා දීම. | 11 ශ්‍රේණිය සිසුන් හා ගණිත ගුරුවරුන් දැනුවත් කිරීම / විභාග ඉලක්ක පිළිබඳ අවධානය යොමු කිරීම. | ලකුණු වාර්තා අභ්‍යාස පොත් ගුරු සටහන් ගුරු උපදේශක සටහන් | ලකුණු වාර්තා ඵලදායී ලෙස භාවිතයට ගැනීම, ප්‍රතිපෝෂණ වැඩසටහන් සැලසුම් කිරීම | 2019 ඔක්තෝ.04 |

### 3.2.1 පළමු මැදිහත්වීම ක්‍රියාත්මක කළ ආකාරය

"ර/ඇඹි/කාවන්තිස්සපුර විද්‍යාලයේ 06-11 ශ්‍රේණිවල ගණිතය විෂයය වාර විභාග ලකුණු විශ්ලේෂණ ශිෂ්‍ය ප්‍රතිපෝෂණ වැඩසටහන් සඳහා යොදා නොගැනීම" යන ගැටලුව විසඳීම සඳහා අප ක්‍රියාමූලික පර්යේෂණ ක්‍රමවේදය යටතේ මැදිහත් වීමු.

**පියවර 01**

2018.11.30 වන දින මෙම පාසලේ විදුහල්පති සමඟ ගැටලුව පිළිබඳ සාකච්ඡා කළෙමු. එහි දී වාර විභාග ලකුණු පවත්වා ගැනීම හා විශ්ලේෂණය කිරීම සම්බන්ධව පාසලේ ප්‍රතිපත්තිය පිළිබඳව ද විමසා බලන ලදී. ඒ අනුව 06-11 ශ්‍රේණිවල ගණිතය විෂය සාධන මට්ටම් අවම වීමට බලපෑ හැකි යැයි අනුමාන කිරීම් පිළිබඳව ද අවධානය යොමු කෙරිණි. වර්තමානයේ දී ඒ හා සම්බන්ධව පාසල විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව ද සොයා බැලූ අතර ගැටලුව විසඳීම සඳහා ක්‍රියාමූලික පර්යේෂණයක් මගින් මැදිහත් වීමේ ඵලදායීතාව පිළිබඳව ද සාකච්ඡා කෙරිණි. වාර විභාග ලකුණු විශ්ලේෂණය ඵලදායී ලෙසින් සිදු කිරීම සඳහා ගත හැකි ක්‍රියාකාරකම් හඳුනාගැනීම ද සිදු කෙරිණි. වාර විභාග ලකුණු විශ්ලේෂණය තවදුරටත් සුවිශේෂීව සිදු කිරීම මත ශිෂ්‍ය අවශ්‍යතා හඳුනාගැනීම පහසු කාර්යයක් වන බවට ද අවධානය යොමු කෙරිණි. එමෙන්ම සම්පත් පුද්ගලයන් මගින් ප්‍රතිපෝෂණ වැඩසටහන් පැවැත් වීම කෙරෙහි ද අවධානය යොමු කරන ලදී.

**පියවර 02**

එදිනම 06-11 ශ්‍රේණි අංශභාර ගුරුභවතා සමග අදාළ ගැටලුව පිළිබඳ සාකච්ඡා කෙරිණි. වාර විභාග ලකුණු විශ්ලේෂණය හා එම විශ්ලේෂණය ශිෂ්‍ය ප්‍රතිපෝෂණය සඳහා සාධනීය මට්ටමින් භාවිතා කළ හැකි ආකාරය පිළිබඳව හා එහි දී අංශභාර ගුරු කාර්යයභාරය කෙසේ විය යුතු ද යන්න ද පහත කරුණු ඇසුරින් අවධානයට යොමු කරන ලදී.

- 06 ශ්‍රේණියේ සිට ගණිතය විෂය වාර විභාග ලකුණු නිරීක්ෂණයට ලක් කිරීම.
- 11 ශ්‍රේණිය තෙක් වාර විභාගවල දී ලකුණු ව්‍යාප්තිය පිළිබඳ සොයා බැලීම.
- දිගු කාලීනව සිසුන් දුෂ්කරතා දක්වන ක්ෂේත්‍ර සොයා බැලීම.
- ගැටලුකාරී තත්ත්වයන් පිළිබඳ විවිධ අංශ ඔස්සේ අවධානය යොමු කිරීම හා විකල්ප විසඳුම් උත්පාදනය කිරීම.
- අවශ්‍ය සම්පත් පුද්ගල සහය ලබා ගැනීම.
- දෙමාපිය සහය ලබා ගැනීමට විවිධ වැඩ සැලසුම් සැකසීම.

**පියවර 03**

2019.01.31 වන දින කලාප කණ්ඩායම් නියාමන ක්‍රියාවලියේ දී ර/ඇඹි/කාවන්තිස්සපුර විද්‍යාලය ඒ සඳහා තෝරා ගන්නා ලදී. එහි දී සුවිශේෂී ලෙසින් 06-11 ශ්‍රේණිවල ගණිතය විෂය සාධන මට්ටම, ලකුණු වාර්තා තැබීම, ලකුණු විශ්ලේෂණය සිදුකළ ආකාරය, ඊට සමගාමීව සිදු කළ ප්‍රතිකාර්යය වැඩසටහන් ආදිය විමර්ශනයට භාජනය කරන ලදී. ඒ අනුව වාර විභාග ලකුණු විශ්ලේෂණ වාර්තා ශිෂ්‍ය ප්‍රතිපෝෂණය සඳහා ඵලදායී ලෙස භාවිතයට ගෙන නොමැති බව අනාවරණය විය. ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා සුවිශේෂී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කෙරෙහි දි එහි දී ප්‍රබල ලෙසින් අවධානයට ලක් කෙරුණි. එදිනම ගණිතය විෂයභාර ගුරුභවතුන්ගේ අවධානය ද අදාළ ගැටලුව කෙරේ යොමු කරවන ලදී.

**පියවර 04**

කේවල නියාමන, කණ්ඩායම් නියාමන ඇසුරින් ලබා ගත් දත්ත මත පදනම්ව දෙමාපිය දැනුවත් කිරීම මගින් ශිෂ්‍ය ප්‍රතිපෝෂණ වැඩසටහන් අර්ථවත් කර ගත හැකි බව විදුහල්පති, අංශභාර ගුරු සාකච්ඡාවලින් ද මතුවිය. 2019.07.31 කේවල නියාමනයේ දී මේ පිළිබඳව අවධානය යොමු කෙරිණි. පාසල විසින් දෙමාපිය දැනුවත් කිරීම් පවත්වා ඇති අතර, ඒවා අර්ථවත් කර ගත යුතු ආකාරය ද පැහැදිලි කරන ලදී. එමෙන්ම එදින පාසල්වල පැමිණ සිටි දෙමාපියන් කිහිප දෙනෙකු අහඹු ලෙසින් සාකච්ඡාවට යොමු කරවා ගැනුණි. එහිදී ද අනාවරණය වූයේ දෙමාපිය අධ්‍යාපනික මැදිහත් වීම තවදුරටත් සංවර්ධනය විය යුතු බවයි.

**පියවර 05**

2019.10.04 දින ර/ඇඹි/කාවන්තිස්සපුර විද්‍යාලයීය ලකුණු වාර්තා පොත් නිරීක්ෂණය සුවිශේෂීව සිදු කරන ලද අතර විදුහල්පති , නියෝජ්‍ය විදුහල්පති හා ගණිතය සාධන මට්ටම සංවර්ධනය සඳහා වාර විභාග ලකුණු යොදාගත හැකි ආකාරය පිළිබඳව සාකච්ඡා කොට වැඩසටහන් සැලසුම් කළෙමු.

එදින 11 ශ්‍රේණිය සිසුන් දැනුවත් කිරීම ද සිදු කෙරිණි. ගණිතය විෂයේ දී තමා සංවර්ධනය විය යුතු අංශය පිළිබඳ සුවිශේෂී ව සිසුන් හා සාකච්ඡා කෙරිණි. ඊට සමගාමීව ඇඹිලිපිටිය කලාප ගණිත ගුරු උපදේශක විසින් ගණිතය පහසුවෙන් ඉගෙන ගත හැකි ආකාරයන් පිළිබඳව ද සිසුන් දැනුවත් කරන ලදී. සිසුන් ප්‍රායෝගිකව සම්බන්ධ කර ගනිමින් ගණිත අභ්‍යාස කර වීම තුළ ඔවුන් දුර්වලතා දක්වන ක්ෂේත්‍ර හඳුනාගැනීමට ද අවස්ථාව උදාවිය.

**පළමු මැදිහත් වීමේ ක්‍රියාවලිය පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණය**

"ර/ඇඹි/ කාවන්තිස්සපුර විද්‍යාලයේ 06-11 ශ්‍රේණිවල ගණිතය විෂයය වාර විභාග ලකුණු විශ්ලේෂණ, ශිෂ්‍ය ප්‍රතිපෝෂණ වැඩසටහන් සඳහා යොදා ගැනීම" යන ගැටලුව විසඳීම සඳහා වූ පළමු මැදිහත් වීමේ ක්‍රියාවලිය 2018.11.30 දින සිට 2019.10.04 දින තෙක් ක්‍රියාත්මක කෙරිණි. පියවර 05ක් ඔස්සේ මැදිහත් වීම් සිදුකෙරුණු අතර, පැවති තත්ත්වයට වඩා සාධනීය පියවරක් ඉදිරියට තබා ඇති බව නිරීක්ෂණයට ලක් විය. එහෙත් අපේක්ෂිත ඉලක්කය කරා ලගා වී නොමැති බව ද විද්‍යමාන විය.

විදුහල්පති හා පවත්වන ලද පළමු සාකච්ඡාවෙන් පසු සම්පත් පුද්ගල සහය ලබා ගැනීම සඳහා යොමු වී ඇති බව පහත කරුණු ඇසුරින් සනාථ කළ හැකිය.

1. සම්පත් පුද්ගල සහය මත 2019.08.05,06 හා 27 යන දිනයන්හි දී සිසුන් සඳහා ප්‍රතිපෝෂණ වැඩසටහන් පැවැත් වීම.
2. මොරටුව විශ්ව විද්‍යාල සංසදය මගින් 2019.09.07,08,09 තෙදින ගණිතය විෂයය සඳහා ප්‍රතිපෝෂණ වැඩසටහන් පාසල තුළ පැවැත්වීම.
3. සවස්වරු අතිරේක පංති පැවැත්වීම.

පියවර 05ක් යටතේ ක්‍රියාත්මක කළ ක්‍රියාමූලික පර්යේෂණයේ ක්‍රියාකාරකම් තුලින් වාර විභාග ලකුණු විශ්ලේෂණ තවදුරටත් ඵලදායීව සිදුකර ගත යුතු බව හා එමඟින් ශිෂය ප්‍රතිපෝෂණ වැඩසටහන් පිළිබඳ සුවිශේෂී අවධානය යොමු කල යුතු බවට ද පාසල් විසින් ප්‍රත්‍යක්ෂ කර ගන්නා ලදී. වාර විභාග ලකුණු විශ්ලේෂණ, ලිපි ගොනුවකට පමණක් සීමා නොකට ශිෂ්‍ය ප්‍රතිපෝෂණය සඳහා යොදා ගත හැක්කේ කෙසේ ද යන්න පිළිබඳව විවිධ අංශ ඔස්සේ සොයා බැලීමට පාසල පෙළඹීම අගය කළ යුතු ය. එහෙත් අපේක්ෂිත ඉලක්කය කරා යාමට නොහැකි වීම හේතුවෙන් තවදුරටත් දෙවන මැදිහත් වීමක් කරා යා යුතු බවට තීරණය කළෙමු.

### 3.2.2 දෙවන මැදිහත් වීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කළ ආකාරය

**පියවර 01**

නැවත පළමු මැදිහත් වීමේ ක්‍රියාකාරකම් ප්‍රතිසැලසුම් කරමින් 2019.10.14.දින සිට ආරම්භ කරන ලදි. පළමුවන වාරය සහ දෙවන වාරය ලකුණු විශ්ලේෂණ වාර්තා ප්‍රයෝජනයට ගනිමින් විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති, හා සම්මුඛ සාකච්ඡා පැවැත් වූ අතර, එමගින් අවශ්‍යතා සහිත සිසුන්ට අතිරේක පන්ති පැවැත්වීම කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කරන ලදි. මෙහිදි දුර්වලතා දක්වන අංශ කෙරෙහි වැඩි නැඹුරුවක් සහිතව ක්‍රියාත්මක වැඩ සැලසුමක් සකස් කරන ලදී.

**පියවර 02**

සැලසුම් සහගත ක්‍රියාකාරකම්වලට අනුව දුර්වලතා දක්වන සිසුන්ගේ අදාල සැකසිය යුතු අංශ සඳහා වෙන් වශයෙන් ප්‍රතිපෝෂණ වැඩසටහන් දක්ෂතා දක්වන සිසුන් සඳහා ඔවුන්ගේ දක්ෂතා වැඩි දියුණු කර ගැනීම සඳහා මගපෙන්වීම් ද, පාසල හා බාහිර ආයතන සහය මත සිදු කරන ලදී.

**පියවර 03**

මාසිකව පාසල විසින් දෙමව්පිය සාකච්ඡා පැවැත්වීම හා අධ්‍යාපනික වශයෙන් සිසුන්ට සමීප කරවීමේ උපදේශන වැඩසටහන්ද ක්‍රියාවට නැංවිණි. බාහිර සම්පත් දායකයන්ගේ මගපෙන්වීම් යටතේ මෙම වැඩසටහන් ක්‍රියාත්මක විය.

**පියවර 04**

ගණිත විෂය සඳහා මාසික පරීක්ෂණ පැවැත්වීම හා ඒ ඇසුරින් වාර පරීක්ෂණ පැවැත්වීම ද සිදු කළ අතර ඒ සෑම අවස්ථාවකදීම සුවිශේෂී ලෙසින් සිසුන්ගේ ගණිතමය හැකියාවන් කෙරෙහි අවධානය යොමු කරමින් ක්‍රියාකාරකම් සැලසුම් කරන ලදී.

**දෙවන මැදිහත් වීම හා සම්බන්ධ ප්‍රත්‍යවේක්ෂණය**

2019.11.25 තෙක් දෙවන මැදිහත්වීම ආශ්‍රිත ක්‍රියාකාරකම් සිදුකෙරුනු අතර ,පළමු මැදිහත්වීමට වඩා සාධනීය තත්වයක් පෙන්වන ලදී. සිසුන් ගණිතය විෂය පිළිබඳ පෙරට වඩා උනන්දුවකින් කටයුතු කරනු දක්නට ලැබුණි. සමපදස්ථ ඉගෙනුම කෙරෙහි යොමු වීමට ද විශේෂයෙන් කැපී පෙනුනි. සියලු සිසුන්ගේ හැකියා එක සමාන නැත. ක්‍රියාකාරකම් මගින් ගුරු චර්යාවන්ගේ ද වෙනස්කම් දක්නට ලැබුණි. සිසුන්ට ආදරණීය ලෙස ආමන්ත්‍රණය කිරීම මත ද සිසු අවධානය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට යොමු වීමට බලපෑ බව ප්‍රත්‍යවේක්ෂණය තුළින් අනාවරණය විය.

ගැටලුව විසඳීම සඳහා සාහිත්‍ය විමර්ශනය මගින් ලබා ගත් නව දැනුම තුළ අප වෘත්තීය සංවර්ධනය සිදු වූ සේම ක්‍රියා මූලික පර්යේෂණය ඵලදායී ලෙසින් සිදු කිරීම සඳහා බලපාන ලද බව ද අපගේ තක්සේරුව යි.

ගැටලුවකට විසදුමක් සෙවීමේ දි සැලසුම් සහගත ලෙසින් ඊට මැදිහත් වීම මත ගැටලුව නිරාකරණය කර ගැනීම වඩා පහසුවන බව ක්‍රියා මූලික පර්යේෂණයේ යෙදීමෙන් අවබෝධ කර ගතිමු. එමෙන් ම ගැටලුවට බලපෑ හේතු දත්ත ත්‍රිකෝණියකරණය කිරීමෙන් සුවිශේෂී ලෙසින් අනාවරණය කර ගත හැකි බව ද පැහැදිලි විය.

ර/ඇඹි/කාවන්තිස්සපුර විද්‍යාලයේ වාර විභාග ලකුණු විශ්ලේෂණ ශිෂ්‍ය ප්‍රතිපෝෂණ සඳහා ඵලදායී ලෙසින් යොදා ගැනීමට මෙමගින් ඉඩ ප්‍රස්ථාව ලැබුණු බව පසු කාලීනව වාර විභාග ලකුණු විශ්ලේෂණ ය මගින් පැහැදිලි වේ. සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා යොමු වීම හා සමපදස්ථ ඉගෙනුම් කෙරෙහි යොමු වීම ද ක්‍රියාමුලික පර්යේෂණ ක්‍රියාකාරකම් මගින් තවදුරටත් ඵලදායී වූ බව පැහැදිලි වේ.

## 4. නිගමන

- වාර විභාග ලකුණු විශ්ලේෂණ සිදු කිරීම සම්ප්‍රදායානුකූලව ඉටු කිරීමට යොමු වී ඇත.
- ලකුණු විශ්ලේෂණය කළ ද එය ප්‍රතිපෝෂණය සඳහා ඵලදායී ලෙසින් භාවිත කර නොමැත.
- දෙමාපිය හා පාසල අතර අධ්‍යාපනික සම්බන්ධතාව අවම ය.
- අධ්‍යාපනය කෙරෙහි දෙමාපිය ආකල්ප ධනාත්මක නොවේ.

## 5. යෝජනා

- අභ්‍යන්තර හා බාහිර අධීක්ෂණය සැලසුම් සහගත ලෙසින් සාධන මට්ටම නැංවීම කෙරෙහි සෘජු දායකත්වයක් ලැබෙන සේ ක්‍රියාත්මක කළ යුතු ය.
- මාසික ප්‍රගති සමාලෝචන වැඩසටහනක් පාසල මගින් සැලසුම් කොට පවත්වා ගත යුතු ය.
- වාර විභාග ලකුණු විශ්ලේෂණ, ශිෂ්‍ය සාධන මට්ටම් ප්‍රතිපෝෂණය කෙරෙන සේ යොදවා ගැනීම පිළිබඳ ගුරු තත්ව කව නිර්මාණය කර ගත යුතු ය.
- මසකට හෝ වාරයකට වරක් පාසලෙහි අභිමතය පරිදි දෙමාපියන් අධ්‍යාපනික සංවර්ධනය සඳහා සාකච්ඡාවකට යොමුකර ගත යුතු ය.
- පාසල් අධීක්ෂණ හා අභ්‍යන්තර අධීක්ෂණය තවදුරටත් ඵලදායී ලෙසින් පවත්වා ගත යුතු ය.

### ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

ගුණවර්ධන, ඒ. ජේ. (1992). ගණිතය ඉගැන්වීමේ ක්‍රියාවලිය, කොළඹ, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

ජාතික අධ්‍යාපන ආයතනය (1996). ඉගැන්වීමේ ක්‍රම හා ශිල්ප ගණිතය ගුරු පුහුණු පාඨමාලාව, මහරගම, අධ්‍යාපන පර්යේෂණ ආයතනය, කොළඹ.

දේවසුරේන්ද්‍ර, ඩබ්. එන්. (1992). ගණිතය ඉගැන්වීමේ ක්‍රම හා ක්‍රම ශිල්ප, කොළඹ, පඩ්ඩ්වින් ප්‍රින්ටරස්

වික්‍රමසිංහ, ටී. ඩී. (1997). ගණිතයෙන් විනෝදය, මරදාන, රත්න පොත් ප්‍රකාශකයෝ

පලිහක්කාර, එච්. (1998). අධ්‍යාපන පර්යේෂණයට අත්වැලක්, මරදාන, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ

# දෙහිඕවිට කලාපයේ පාසල්වල සිසුන්ගේ ශිෂ්‍ය සාධනය කෙරෙහි පාසලේ නායකත්වය හා කළමනාකරණය දක්වන බලපෑම අධ්‍යයනය කිරීම

ඩී.ඩී.ආර්. රූපසිංහ (BSc., PGDE)

නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන කාර්යාලය, දෙහිඕවිට
0716210225 / drupasinghe238@gmail.com

## සංක්ෂිප්තය

දෙහිඕවිට කලාපයේ සිසුන්ගේ ශිෂ්‍ය සාධනය සහ පාසලේ නායකත්වය හා කළමනාකරණය අතර සම්බන්ධතාවය විශ්ලේෂණය කිරීම මෙම අධ්‍යයනය මගින් සිදු කෙරේ. ඒ අනුව මෙම පර්යේෂණයේ අරමුණ වූයේ පාසලක සිසුන්ගේ ශිෂ්‍ය සාධනය කෙරෙහි පාසලේ නායකත්වය හා කළමනාකරණය බලපෑමක් සිදු කරයි ද යන්න අධ්‍යයනය කිරීමත්, බලපෑමක් පවතී නම් එම බලපෑමේ ස්වභාවය හඳුනා ගැනීමත්, ඒ අනුව පාසලේ කළමනාකරණයේ සිදු විය යුතු වෙනස්කම් පිළිබඳව යෝජනා ඉදිරිපත් කිරිමත්ය. මෙම පර්යේෂණය සඳහා ප්‍රමාණාත්මක පර්යේෂණ ප්‍රවේශය යටතේ විස්තරාත්මක සමීක්ෂණ ක්‍රමවේදය යොදා ගන්නා ලදී. පර්යේෂණ උපකරණ ලෙස ප්‍රශ්නාවලි හා අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 31/2014 අනුව ඇගයීම් ක්ෂේත්‍ර යොදා ගන්නා ලදී. පර්යේෂණ නියදිය ලෙස දෙහිඕවිට කලාපයේ පාසල් 10ක් සරල අහඹු නියදි ක්‍රමය යටතේ තෝරා ගැනිණි. පාසලේ නායකත්වය හා කළමනාකරණ සහ ශිෂ්‍ය සාධනය යන විචල්‍යයන් ඔස්සේ ලබා ගත් දත්ත වගු හා ප්‍රතිශත මගින් විශ්ලේෂණය කිරිමෙන් නිගමන හා යෝජනා ඉදිරිපත් කෙරිණි. පාසලක ශිෂ්‍ය සාධනය කෙරෙහි පාසල් නායකත්වය හා කළමනාකරණය බලපෑමක් දක්වන බවත් එය ඍජු හෝ වක්‍ර බලපෑමක් වන බවත් මෙහිදී අනාවරණය විය. ඒ අනුව විධිමත් අධ්‍යයනයක් සහිත ශිෂ්‍යයෙකු බිහිකිරීම සඳහා පාසල් කළමනාකරණය සම්බන්ධයෙන් අවශ්‍ය මගපෙන්වීම, පාසල් නායකත්වයට අඛණ්ඩව ලබා දීමට යෝජනා ඉදිරිපත් කර ඇත.

**මුඛ්‍ය පද : ශිෂ්‍ය සාධනය. නායකත්වය හා කළමනාකරණය**

# 1. හැඳින්වීම

අධ්‍යාපනය ලබා ගැනීම ශිෂ්‍යයාට පමණක් නොව සමාජයට, රටට ඉතා වැදගත් කරුණකි. ඉහළ සාක්ෂරතාවක් සහිත රටක, පුරවැසියන්ගේ රැකියා පිළිබඳ තහවුරුව ඉහළ මට්ටමක පවතින අතර, ආර්ථික මට්ටම ද ඉහළ අගයක පවතී. එම නිසා අධ්‍යාපනය සඳහා දරන පිරිවැය පාසල තුළ කළමනාකරණය කිරීම අභියෝගයට ලක් වන කරුණකි. බොහෝ රටවල්, විශේෂයෙන් ම ශ්‍රී ලංකාව වැනි දියුණු වන රටවල් අධ්‍යාපනය සඳහා විශාල මුදල් ප්‍රමාණයක් යොදවන බැවින් පාසල්වල ඉතා ඉහළ මට්ටමේ කළමනාකාරිත්වයක් ඇති කිරීම අත්‍යවශ්‍ය කරුණකි.

එක් එක් පුද්ගලයාගේ ජීවිතය තීරණය කිරීම සඳහා නිසි අධ්‍යාපනයක් ලැබීම ඉතා වැදගත් ය. වගකීම් සහගත, නීතිගරුක, සංස්කෘතියට ගරු කරන පුද්ගලයෙකු බිහිකිරීම අධ්‍යාපනයේ කාර්යභාරයකි. එම නිසා විධිමත් අධ්‍යාපනයක් සහිත ශිෂ්‍යයෙකු බිහිකිරීම සඳහා පාසල් කළමනාකාරිත්වයේ ඵලදායිතාව හා කළමනාකරණය නිසි ලෙස පැවතීම ඉතා වැදගත් වේ.

"නායකත්වය සහ කළමනාකරණය" අධ්‍යාපනයේ වැදගත් කාර්යභාරයක් ඉටු කරන ඉතා අත්‍යවශ්‍ය අංග වේ. මෙවැනි අවස්ථාවක දී හොඳ කළමනාකරුවෙක් සහ නායකයෙක්, රටක සිටින සියලුම පුරවැසියන්ට තමන්ගේ යහපත සඳහා ඉගෙන ගැනීමට දිරි ගැන්වීම සහතික කරයි. (Great Britain Department for Education and skills , 2005, P 12)

ශ්‍රී ලංකාවේ වර්තමාන පාසල් පද්ධතියට බ්‍රිතාන්‍ය යටත් විජිත සමය දක්වා දිවෙන දීර්ඝ ඉතිහාසයක් ඇතත් එම පද්ධතියේ කළමනාකරණය හා අධ්‍යාපන ව්‍යවහාර පිළිබඳ ගැටලු පවතී. (Reberu, 1962) ඒවා නම් බලතල පැවරීම් දුර්වලතා, අධික ශිෂ්‍ය සංඛ්‍යාව සහිත පංති කාමර, සම්පත් හිඟය, ගුරුවරුන්ගේ නොපැමිණීම හා ප්‍රමාදවීම, ශිෂ්‍යයන්ගේ නොපැමිණීම, ශිෂ්‍යයන්ගේ දුර්වල සාධනය, නියාමනය හා අධීක්ෂණ දුර්වලතා, විදුහල්පති, ගුරුවරුන්, ශිෂ්‍යයන් හා දෙමාපියන් අතර යහපත් සම්බන්ධතා ගොඩනැගීම පිළිබඳ ගැටලු, සෙමින් ඉගෙන ගන්නා හා දුර්වල ශිෂ්‍යයන් සඳහා ප්‍රතිකාර්ය ඉගැන්වීම් ක්‍රම නොමැතිවීම, පාසල් වල කාල සටහන් නිසි පරිදි ක්‍රියාත්මක නොවීම, පාසල පදනම් කරගත් ඇගයීම් දුර්වලතා, නූතන ඉගැන්වීමේ ක්‍රම භාවිතයේ ප්‍රමාණවත් නොවන බව ආදිය යි (NEREC, 2004).

අධ්‍යාපනය සඳහා ආයෝජනය කරන භෞතික හා මානව සම්පත් ප්‍රමාණය නිසි ප්‍රමිතියකින් යුක්තව කළමනාකරණය කිරීමෙන්, ඉහළ ඵලදායිතාවයකින් හා කාර්යක්ෂමතාවකින් යුත් පාසල් පද්ධතියක් නිර්මාණය කළ හැකිය.

මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමෙහිලා අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව ඉලක්ක කර ගත් ඵලදායී හා කාර්යක්ෂම කළමනාකරණ ක්‍රියාවලියක් මෙන් ම ශක්තිමත් හා අඛණ්ඩ ඇගයීම් ක්‍රමයක් පාසල් පද්ධතිය තුළ ස්ථාපිත කිරීම අත්‍යවශ්‍ය වේ. එහිදී පාසල්වල පවත්නා විවිධතාවලට ගැළපෙන පරිදි පොදු නිර්ණායක හා දර්ශක පදනම් කර ගත් ස්වයං ඇගයීමේ ක්‍රමවේදයක් මෙන්ම එම ස්වයං ඇගයීම වඩාත් ඵලදායී කර ගැනීම සඳහා මගපෙන්වන විධිමත් බාහිර ඇගයීම් ක්‍රියාවලියක් ද ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ ක්‍රියාත්මක වේ.

1980 දශකයෙන් පසු විවිධ රටවල පාසල් පද්ධතීන් හි දැකිය හැකි කළමනාකරණ ක්‍රියාවලියේ වෙනස් වීමේ විශේෂ ලක්ෂණයක් ලෙස ඉහළ සිට පහළට සිදු කෙරෙන පාසල් කළමනාකරණය වෙනුවට පහළ සිට ඉහළට සිදු කෙරෙන කළමනාකරණ පිළිවෙත කෙරෙහි අවධානය යොමු වීම පෙන්වා දිය හැකිය. මෙහි ප්‍රතිඵලයක් ලෙස පාසල් මට්ටමින් තීරණ ගැනීමේ හැකියාවත්, එම තීරණ ක්‍රියාත්මක කිරීමේ ස්වාධීනත්වයත් පාසල් කළමනාකරණයට ලැබිණි.

ශ්‍රී ලංකාවේ පාසල් සඳහා ද, පාසල් නගා සිටුවීමේ වැඩසටහන දියත් කළ පසු පාසල පිළිබඳ තීරණ ගැනීමේ හැකියාවත්, එම තීරණ ක්‍රියාත්මක කිරීමේ ස්වාධීනත්වයත් පාසල් කළමනාකාරිත්වයට ලැබිණි. එමගින් සිසුන්ගේ ඉගෙනුම් තත්ත්වයන් වැඩි දියුණු කිරීම සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාවිත කරනු ලබන අධ්‍යාපන හා තාක්ෂණයේ සියලු ක්‍රියාවලීන් කළමනාකරණය කිරීමේ කාර්යය පාසල් නායකත්වයට පැවරී ඇත (අධ්‍යාපන අමාත්‍යාංශය, 2009).

මෙහිදී වර්තමාන අවශ්‍යතාවලට ගැළපෙන පරිදි පාසල් අධ්‍යාපන ක්‍රියාවලියේ ගුණාත්මක සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමේ නව ඇගයීම් සංස්කෘතියක් ස්ථාපිත කිරීමේ කාලීන අවශ්‍යතාවක් ලෙස තත්ත්ව සහතිකකරණය (Quality Assurance) සංකල්පය ඔස්සේ පාසල්වල ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා 2015 වර්ෂයෙහි සිට ශ්‍රී ලංකාවේ පාසල්වලට හඳුන්වා දුන් නිර්ණායක මූලික ඇගයීම් ක්‍රමය මගින් පාසල විශිෂ්ටත්වය කරා ප්‍රවේශ කරවීමට කටයුතු කරයි. අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 31/2014 අපේ පාසල කොතරම් ගුණාත්මකද යන මාර්ගෝපදේශයට අනුව පාසල තුළ ඇගයීම් කටයුතු සිදු කිරීම තුළින්, පාසලේ පවතින ප්‍රබලතා මෙන්ම දුබලතා කෙරෙහි ද සංවේදී වෙමින් පාසල දැනට පවතින තත්ත්වයෙන් ඉහළට ඔසවා තැබීම පාසල් කළමනාකාරිත්වයේ වගකීමක් බව සනාථ කර දක්වයි.

## 2. ගැටලුව හැඳින්වීම -

ලෝකයේ බොහෝ රටවල සිසුන් ප්‍රමාණවත් සහ උසස් තත්ත්වයේ අධ්‍යාපනයක් අත්කර ගැනීමට නොහැකිව පාසල් අධ්‍යාපනයෙන් අසමත් වී ඇත. ශ්‍රී ලංකාවේ ද ජාතික මට්ටමේ විභාග සඳහා පෙනී සිටින සිසුන්ගෙන් යම් ප්‍රමාණයක් සෑම වර්ෂයකම අසමත් වේ. වසර 5 ක් සැසදීමේ දී ශ්‍රී ලංකාවේ අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත් වීමේ අනුපාතය 60% ක් පමණ වේ. එනම් 40%ක් දරුවන් උසස් පෙළ හැදෑරීම සඳහා සුදුසුකම් නොලබයි.

අධ්‍යාපනය විධිමත් ලෙස කළමනාකරණය කරගත් ලෝකයේ බොහෝ රටවල්, ලෝක වෙළඳපොළේ ඉල්ලුමට ගැළපෙන විශිෂ්ටයන් හා වෘත්තිකයින් බිහිකිරීමට සමත්ව ඇත. එසේ නොමැති බොහෝ රටවල් තම විවිධ වූ කාර්යයන් සඳහා විද්වතුන් ආනයනය කිරීමට විශාල මුදලක් වැය කරයි. මෙම සංකල්පයට අනුව සිසුන් සඳහා නියමිත දැනුම හා කුසලතා ලබා දීමට යොදා ගන්නා සම්පත් නිසියාකාරව හා ප්‍රමාණාත්වකව භාවිත කිරීම අත්‍යවශ්‍ය බව තහවුරු වේ.

මේ වන විට ලෝකයේ බොහෝ රටවල අධ්‍යාපනය නිසි ලෙස කළමනාකරණය කර ගැනීම සඳහා ශිෂ්‍යයාට ඉගෙනීම වඩාත් සුදුසු පාසලක් ගොඩනැගීම කෙරෙහි තම අරමුණු නාභිගත කර ඇත.

පසුගිය ආසන්න වසර පහ සැලකීමේදී දෙහිඕවිට අධ්‍යාපන කලාපයේ අ.පො.ස. (සා/පෙළ) සමත්වීමේ ප්‍රතිශතය 63% ක් වේ. මේ සඳහා හේතු විය හැකි සම්පත් හිඟය, ගුරුවරුන්ගේ හිඟය, ශිෂ්‍යයන්ගේ දුර්වල සාධනය, නියාමනය හා අධීක්ෂණ දුර්වලතා, සෙමින් ඉගෙන ගන්නා හා දුර්වල ශිෂ්‍යයන් සඳහා ප්‍රතිකාර්ය ඉගැන්වීම් ක්‍රම අඩුවීම, පාසල්වල කාල සටහන් නිසි පරිදි ක්‍රියාත්මක නොවීම, නූතන ඉගැන්වීමේ ක්‍රම භාවිතයේ අප්‍රමාණවත් බව වැනි අවශ්‍යතා නිසි පරිදි කළමනාකරණය කර ගැනීමේ අවශ්‍යතාවය පවතී. එම නිසා විදුහල්පති නායකත්වය හා කළමනාකාරිත්වය, ශිෂ්‍යයාගේ සාධන මට්ටම කෙරෙහි දක්වන බලපෑම අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාව මෙහිදී පැන නැගී ඇත.

## 3. සාහිත්‍ය විමර්ශනය

විදුහල්පතිවරයා පාසල පිළිබඳ වග විය යුතු පුද්ගලයා ය. පාසලේ අධ්‍යාපනය සම්බන්ධයෙන් ඔහු වග විය යුතුය. පාසලට ප්‍රවේශ වූ අවස්ථාවේ සිට පාසලෙන් පිටව යන තෙක් ශිෂ්‍යයන් පිළිබඳ වග විය යුත්තේ ඔහු ය. ගුරුවරුන් පාසලට ගෙන්වා ගැනීම හා ගුරුවරුන් ලබා ගැනීම පිළිබඳව ද ඔහු වග විය යුතු ය. මෙම කාර්යයන් හී දී විදුහල්පතිවරයා ත්‍රිවිධාකාර කාර්යභාරයක නිරත වී සිටියි. මෙම කාර්යයන් වන්නේ,

- පරිපාලන කටයුතු
- කළමනාකරණ කටයුතු සහ
- පාසලට ලබා දෙන නායකත්වය යි.

පරිපාලනය යනු කිසිවෙකු විසින් දෙන ලද නියෝග දක්ෂ ලෙස ක්‍රියාත්මක කිරීමයි. විදුහල්පතිවරයා පාසලට ලැබෙන චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුය. ඔහු රටේ නීතිමය පදනම සැලකිල්ලට ගනිමින් කටයුතු කළ යුතුය. පාසලට ලැබෙන මුදල් ඔහු විසින් පරිහරණය කළ යුත්තේ චක්‍රලේඛ අනුව ය. පරිපාලන කටයුතුවලදී ඔහු අමාත්‍යාංශ අවශ්‍යතාවයන්ට ධනාත්මක ප්‍රතිචාර දක්වන්නෙක් වේ. ඔහු පරිපාලන කටයුතු කළ යුත්තේ පාසල ඵලදායී කිරීම අභිමුව යි. ඔහු පරිපාලකයෙකු වශයෙන් ගුරු මණ්ඩලයට අඛණ්ඩව උපදෙස් ලබා දෙයි.

විදුහල්පතිවරයා කළමනාකරුවෙකු ද වන්නේය. ඔහු පාසලේ අධ්‍යාපන අරමුණු සාක්ෂාත්කරණය අරබයා සම්පත් යොදවයි. ඒ සඳහා විදුහල්පතිවරයා පාසලේ කටයුතු පුරෝකථනය, සැළසුම්කරණය, සංවිධානය, මෙහෙයවීම සහ පාලනය කරයි. මෙම කාර්යයන් මගින් පාසලේ සංවිධාන කාර්යයන් සමායෝජනය කළ හැකිය. ඔහු අරමුණු ස්ථාපනය කිරීමෙන් පාසලේ සියලු දෙනාගේ කාර්යයන් සමායෝජනය කරයි.

විදුහල්පතිවරයා පාසලේ නායකයා ද වන්නේය. ඔහු පාසලේ අරමුණු සාර්ථක කර ගැනීමට කටයුතු කළ යුතුය. මෙම කාර්යයෙහි දී ඔහු ක්‍රියා කළ යුත්තේ කවර අයුරින් පාසල් අරමුණු සාක්ෂාත්කරණය කළ යුතුද යන්න අනුවය. ඔහු ගුරුවරු මෙහෙයවිය යුත්තේය. අරමුණු සාක්ෂාත්කරණය අරබයා ගුරු මණ්ඩලය මෙහෙයවීමේ දී ඔවුන්ගේ සුබසිද්ධිය සහ චිත්ත ධෛර්ය වර්ධනය සඳහා කටයුතු කළ යුතු වෙයි. ඔහු ගුරු මණ්ඩලය තුළ අන්තර්ක්‍රියා වර්ධනය සහ අන්තර් යැපීම දියුණු කළ යුතුය. ඔවුනට පාසලේ කාර්යයන් පිළිබඳ දැනුවත් කළ යුතුය. සමස්ත ගුරු මණ්ඩලය පිළිබඳ ව ඔහු සැලකිලිමත්

විය යුතුය. ඔහු එක් එක් ගුරුවරයාට මාර්ගෝපදේශය සැපයීම හා අභිප්‍රේරණය කළ යුතුය. සංවර්ධනය කළ යුතුය. කාර්යය කණ්ඩායම් සහ පුද්ගලයින් යන කරුණු කෙරෙහි අවධානය කොට පාසලක ඵලදායී බව වර්ධනය කළ යුතුය. කාර්යයන් ගුරු මණ්ඩලය සහ එක් එක් පුද්ගලයා පිළිබඳව කටයුතු කිරීමේදී යම් තුල්‍ය බවකින් කටයුතු කළ යුතු වන්නේ ය (සේනාරත්න, 2005).

මිසූරි මධ්‍යම පාසල්වල විදුහල්පති නායකත්වය, පාසල් සංස්කෘතිය හා ශිෂ්‍ය සාධනය පිළිබඳව Mees, විසින් (2008) දී මධ්‍ය පාසල් 79 ක් යොදාගෙන, ප්‍රමාණාත්මක ප්‍රවේශය යටතේ, විදුහල්පති නායකත්ව ප්‍රශ්නාවලිය හා පාසල් සංස්කෘතිය සමීක්ෂණ ප්‍රශ්නාවලිය දත්ත රැස්කිරීමේ උපකරණ ලෙස භාවිතා කර පර්යේෂණයක් සිදු කර ඇත. මෙම අධ්‍යයනය මගින්, පාසලේ නායකත්වය හා පාසල් සංස්කෘතිය ශිෂ්‍ය ජයග්‍රහණ හා සම්බන්ධ බව අනාවරණය වේ.

පාසලේ ප්‍රධාන කළමනාකරු වන විදුහල්පතිට මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් සැලකිය යුතු වැඩ කොටසක් ඉටු කිරීමට සිදු වෙයි. තම පාසලේ පරමාර්ථ, අරමුණු ඉටු කරවා ගැනීම සඳහා තම සේවකයින් පොළඹවා ගැනීමේ දී නොයෙක් උපාය මාර්ග අනුගමනය කිරීමටද සිදු වෙයි. එම කාර්යයේ දී මෙම න්‍යායයන් විදුහල්පතිවරුනට මග පෙන්වයි.

පාසලක පරමාර්ථ, අරමුණු ඉටු කර ගැනීමේදී තම සේවකයින්, ශිෂ්‍යයන්, පාසල් කළමනාකරණ ක්‍රියාවලියට සම්බන්ධ වන්නන් ආදීහු විදුහල්පතිගේ නායකත්වය යටතේ කටයුතු කරති. ඔවුන් අභිප්‍රේරණය කිරීම සඳහා ඉහත න්‍යායයන්ගෙන් ඉදිරිපත් කෙරෙන කරුණු විදුහල්පතිවරුන් සැලකිල්ලට ගැනීම වැදගත් වී තිබේ. පාසල් කළමනාකරුවන් විසින් ඉටු කළ යුතු භූමිකා හඳුනා ගැනීම සඳහා හෙන්රි මින්ස්බර්ග් (Henri Mintzburg) විසින් ලොවට ඉදිරිපත් කරන ලද කරුණු උපකාර වනු ලැබේ. විදුහල්පතිවරයෙකුට පාසල් කළමනාකරුවෙකු වශයෙන් තමා නිරත විය යුතු භූමිකා පිළිබඳ මග පෙන්වීමක් මෙ මගින් ලැබේ.

පාසලේ ප්‍රධාන කළමනාකරු වශයෙන් විදුහල්පතිට වර්තමානයේ දී පාසල් අභ්‍යන්තර ප්‍රජාවට මෙන්ම බොහෝ විට පාසල අවට ප්‍රජාවට ද නායකත්වය සැපයීමට සිදු වෙයි. එමෙන්ම පාසලේ පරමාර්ථ, අරමුණු ඉටු කර ගැනීම සඳහා පාසල් බාහිර ප්‍රජාව සම සබඳතා පැවැත්වීමට ද විදුහල්පතිට සිදු විය හැකිය.

තම පාසල් සංවිධානයට සම්බන්ධ ව්‍යාපාරික පරිසරයේ සිදුවන වෙනස්කම්වලට අනුවර්තනය වීමට, එදිනෙදා මතු වන ගැටලුවලට මුහුණ දී අවශ්‍ය විසඳුම් ලබා දීම සඳහා අවශ්‍ය සම්පත් රැස් කිරීමට ද, එම සම්පත් අවශ්‍ය පාර්ශවයන් වෙත ප්‍රමුඛතා සලකා බලා බෙදා දීමට ද විදුහල්පතිට සිදු වෙයි. මෙමගින් පෙන්වා දෙන පරිදි වර්තමාන පාසල් සංවිධානයේ ප්‍රධාන කළමනාකරු වශයෙන් විදුහල්පතිට, හෙන්රි මින්ස්බර්ග් (Henri Mintzburg) සඳහන් කළ ආකාරයේ භූමිකා කාර්යයන්හි නිරත වීමට සිදු වෙයි (කස්තුරුආරච්චි, 2009).

Malloy සහ Leithwood (2017) විසින් ශිෂ්‍ය සාධනය කෙරෙහි පාසල් නායකත්වයේ බලපෑම පිළිබඳව කරන ලද පරීක්ෂණයට අනුව පාසලේ ශාස්ත්‍රීය පසුබිම හා ශිෂ්‍ය සාධනය අතර ධනාත්මක සම්බන්ධතාවයක් ඇති බව අනාවරණය වී ඇත.

අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය පාසලයි. පාසලක කාර්ය සඵලතාව සඳහා එහි රේඛීය කළමනාකරු වන විදුහල්පතිවරයාගේ ක්‍රියාකාරීත්වය හා මෙහෙයුම් නායකත්වය සෘජු බලපෑමක් ඇති කරයි. ඒ සඳහා සියලු ස්ථරවල ශක්තිය හා මාර්ගෝපදේශ ලබා ගනිමින් ඵලදායි හා කාර්යක්ෂම ලෙස අධ්‍යාපන අරමුණු ඉටුකර ගැනීමට පාසලට නායකත්වය ලබාදීම විදුහල්පතිගේ කාර්යභාරයයි. එහි දී රාජ්‍ය ප්‍රතිපත්ති, අධ්‍යාපන අරමුණු, සමාජ ඉල්ලුම, ප්‍රජා අභිලාෂ හා කාලීන ප්‍රවණතා හමුවේ පාසල් ප්‍රතිපත්ති කෙසේ සකස් විය යුතුද යන්න පිළිබඳව මනා අවබෝධයක් ලබා ගත යුතු වේ. එමෙන් ම ඒ සඳහා චක්‍රලේඛ, රෙගුලාසි, සම්ප්‍රදායන්, කාලීන වෙනස්කම්, ප්‍රතිසංස්කරණ හා නව්‍යතාවන් පිළිබඳ ව අවදියෙන් කටයුතු කළ යුතු වේ (අධ්‍යාපන අමාත්‍යංශය, 2020).

## 4. පර්යේෂණ ක්‍රමවේදය

**පර්යේෂණයේ අරමුණ**

- දෙහිඕවිට කලාපයේ සිසුන්ගේ ශිෂ්‍ය සාධනය කෙරෙහි පාසල් නායකත්වය හා කළමනාකරණය දක්වන බලපෑම අධ්‍යයනය කිරීම.

**සුවිශේෂී පර්යේෂණ අරමුණු**

- දෙහිඕවිට කලාපයේ පාසල් සිසුන්ගේ ශිෂ්‍ය සාධනය කෙරෙහි පාසලේ නායකත්වය හා කළමනාකරණය බලපෑමක් සිදු කරයිද යන්න අධ්‍යයනය කිරීම.
- එලෙස බලපෑමක් පවතී නම්, එම බලපෑමේ ස්වභාවය හඳුනා ගැනීම.
- ඒ අනුව පාසලේ කළමනාකරණයේ සිදු විය යුතු වෙනස්කම් පිළිබඳව යෝජනා ඉදිරිපත් කිරීම.

**පර්යේෂණ ක්‍රමය**

මේ සඳහා ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රමවේදය (Quantitative Research Paradigm) යටතේ විස්තරාත්මක සමීක්ෂණ (Descriptive Survey design Paradigm) ක්‍රමවේදය භාවිත කරන ලදී. විස්තරාත්මක සමීක්ෂණ ක්‍රමවේදයට අනුව අධ්‍යයනය සඳහා යොදා ගත් මාතෘකාවේ පවත්නා තත්ත්වය පිළිබඳව දත්ත රැස් කර අධ්‍යයනය කර ඇත. සුවිශේෂීව මෙම පර්යේෂණයෙන් දෙහිඕවිට කලාපයේ ශිෂ්‍ය සාධනය කෙරෙහි විදුහල්පති නායකත්වයේ බලපෑම අධ්‍යයනය කිරීම සඳහා මෙම ක්‍රමවේදය යොදා ගැනීම යෝග්‍ය විය.

පර්යේෂණයේ පළමු පියවර ලෙස සිසුන්ගේ සාධන මට්ටම තක්සේරු කිරීම සඳහා සුදුසු අංශ ලෙස විෂය මාලා කළමනාකරණය, භෞතික සම්පත් කළමනාකරණය, නායකත්වය හා කළමනාකරණය, විෂය සමගාමී කළමනාකරණය, ශිෂ්‍ය සුබසාධනය හා පාසල හා ප්‍රජාව යන අංශ පර්යේෂණ සාහිත්‍ය ආශ්‍රයෙන් හඳුනා ගන්නා ලදී. දෙවනුව පර්යේෂණ මාතෘකාවට අදාළ වන ලෙස ශිෂ්‍ය සාධනය කෙරෙහි බලපෑ හැකි සාධක හඳුනා ගන්නා ලදී. ඒ අනුව ස්වායත්ත විචල්‍ය ලෙස පාසලේ නායකත්වය හා කළමනාකරණයද, පරායත්ත විචල්‍ය ලෙස ශිෂ්‍ය සාධනය ද යොදා ගෙන ස්වායත්ත විචල්‍ය අනුව පරායත්ත විචල්‍යයේ වෙසෙසි වෙනසක් ඇති බවට උපකල්පනය කරන ලදී. ඒ අනුව පර්යේෂණ පිරිසැලසුම ගොඩනංවන ලදී.

**නියැදිය**

දෙහිඕවිට කලාපයේ කොට්ඨාස 5කට අයත් ප්‍රාථමික නොවන පාසල් 132 අතරින් පාසල් 2 බැගින් පාසල් 10 ක් නියැදිය වශයෙන් තෝරා ගන්නා ලදී. මෙහි දී 1AB, 1C හා 2 වර්ගයේ පාසල් සංඛ්‍යාවට සමානුපාතිකව 1AB පාසල් 1 ක්ද, 1C පාසල් 3 ක්ද, 2 වර්ගයේ පාසල් 6ක් ද තෝරා ගත් අතර නියැදි පාසල් තේරීම සඳහා සරල අහඹු නියදි ක්‍රමය භාවිත කරන ලදී.

**පර්යේෂණ උපකරණ**

අදාළ සංකල්පය සහ තොරතුරු අධ්‍යයනය කිරීමෙන් පර්යේෂණ උපකරණ ගොඩනංවන ලදී. පළමු උපකරණය ලෙස පාසල්වල විදුහල්පතිවරුන් සඳහා ප්‍රශ්නාවලියක් ලබා දෙන ලදී. එහි පළමුවන කොටසින් විදුහල්පතිගේ වයස, ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම, විදුහල්පතිවරයෙකු ලෙස සේවා කාලය යන කරුණු පිළිබඳව ද, දෙවන කොටස මගින් පාසල් පැතිකඩ එනම් පාසල් වර්ගය, පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව, ගුරු සංඛ්‍යාව සම්බන්ධ තොරතුරු විමසන ලදී.

දෙවන උපකරණය ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 31/2014 අපේ පාසල කොතරම් ගුණාත්මකය යන ප්‍රකාශනයට අනුව, පාසල්වල බාහිර අධීක්ෂණය සිදු කර, ශිෂ්‍ය සාධනය හා නායකත්වය හා කළමනාකරණය යන ඇගයීම් ක්ෂේත්‍රවලට හිමිවන ලකුණු ගණනය කරන ලදී.

දත්ත විශ්ලේෂණය සඳහා වගු ප්‍රස්ථාර සහ පරිගණක යෙදවුම් මෘදුකාංගයක් (Computer Application Software) උපයෝගී කරගෙන සංඛ්‍යානය, ප්‍රතිශතය, මධ්‍යයනය සහ සම්මත අපගමනය යන විස්තරාත්මක සංඛ්‍යාත ක්‍රම භාවිතයෙන් නායකත්වය හා කළමනාකරණයේ මධ්‍යයනය අගය අනුව ශිෂ්‍ය සාධනයට දක්වන බලපෑම අධ්‍යයනය කරන ලදී.

## 5. දත්ත ඉදිරිපත් කිරීම

වගුව 1 ඃ විදුහල්පති ප්‍රශ්නාවලිය මගින් ලබාගත් දත්ත


| පාසල සංකේතය | විදුහල්පතිගේ තොරතුරු | | | පාසලේ තොරතුරු | | | සාධනය ලකුණු % |
|---|---|---|---|---|---|---|---|
| | වයස | අධ්‍යාපන සුදුසුකම් | සේවා කාලය | වර්ගය | ගුරු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව | |
| A | 58 | උපාධි | 33 | Type 2 | 23 | 310 | 58 |
| B | 55 | උපාධි | 29 | Type 2 | 24 | 260 | 67 |
| C | 51 | පශ්.උපාධි | 24 | 1C | 38 | 580 | 36 |
| D | 53 | උපාධි | 27 | 1AB | 47 | 623 | 60 |
| E | 59 | උ.පෙළ | 32 | Type 2 | 19 | 204 | 84 |
| F | 53 | පශ්.උපාධි | 25 | Type 2 | 19 | 231 | 56 |
| G | 52 | උ.පෙළ | 24 | Type 2 | 18 | 142 | 74 |
| H | 46 | පශ්.උපාධි | 20 | 1C | 32 | 347 | 100 |
| I | 54 | උපාධි | 25 | Type 2 | 64 | 1043 | 30 |
| J | 54 | උපාධි | 26 | 1C | 26 | 187 | 72 |

වගුව 2 : අධ්‍යාපන අමාත්‍යංශ චක්‍රලේඛ අංක 31/2014 ඇගයීම් ක්ෂේත්‍රවලට ලබාගත් ලකුණු ප්‍රතිශත

| පාසල | වර්ගය | නායකත්වය හා කළ. ලකුණු ප්‍රතිශතය | ශිෂ්‍ය සාධනය ලකුණු ප්‍රතිශතය |
|---|---|---|---|
| A | Type 2 | 53 | 58 |
| B | Type 2 | 68 | 67 |
| C | 1C | 58 | 36 |
| D | 1AB | 59 | 60 |
| E | Type 2 | 73 | 84 |
| F | Type 2 | 54 | 56 |
| G | Type 2 | 72 | 74 |
| H | 1C | 75 | 100 |
| I | Type 2 | 53 | 30 |
| J | 1C | 75 | 72 |


## 6. දත්ත විශ්ලේෂණය කිරීම

විදුහල්පතිගේ වයස, හා රැකියාවේ පළපුරුද්ද යන විදුහල්පති සම්බන්ධ පුද්ගල සාධක පාසලේ ශිෂ්‍ය සාධනය කෙරෙහි දක්වන බලපෑම විශ්ලේෂණය කිරීම




රූපය 1: විදුහල්පතිගේ වයස, සේවා කාලය සහ ශිෂ්‍ය සාධනය අතර සම්බන්ධතාව

පාසලේ ගුරු ශිෂ්‍ය අනුපාතය, පාසලේ ශිෂ්‍ය සාධනය කෙරෙහි දක්වන බලපෑම විශ්ලේෂණය කිරීම.




රූපය 2: ගුරු/ශිෂ්‍ය අනුපාතය සහ ශිෂ්‍ය සාධනය අතර සම්බන්ධතාව

statgraphics stratus:-

| Home | Preferences | Add to Session Logfile | Save Script |
|---|---|---|---|

Two SAMPLE COMPARISON
This procedure compares two columns of numeric data, where the values in each row are not paired.
Documentation

| Data Input | Tables and Graphs | Output |
|---|---|---|


Statgraphics stratus
Generated: 5/12/2021 AM


Data file:

Two Sample Comparison - Leadership & Student Achievement
Sample 1: Leadership
Sample 2: Student Achievement

Sample 1: 10 values rangin from 53 to 75
Sample 2: 10 values rangin from 8 to 100

FueHir




The StatAdvisor
This procedure is designed to compare two samples of data. It will calculate various statistics and graphs for each sample, and it will run several tests to determine whether there are statistically significant differences between the two samples.

රූපය 3 : පාසලේ ශිෂ්‍ය සාධනය සහ පාසල් නායකත්ව හා කළමනාකරණය අතර සම්බන්ධතාව

## 7. දත්ත අර්ථකථනය කිරීම

- 1 වන රූප සටහනට අනුව මෙම පාසල්වල විදුහල්පතිවරුන්ගේ වයස, හා සේවා කාලය ආසන්න පරාසයක පිහිටන බවත් මෙම පාසල්වල ශිෂ්‍ය සාධනය සහ ඉහත දැක්වූ පුද්ගල සාධක අතර සම්බන්ධතාවක් නොමැති බවත් පැහැදිලි වේ.
- 2 වන රූප සටහනට අනුව මෙම පාසල්වල ගුරු/ශිෂ්‍ය අනුපාතය ආසන්න පරාසයක පිහිටන බවත් සහ ශිෂ්‍ය සාධනයත් ගුරු/ශිෂ්‍ය අනුපාතයත් අතර සම්බන්ධතාවක් නොමැති බවත් පැහැදිලි වේ.
- 3 වන රූප සටහනට අනුව බොහෝ පාසල් වල නායකත්ව හා කළමනාකරණ ක්ෂේත්‍රය සඳහා හිමිවන ලකුණු මට්ටම වැඩිවීමත් සමග ශිෂ්‍ය සාධනය සඳහා හිමිවන ලකුණු මට්ටම ද වැඩි වී ඇති බව පැහැදිලි වෙයි.

## 8. නිගමන

- විදුහල්පතිගේ වයස, අධ්‍යාපන මට්ටම හා රැකියාවේ පළපුරුද්ද යන විදුහල්පති සම්බන්ධ පුද්ගල සාධකවල විවිධත්වය, පාසලේ ශිෂ්‍ය සාධනය කෙරෙහි බලපෑමක් නොමැත.
- එසේම පාසල් වර්ගය, පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව වැනි පාසල් පැතිකඩද පාසලේ ශිෂ්‍ය සාධනය කෙරෙහි බලපෑමක් නොදක්වයි.
- පාසලක ශිෂ්‍ය සාධනය කෙරෙහි පාසල් නායකත්ව හා කළමනාකරණය බලපෑමක් දක්වයි. එම බලපෑම ඍජු හෝ වක්‍ර බලපෑමක් විය හැකිය.

## 9. යෝජනා

- විධිමත් අධ්‍යාපනයක් සහිත ශිෂ්‍යයෙකු බිහිකිරීම සඳහා පාසල් කළමනාකාරිත්වයේ ඵලදායිතාව හා කළමනාකරණය නිසි ලෙස පවත්වා ගැනීම සඳහා අවශ්‍ය පුහුණුව හා මගපෙන්වීම, පාසල් නායකත්වයට අඛණ්ඩව ලබා දීම.
- සිසුන්ගේ අධ්‍යාපන ජයග්‍රහණ සඳහා අධ්‍යාපන නායකත්වයේ ධනාත්මක බලපෑම පිළිබඳව සඳහන් කරමින්, පාසලේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා, අධ්‍යාපන නායකත්ව හැසිරීම/ විදුහල්පති භූමිකාව සකස් කිරීම සඳහා අනුගමනය කළ යුතු පූර්වෝපායන් සකස් කිරීම.
- විදුහල්පති භූමිකාවට අමතරව පාසලක නායකත්වය ගොඩනැගීමට දායකවන නියෝජ්‍ය විදුහල්පති, අංශ භාර, ශ්‍රේණිභාර, විෂයභාර වැනි විවිධ නායකත්ව භූමිකා ශක්තිමත් කිරීම.

### පර්යේෂණය සඳහා සීමාවන්

- මෙම පර්යේෂණය සඳහා සුදුසු යැයි අනුමාන කළ, සමහර අධ්‍යයනයන්වල සම්පූර්ණ අධ්‍යයනය සඳහා ප්‍රවේශවීමට දත්ත පාදක පද්ධති හරහා සෙවීම් කළ නොහැකි වීම.
- බොහෝ අධ්‍යයනයන් ඉංග්‍රීසි භාෂාවට සීමාවීම හා අනෙක් භාෂාවලින් කරන ලද අධ්‍යයන සඳහා ප්‍රවේශවීමට ඇති හැකියාව සීමාසහිත වීම.
- අධ්‍යාපන නායකත්වයේ ස්වභාවය පැහැදිලි කිරීම සඳහා ගුණාත්මක අධ්‍යයන ප්‍රවේශය බහුල ලෙස භාවිත කිරීම.

## අනාගත පර්යේෂණ සඳහා යොමුකිරීම්

මෙම පර්යේෂණය මගින් අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 31/2014 අපේ පාසල කොතරම් ගුණාත්මකද යන ප්‍රකාශනයට අනුව, පාසලේ ශිෂ්‍ය සාධනය ක්ෂේත්‍රය කෙරෙහි නායකත්වය හා කළමනාකරණය යන ක්ෂේත්‍රයේ බලපෑම අධ්‍යයනය කර ඇත. ශිෂ්‍ය සාධනය ක්ෂේත්‍රය කෙරෙහි අනෙකුත් ක්ෂේත්‍රවල බලපෑම අධ්‍යයනය කිරීම සඳහා මෙහිදී යෝජනා කෙරේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


Agostino, J, (2000). *Instructional and reading and mathematics achievement. school Effectiveness and school Improvemen*t. 11(2), p 197 - 235

Argyris, C, & Schon, D. (1996). *Organizational learning: Theory, Method, and Practice*. Reading Mass; Addis

Malloy, J., & Leithwood, K. (2017). Effects of distributed leadership on school academic press and student achievement. *How School Leaders Contribute to Student Success*, 69-91. https://doi.org/10.1007/978-3-319-50980-8_5

Mees, G. W. (2008). The relationship among principal leadership, school culture, and student achievement in Missouri middle schools, https://doi.org/10.32469/10355/5540

NEREC (2004). *A qualitative study to identify the interrelated educational and management practices that enhance student learning in Sri Lankan schools*

අධ්‍යාපන අමාත්‍යංශය, (2013) *පාසල් නගා සිටුවීමේ වැඩසටහන මාර්ගෝපදේශ සංග්‍රහය.* කොළඹ

කස්තුරිආරච්චි, සී. (2009). *අධ්‍යාපන කළමණාකරණය,* කතෘ ප්‍රකාශන, කොළඹ

# මීගමුව අධ්‍යාපන කලාපයේ තෝරාගත් පාසලක 6 වන ශ්‍රේණියේ සිසුන්ගේ සාක්ෂරතාව හා සබැඳි ලිවීමේ කුසලතා ප්‍රවර්ධනය සඳහා සිදු කරනු ලබන සාමූහික කාර්යමූල පර්යේෂණය

එස්. ඒ. සුධර්මා ගුණසේකර (BA, PGDE )
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන කාර්යාලය, මීගමුව
0703904729/0771414948 / sudharmagnskr@gmail.com

**සංක්ෂිප්තය**

අර්ධ නාගරික පරිසරයක පිහිටි, වසර ගණනාවක දී අ.පො.ස සා/පෙළ ප්‍රතිඵල අවම මට්ටමක පැවති 2 වර්ගයේ පාසලක 6 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන් 17 දෙනෙකුගේ සාක්‍ෂරතාව හා සබැඳි ගැටලු අවම කර ගැනීම සඳහා සිදු කරන ලද කාර්යමූල පර්යේෂණයකි. පාසලේ සියලු විෂයයන්ගේ සාධන මට්ටම් අඩු වීමට සාක්‍ෂරතා දෝෂ බලපා ඇති ආකාරයක් පූර්වයෙන් හඳුනා ගෙන තිබුණි. සිංහල විෂයයේ සාක්‍ෂරතාව හා සබැඳි ලිවීමේ කුසලතාව සිසුන් තුළ සංවර්ධනය කිරීම හා එමගින් සියලු විෂයයන් හොඳින් අධ්‍යයනයට අවශ්‍ය පසුබිම නිර්මාණය කර ශිෂ්‍ය සාධන මට්ටම් සංවර්ධනය කිරීම අරමුණු විය. අදාළ පාසල වෙත ගොස් නිරීක්‍ෂණය, සම්මුඛ සාකච්ඡා, ලේඛන පරිශීලනය ආදී ක්‍රමවේද මගින් අවශ්‍ය තොරතුරු හා දත්ත රැස්කර ගන්නා ලදී. තව ද පංති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය නිරීක්‍ෂණයට ලක් කරන ලදී. ඉලක්ක ශිෂ්‍ය කණ්ඩායම වෙනුවෙන් ''සාක්‍ෂරතා කඳවුර'' ක්‍රියාත්මක කරන ලද අතර එහි දී ශිෂ්‍ය ක්‍රියාකාරකම් තුළින් හඳුනාගත් සංවර්ධනය විය යුතු අංශවලට අදාළව තව දුරටත් ක්‍රියාකාරකම් සැලසුම් කර මෙම ශිෂ්‍ය කණ්ඩායම වෙත යොමු කිරීම සිදු විය. එම අවස්ථා අධීක්‍ෂණය කරමින් අවශ්‍ය ප්‍රතිපෝෂණ සැපයීම ද සිදු විය. මෙම කාර්යමූල පර්යේෂණය තුළින් සිසුන් අඛණ්ඩව ලිඛිත අභ්‍යාස වෙත යොමු කරමින් ඒවා පරීක්‍ෂාවට ලක් කිරීමෙන් ලේඛන දුබලතා රැසක් අවම කරගත හැකි බව අනාවරණය විය. සුවිශේෂී ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රම ශිල්ප භාවිතයට ගුරුභවතුන් යොමු වීම නිසා සිසුන්ට ප්‍රබෝධජනක ලෙස ඉගෙනීමට අවශ්‍ය පසුබිම නිර්මාණය වන බව ද දැකිය හැකි විය. සිසුන් කේවල වශයෙන් ගුරු මග පෙන්වීමට ලක්වීම මගින් ශිෂ්‍ය සාධන මට්ටම් වර්ධනය කර ගත හැකි විය. එසේම ගුරුභවතුන් නව ඉගෙනම් ඉගැන්වීම් ක්‍රම ශිල්ප වෙත යොමු වීමෙන් සිසු ක්‍රියාකාරීත්වය වර්ධනය කළ හැකි බව ද තහවුරු විය. සිසු අවධානයට ලක්වන නිර්මාණ හා ආධාරක සහිතව පංති ඉගෙනුම් පරිසරය සකස් කිරීම, සිසු නිර්මාණ එළි දැක්වීමට අවස්ථා සලසා දීම, සමපදස්ථ ඉගෙනුම් අවස්ථා සැලසීම, සිසු අභ්‍යාස පොත් නිරතුරුව පරීක්‍ෂාවට ලක්කිරීම වැනි දේ අත්‍යවශ්‍ය බව යෝජනා කරමි. එසේම නව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රම ශිල්ප වෙත ගුරුභවතුන් යොමුවීම, පොදු හා කේවල උපදේශනය හා ගුරු මැදිහත්වීම, සිංහල භාෂාව හා බැඳි ලේඛන දෝෂ බහුලව සිදුවන අවස්ථා සඳහා පිළියම් යෙදීම, ගුරුභවතුන් යාවත්කාලීන වෙමින් සිසුවාට මග පෙන්වීම අඛණ්ඩව සිදු කළයුතු බව ද යෝජනා කරමි.

**මුඛ්‍ය පද : - සාක්ෂරතාව, ලිවීමේ කුසලතා, ශිෂ්‍ය සාධනය**

## 1. පසුබිම

වර්තමානයේ බොහෝ අභියෝග ජයගැනීමට දායකවනුයේ අධ්‍යාපනයයි. එහි දී සාක්ෂරතාව පිළිබඳව සුවිශේෂී අවධානයක් යොමුකළ යුතුව ඇත. සවන් දීම, කථනය, කියවීම, ලිවීම යන චතුර්විධ භාෂා කුසලතාවෙන් සපිරි දරුවෙකු බිහි කිරීම අධ්‍යාපනයේ ප්‍රමුඛ වගකීමකි. ඕනෑම විෂය ක්ෂේත්‍රයක් අධ්‍යයනයේ ලා ඉහත කුසලතා අත්පත් කර ගැනීම අත්‍යවශ්‍ය වේ.

අනාගත ලෝකය ජය ගැනුමට වෙර දරනා දරු පරපුර සීඝ්‍රයෙන් ව්‍යාප්තවන දැනුම අත්පත් කර ගනුයේ අධ්‍යාපනය තුළිනි. ඒ සඳහා නිසි භාෂා ඥානයක් පැවතිය යුතු ය. භාෂාව හා බැඳි විවිධ කුසලතා සංවර්ධනය කිරීම තුළින් සියලු විෂයයන්ගේ සාධන මට්ටම් වර්ධනය කර ගත හැකිවනු ඇත.

භාෂාව, මිනිස් චින්තනයේ උපකරණය වනවාසේ ම, සංකල්ප සාධනය සහ සංස්කෘතිය සම්ප්‍රේෂණය සඳහා දායකවන, මිනිස් ජීවිතය හා ප්‍රබලව බැඳී පවතින්නකි. එනිසා ම භාෂාව පරිහරණය සුපරීක්ෂා-කාරීව කළ යුතු ය. එහිදී සාක්ෂරතාව හා සබැඳි ලිවීමේ කුසලතා සංවර්ධනය ඉතා වැදගත් වේ. ලිවීමේ කුසලතා ප්‍රවර්ධනය තුළින් සියලු විෂයයන් හොඳින් අධ්‍යයනයට අවශ්‍ය පසුබිම නිර්මාණයට දරන ප්‍රයත්නයක් ලෙස මෙම කාර්යමූල පර්යේෂණය හඳුන්වා දිය හැකි ය.

මීගමුව අධ්‍යාපන කලාපයේ පසුගිය වසර කිහිපයක (2016 -2018) අ.පො.ස. සා/පෙළ විභාග ප්‍රතිඵල විශ්ලේෂණ අනුව පෙනී යන්නේ සමහර පාසල්වල ප්‍රතිඵල ඉතා පහළ මට්ටමක පවතින බවකි. මේ සම්බන්ධව විමසා බැලීමේ දී සාක්ෂරතා ගැටලුව ද එක් හේතුවක් වී ඇති බව පැහැදිලි වේ. එහිදී ලිවීම හා බැඳි ගැටලු පැවතීම ප්‍රධාන තැනක් ගන්නා අතර එම තත්ත්වය සියලු විෂයයන්ගේ සාධන මට්ටම් කෙරෙහි අයහපත් ලෙස බලපා ඇති බවක් දක්නට ලැබේ. සාක්ෂරතා ගැටලුව අවම කිරීමේ ලා ප්‍රතිකාර්ය වැඩසටහනක් ලෙස '' සාක්ෂරතා කඳවුරු ක්‍රමය '' 2018 වසරේ දී කලාපයේ තෝරාගත් පාසල් වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලදී. එම පාසල්වල 6 ශ්‍රේණියේ සිසු පිරිස මෙහි ඉලක්ක කණ්ඩායම විය. එම වැඩසටහනේ අනාවරණ අපගේ පර්යේෂණය සඳහා පදනම විය. මෙහි දී ඉතා පහළ සාධන මට්ටමක් පෙන්වූ, එමෙන් ම ආසන්න වසර කිහිපයක දී අ.පො.ස සා/පෙළ ප්‍රතිඵල ද පහළ මට්ටමක පැවති පාසලක් අපගේ කාර්යමූල පර්යේෂණය සඳහා තෝරා ගන්නා ලදී.

අප තෝරා ගත් පාසල, මීගමුව අධ්‍යාපන කලාපයේ ජා-ඇල කොට්ඨාසයට අයත් 2 වර්ගයේ පාසලකි. එහි 6 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන් 17 දෙනා (ආරම්භයේ 16) අපගේ ඉලක්ක කණ්ඩායම විය. ඔවුන්ගේ සාධන මට්ටම් වර්ධනයේ ලා සාක්ෂරතාව හා බැඳි ලිවීමේ කුසලතා වර්ධනය කිරීම අපගේ ප්‍රධාන අරමුණ විය. මෙය සිංහල භාෂාව හා සම්බන්ධව සිදු කිරීමට තීරණය වූයේ මෙම පිරිසගේ අධ්‍යයන මාධ්‍යය සිංහල භාෂාව වීම නිසා ය.

## 2. ගැටලුව හැඳින්වීම

ශ්‍රී ලංකාවේ සිංහල මාධ්‍ය පාසල්වල ද්විතීයික අධ්‍යාපනයේ අනිවාර්ය විෂයයක් ලෙස සිංහල භාෂාව හැඳින්විය හැකි ය. යම් සිසුවෙකු අ.පො.ස සා/පෙළ සමත් අයකු සේ සැලකීම සඳහා සිංහල විෂය සමත්වීම තීරණාත්මක සාධකයක් වේ. බොහෝ සිසුන්ගේ සියලු විෂය සඳහා අධ්‍යයන මාධ්‍යය වනුයේ ද සිංහල භාෂාවයි. ඒ හා බැඳි චතුර්විධ භාෂා කුසලතාවන සවන්දීම, කථනය, කියවීම, ලිවීම යන අංශවලින් පරිපූර්ණ සිසුවෙකු පාසල් පද්ධතියෙන් බිහි කිරීම අධ්‍යාපනයේ එක් අරමුණකි. ජාතික පොදු නිපුණතාවල සන්නිවේදන නිපුණතාවයේ අන්තර්ගතයේ වූ සාක්ෂරතාව තුළ ද ''නිවැරදි ලිවීම'' යන කරුණ වෙත අවධානය යොමුකර තිබේ. පාසල් විභාග ප්‍රතිඵල විශ්ලේෂණ අනාවරණ අනුව 100%ක සාක්ෂරතා මට්ටමක් සිසුනට අත්පත් කර දීමට පාසල අපොහොසත්ව ඇති බවක් පෙන්නුම් කෙරේ. ආසන්න වසර කිහිපයක අ.පො.ස සා/පෙළ ජාතික ප්‍රතිඵල මගින් මෙම තත්ත්වය සනාථ කරගත හැකිය.

වගුව 1 : වසර තුනක් තුළ අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාග සියලු විෂයයන් අසමත් වීම

| වසර | පෙනී සිටි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | W – 9 ලද ශිෂ්‍ය සංඛ්‍යාව | W – 9 ප්‍රතිශතය |
|---|---|---|---|
| 2016 | 286,251 | 8,900 | 3.11% |
| 2017 | 296,812 | 7,308 | 2.46% |
| 2018 | 296,029 | 5,917 | 2% |

(විභාග දෙපාර්තමේන්තු වාර්තා ඇසුරෙන්)

ඉහළ සාක්ෂරතා මට්ටමක් සහිත රටක් වුවත් අප රටේ ග්‍රාමීය හා අර්ධ නාගරික පාසල් රැසක තවමත් සාක්ෂරතා ගැටලු ඇති බව හඳුනාගත හැකිය. 21වන සියවසෙහි අභියෝග ජය ගැනුමට එය බාධාවක් වනවා සේ ම රටේ සංවර්ධනයට ද ගැටලුකාරී තත්ත්ව උදාකරනු ඇත. වර්තමානයේ අධ්‍යාපනයට යොමු වීමේ වර්ධනයක් ඇති අතර, පාසලෙන් ගිලිහෙන පිරිස් ද තවමත් හඳුනාගත හැකි ය.

නිපුණතා පාදක ප්‍රාථමික අධ්‍යාපනයක් මෙරට ක්‍රියාත්මක වුව ද ද්විතීයික අධ්‍යාපනය සඳහා අවශ්‍ය කුසලතා සම්පූර්ණ නොකළ සිසුන් 6 ශ්‍රේණියට ප්‍රවේශ වීම පාසල් පද්ධතිය තුළ තවමත් දැකිය හැකි ය. සිංහල භාෂාවේ මෙන් ම සෙසු විෂයයන්ගේ සාධන මට්ටම් කෙරෙහි ද මෙම තත්ත්වය අහිතකර ලෙස බලපා ඇත. මෙය බොහෝ ගුරුභවතුන් හට දැඩි පීඩාකාරී වාතාවරණයන් ඇති කරයි.

1-5 ශ්‍රේණි ඇතුළත් ප්‍රාථමික අංශයේ එක් එක් අවධි තුළ දී සිසුවෙකු අත්පත් කරගත යුතු නිපුණතා ඇත. මව්බස (සිංහල) විෂය සඳහා සම්පූර්ණ කළ යුතු ලිවීම හා සම්බන්ධ අපේක්ෂිත නිපුණතා අත්පත් කර නොගත් තත්ත්වය මෙම අධ්‍යයනය සඳහා සාක්ෂරතා ගැටලුව සේ සලකා ඇත. මෙහි දී ලිවීම හා සම්බන්ධව පවතින ගැටලු විසඳීමේ අරමුණින් ප්‍රතිකාර්ය වැඩසටහනක් වෙත යොමු විය. එමගින් සියලු විෂයයන් අධ්‍යයනය සඳහා වන බාධා මගහැර, සාධන මට්ටම් වර්ධනය ප්‍රධාන අරමුණ සේ ගෙන ඇත.

2016 - 2018 තෙවසර තුළ මීගමුව අධ්‍යාපන කලාපයේ, අ.පො.ස සා/පෙළ ප්‍රතිඵල පහළ මට්ටමක පැවති පාසල් ගණනාවක් අධීක්ෂණ කාර්යයේ දී හා ප්‍රතිඵල විශ්ලේෂණ තුළින් අප විසින් හඳුනාගෙන ඇත. එසේම පාසල් අධීක්ෂණයේ දී ''ශිෂ්‍ය සාධනය'' ක්ෂේත්‍රය සඳහා ලබා ගන්නා ලකුණු සංඛ්‍යාව මත ද පහළ සාධන මට්ටම් සහිත පාසල් හඳුනාගෙන තිබේ.

ගුරු උපදේශකවරුන්ගේ සහාය ඉගැන්වීම් ආශ්‍රිත කරුණු සහ 2018 වර්ෂයේ දී පැවති ''සාක්ෂරතා කඳවුරු'' වැඩසටහනේ අනාවරණ ද පදනම් කර ගනිමින්, සිංහල විෂය හා බැඳි ලිවීමේ ගැටලු සියලු විෂයයන් කෙරෙහි අයහපත් ලෙස බලපා ඇති බව හඳුනා ගතිමු. 2015 සිට මීගමුව අධ්‍යාපන කලාපය තුළ පාසල් අධීක්ෂණ ක්‍රියාවලිය සඳහා දායකවන මා හට ද ඉහත තත්ත්වය නිරීක්ෂණය වී තිබේ.

නිර්මාණාත්මක ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රම ශිල්ප වෙනුවට ගුරු කේන්ද්‍රීයත්වය තුළින් විෂය නිර්දේශ ආවරණය කිරීමේ සටනකට අවතීර්ණ වී ඇති බහුතර ගුරු පිරිස සාක්ෂරතා ගැටලු සහිත සිසුන් ද්විතියික අධ්‍යාපනයට ප්‍රවේශ වීම තුළ දැඩි මානසික පීඩාවන්ට ලක්ව ඇත. එසේම සමහර සිසුන් ද මේ නිසා පංති කාමරය තුළ අපහසුතාවන්ට ලක්වන බව නිරීක්ෂණය වී තිබේ. විෂයයන් ගණනාවක් හැදෑරීමේ දී ලිවීම හා සම්බන්ධ ගැටලු පැවතීම තුළ අධ්‍යාපනික වශයෙන් අවාසිදායක තත්ත්වයන්ට මුහුණ දීමට සිසුනට සිදු වේ.

මේ පිළිබඳ නිසි අවබෝධයකින් යුතුව අප පර්යේෂණ කණ්ඩායම කලාපයේ තෝරාගත් පාසලක් වෙනුවෙන් ඵලදායී ප්‍රතිපෝෂණ වැඩසටහනක් හඳුන්වා දීමට තීරණය කළෙමු. සිංහල විෂය හා සබැඳි ලිවීමේ කුසලතා සංවර්ධනය තුළින් සියලු විෂයයන්ගේ සාධන මට්ටම් වර්ධනය උදෙසා සාමුහික කාර්යමූල පර්යේෂණයක් අදාළ පාසල තුළ ක්‍රියාත්මක කිරීමට යොමු වීමු.

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයට අයත් මීගමුව අධ්‍යාපන කලාපය මීගමුව, ජාඇල, කටාන යන අධ්‍යාපන කොට්ඨාස තුනකින් සමන්විත ය. 2016 - 2018 තෙවසර තුළ ඉතා පහළ මට්ටමක අ.පො.ස සා/පෙළ ප්‍රතිඵලයකට හිමිකම් කියූ මෙම තෝරාගත් පාසල අධීක්ෂණ කාර්යයේ දී නිරන්තර සාකච්ඡාවට බඳුන් වූවකි. ජා ඇල කොට්ඨාසයේ අර්ධ නාගරික පරිසරයක පිහිටි මෙය 1 -11 ශ්‍රේණි ක්‍රියාත්මක 2 වර්ගයේ පාසලක්වන අතර පාසල් අධීක්ෂණ ක්‍රියාවලියේ දී ''ශිෂ්‍ය සාධනය'' ක්ෂේත්‍රය සඳහා ද පහළ ලකුණු ලබා තිබේ. එසේම අවාසිදායක පවුල් පරිසරවලින් පැමිණෙන බහුතර සිසු පිරිසක් සහිත මෙය යම් ප්‍රගතියක් කරා යාමට වෙර දරනා පාසලක් බව කිව හැකිය.

අදාළ පාසලේ 6 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන් 17 දෙනා (ආරම්භයේ දී 16ක් විය) අපගේ ඉලක්ක කණ්ඩායම විය.

වගුව 2: තෝරාගත් පාසලේ අ.පො.ස සා/පෙළ ප්‍රතිඵල

| වර්ෂය | ඉදිරිපත් වූ සිසුන් ගණන | 3/6 සමත් ගණන | 3/6 සමත් ප්‍රතිශතය |
|---|---|---|---|
| 2016 | 20 | 01 | 5% |
| 2017 | 09 | 02 | 22% |
| 2018 | 04 | 01 | 7% |

වගුව 3 : ශිෂ්‍ය සාධනය ක්ෂේත්‍රය සඳහා ලබාගත් ලකුණු


| වර්ෂය | කොට්ඨාස අධීක්ෂණය | කලාප අධීක්ෂණය |
|---|---|---|
| 2016 | 41.26% | - |
| 2017 | 44% | 46% |
| 2018 | 36% | - |

(විද්‍යාලයීය ක්ෂේත්‍ර ලිපිගොනු ඇසුරෙන්)

## 3. පර්යේෂණයට යොමුවීම සහ මැදිහත් වීම

තෝරාගත් පාසලේ අධීක්ෂණ ක්‍රියා ආශ්‍රිත වාර්තා, ජාතික විභාග ප්‍රතිඵල ලේඛන හා විශ්ලේෂණ වාර්තා, වාර පරීක්ෂණ හා ඇගයීම් ලකුණු වාර්තා, ගුරු උපදේශකවරුන්ගේ සහාය ඉගැන්වීම් ආශ්‍රිත තොරතුරු අධ්‍යයනය කිරීම සිදුවිය. එසේම ගුරු, සිසු, විදුහල්පති සමග සම්මුඛ සාකච්ඡා සිදුකර ලබාගත් තොරතුරු ද අධ්‍යයනය කරන ලදී. මෙලෙස ලද තොරතුරු මත පදනම්ව මෙම විදුහලේ 6 වන ශ්‍රේණිය සඳහා සාමූහික කාර්යමූල පර්යේෂණයක් ක්‍රියාත්මක කිරීමට තීරණය කළෙමු.

## 4. සාමූහික කාර්යමූල පර්යේෂණ ක්‍රියාවලිය (ක්‍රමවේදය)




රූපය 1 : 6 වන ශ්‍රේණියේ සිසුන්ගේ සාක්ෂරතාව හා සබැඳි ලිවීමේ කුසලතා ප්‍රවර්ධනය සඳහා සිදු කරනු ලබන සාමූහික කාර්යමූල පර්යේෂණයෙහි පර්යේෂණ ක්‍රමවේදය

අදාළ වසර (2019) පළමු වාරය ආරම්භයේ දී හා අතරතුර දී තෝරාගත් පාසල වෙත ගොස් 6 වන ශ්‍රේණියේ සිසුන් සම්බන්ධව පවතින තත්ත්වය අනාවරණය කර ගතිමු.

මීට අමතරව සිසුන්ගේ අභ්‍යාස පොත් පරීක්ෂාකර ලිවීමේ කාර්ය හා සම්බන්ධ සාධන මට්ටම් හඳුනා ගැනීම සිදු කරන ලදී. එසේම සිංහල හා වෙනත් විෂය කීපයක පංති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සිංහල විෂයභාර ගුරු උපදේශකතුමන්ගේ අධීක්ෂණයට ලක් කිරීම හා අපගේ නිරීක්ෂණයට ලක් කරන ලදී. විෂයභාර ගුරුතුමිය, වෙනත් විෂයයන්ට අදාළ ගුරුභවතුන් කිහිපදෙනෙකු සහ විදුහල්පතිතුමිය සමග සම්මුඛ සාකච්ඡා සිදු කිරීමෙන් ද ඉලක්ක කණ්ඩායම පිළිබඳව පවතින තත්ත්වය අනාවරණය කර ගතිමු.

ඉහත ලකුණු සඳහා පදනම් වී ඇත්තේ බොහෝවිට සිංහල විෂය හා බැඳි ලිවීමේ ක්‍රියාකාරකම් ය. එම නිසා සිසුන් තුළ පවතින ලේඛන හා සම්බන්ධ ගැටලු හඳුනාගැනීම අප පරීක්ෂණ කණ්ඩායමේ ප්‍රධාන අරමුණක් විය.

### 5. පර්යේෂණ කණ්ඩායම

තෝරාගත් පාසලේ 6 වන ශ්‍රේණියේ සිංහල විෂයභාර ගුරුතුමිය, ජා ඇල කොට්ඨාසයේ සිංහල විෂයභාර ගුරු උපදේශකතුමන් සහ මීගමුව අධ්‍යාපන කලාපයේ සෞන්දර්ය විෂය අධ්‍යක්ෂ වන මා මීට අයත් විය. සාක්ෂරතා කඳවුර පවත්වන දිනයේ සිංහල විෂයභාර අධ්‍යක්ෂතුමිය, කටාන කොට්ඨාසයේ සිංහල විෂයභාර ගුරු උපදේශකතුමිය සහ විද්‍යාලයීය ගුරු මහත්මීන් තිදෙනෙකුගේ සම්පත් දායකත්වය අවස්ථානුකූලව සිදුවිය.

### 6. දත්ත රැස් කිරීම සඳහා භාවිත කරන ලද ක්‍රමවේදය


| | |
|---|---|
| සම්මුඛ සාකච්ඡා ක්‍රමය | - ගුරු, සිසු, විදුහල්පති සමග |
| සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමය | - 6 ශ්‍රේණිය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය |
| ලිඛිත වාර්තා අධ්‍යයනය | ශිෂ්‍ය සාධනය හා සම්බන්ධ ලිපි ගොනු, ලකුණු විශ්ලේෂණ වාර්තා, ලකුණු පොත්, අධීක්ෂණ වාර්තා, ප්‍රතිඵල විශ්ලේෂණ වාර්තා, සිසු අභ්‍යාස පොත්, ගුරු - සිසු පැමිණීමේ ලේඛන, ගුරු උපදේශක වාර්තා, ප්‍රත්‍යවේක්ෂණ ජ'නලය |

### 7. ඉලක්ක කණ්ඩායම වෙනුවෙන් ක්‍රියාත්මක කළ දේ :-

අනාවරණ පරීක්ෂණ පැවැත්වීම, ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් අවස්ථා සැලසීම, විනෝදාත්මක ඉගෙනුම් පරිසර නිර්මාණය, ලිඛිත අභ්‍යාස ලබාදීම, සාක්ෂරතා කඳවුර පැවැත්වීම.

අවස්ථා ගණනාවක දී පසු පරීක්ෂණ සිදු කර සිසු සාධන මට්ටම් පිළිබඳ තත්ත්ව අනාවරණය කර ගන්නා ලදී. ඉහත ක්‍රියාකාරකම් වෙත සිසුන් අඛණ්ඩව යොමු කිරීමෙන් සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගත හැකි බව තහවුරු විය.

## 8. ලිවීම හා සම්බන්ධව පැවති ගැටලු




රූපය 2 : සිසුන්ගේ ලිවීම හා සම්බන්ධව අනාවරණය කර ගත් ගැටලු

මෙවැනි දුබලතා පෙන්වීමට හේතු විමසා බලා ඔවුන්ගේ ප්‍රාථමික අවධියට අදාළ තොරතුරු ද යම් පමණකට සොයා බලන ලදී. එහිදී අනාවරණය කරගත් කරුණු කිහිපයක් පහත සඳහන් වේ.

* සිසුන් අඛණ්ඩව පාසල් පැමිණීම සිදු නොවීම.
* නිවස අධ්‍යාපනික නොවීම හා අයහපත් සමාජ, ආර්ථික පවුල් පරිසරයක් පැවතීම.
* අසුන්ගත, ලිවීමේ ක්‍රියාකාරකම් සඳහා සිසුන් දක්වන මැලිකම.
* විෂය සුවිශේෂී, පුහුණු ගුරුභවතුන් වෙතින් විෂය ඉගැන්වීම සෑම අවස්ථාවක දී ම සිදු නොවීම.
* ගුරුභවතුන්ගේ ඉගැන්වීමේ ක්‍රම ශිල්පවල ඌණතා පැවතීම.

ලිවීම හා සම්බන්ධ සිසු කුසලතා වර්ධනයට උචිත ක්‍රියාකාරකම් සැලැස්මක් සකසා පාසල වෙත ඉදිරිපත් කළෙමු. විෂයානුබද්ධව නිර්මාණය කරන ලද විනෝදාත්මක ක්‍රියාකාරකම් සහ ශිල්පීය ක්‍රමවේද සහිත ''සාක්ෂරතා කඳවුර'' වැඩසටහන ඒ අතර ප්‍රධාන විය. ඒ පිළිබඳ සිංහල විෂයභාර ගුරුතුමිය දැනුවත් කර පූර්ව සූදානම අධීක්ෂණය කළෙමු. කඳවුර පැවැත්වෙන දිනය ඉලක්ක කණ්ඩායමට සුවිශේෂී දිනයක් සේ හැඟෙන පරිදි එළිමහන් ක්‍රියාකාරකම් සහිතව ක්‍රියාත්මක කිරීමට යොමු කළෙමු.

සාක්ෂරතා කඳවුර දිනය දා පැමිණි සිසුන් ඉතා උද්යෝගයෙන් යුතුව එයට දායක වූ අතර, වින්දනාත්මක අදහස් පළ කරන ලදී. විදුහල්පතිතුමිය විසින් ඔවුන් වෙත තිළිණ ප්‍රදානයක් ද සිදු කරන ලදී. සිසුනට ප්‍රබෝධාත්මක ඉගෙනුමකට අවශ්‍ය පහසුකම් පාසල විසින් සපයා දී තිබුණි.

## 9. ක්‍රියාකාරකම් සැලැස්ම

වගුව 4 : පර්යේෂණයෙහි ක්‍රියාකාරී සැලැස්ම

| ක්‍රියාකාරකම | අනු ක්‍රියාකාරකම් | අපේක්ෂිත ඉලක්ක | යොදාගත් සම්පත් | කාලය |
|---|---|---|---|---|
| විෂය කඳවුර | වචන පැදුර | අක්ෂර වින්‍යාස නිවැරදිව භාවිත කරයි | වර්ණ කඩදාසි, ප්ලැටිග්නම් | 2019 II වාරය<br><br>(මැයි මාසයේ පූර්ව සූදානම, ජූනි මාසය තුළ ක්‍රියාත්මක කිරීම) |
| | ප්‍රහේලිකා | නිවැරදි ස්ථානයේ ලියයි | ළමා පුවත්පත් | |
| | කෙටි ලිඛිත ප්‍රශ්න | නිවැරදි පිළිතුරු ලියයි | 6 ශ්‍රේණිය සිංහල පෙළ පොත | |
| | අසම්පූර්ණ වැකි | උචිත පද යොදා සම්පූර්ණ කරයි | ගුරු අත්පොත (6 ශ්‍රේණිය-සිංහල) | |
| | හිස්තැන් පිරවීම් | සුදුසු වචන තෝරා හිස්තැන් ලියයි | විෂයානුබද්ධ පොත් | |
| | පින්තූරය බලා වැකි ලිවීම | නිර්මාණාත්මක වැකි ලියයි | කතන්දර පොත් | |
| | අසා ලිවීම | අර්ථාන්විතව පද වෙන් කරයි | 6 ශ්‍රේණිය සිංහල පෙළ පොත | |
| | පාරිභාෂික වචන | න ණ, ල ළ, අල්ප/ මහාප්‍රාණ, මූර්ධජ අක්ෂර නිවැරදිව භාවිත කරයි | 6 ශ්‍රේණිය සිංහල පෙළ පොත | |
| විෂයානුබද්ධ පංතිකාමර ක්‍රියාකාරකම් (විෂයභාර ගුරුවරු / ගුරු උපදේශකවරු) | පාරිභාෂික වචන | නිවැරදි අක්ෂර වින්‍යාස භාවිත කරයි | ගුරුඋපදේශක ල බා දී ඇති වචන පොත | 2019 ජූනි |
| | කෙටි වැකි | උක්තය හා ආඛ්‍යාතය නිවැරදිව ගළපයි | පින්තූර සහිත ළමා කතා පොත් | 2019 ජූලි/සැප්තැ. /ඔක්තෝම්බර් |
| | පිටපත් ලිවීම | අකුරුවල නියමිත ප්‍රමාණය හා හැඩය පවත්වා ගනිමින් රූල මත නිවැරදිව ලියයි | 6 ශ්‍රේණියේ සිංහල පෙළ පොත | 2019 ජූනි/ජූලි/ සැප්තැම්බර්/ ඔක්තෝම්බර් |
| | අසා ලිවීම | ශ්‍රවනයෙන් ග්‍රහණය කරගත් කරුණු නිවැරදිව ලියයි | 6 ශ්‍රේණියේ සිංහල පෙළ පොත | 2019 ඔක්තෝ./ නොවැම්බර් |

මෙවැනි ක්‍රියාකාරකම් අඛණ්ඩව පංති කාමරය තුළ දී ක්‍රියාත්මක කර, සිසුනට තව දුරටත් අත්දැකීම් ලබා දීමට යොමුවන ලෙස විෂයභාර ගුරුතුමියට උපදෙස් දුනිමු. නිරන්තරව සිදුකරන ලිඛිත අභ්‍යාස තුළින් සිසුනගේ ලිවීම හා සම්බන්ධ කුසලතා සංවර්ධනය වන ආකාරය පිළිබඳ වාර්තා පවත්වා ගැනීමට ද ගුරුතුමියට දන්වන ලදී. මේ සම්බන්ධව කෙටි කාලීන, මධ්‍ය කාලීන, දිගු කාලීන ලෙස අරමුණු සකසා ඒවා සාක්ෂාත් කර ගැනීමට යොමුවීම පාසලේ සමස්ත ගුරු මණ්ඩලයේ ම වගකීමක් බව පැහැදිලි කර දෙන ලදී.

සාක්ෂරතා කඳවුරෙන් පසු පංති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර දී සිංහල විෂයයේ ලිවීම හා සම්බන්ධ ක්‍රියාකාරකමක් සඳහා සිසුන් ලද ලකුණු, I හා II වාර සිංහල ඇගයීම් ලකුණු, වාර විභාග ලකුණු ආදී පසු පරීක්ෂණ ආශ්‍රිත ලකුණු ගෙන විශ්ලේෂණය කළෙමු. සිසුන් 11/17 දෙනෙකු (64.7% ක් පමණ) ක්‍රමයෙන් ලිවීම හා සම්බන්ධ යම් සංවර්ධනාත්මක තත්ත්වයකට එළඹෙමින් සිටින බව තහවුරු විය.

## 10. දත්ත රැස් කිරීම හා විශ්ලේෂණය :-

මේ සඳහා සම්මුඛ සාකච්ඡා ක්‍රමය, සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමය හා පාසලේ ශිෂ්‍ය සාධන මට්ටම් පිළිබිඹුවන වාර්තා හා ලේඛන අධ්‍යයනය, සිසුන්ගේ අභ්‍යාස පොත් පරීක්ෂාව, විෂයභාර ගුරුතුමියගේ ප්‍රත්‍යවේක්ෂණ ජ'නලයේ අන්තර්ගත කරුණු පරීක්ෂාව, කොට්ඨාස හා කලාප අධීක්ෂණ වාර්තා හා ගුරු උපදේශක සහාය ඉගැන්වීම් ආශ්‍රිත වාර්තා අධ්‍යයනය යන ක්‍රමවේද භාවිත කරන ලදී. ලබාගත් තොරතුරු විශ්ලේෂණය කර ඒ මත පදනම්ව අවශ්‍ය ක්‍රියාකාරකම් සැලසුම් කරන ලදී. පසු පරීක්ෂණවලින් ලත් අනාවරණ මත නිගමන හා යෝජනා ඉදිරිපත් කිරීම සිදු වේ.

## 11. නිගමන :-

- ශිෂ්‍ය කේන්ද්‍රීය, ප්‍රබෝධමත් ඉගෙනුම් අවස්ථා ලබා දීමෙන් ශිෂ්‍ය සාධන මට්ටම් වර්ධනය කරගත හැකි බව.
- අඛණ්ඩව අභ්‍යාස කිරීමෙන් ලිවීම හා සම්බන්ධ බොහෝ දුබලතා මගහැර ගත හැකි බව.
- නිරන්තර ගුරු මග පෙන්වීම හා උපදේශනය සිසුනට අත්‍යවශ්‍ය බව.
  (කේවල වශයෙන් සිදුවීම වඩාත් ඵලදායී බව)
- කඳවුරු ක්‍රමය තුළ සිසුන් විනෝදයෙන් යුතුව අධ්‍යයනයේ නිරතවන බව.
- නව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රම ශිල්ප වෙත ගුරුභවතුන් යොමුවීමෙන් සිසුන් ක්‍රියාශීලී කල හැකි බව.
- බොහෝ සිසුන්ගේ ලිවීම හා සම්බන්ධ කුසලතා සංවර්ධනය විය යුතු මට්ටමක ඇති බව.
- පර්යේෂණ වෙත යොමු වීමෙන් ගුරු වෘත්තීය සංවර්ධනයක් සිදුවන බව.

## 12. යෝජනා :-

- සිංහල භාෂාව හා බැඳි ලිඛිත දේ නිරන්තරව සිසුනට දිස්වන සේ ඉගෙනුම් පරිසරය නිර්මාණය කිරීම.
- ප්‍රහේලිකා, ගද්‍ය, පද්‍ය වැනි සිසු නිර්මාණ ඇතුළත් බිත්ති පුවත්පත් නිර්මාණය.
  (විවිධ විෂය ක්ෂේත්‍ර ආවරණයවන සේ)
- පුස්තකාල පරිහරණය ඵලදායීව සිදු කිරීම හා කිය වූ පොත්පත් පිළිබඳව නිර්මාණාත්මක අදහස් රචනයට සිසුනට මග පෙන්වීම.

- සිංහල භාෂා තරග අවස්ථා සඳහා සිසුන් යොමු කිරීම.
- සමපදස්ථ කණ්ඩායම් වෙතින් පෝෂණය වීමට සිසුනට අවස්ථා සලසා දීම.
- සිසු අභ්‍යාස පොත් නිරන්තර පරීක්ෂාවට ලක් කිරීම.
- ගුරුභවතුන් දැනුම යාවත්කාලීන කර ගැනීමට යොමු වීම. (නව ඉගැන්වීම් ක්‍රම ශිල්ප හඳුනා ගැනීම)

## ආශ්‍රිත ග්‍රන්ථ :-

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව (2018) අධ්‍යාපන වෘත්තිකයන්ගේ සංවර්ධනය සඳහා කාර්යමූලික පරීක්ෂණ පිළිබඳ උපදෙස් සංග්‍රහය, කොළඹ, බස්නාහිර පළාත් මුද්‍රණාලය.

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව (2018) ප්‍රත්‍යාවලෝකන වාර්ෂික අධ්‍යාපන පර්යේෂණ සංග්‍රහය, කොළඹ, බස්නාහිර පළාත් මුද්‍රණාලය.

කොඩිතුවක්කු පී. (1996) කාර්යමූල පර්යේෂණ ප්‍රවේශය, නුගේගොඩ, සුනෙර ප්‍රකාශකයෝ

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව (2014). 6 වන ශ්‍රේණිය, සිංහල පෙළ පොත, කොළඹ, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

ජාතික අධ්‍යාපන ආයතනය (2015) 6 වන ශ්‍රේණිය සිංහල ගුරු මාර්ගෝපදේශය, මහරගම, ජාතික අධ්‍යාපන ආයතන මුද්‍රණාලය.

# පාසලේ අභ්‍යන්තර ඇගයීම් ක්‍රියාත්මක කිරීම හා වාර්තාකරණය ශක්තිමත් කිරීම මගින් පාසලේ ගුණාත්මක දර්ශකය ඉහළ නැංවීම

එස්. එන්. හෙට්ටිආරච්චි (MA, PGDE)
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන කාර්යාලය, බදුල්ල
0718605855 / sarangeenilushika@gmail.com

**සංක්ෂිප්තය**

පාසල් පද්ධතිය ගුණාත්මකව සංවර්ධනය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ ප්‍රමිති ශාඛාව 'අපේ පාසල කෙතරම් ගුණාත්මකද' යන මාර්ගෝපදේශය පාදක කර ගනිමින් ප්‍රමිති ක්ෂේත්‍ර පදනම් කර ගත් යාන්ත්‍රණයක් හඳුන්වා දී ඇත. එම යාන්ත්‍රණය මගින් අභ්‍යන්තර හා බාහිර ඇගයීම් ක්‍රියාවලීන් හඳුන්වා දී ඇති අතර ඒ තුලින් ගුණාත්මක පාසලක් සංවර්ධනය කිරීමට අවශ්‍ය මගපෙන්වීමත් සිදුකර ඇත. ගුණාත්මකතාවය මැන බලනුයේ නිර්ණායක හා දර්ශක සඳහා පාසල ලබා ගන්නා වූ ලකුණු ගණනය කර සකස් කරනු ලබන පාසල් ගුණාත්මක දර්ශකය පදනම් කර ගනිමිනි. මගේ පර්යේෂණය වූයේ තෝරා ගත් පාසලක පාසල් ගුණාත්මක දර්ශකය අඩු වීම සඳහා බලපාන්නා වු හේතු හඳුනා ගෙන සංවර්ධනය සඳහා මැදිහත් වී ක්‍රියාමාර්ග හඳුනා ගැනිමයි. පාසලේ පවතින අභ්‍යන්තර ඇගයීම් ගොනු පරික්ෂා කිරීමත් , අභ්‍යන්තර නියාමන ලකුණු හා බාහිර නියාමන ලකුණු සංසන්දනය කිරීම හා ඇගයීම් භාර ගුරුවරු හා විදුහල්පති සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම මගින් පාසලේ පවතින වර්තමාන තත්වය අනාවරණය කර ගැනිමටත් ගුණාත්මක දර්ශකය අඩුවීම සඳහා බලපාන්නා වු හේතු හඳුනා ගැනිමටත් හැකි විය. ඇගයීම් දර්ශක සඳහා ලකුණු ලබා දිමේදි දැනුවත්භාවයේ පවතින දුර්වලතා නිසා පුද්ගලබද්ධතාවය මත ලකුණු ලබා දිම, වාර්තාකරණය ශක්තිමත් නොවිම, තොරතුරු යාවත්කාලිනව පවත්වා නොගැනිම, අනාවර්තිත කරුණු මත පදනම්ව පාසල තුළ වැඩසටහන් ක්‍රියාත්මක නොවිම යන මූලික හේතුන් පර්යේෂණයේදි මා හට හඳුනා ගැනිමට හැකි විය. ඒ අනුව ඇගයීම් ක්ෂේත්‍ර භාර කණ්ඩායම් සමග සම්බන්ධ වෙමින් අභ්‍යන්තරව හා බාහිරව ලබා දි ඇති ලකුණු අතර වෙනසට හේතුන් ද පුද්ගලබද්ධ නොවි දර්ශක සඳහා ලකුණු ලබා දිය හැකි ආකාරය පැහැදිලි කළෙමි. ඇගයීම් ගොනු යාවත්කාලිනව පවත්වා ගැනිමත් පාසලේ විවිධාකාරයෙන් සිදුවන ක්‍රියාකාරකම් වාර්තා කිරීම නිසි පරිදි සිදු කරන ආකාරයත් කාර්යාලිය ක්‍රමවේද අනුව ගොනු පවත්වා ගැනිමත් නඩත්තු කිරීම සඳහාත් මැදිහත් විමි. ආරම්භයේදි විවිධ දුෂ්කරතා මත මගේ මැදිහත් විම සිදු වුවත් පියවරින් පියවර පාසල තුළින් හඳුනා ගත් විවිධ ක්‍රියාකාරකම් පාදකව අභ්‍යන්තර නියාමනය හා වාර්තාකරණය ශක්තිමත් කිරිමටත් එමගින් බාහිර නියාමනයේ දී ලබා ගන්නා ලකුණු අතර පරස්පරතාව අවම කිරිමටත් හැකි වු අතර ගුණාත්මක දර්ශකය පැවති මට්ටමින් ඉහළ අගයක් කරා රැගෙන ඒමටත් හැකි විය. පර්යේෂකයෙක් වශයෙන් කාර්ය මූලික පර්යේෂණයක දී මගේ භූමිකාවත් ප්‍රායෝගිකව නිරතවිම නිසා තත්‍ය ගැටලු හා ප්‍රායෝගික විසඳුම් කෙරෙහි යොමු විමට හැකි විය.

**මුඛ්‍ය පද : පුද්ගලබද්ධතාවය, වාර්තාකරණය**

## 1. හැඳින්වීම

කිසියම් සංවිධානයක් අපේක්ෂිත ඉලක්ක කරා යොමු වන්නේදැයි සොයා බැලීම එම සංවිධානයේ ප්‍රගති පාලනය සඳහා අත්‍යවශ්‍යය වේ. අධ්‍යාපන ක්‍රියාවලියේ අපේක්ෂාවන් නිශ්චිත ඉලක්ක කරා පියමන් කරවීමේ වැදගත් අංගයක් ලෙස ප්‍රගති පාලන ක්‍රමය හැඳින්විය හැකිය.

පාසල් පද්ධතියේ ගනුදෙනුකරුවන් වන පාසල් ප්‍රජාව සතුටට පත් කිරීම හා මානව, භෞතික සම්පත් ඵලදායිව හා කාර්යක්ෂමව භාවිත කිරීමෙන් ගුණාත්මක අධ්‍යාපනයක් හා යහපත් පෞරුෂයෙන් හෙබි පුරවැසියෙක් සමාජයට දයාද කිරීමට නම් සමස්ථ පාසල් පද්ධතිය ප්‍රමිති ක්ෂේත්‍ර පදනම් කර ගත් ඇගයීම් නියාමන යාන්ත්‍රණයක් මගින් සංවර්ධනය කළ යුතුය. එමෙන්ම පාසල් ඇගයීම් ක්‍රියාවලිය මනා ප්‍රතිපත්තියක්, සංවිධානයක් හා මෙහෙයවීමක් මෙන්ම සංවර්ධනයට නැඹුරු වූ ආකල්ප පදනම් කර ගත් ක්‍රියාවලියක් විය යුතුය. ගුණාත්මක අධ්‍යාපනයක් යන්න යථාර්ථයක් බවට පත් කර ගැනීමේදි පාසල්වල කළමනාකරණ ක්‍රියාවලියේ ගුණාත්මක තත්ත්වය තහවුරු කිරීම අත්‍යවශ්‍ය වේ.

උක්ත තත්ත්වය තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියේ විවිධ ඇගයීම් ක්‍රම භාවිත වූ අතර ඒ පිළිබඳ විමසා බැලීමේ දි 1980 දශකයට එහා ගිය අතීතයක් ඊට පවතින මුත් ඒවා බොහෝමයක් කඩා පැනීම් වැනි තත්ත්වයන් වූ අතර එහි දී විද්‍යාලයේ අඩුපාඩු සොයා බැලීම් හා චෝදනා කිරීම් වලින් පමණක් යුක්ත විය. එවකට එම කාර්යය සඳහා භාවිත කරන ලද්දේ 'අධීක්ෂණය' යන වචනය වූ අතර ශ්‍රී ලංකාවේ පාසල් හා වෙනත් අධ්‍යාපන ආයතන අධීක්ෂණයේ දි ළඟා කර ගැනීමට උත්සාහ කළ යුතු අපේක්ෂණ, අධීක්ෂකවරයෙකු සතු විය යුතු ලක්ෂණ හා එබඳු වැඩසටහනක තිබිය යුතු මූලික අවශ්‍යතා පිළිබඳ සවිස්තර විග්‍රහයක් 'පාසල් හා අධ්‍යාපනයට සම්බන්ධ වෙනත් ආයතන පිළිබඳ අධීක්ෂණ වැඩපිළිවෙල' මැයින් අංක 17/19 දරණ අධ්‍යාපන අමාත්‍යංශ චක්‍රලේඛණයෙහි විග්‍රහ කර ඇත.

යටත්විජිත සමයේ දි පාසල් අධීක්ෂණය සඳහා යොමු වූයේ පාසල් පරීක්ෂක ලෙස සඳහන් වූ තනතුරක් මගින් වන අතර ඔවුන්ගේ හැසිරීම, පටු ආකල්ප මත අධීක්ෂණය යන්න වැරදි ලෙස අර්ථකතනය කර ඇති අතර එය හුදු පාසල් සංවර්ධනයෙන් පිට පැන්නුමක් ව ගුරුවරුන් විසින් ප්‍රතික්ෂේපයට භාජනය වූ වචනයකි.

පාසල් අධීක්ෂණයට පුළුල් අර්ථයක් දෙමින් එය උපදේශනාත්මක ක්‍රියාවලියක් බවට පත් කරමින් 1994 වර්ෂයේ දි අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යංශය මගින් 'පාසල් අධීක්ෂණය සඳහා උපදෙස් සංග්‍රහය' නිකුත් කර ඇත. එමගින් අධීක්ෂණයේ අවශ්‍යතාව, අරමුණු , අධීක්ෂණයට භාජනය විය යුතු අංග, අධීක්ෂකවරුන්ගේ භූමිකාව ආදිය පිළිබඳ විග්‍රහත්මකව දක්වා ඇත.

2001 වර්ෂයේ සිට මෙම තත්ත්වය වෙනස් කරමින් නිර්ණායක මූලික ඇගයීම් ක්‍රමයක් හඳුන්වා දී ඇත. එමගින් පුද්ගලබද්ධතාව අවම කර ගනිමින් සමස්ථ පාසල් පද්ධතියම නිශ්චිත නිර්ණායක මත ඇගයීමට ලක් කිරීමට අපේක්ෂිතය. මෙම තත්ත්වයද වරින් වර සංශෝධනයට ලක්ව 2015 දි ලංකාවේ අධ්‍යාපනය නව සංස්කෘතියක් මගින් ප්‍රමිතිකරණයට උත්සහ ගෙන ඇත.

2014 වර්ෂයේදි අධ්‍යාපන අමාත්‍යංශය මගින් නිකුත් කළ පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක බව තහවුරුව සඳහා වු ඇගයිම් ක්‍රියාවලිය ' අපේ පාසල කෙතරම් ගුණාත්මකද? ' මැයින් වන අත්පොත මගින් පාසල් ඇගයිම් සිදු කිරිමේදි පහත සඳහන් ක්ෂෙත්‍ර ඔස්සේ සමස්ථ පාසල එකවර අනාවරණය කර ගැනිමට උත්සහ කර ඇත.

- ශිෂ්‍ය සාධනය
- ඉගනුම ඉගැන්විම හා ඇගයිම
- විධිමත් විෂයමාලා කළමනාකරණය
- විෂය සමගාමි කටයුතු
- ශිෂ්‍ය සුභසාධනය
- නායකත්වය හා කළමනාකරණය
- භෞතික සම්පත් කළමනාකරණය
- පාසල හා ප්‍රජාව

ඉහත සඳහන් ආකාරයට ඇගයිම් ක්ෂේත්‍ර 08 ක් නිර්ණායක 60ක් දර්ශක 210ක් ඔස්සේ පාසල නියාමනය කරන අතර ගුණාත්මක තත්ත්වය තහවුරු කිරිම සඳහා ප්‍රශ්න 40කින් ද යුක්ත වේ. ඉහත සඳහන් දර්ශක අනුව පාසල ඇගයිමට ලක් කර පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශක School Education Quality Index (SEQI) අගයක් පාසලට ලබා දෙන අතර වර්ෂ අවසානයේ ශ්‍රේණි ගත කිරිමෙන් සමස්ත පාසල් පද්ධතිය තුළ ඒ ඒ පාසලෙහි පවත්නා තත්ත්වය අධ්‍යාපන අමාත්‍යංශය මගින් නිකුත් කරනු ලබන ගුණාත්මක පාසල් අධ්‍යාපනය පිළිබඳ වන වාර්ෂික වාර්තාව වන Annual Report on Quality Assurance in School Education මගින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වාර්ෂිකව පාසල් පද්ධතියේ සිදු කරනු ලබන පාසල් ඇගයීම් ලකුණු ප්‍රකාශයට පත් විමේදි පද්ධතියේ ඒ සම්බන්ධයෙන් පවතින මතවාද වෙනස් වු අතර පාසල් ද ඇගයිම් ක්‍රමවේදයන්ට අනුහුරු වන්නට විය. පාසල් ඇගයිම් අපේක්ෂා කරන්නට විය. එම නිසා පාසල් බාහිර නියාමනය ක්‍රමවත්ව සිදු වේ. පාසල් බාහිර ඇගයිමට සුදානම් වන අතර උප පළාතේ ඒ සඳහා පළාත් දෙපාර්තුමේන්තුවේ ප්‍රධානත්වයෙන් විධිමත් නියාමන සැලැස්මක් ද සකස් කරනු ලැබේ. නමුත් බාහිර ඇගයිම් වලදි විදුහල්පති හා ගුරු මණ්ඩලය ඇගයිම් පිළිබඳ දක්වන අවධානය හා කැප කිරිම මත පාසලට හිමි වන ගුණාත්මක දර්ශක අගය තීරණය වුවත් අභ්‍යන්තර ඇගයිම පිළිබඳ දක්වන අවධානය ප්‍රමාණවත් නොවන බවත් නිරික්ෂණය වේ.

කලාපයේ පාසල් අතුරින් ගුණාත්මක දර්ශකය අඩු පාසලක් තෝරා ගෙන පවතින තත්ත්වය වෙනස් කර වැඩි දියුණු කළ යුතුයැයි අධ්‍යාපන අමාත්‍යංශයේ ප්‍රමිති හා කළමනාකරණ ශාඛාවේ තිරණයක් මත 2018 බදුල්ල කලාපයේ ප්‍රමිති හා කළමනාකරණ භාර නිළධාරියා වශයෙන් මා හට කාර්ය මූලික පර්යේෂණයක් සිදු කිරිමට අවස්ථාව හිමි විය. ඒ අනුව 2018 වර්ෂයේ අධ්‍යාපන අමාත්‍යංශයේ ගුණාත්මක පාසල් අධ්‍යාපනය පිළිබඳ වාර්ෂික වාර්තාවට අනුව පාසල් ගුණාත්මක දර්ශකය 55ට අඩු පාසල් 26කින් එක් පාසලක් තෝරාගෙන එහි අභ්‍යන්තර ඇගයිම හා වාර්තාකරණය ශක්තිමත් කිරිම මගින් පාසලේ ගුණාත්මක දර්ශකය ඉහළ නැංවිම සඳහා වු කාර්ය මූලික පර්යේෂණය සිදු කිරිමට තිරණය කළෙමි.

පාසල් 26ක් අතුරින් එම පාසල තෝරා ගැනිමට පහත සඳහන් හේතුන් බලපාන ලදී.

* එය බදුල්ල කලාප කාර්යාලයට අයත් ජාතික පාසල් 6න් එකක් වීම
* ළඟම පාසල හොඳම පාසල සංකල්පය යටතේ සංවර්ධනය වන පාසලක් වීම
* දහතුන් වසරක සහතික කළ අධ්‍යාපනය යටතේ සංවර්ධනය වන පාසලක් වීම
* සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය යටතට ගැනෙන පාසලක් වීම
* නගරාශ්‍රිත හා කලාපයට ආසන්නයේ පිහිටා තිබිම නිසා මැදිහත් වීමේ ක්‍රියාවලියට පහසු වීම
* අවශ්‍ය මානව හා භෞතික සම්පත් නොඅඩුව පවත්නා පාසලක් වීම
* 1 සිට 13 වසර දක්වා පංති පැවැත්වෙන 1AB පාසලක් වීම

මෙම කාර්ය මූලික පර්යේෂණය සිදු කිරීමෙන් පාසලේ ගුණාත්මක අධ්‍යාපන දර්ශකය අඩු විමට බලපානු ලබන හේතු සොයා බැලිම , හඳුනා ගත් හේතු සඳහා සහභාගිත්ව කළමනාකරණය තුළ සිට මැදිහත් විමෙන් ගැටළු අවම කිරිම, පාසලේ අධ්‍යාපන ගුණාත්මක දර්ශකය ඉහළ අගයකට ගෙන ඒම මගේ අපේක්ෂාව විය.

## 2. පසුබිම් තොරතුරු

මා තෝරා ගත් පාසල 1 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා පංති පැවැත්වෙන ශිෂ්‍ය සංඛ්‍යාව 1289ක් වුවකි . අධ්‍යයන කාර්ය මණ්ඩලය 114 ක් වන අතර අනධ්‍යයන කාර්ය මණ්ඩලය 15කි. නියෝජ්‍ය හා සහකාර විදුහල්පතිවරු 05 ක් සිටින අතර අංශ ප්‍රධානින් 04කි. විද්‍යාලයේ ඇගයිම් භාර ගුරුවරයෙක් නම් කර ඇති අතර ප්‍රමිති ක්ෂේත්‍ර 8ට අදාළ ව ගුරු මණ්ඩලය බෙදා දැනුවත් කර ඇත.

පාසලේ අභ්‍යන්තර නියාමනය සිදු කිරිම උපදෙස් සංග්‍රහයට අනුව සිදු කිරීමට පාසල උත්සහ ගෙන තිබුණ ද අභ්‍යන්තර හා බාහිර නියාමනයේ දී පරස්පරතාවයන් මතු වූ අතර එසේ විමට හේතු ලෙස මම පහත සඳහන් කරුණු නිරික්ෂණය කළෙමි.

* අභ්‍යන්තර නියාමනයේ දී නිසි අවබෝධයකින් තොරව ලකුණු ප්‍රදානය නිසා තත්‍ය තත්ත්වයට වඩා අධි තක්සේරුවක් පාසල පිළිබඳ අදාළ පාසල් ප්‍රජාව තුළ පැවතීම
* ඇගයිම් ක්ෂේත්‍ර වලට අදාළ ගොනු නිසි පරිදි නඩත්තු නොවිම හා ක්‍රියාකාරකම් තහවුරු කිරිම සාක්ෂි සහිතව ගොනු කර නොතිබීම
* ඇගයිම් ක්‍රියාවලිය සම්බන්ධයෙන් ගුරුවරුන් තුළ ඇති අවබෝධයේ මඳ කම හා අඩු උනන්දුව
* නිසි නියාමනය හා පසු විපරම නොමැති වීම
* පාසල සිදු කරනු ලබන කාර්යයන් පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණයක නොයෙදිම හා ඒ සඳහා කාලය නොයෙදවිම මෙන්ම ධනාත්මකව ප්‍රත්‍යවේක්ෂණ ක්‍රියාවලිය පිළිබඳ නොදැකීම
* එකිනෙකා අතර අන්තර් සම්බන්ධතාවයක් නොවීම

2018 වර්ෂයේ අධ්‍යාපන අමාත්‍යංශය නිකුත් කළ ගුණාත්මක පාසල් අධ්‍යාපනය පිළිබඳ වන වාර්ෂික වාර්තාවට අනුව පර්යේෂණය සඳහා මා තෝරා ගත් පාසලේ පාසල් ගුණාත්මක දර්ශකය 54%කි.

මා සිදුකළ කාර්ය මූලික පර්යේෂණය අදියර දෙකකින් සමන්විත විය.

- **නාභිගතව කරුණු සොයා බැලීමේ අවධිය**

ඒ සඳහා මා සිදු කළ සම්මුඛ සාකච්ඡා හා සෘජු හා වක්‍ර නිරීක්ෂණ මගින් මම හඳුනා ගත් කරුණු වන්නේ මා ඉහතින් සඳහන් කළ ඇගයීම් ලකුණු අතර පරස්පරතාවට හේතු ලෙස දැක්වූ කරුණු ය. එනම් වාර්තාකරණයේ පවතින දුබලතා, අවබෝධයේ පවතින අඩුලුහුඬුතා, උනන්දුවෙහි පවතින ඌණතාව එම දත්ත ඇසුරින් මා හට හඳුනා ගත හැකි විය.

- **මැදිහත් වීමේ අවධිය**

මා හඳුනා ගත් කරුණු අවම කිරීමෙන් පාසලේ ගුණාත්මක දර්ශකය ඉහළ නැංවිය හැකි බව මා හට අවබෝධ වූ බැවින් මාගේ පළමු මැදිහත් වීම ලෙස ඇගයීම් දර්ශක හා ලකුණු ලබා ගත හැකි ආකාරය පිළිබඳ අවබෝධය පුළුල් කිරීමත්, ඒ සඳහා මැදිහත් වීමත් අභ්‍යන්තර ඇගයීම් ගොනු යාවත්කාලීන කිරීම ප්‍රත්‍යාවේක්ෂණ ක්‍රියාවලියෙහි යෙදීම හා පසුවිපරම සිදුකිරීම ආදිය සඳහා මැදිහත් වුණෙමි.

ඉහත තත්ත්වය මත පාසල වෙනස් කිරීමට හා පාසල් ගුණාත්මක දර්ශකය ඉහළ නැංවීමට මට හැකි විය. කාර්ය මූලික පර්යේෂණයක් සිදු කරන ආකාරය පිළිබඳ මා හට අවබෝධ වූ අතර ප්‍රායෝගිකව පාසලේ පවතින තත්ත්වයන් පිළිබඳවත් මැදිහත් වීම හා පාලනය පිළිබඳ මාගේ පැවති අවබෝධය පුළුල් වූ අතර පර්යේෂකයෙක් වශයෙන් මගේ භූමිකාව සංවර්ධනය විය.

## 3. සාහිත්‍ය විමර්ශනය

මගේ කාර්ය මූලික පර්යේෂණය වන්නේ පාසල් ගුණාත්මක දර්ශකය අඩු පාසලක එය වර්ධනය කිරීමට මැදිහත් වීමයි. ගුණාත්මක අධ්‍යාපනයක් උදෙසා පාසලේ ගුණාත්මක දර්ශකය ඉහළ නංවා ගත යුතුය. ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා පාසලේ ඇගයීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක වීම ඉහළ තලයකට නංවා ලීම කළ යුතු අතර එය පාසලේ කාර්ය මණ්ඩලයේ වගකීම වන අතර ඒ සඳහා මා හට දායක විය හැකි අවස්ථාවන් හිදි ඊට මැදිහත් වීම පර්යේෂණයේ අභිප්‍රාය වේ.

පාසලක ගුණාත්මක බව මැන බැලීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් හඳුන්වා දී ඇති ක්‍රමවේදය වන්නේ පාසල පිළිගත් හා හඳුන්වා දී ඇති නිර්ණායක මූලිකව අභ්‍යන්තරව හා බාහිර ඇගයීමට ලක් කිරීමත් ඉන් පාසලට ගුණාත්මක දර්ශකයක් ලබා දීමත්ය. පාසලේ ගුණාත්මක දර්ශකය ඉහළ නංවා ගැනීම සඳහා පාසල ක්ෂේත්‍ර 08ක් ඔස්සේ ලබාදී ඇති නිර්ණායක මත සංවිධාන කළ යුතු අතර ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නිකුත් කර ඇති 'අපේ පාසල කෙතරම් ගුණාත්මක ද' යන උපදෙස් සංග්‍රහය භාවිතයට ගත යුතුය.

මෙරට අධ්‍යාපන පද්ධතිය විවිධ අංශ වල ප්‍රමාණාත්මක වර්ධනයක් වරින් වර අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා රාජ්‍ය ප්‍රතිපත්ති මත සිදුව ඇත. වරින් වර හඳුන්වා දුන් ප්‍රතිපත්ති මත පාසල් වල භෞතික සම්පත් ද මානව සම්පත් ද සැලකිය යුතු මට්ටමකින් වර්ධනයව ඇති අතර මානව සම්පත් වර්ධිත අපේක්ෂණ වලින් ද යුක්තය. නමුත් පාසල් පද්ධතියේ ගුණාත්මකභාවය පිළිබඳ

සැහිමකට පත් විම ගැටලු සහගතව ඇත. ලංකාවේ භුගෝලීය ව්‍යාප්තිය අනුව පාසල් ඉතා පහසු, පහසු, දුෂ්කර, අති දුෂ්කර ලෙසත්, ජනප්‍රිය, ජනප්‍රිය නොවන ලෙසත් වර්ගිකරණය වි ඇත. කෙසේ වුවත් පුර්ණ පෞර්ෂයකින් යුතු පුද්ගලයෙකු නිර්මාණයට නම් සැම පාසලකටම ගුණාත්මක අධ්‍යාප-නයක් අත්‍යවශ්‍යය. අධ්‍යාපනයේ ගුණාත්මකභාවය නියාමනය මගින් සාධනය කර ගත හැකි අතර තව දුරටත් සංවර්ධන ක්‍රියාමාර්ග ඒ ඔස්සේ නිර්මාණය කර ගත හැකිය.

ආයතනයක ගුණාත්මකභාවය සංවර්ධනය සඳහා පවත්නා තත්ත්වය හඳුනා ගැනිමට ඇගයිම හා නියාමන යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරිම අත්‍යවශ්‍යය කරුණකි. ඇගයිමෙන් හඳුනා ගත් අවස්ථා සඳහා සංවර්ධන ක්‍රමවේද අනුගමනය කිරිම මගින් ගනුදෙනුකරුවා සතුටු කිරිමත් මානව හා භෞතික සම්පත් ඵලදායිව පවත්වා ගෙන යාමටත් අවස්ථාව හිමි වේ. ඒ අනුව සමස්ථ පාසල් පද්ධතිය ඇගයිමට ලක් කිරිමට යෝජනා පැන නැගුණු අතර ඒවා සපත කරමින් උපදෙස් සංග්‍රහයන්, චක්‍රලේඛයන් අධ්‍යාපන පද්ධතියට නිකුත් විය. 1994 වර්ෂයේ දි අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යංශය මගින් නිකුත් කරන ලද 'පාසල් අධික්ෂණය සඳහා උපදෙස් සංග්‍රහය' හි එවකට අධ්‍යාපන ලේකම් වු එන්.වී.කේ.කේ.වේරගොඩ මයා ප්‍රකාශයක් නිකුත් කරමින් දක්වා ඇත්තේ 'අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සඳහා කාලින අවශ්‍යතාවක් හා ඉතා වැදගත් අංශයක් ලෙස සැලකිය හැකි පාසල් අධික්ෂණය මනා ප්‍රතිපත්තියක්, සංවිධානයක් හා මෙහෙයවිමක් මෙන්ම සංවර්ධනයට නැඹුරු වු ආකල්ප පදනම් කර ගත් ක්‍රියාවලියක් විය යුතුය ' ලෙසයි. ඒ අනුව එම උපදෙස් සංග්‍රහය තුළ පාසලක නියාමනය විය යුතු අංශ, අධික්ෂණ නිලධාරින්, ක්‍රමවේද පිළිබඳව විස්තරාත්මකව දක්වා ඇත. සම්පත් ඵලදායිව භාවිත කිරිම මගින් අධ්‍යාපනයේ ගණුදෙනුකරුවන් වන ගුරු සිසු හා පාසල් ප්‍රජාව සතුටින් පවත්වා ගැනිමට මග පෙන්වා ඇත. එමෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක බව සංවර්ධනයේ කාලින අවශ්‍යතාවයක් ලෙස පිළිගෙන ඇත. මෙසේ උපදෙස් සංග්‍රහයන් නිකුත් කිරිමේ මුලික අරමුණ වන්නේ භුගෝලීය විවිධත්වය කුමනාකාරයෙන් වුවත් සමස්ථ පාසල් පද්ධතිය ඒකාකාරව ගුණාත්මකව සංවර්ධනය කිරිම ය.

1986 දි අධ්‍යාපන අමාත්‍යංශයේ සැලසුම් හා කළමනාකරණ සංවර්ධන අංශය මගින් නිකුත් කර ඇති දෙවනි හා තෙවැනි ශ්‍රේණි සඳහා විදුහල්පති අත්පොත තුළ 'අධික්ෂණයෙන් බලාපොරොත්තු වන්-න් අඩුපාඩු සෙවිම, පරික්ෂා කිරිම හෝ දඬුවම් දිම නොවේ' ලෙස සටහන් කර ඇත. ඉන් පැහැදිලි වන්නේ පද්ධතියට හඳුන්වා දුන් අධික්ෂණ ක්‍රමවේදය පාසල් වල අඩුපාඩු සෙවිමක් වි ඇති බවය. තවද එහි වැඩි දුරටත් සඳහන් වන්නේ අධික්ෂණය නිර්මාණාත්මක, මිශ්‍ර, සාමුහික ප්‍රයත්නයක් බවත් පාසල අධික්ෂණය මට්ටම් දෙකක දී, එනම් පාසල් කළමනාකරණ ක්‍රියාවලිය සාර්ථක කිරිමට අවශ්‍ය ආයතනයක් ලෙස හා පංති කාමර ඉගෙනුම් ඉගැන්විම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනිම ලෙස දෙයාකාරකින්ම ක්‍රියාත්මක විය යුතු බවයි.

ගුණසේකර, (2000) සාර්ථක ගුරුවරයෙක් හා ඵලදායි විදුහල්පතිවරයෙක් විමට' යන පොතට අනුව ප්‍රමිති හෝ ක්ෂේත්‍ර ලෙස බෙදා වෙන් නොකළද ඉහතින් සඳහන් කළ කළමනාකරණ ක්‍රියාවලිය හා ඉගෙනුම් ඉගැන්විම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනිමට ගුරුවයෙක් ලෙසත් විදුහල්පතිවරයෙක් ලෙසත් ක්‍රියාත්මක කළ හැකි ක්‍රමවේද දක්වා ඇත. එම ක්ෂේත්‍ර දෙක සංවර්ධනය කිරිම පාසලක අත්‍යවශ්‍ය කරුණක් බව තහවුරු වේ.

ඒ අනුව පාසල් පද්ධතිය පුළුල් දැක්මක් සහිතව සියලුම වැඩසටහන් හා පාසල් සැලසුම් කිරීමටත් මෙන්ම පොදු ප්‍රමිතියක් අනුව ක්‍රියාත්මක කිරීම අධ්‍යාපන අමාත්‍යංශය අරමුණු කර ගත් බැවින් සමස්ථ පාසල එකවර ඇගයීම සඳහා නිර්ණායක මූලික ඇගයීම් ක්‍රමවේදයක් 2000 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ. ඒ අනුව ඉතා සංකීර්ණ ආයතනයක් වන පාසල ඇගයීම් පහසුව සලකා අද වන විට ක්ෂේත්‍ර 08ක් නිර්ණායක ඔස්සේ ගොනු කර ඇත. ඉන් අපේක්ෂා කරනුයේ සමස්ථ පාසල් පද්ධතියම එකම ආකාරයකින් සංවර්ධනය කිරීමයි. අධ්‍යාපන අමාත්‍යංශය මගින් 2010 දී හඳුන්වා දී ඇති පාසල් අධ්‍යාපන ක්‍රියාවලියේ ගුණාත්මක සංවර්ධනය 111 ජාතික අධ්‍යාපන ප්‍රමිති මාර්ගෝපදේශය හා ගුරු උපදෙශක නිපුණතා නම් අත්පොතෙහි 'මෙම එක් එක් ක්ෂේත්‍රය යටතේ ප්‍රමිතීන්ද ඒ හා බද්ධ වූ ප්‍රමිති මට්ටම් අනුව සම්බන්ධ දර්ශකද සකස් කර ඇත. එම දර්ශක යටතේ ඇති නිර්ණායක කෙරෙහි අවධානය යොමු කරමින් එක් එක් දර්ශකයට උපරිම වශයෙන් අයත් ලකුණු 05න් හිමි විය යුතු ලකුණු ප්‍රමාණය තීර්ණය විය යුතුය. ඒ අනුව එක් එක් ප්‍රමිතිය යටතේ පාසලේ ඒ ඒ අංශවලට හිමි වන ගුණාත්මක මට්ටම හෝ තත්ත්වය තීරණය කරනු ලැබේ ; මෙලෙස සමස්ථ පාසල් පද්ධතිය දර්ශක පාදකව ලකුණු ප්‍රදානය කර සමස්ථය තරා කිරීමට ලක් කිරීමට උත්සහ කර ඇත.

2009 වර්ෂයේ සිට පාසල ස්වයංව ඇගයීමත් එය බලවත්ත කිරීමටත් උත්සහ ගත් අතර පාසල් මට්ටමින් ඇගයීම් සැලසුම් සකස් කිරීම කමිටු පිහිටු වීම හා පාසලේ ප්‍රබලතා මෙන්ම ගැටලු හඳුනා ගැනීමට මග පාදන ලදි. නමුත් පාසල් පද්ධතිය තුළ මෙය බලාපොරොත්තු වූ මට්ටමින් ස්ථාපනය කිරීමට අපොහොසත් විය.

තත්ත්වය මෙසේ පවතිද්දී පාසලෙහි ගුණාත්මක සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම හා නව ඇගයීම් සංස්කෘතියක් ස්ථාපනය කිරීමේ අරමුණින් 2015 දී නිර්ණායක මූලික ඇගයීම් ක්‍රමය සංවර්ධනය කර හඳුන්වා දෙන ලදි. එහිදි තත්ත්ව සහතිකකරණ සංකල්පය ඔස්සේ ඒ ඒ පාසල්වල ගුණාත්මකභාවය තහවුරු කිරීමත් පාසල් වල අභ්‍යන්තර හා බාහිර නියාමනය ශක්තිමත් කිරීමත් අරමුණු විය. ඒ අනුව ක්ෂෙත්‍ර 08ක් ප්‍රමිති 10ක් නිර්ණායක 60ක් හා දර්ශක 210ක් ඔස්සේ පාසල නියාමනය කරන අතර ගුණාත්මක තත්ත්වය තහවුරු කිරීම සඳහා ප්‍රශ්න 40කින්ද සමන්විතය වූ උපදෙස් සංග්‍රහයක් හඳුන්වා දී ඇත. තව ද පාසල ඇගයීමට ලක් කර පාසල සඳහා ගුණාත්මක දර්ශකයක් (SEQI -School Education Quality Index) ලබා දීමත් වර්ෂාවසානයේ ශ්‍රේණිගත කිරීමත් පාසලෙහි තත්ත්වය පිළිබඳ වාර්තා තබා ගැනීමත් නව ක්‍රමවේදය ඔස්සේ අත්‍යවශ්‍යය විය.

'මෙවැනි ලකුණු පරිමාණයකින් යුක්තව ඇගයීම් වාර්තාවක් වාර්ෂිකව පවත්වා ගැනීම මගින් පාසලේ ගුණාත්මක තත්ත්වය තහවුරු වී තිබේද නැද්ද යන්න පිළිබඳ ඇගයීම්කරුවන්ට, කළමණාකරුවන්ට, ගුරුවරුන්ට හා පාසල් ප්‍රජාවට දැන ගත හැකි වේ. එසේම පාසලට සම්පත් සපයන සැපයුම්කරුවන්ට නිළධාරින්ට හා පුහුණුකරුවන්ට ද පාසලේ ගුණාත්මක තත්ත්වය වර්ධනයට මෙම තොරතුරු උපකාරි කර ගත හැකිය.' ලෙස අධ්‍යාපන අමාත්‍යංශය මගින් නිකුත් කර ඇති පාසල් අධ්‍යාපන ක්‍රියාවලියේ ගුණාත්මක සංවර්ධනය 111 ජාතික අධ්‍යාපන ඇගයීම් සම්බන්ධ ව මාර්ගෝපදේශය හා ගුරු උපදේශක නිපුණතා අත්පොතෙහි දක්වා ඇත.

පාසල ළඟා කර ගත් ගුණාත්මක දර්ශකය පවත්වා ගැනීම ඉහළ නංවා ගැනීම පාසල් කාර්ය මණ්ඩලයේත් ප්‍රජාවගේත් වගකීම වන අතර නිර්මාණශීලීත්වය , තීර්ණ ගැනීමේ ප්‍රබලත්වය, සාමුහකත්වය, ධනාත්මක ආකල්ප මත අගය වර්ධනය කර ගැනීම අපහසු නොවේ.

පාසල් පද්ධතියේ මෙම තත්ත්වය ස්වයංව වර්ධනය කර ගත් පාසල් තිබුනද බහුතරය සාමාන්‍ය 'හොදයි' යන මට්ටම්වල වූ අතර එතරම් ගැඹුරු අයුරකින් ඇගයීම් ක්‍රියාවලිය පාසල්වල ක්‍රියාත්මක වන බව හඳුනා ගැනීම අපහසු විය .

## 4. පර්යේෂණයේ අරමුණු

- තෝරා ගත් පර්යේෂිත පාසලෙහි ගුණාත්මක දර්ශකය 54%ක් වැනි අගයක රැඳී පැවතීමට හේතු සොයා බැලීම
- හදුනාගත් හේතු සංවර්ධනයට ගත හැකි ක්‍රියාමාර්ග සොයා බැලීම
- සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීමට මැදිහත් වීම හා ක්‍රමවේද පිළිබඳ සොයා බැලීම
- එම ක්‍රමවේද ඔස්සේ ගුණාත්මක දර්ශකය වර්ධනය වන්නේදැයි සොයා බැලීම
- මතුවන ගැටළු සඳහා පාසල් පාදකව විසඳුම් සොයා ගැනීමට හැකිදැයි සොයා බැලීම

## 5. සහභාගිවන්නන් හෙවත් පාසල් ව්‍යවහාරිකයන්

- පාසලේ විදුහල්පති
- නියෝජ්‍ය විදුහල්පතිවරු පස්දෙනා
- ඇගයීම්භාර ගුරුවරයා
- එක් එක් ඇගයීම් ක්ෂේත්‍ර භාරකාරිත්වය දරන ගුරුවරු අට දෙනා
- පාසල් සංවර්ධන විධායක කමිටු සාමාජිකයන්
- සහභාගි වීමට කැමැත්ත ඇති මෙන්ම අවකාශය මත ගුරුවරු තෝරා ගැනුණි.

## 6. පර්යේෂණ ක්‍රමවේදය

පර්යේෂණය සිදු කිරීමට ප්‍රථම මම පාසලට ගොස් විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පතිවරු, ඇගයීම් භාර ගුරුභවතුන් සමග පාසලේ ගුණාත්මක දර්ශකය අභ්‍යන්තර හා බාහිර නියාමනයේදි වෙනස් වීම් පිළිබඳ සාකච්ජා කළ අතර පවතින වර්තමාන තත්ත්වය පැහැදිලි කර ගනු සඳහා සහභාගිත්ව නිරීක්ෂණ , අවිධිමත් සම්මුඛ සාකච්ජා හා ලේඛණ විග්‍රහ කර බැලුවෙමි. ඒ සඳහා මා ඉහත සඳහන් පාර්ශවයන් සම්බන්ධ කර ගතිමි. මූලික වශයෙන් පහත සඳහන් පරිදි ආසන්නතම ඇගයීමෙහි ලකුණු ප්‍රදානය වී තිබුණි.

වගු අංක 01 - පාසලේ ඒ ඒ ඇගයීම් ක්ෂේත්‍ර සඳහා ලබා ගත් අභ්‍යන්තර හා බාහිර ඇගයීම් ලකුණු

| | ඇගයීම් ක්ෂේත්‍රය | අභ්‍යන්තර ඇගයීම් ලකුණු | බාහිර ඇගයීම් ලකුණු |
|---|---|---|---|
| 1 | ශිෂ්‍ය සාධනය | 66 | 61 |
| 2 | ඉගෙනුම ඉගැන්වීම හා ඇගයීම | 75 | 58 |
| 3 | වීධිමත් විෂයමාලා කළමනාකරණය | 87 | 53 |
| 4 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | 66 | 42 |
| 5 | ශිෂ්‍ය සුභසාධනය | 60 | 50 |
| 6 | නායකත්වය හා කළමනාකරණය | 70 | 52 |
| 7 | භෞතික සම්පත් කළමනාකරණය | 75 | 59 |
| 8 | පාසල හා ප්‍රජාව | 84 | 54 |

ඒ අනුව අභ්‍යන්තර හා බාහිර ඇගයීම් ලකුණු අතර සැලකිය යුතු පරස්පරතාවයක් ඇති බවත් ඒ පිළිබඳ පාසලේ අවධානයක් යොමු වී නොතිබුණු බවත් දක්නට ලැබුණි. තවද මා ඉහත සඳහන් කළ මෙම පර්යේෂණය සඳහා සහභාගි වන පිරිස සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡා හා භාවිත කළ ප්‍රශ්නාවලිය මගින් පහත සඳහන් තොරතුරු අනාවරණය විය.

වගු අංක 02 - අනාවරණය වු කරුණු පිළිබඳ සංඛ්‍යාත්මක විග්‍රහය

| | හඳුනා ගත් හේතු | සහභාගි වු සංඛ්‍යාව | එකග වු සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | නිර්ණායක සඳහා උපරිම ලකුණක් ලබා ගැනීමට තිබිය යුතු තත්ත්වයන් පිළිබඳ නිවැරදි අවබෝධයක් නොවීම | 14 | 11 |
| 2 | ගොනු ගත කිරීමේ දි පාසලේ සත්‍ය වශයෙන්ම සිදු වු සියල්ල නිසි පරිදි සාක්ෂි සහිතව ගොනු වී නොමැති බව | 14 | 8 |
| 3 | පාසල තුළ ඔවුනොවුන් අතර අන්තර් සම්බන්ධතාවයන්ගේ දුබලතා පවතින බව | 14 | 9 |
| 4 | සිදු කරනු ලබන ක්‍රියාකාරකම් පිළිබඳ පසුවිපරම් සිදු කර නොමැති බව | 14 | 12 |
| 5 | ඇගයීම් සම්බන්ධයෙන් ගුරුවරුන් අතර ධනාත්මක සිතා බැලීමක් නො මැති බව | 14 | 6 |

මෙම කරුණු පිළිබඳ සොයා බැලීම සඳහා පාසලට යාමද මැදිහත් වීමක් ලෙස මම උපකල්පනය කළෙමි. ඊට අමතරව අධ්‍යාපන අමාත්‍යංශය මගින් වාර්ෂිකව ගුණාත්මක පාසල් අධ්‍යාපනය සම්බන්ධයෙන් වාර්තාවක් නිකුත් කරන බව හා එහිදි තම පාසල ශ්‍රේණි ගත වීමක්ද ඕනෑම අයෙකුට තම පාසල පිළිබඳ එම දත්ත ලබාගත හැකි බව දැන සිටියේ විදුහල්පති හා ඇගයීම් භාර ගුරුවරයා පමණක් විය. ඒ අනුව පාසල දැනට පවතින තත්ත්වය සතුටුදායක නොවන බව ඔවුනට අවබෝධ වුයේ මගේ පැහැදිලි කිරීමත් සමග බව ප්‍රකාශ කර සිටියහ.

විද්‍යාලය අයත් කොට්ඨාසයේ කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ ලෙස වැඩ බැලීමත්, පාසල් සංවර්ධන කමිටුවේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ බලය පවරන ලද නිළධාරියා ලෙස කටයුතු කිරීම නිසාත් කාර්යාලයට ආසන්නයේ පිහිටා තිබීම නිසාත් පාසල සමග නිරන්තර සම්බන්ධ වන නිළධාරියෙකු වන මා හට ඇගයීම් ක්‍රියාවලිය සංවර්ධනය සඳහා මැදිහත් වීම අපහසු කරුණක් නොවිය. පාසලේ ගුණාත්මක දර්ශකය ඉහළ නැංවීම සඳහා මා හට මැදිහත් විය හැකි ආකාරය පිළිබද සොයා බැලීමේදී සියලුදෙනාගේ ඉල්ලීම මත ඇගයීම් දර්ශක සඳහා ලකුණු පිරිනමන ආකාරය පිළිබද ඔවුනට ඇති අවබෝධය පුළුල් කර දෙන ලෙස ඉල්ලා සිටි අතර ඒ නිසා ඇගයීම් දර්ශක වෙන වෙනමත් ලකුණු සංවර්ධනය සඳහා පාසල් පාදකව මැදිහත් විය හැකි ආකාර පිළිබඳ පැහැදිලි කළෙමි. මගේ මැදිහත් වීම ඒ ආකාරයෙන් සිදු වූ අතර අඩුපාඩු නිවැරදි කරමින් ගොනු නැවත සකස් කිරීමටත් නැවත අභ්‍යන්තර ඇගයීමක් සිදු කර පාසලේ වත්මන් තත්ත්වය අනාවරණය කර ගැනීමට සියළුදෙනා එකඟත්වය ප්‍රකාශ කළහ. එසේ මගේ මැදිහත් වීම සිදු වෙද්දී අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රමිති හා කළමනාකරණ අංශ ප්‍රධානියාගේ ප්‍රධානත්වයෙන් කලාප හා කොට්ඨාශ තෝරා ගත් නිලධාරි කණ්ඩායමක් මගින් පාසල බාහිර නියාමනයට ලක් විය. නමුත් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලබා දුන් බාහිර ලකුණත්, අභ්‍යන්තර ඇගයීම් ලකුණත්, කලාපිය බාහිර ඇගයීම් ලකුණත් අතර සමානාත්මතාවයක් දක්නට ලැබුනද සැලකිය යුතු වර්ධනයක් මගේ මැදිහත් වීම තුළ හඳුනා ගත නොහැකි විය.

වගු අංක 03 - ඇගයීම් ලකුණු සංසන්දනය සඳහා වූ වගුව

| | ඇගයීම් ක්ෂේත්‍රය | අභ්‍යන්තර ඇගයීම් ලකුණු | කලාපිය බාහිර ඇගයීම් ලකුණු | අමාත්‍යංශ බාහිර ඇගයීම් ලකුණු |
|---|---|---|---|---|
| 1 | ශිෂ්‍ය සාධනය | 66 | 61 | 64 |
| 2 | ඉගෙනුම ඉගැන්වීම හා ඇගයීම | 75 | 58 | 59 |
| 3 | වීධිමත් විෂයමාලා කළමනාකරණය | 87 | 53 | 53 |
| 4 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | 66 | 42 | 54 |
| 5 | ශිෂ්‍ය සුභසාධනය | 60 | 50 | 41 |
| 6 | නායකත්වය හා කළමනාකරණය | 70 | 52 | 58 |
| 7 | භෞතික සම්පත් කළමනාකරණය | 75 | 59 | 63 |
| 8 | පාසල හා ප්‍රජාව | 73 | 64 | 54 |
| 9 | පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය | 59 | 57 | 54 |

එසේ වුවත් මගේ මැදිහත් වීම තුළ පාසලේ සැබෑ තත්ත්වය පාසලට අවබෝධ කරලීමට මා සමත්ව ඇති බව තහවුරු විය. මගේ වැයම තුළ ලකුණු ප්‍රදානය කිරීමේ පවතින පරස්පරතාවය අවම කරලීමට පාසලේ අභ්‍යන්තර ඇගයීම් මණ්ඩලය අවබෝධ කර ගෙන ඇති බව හා ඉදිරි පියවරයන් පිළිබද වැටහීමක් ඇති බවත් ඒ සඳහා ඇති ඉඩ ප්‍රස්ථා අවබෝධ කර ගෙන ඇති බවත් පසක් විය.

තත්ත්වය මෙසේ තිබියදි ජාතික පාසල් ගුරු මාරුවීම් ක්‍රියාත්මක වීම නිසා පාසලේ ගුරු මණ්ඩලයෙන් 1/3 පමණ ප්‍රමාණයක් ස්ථාන මාරු ලැබ පාසලින් ඉවත් වීම නිසා නැවතත් පාසලේ ඇගයීම් කටයුතු සිදුකිරීම පිළිබඳ ගැටළු ඇති වුවත් විදුහල්පති මැදිහත්ව පෙර සම්බන්ධ වූ ගුරුවරුන් මගින් පාසලට නවක ගුරුවරුන් සවිමත් කිරීමේ කාර්ය භාර ගන්නා ලදී.

ඉන් පසු ඇගයීම් ක්‍රියාවලිය සංවර්ධනය කරන්නේ කෙසේද යන්න පිළිබඳ මා ඇතුළු පාසලේ කාර්ය මණ්ඩලය සාකච්ඡා කළ අතර එහිදී ඔවුන් සියළුදෙනාගේ අදහස වූයේ පහත සඳහන් කරුණු පිළිබඳ විශේෂ අවධානය යොමු විය යුතු බවයි.

- ජාතික පාසලක් වන බැවින් ද නගරයේ පිහිටි සියලුම භෞතික පහසුකම් සහිත පාසලක් බැවින් ද 1289ක ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටින පාසලක් වන නිසාත් දෙමාපිය අපේක්ෂණය ගුණාත්මක අධ්‍යාපනයක් නිසාත් ශිෂ්‍ය සාධනය අවම වශයෙන් 75%ක් දක්වා වත් ගෙන ආ යුතු බව
- ඉගෙනුම ඉගැන්වීම හා ඇගයුම පාසලේ පවතින ප්‍රධානතම හා ප්‍රමුඛතම කාර්ය වන අතර ශිෂ්‍ය සාධනය හා සෘජුවම සම්බන්ධ වන නිසාත් ගුණාත්මක අධ්‍යාපනයකදි එයට වැඩි ඉඩ කඩක් වෙන්වන නිසාත් ඉගෙනුම ඉගැන්වීම හා ඇගයුම සංවර්ධනය කල යුතු බව
- ඇගයීම් වලට අදාළ ගොනු විධිමත්ව නඩත්තු කිරීම, පාසලේ සිදුවන කාර්යයන් සාක්ෂි හා තොරතුරු සහිතව ගොනු ගත කිරීම, පසුවිපරම් කිරීම, සාකච්ඡා කිරීම සඳහා අන්තර් සම්බන්ධතා සඳහා අවස්ථා පාසල් වේලාවේ දී හෝ පසුව ඇති කළ යුතු බව

මෙම අවස්ථා තුන සඳහා මුලිකත්වය ලබා දිමෙන් පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය ඉහළ නංවාලිය හැකි බවත් මුලින්ම එම යෝජනා තුන සඳහා අවස්ථාව හිමි විය යුතු බවත් පසුව ක්‍රමයෙන් අනිකුත් ඇගයීම් ක්ෂේත්‍ර සංවර්ධනය කළ හැකි බවත් බහුතරයකගේ අදහස වු බැවින් මා ද ඊට එකඟත්වය පළ කළෙමි.

වාර විභාග ළකුණු පොත් විශ්ලේෂණ අනුව ලකුණු 40ට අඩු ශිෂ්‍යයන් හට ඔවුනට ආවේනික වු ප්‍රතිකාර්ය වැඩසටහන් දියත් කරමින් ඔවුනගේ සාධන මට්ටම සංවර්ධනයට යොමු කිරීම හා එම කටයුතු සඳහා සහය වීම පාසලින් සිදුවිය යුතු ප්‍රධාන කාර්යක් ලෙස ප්‍රමුඛතාකරණය විය . එහිදි මා පාසලට යෝජනා කලේ සිසුන් අදාළ පංතියේ සිටියදි ඒ ඒ විෂයට ලකුණු 40ට අඩු සිසුන් අදාළ කාලච්ජේදයට පමණක් එක් පංතියකටත් අනිත් සිසුන් එක් පංතියකටත් වශයෙන් බෙදා අධ්‍යයන කටයුතු වලට යොමු කිරීම සුදුසු බවයි. එයට එකඟව ඒ සඳහා සුදානම් වුවත් කාලසටහන් සකස් කිරීමේ ගැටළුව තදින් මතු වීම නිසා එය අසාර්ථක විය. පසුව පාසලේ යෝජනාව වූයේ ලකුණු මට්ටම් අනුව සිසුන් පංතිවලට වෙන් කිරීම හා ඒ අනුව ගුරුවරු යොමු කිරීමත් ය. ඒ සඳහා පාසල් සංවර්ධන කමිටුවේ අනුමැතියද ලැබුණු බැවින් මා ද ඊට එකඟව කටයුතු කළෙමි. උක්ත තත්ත්වය මත සමාන්තර පංති අතර සිසුන් බෙදා වෙන් කළ අතර ඇතැම් ගුරුවරු තම කැමැත්තෙන්ම දුර්වල සිසුන් සහිත පංති භාර ගත්හ. ඒ සඳහා ඔවුන් සංවර්ධන වැඩසටහන් දියත් කිරීමට සැලසුම් සකස් කළහ. රටේ පැවති කලබලකාරි තත්වය මත සිසු සංවර්ධනය සඳහා යෝජිත සිසු විෂය කඳවුරු, පෙරහුරු ක්‍රියාකාරම්, තරමක් පසුගාමි තත්ත්වයක පැවැතුණද පෙර වර්ෂයන්ට සමගාමිව සිදු කරන ලද වෙනසට සාපේක්ෂව පහත සඳහන් ජයග්‍රහණ පාසලට අත්පත් කර ගැනිමට හැකි වි ඇත.

- වසර 6කට පසුව 2019 වසරේදි ශිෂ්‍යත්ව විභාගයෙන් ඉදිරිපත් වූ සිසුන් 96න් 30ක් කඩඉම් ලකුණ අභිබවා සමත් කිරීමට හැකි විය.
- 13 වසරක වෘත්තිය පාඨමාලාව පවත්වාගෙන යන පාසල් අතුරින් සමස්ත ලංකාවෙන් හොඳම පාසල් වලින් 05 ස්ථානය හිමි කර ගැනීමට හැකි විය.
- අ.පො.ස.(ස.පෙළ) හා අ.පො.ස.(උ.පෙළ) විභාගවල දී පෙර වර්ෂවලට වඩා සාධනිය වෙනසක් බලාපොරොත්තු විය හැකි තත්ත්වයක් ඇගයීම් ලකුණු විශ්ලේෂණ අනුව පැහැදිලි වේ.

ගන්නා ලද දෙවන තීරණයේ දී ගුරු මහත්ම මහත්මින්ගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය සඳහා පාසලේ පෙර සඳහන් කළ අප කණ්ඩායම එක් වී අභ්‍යන්තර අධීක්ෂණය ශක්තිමත් කිරීම සඳහා විධිමත් අභ්‍යන්තර සැලැස්මක් සකස් කළෙමු. සමස්ථ ගුරු මණ්ඩලය 107ක් වූ අතර නියෝජ්‍ය විදුහල්පතිවරු 06 හා ජ්‍යෂ්ඨ ගුරුවරු 04ක් යොදා ඔවුනට ගුරුවරු 107 බෙදා සැලැස්මකට අනුව අධීක්ෂණයට යොමු කළෙමු . තවද අධීක්ෂණ වාර්තා තැබීම සඳහා පොතක් සකස් කළ අතර ගුරුවරයා අධීක්ෂණය කළ පසු වාර්තා එම පොතෙහි සටහන් කළ යුතු අතර නැවත අධීක්ෂණයට ප්‍රථම එම වාර්තාව කියවා බලා ලබා දුන් උපදෙස් අනුව ගුරුවරයා කටයුතු කරනවාද යන්නත් නිරීක්ෂණය කර වාර්තා කළ යුතුයි. ඒ අනුව මාස 4කට පසුව පහත සඳහන් තොරතුරු අනාවරණය වූ අතර ගුරුවරුන්ගෙන් 10%ක ප්‍රමාණයක් වෙනදාට වඩා සූදානමින් පංතිකාමරයට යැවීමට හැකි වූ බව නිරීක්ෂණය විය.

වගු අංක 04 - ගුරුවරුන්ගේ පාඩම ඉගැන්වීම සඳහා සූදානම පිළිබඳ වගුව

| ගුරු සංඛ්‍යාව | වාර සටහන් ලියා ඇති සංඛ්‍යාව | වාර සටහන් යාවත්කාලිනව පවත්වාගෙන යන සංඛ්‍යාව | ඉගනුම් උපකරණ, පැවරුම් භාවිතයෙන් උගන්වන සංඛ්‍යාව | දෛනික සටහන් ලියා සූදානමින් පංති කාමරයට යන සංඛ්‍යාව | වරින් වර දෛනික සටහන් ලියන සංඛ්‍යාව (දින 03ක්) | දෛනික සටහන් නොලියන සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 107 | 107 | 96 | 56 | 45 | 34 | 28 |

ඇගයීම් ක්‍රියාවලියට අදාළ ගොනු යාවත්කාලිනව පවත්වා ගැනීම සඳහා විදුහල්පති සමඟ සාකච්ඡා කර ඔවුනට ඒ සඳහා මසකට වරක් රැස්වීමට අවස්ථාව සලසා දුන් අතර මම ද ඔවුන් හා එක්ව සාක්ෂි සහිතව ගොනු සකස් කිරීමට සහය වුනෙමි. වාර්තා තබා ගන්නා ආකාරය, ඒවා නිවැරදිව ගොනු කිරීම, ඒ අනුව වැඩසටහන් සකස් කිරීම, වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදි ඡායාරූප, වීඩියෝ මෙන්ම ප්‍රත්‍යවේක්ෂණ සටහන් රැස් කිරීම, ගොනු කිරීම පිළිබඳ ඔවුනගේ පැවති අවබෝධය ශක්තිමත් කරමින් ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමට අවස්ථා සම්පාදනය කළෙමි.

මාස 04කට පසුව කරන ලද අභ්‍යන්තර ඇගයීමේදි හා බාහිරව තෝරා ගත් නිළධාරීන් 08 දෙනෙකු සමග කරන ලද බාහිර නියාමනයේදි මගේ මැදිහත් වීම ඵලදායි වී ඇති බව නිරීක්ෂණය විය.

වගු අංක 05 - පාසලේ මාස 04කට පසු ඇගයිම් ලකුණු

| | ඇගයිම් ක්ෂේත්‍රය | අභ්‍යන්තර ඇගයිම් ලකුණු | බාහිර ඇගයිම් ලකුණු |
|---|---|---|---|
| 1 | ශිෂ්‍ය සාධනය | 68 | 65 |
| 2 | ඉගෙනුම ඉගැන්වීම හා ඇගයිම | 70 | 75 |
| 3 | වීධිමත් විෂයමාලා කළමනාකරණය | 61 | 58 |
| 4 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | 50 | 51 |
| 5 | ශිෂ්‍ය සුභසාධනය | 58 | 50 |
| 6 | නායකත්වය හා කළමනාකරණය | 62 | 65 |
| 7 | භෞතික සම්පත් කළමනාකරණය | 71 | 65 |
| 8 | පාසල හා ප්‍රජාව | 74 | 70 |

ඒ අනුව මාස 04කට පසු මගේ මැදිහත් විම ඵලදායි වි ඇති බව නිරික්ෂණය වුන අතර තවදුරටත් ඇගයිම් ක්‍රියාවලිය සංවර්ධනය ඵලදායිව කරගෙන යාම සඳහා මගේ සහයෝගය ඔවුනට අවශ්‍ය බව ප්‍රකාශ විය. ඉදිරියටත් ඉහත ක්‍රියාදාමයන් අනුගමනයටත්, නිර්මාණාත්මකව ඉගෙනුම් පරිසරයක් පාසල තුළ හා පංති කාමර තුළ සකස් කිරිමටත් පාසල විසින් සැලසුම් කරන ලදි. ඉන් ඔවුනගේ උනන්දුව හා පාසල ගුණාත්මකව සංවර්ධනය කිරීමට නිවැරදි මාර්ගයට එළඹ ඇති බව පැහැදිලි විය.

## 7. අනාවරණ

- තම පාසල තුළ ඇගයිම් ක්‍රියාවලිය ගොඩනැගිම නිසා පාසලෙහි ඊට ආවේනික සංස්කෘතියක් සංවර්ධනය වන බවට පැහැදිලිතාවයක් පාසලට නොවිම.
- ඇගයිම් දර්ශක සඳහා ලකුණු පිරිනැම්මේදි ලකුණු ලබා දිමේ දි පැවතිය යුතු තත්ත්වයන් පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොවිම
- පාසලේ සත්‍ය තත්ත්වය අභ්‍යන්තරිකව හඳුනා ගැනිමත් එය සංවර්ධනය කිරිමට පාසල තුළින්ම එකඟතාවයක් ඇති කිරිමේ වටිනාකම පිළිබඳ නිරවුල් බවක් නොතිබිම
- ඇගයිම් සම්බන්ධ ඉදිරි කටයුතුවල නිරතවිමට සාකච්ජා කිරිමට අන්තර් සම්බන්ධතා සංවර්ධනයට අවස්ථා පාසල තුළ නොමැති විම
- වාර්ෂිකව අධ්‍යාපන අමාත්‍යාංශය නිකුත් කරන ගුණාත්මක පාසල් පිළිබඳ වාර්තාව පිළිබද හෝ තම පාසල ශ්‍රේණි ගත විම, එය ප්‍රකාශ විම මෙන්ම ඕනැම පුද්ගලයෙකුට ඒ පිළිබඳ තොරතුරු අන්තර්ජාලය ඔස්සේ ලබා ගත හැකි බව පිළිබඳ අවබෝධයක් නොමැති විම.

## 8. නිගමන

- පාසලක ඇගයීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඹඳ පැහැදිලි ප්‍රක්ෂේපණයන් ඇති අවස්ථාවන්හි දි සමස්ත පාසල ඇගයීමට ලක් කිරීම හා අත්දැකීම් හුවමාරුවට ඉඩ ප්‍රස්ථා ලබා දීම වැදගත් වේ.
- පාසල් ස්වයං ඇගයීම ශක්තිමත් කිරීම හා පාසල තනිව ගොඩනැගීමටත් ආවේනික පාසල් සංස්කෘතියක් සංවර්ධනයට යොමු කළ යුතුය.
- ඇගයීම් සම්බන්ධ නිර්මාණශීලි චින්තනය සංවර්ධනයටත් අන්තර් සම්බන්ධතා සංවර්ධනයටත් පාසල තුළ ඉඩ ප්‍රස්ථා ගොඩනැංවිය යුතුය.
- සෑම අවස්ථාවකදිම තමන් ඇගයීම් ක්‍රියාවලිය සංවර්ධනයට ගත් ක්‍රියාමාර්ග පිළිබඳ පසු විපරම, නියාමනය හා ප්‍රත්‍යවේක්ෂණය කෙරෙහි යොමු කළ යුතුය.

## 9. යෝජනා

- ඇගයීම් දර්ශක සඳහා ලකුණු පිරිනැමීමේ දි එක් එක් ලකුණ සඳහා බර තිබිය යුතු තත්වයන් පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා දීමට නිර්ණායක ඉදිරිපත් කර පුද්ගලබද්ධතාවය අවම කිරීමට යොමු වීම.
- පාසලෙහි ස්වයං ඇගයීම් ශක්තිමත් කිරීම හා පාසලට ආවේනික සංස්කෘතියක් සංවර්ධනයට යොමු කිරීම හා අත්දැකීම් හුවමාරුවට ඉඩ ප්‍රස්ථා ලබා දීම.

## ආශ්‍රිත ග්‍රන්ථ


අධ්‍යාපන අමාත්‍යංශය (1986), දෙවන හා තෙවන ශ්‍රේණි විදුහල් සඳහා විදුහල්පති අත්පොත-සැලසුම් හා කළමනාකරණ සංවර්ධන අංශය, බත්තරමුල්ල ; කොළඹ

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබද අමාත්‍යංශය (1994), පාසල් අධීක්ෂණය සඳහා උපදෙස් සංග්‍රහ " බත්තරමුල්ල ඃ කොළඹ

අධ්‍යාපන අමාත්‍යංශය (2005), පාසල් අධ්‍යාපන ක්‍රීයාවලියේ ගුණාත්මක සංවර්ධනය- අභ්‍යන්තර ඇගයීම් පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය, රජයේ මුද්‍රණාලය, බත්තරමුල්ල; කොළඹ

ගුණසේකර, ඩබ්. (2000), සාර්ථක ගුරුවරයෙක් හා ඵලදායි විදුහල්පතිවරයෙක් වීමට, දීපානි ප්‍රකාශන

අධ්‍යාපන අමාත්‍යංශය (2010), පාසල් අධ්‍යාපන ක්‍රියාවලියේ ගුණාත්මක සංවර්ධනය 111 - ජාතික අධ්‍යාපන ප්‍රමිති මාර්ගෝපදේශය හා ගුරු උපදේශක නිපුණතා, රජයේ මුද්‍රණාලය, බත්තරමුල්ල; කොළඹ

අධ්‍යාපන අමාත්‍යංශය (2014), පාසල් අධ්‍යාපන ක්‍රියාවලියේ ගුණාත්මක තහවුරුව සඳහා වු ඇගයීම් ක්‍රියාවලිය, රජයේ මුද්‍රණාලය, බත්තරමුල්ල; කොළඹ

අධ්‍යාපන අමාත්‍යංශය (2014), ගුණාත්මක ඉගනුම්ඵල සඳහා නායකත්වය ලබා දීම, මානව සම්පත් සංවර්ධන ශාඛාව, රජයේ මුද්‍රණාලය, බත්තරමුල්ල; කොළඹ

# තෝරාගත් පාසල් තුනක 6 ශ්‍රේණියේ සිසුන්ගේ රචනා ලිවීමේ හැකියාව තුළින් ශිෂ්‍ය සාධනය සංවර්ධනය කිරීම

ඩබ්ලිව්. එන්. විජේතුංග (MEd., PGDE)
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන කාර්යාලය, හගුරන්කෙත
0718197730 / wijenilanthi@gmail.com

ආර් .එම් . යූ . කේ . රාජනායක (BA, PGDE)
ගුරු උපදේශක, දෙනුවර අධ්‍යාපන කලාප කාර්යාලය, පිළිමතලාව
070 5920440 / udenirajanayaka@gmail.com

## සංක්ෂිප්තය

පාසල් බාහිර නියාමන ක්‍රියාවලියේ දී ශිෂ්‍ය සාධනය ක්ෂේත්‍රය යටතේ වාර විභාග ලකුණු පරීක්ෂා කිරීමේ දි බොහෝ පාසල්වල 6 ශ්‍රේණියේ දරුවන්ගේ පළමු වාර පරීක්ෂණ ලකුණු ඉතා ම අඩු මට්ටමක පවතින බව දක්නට ලැබුණි. සිසුන්ගේ පිළිතුරුපත් ගෙන පරීක්ෂා කර බැලීමේ දී අනාවරණය වූ සුවිශේෂි කරුණු කිහිපයකි. සියලු විෂයයන් සඳහා අඩු ලකුණක් ලබා ගැනීම, සිංහල විෂය සඳහා අඩු ලකුණක් ලබා ගැනීම, සිංහල විෂයයේ රචනා ප්‍රශ්නය සඳහා අඩු ලකුණක් (ලකුණු 20 න් 4 -6 ක් පමණ ) ලබා ගැනීම, රචනා ප්‍රශ්නයයට ඉතා හොඳ ලකුණක් ලබා ගැනීම සිසුනට ඉතා පහසුවෙන් කළ හැකි දෙයකි. ඒ අනුව අප පාසල් තුනක් තෝරගෙන 'කාර්යමූල පර්යේෂණය' රචනාවේ සාධනීය මට්ටම ඉහළ නැංවීමේ අරමුණෙන් ක්‍රියාත්මක කරන ලදී. රචනා වැඩසටහන ක්‍රියාත්මක කිරීම තුළින් සිංහල විෂයේ මෙන් ම සෙසු විෂයයන්ගේ ද සාධන මට්ටම ඉහළ නැංවීම, අ.පො.ස. සාමාන්‍ය පෙළ. විෂය සාධන මට්ටම ඉහළ නැංවීම, රචනය කෙරෙහි ගුරු සිසු ආකල්ප සංවර්ධනය කිරීම, ගුරුවරුන් හා සිසුන් තුළ ධනාත්මක සිතුවිලි ඇති කිරීම, පුවත්පත් කියවීම, ප්‍රවෘත්තිවලට සවන්දීම, පුස්තකාල පරිහරණය වර්ධනය කිරීමට හැකි විය. පළමුවෙන් ම සිංහල විෂය ඉගැන්වීමේ නිරත ගුරු භවතුන් වැඩ සටහන පිළිබඳ දැනුම්වත් කර විවිධ විෂයයන්ට අදාළ රචනා මාතෘකා 30 ක් හා රචනා සැකිලි 10 ක් සකස් කරන ලදී. සරල මාතෘකාවේ සිට සංකීර්ණ මාතෘකාව දක්වා සතියකට එක් මාතෘකාවක් බැගින් සිසුන්ට ලබා දී රචනා ලියවා වැරදි නිවැරදි කරමින් බලා ලකුණක් ප්‍රදානය කිරීමට ගුරුවරුන් දැනුම්වත් කරන ලදි. බාහිර නියාමන හා සහාය ඉගැන්වීම් ක්‍රියාවලියේදී මෙය නියාමන කාර්යයේ යෙදුණෙමු .ඒකක හා මාසික සඳහා පලමු වාරයට වඩා ඉහල ලකුණක් සිංහල විෂයට ලබාගත් අතර 2 වන 3 වන වාර වලදී සියලු විෂයන්ගේ සාධන මට්ටම ඉහළ නංවා ගැනීමට හැකි විය. ඉදිරි වර්ෂ සඳහා 6 ශ්‍රේණියේ සිට 9 ශ්‍රේණිය දක්වා මෙම රචනා වැඩ සටහන සියලු පාසල් තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන්නෙමු.

**මුඛ්‍ය පද : ශිෂ්‍ය සාධනය, පුස්තකාල පරිහරණය, නියාමනය, සිංහල විෂය, ලකුණු**

## හැඳින්වීම

පාසල් බාහිර නියාමන ක්‍රියාවලියේ ශිෂ්‍ය සාධනය ක්ෂේත්‍රය යටතේ පාසල් වාර විභාග ලකුණු පරීක්ෂා කර බැලීමේ දී 6 ශ්‍රේණියේ සිසුන්ගේ පළමු වාර පරීක්ෂණ ලකුණු ඉතා අඩු මට්ටමක පවතින බව දක්නට ලැබුණි. විෂය අනුව පරීක්ෂා කර බැලීමේ දි සෙසු විෂයන් මෙන් ම සිංහල විෂය සඳහා ද ලබාගෙන ඇත්තේ ඉතා අඩු ලකුණකි . සිංහල විෂය පිළිතුරු පත් ගෙන පරීක්ෂා කිරීමේ දී දක්නට ලැබුණේ රචනා ප්‍රශ්නය සඳහාා (ලකුණු 20 න්) ඉතා අඩු (4 - 6 අතර) ලකුණක් ලබා ගෙන ඇති බවකි. එම රචනා ද ලියා ඇත්තේ කිසිදු උක්ත ආඛ්‍යාත පද ගැළපීමක් නොමැතිව ය. මාතෘකාවට අනුකූල බව, නිර්මාණාත්මක බව, සාරවත් බව එම රචනා තුළ දක්නට නොතිබුණි. .සමස්ත රචනය ද වාක්‍ය තුන හතරකි. මෙම තත්ත්වය සිංහල විෂයේ මෙන් ම සියලු විෂයන්ගේ සාධන මට්ටම කෙරෙහි බලපා ඇත. මෙම ගැටලුව 6 - 11 ශ්‍රේණි දක්වා ඉගෙනුම ලබන සියලු සිසුන්ගේ සාධන මට්ටමට ද අධ්‍යාපන පොදු සහතික පත්‍ර සමාන්‍ය පෙළ විභාග ප්‍රතිඵල කෙරෙහි ද බලපාන්නකි. මෙම ගැටලුවට විසඳුම් සෙවීම සඳහා 6 ශ්‍රේණියේ සිසුන් රචනා ලිවීමට යොමු කිරීමේ සූදානම් පියවරක් ආරම්භ කළ යුතුය යන අරමුණ අපි ගොඩ නගා ගතිමු. ඒ අනුව කලාප කාර්යාලය මැදිහත් වීමෙන් මෙම ගැටලුව ජය ගත හැකි ද යන්නට කාර්යමූල පර්යේෂණයක් ක්‍රියාත්මක කිරීමට අපි ප්‍රයත්න දැරුවෙමු.

## අරමුණ

දෙනුවර අධ්‍යාපන කලාපයේ තෝරාත් පාසල් තුනක හය ශ්‍රේණියේ සිසුන්ගේ රචනා ලිවීමේ නිපුණතාව වැඩි දියුණු කිරීම තුළින් ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නැංවීම .

## සුවිශේෂි අරමුණු

- රචනා ලිවීමට අවශ්‍ය තොරතුරු සිසුන් විසින් ම සොයා ගැනීමට පෙළඹවීම .
- නිවැරැදි අක්ෂර වින්‍යාසය උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය සහිත වාක්‍යය භාවිතයට යොමු කිරීම
- ඒ ඒ විෂයයන්ට අදාළ අමතර පොත්පත් පරිශීලනයට හා පුස්තකාල පරිශීලනයට යොමු කිරීම .
- සිංහල විෂයයේ සාධන මට්ටම ඉහළ නැංවීම
- සෙසු විෂයයන්ගේ සාධන මට්ටම ඉහළ නැංවීම
- දෙනුවර අධ්‍යාපන කලාපයේ අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාග ප්‍රතිඵල ඉහළ නැංවීම

## පර්යේෂණ ප්‍රශ්නය

රචනා ලිවීම ඉගැන්වීම තුළින් හය ශ්‍රේණියේ සිසුන්ගේ සාධන මට්ටම ඉහළ නැංවීමට මැදිහත් වන්නේ කෙසේ ?

## මැදිහත්වීමේ ක්‍රියාවලිය

### පළමු මැදිහත්වීම

තෝරාගත් පාසල් තුනක හය ශ්‍රේණියේ සිසුන්ගේ රචනා ලිවීමේ හැකියාව මැන බැලීම සඳහා "අපේ පාසල" මාතෘකාව යටතේ රචනාවක් ලිවීමට දෙන ලදී. ඒ අනුව මැදිහත් වීමට ප්‍රථම පාසල් තුනෙහි සාධන මට්ටම පහත දැක්වේ.

වගුව : පාසල්වල සිසුන් රචනාව ලියා ඇති ආකාරය ප්‍රමාණාත්මක ලෙස දැක්වීම

| පාසලේ නම | සිසුන් සංඛ්‍යාව | වාක්‍ය 4-5ක් ලියා ඇති සිසුන් සංඛ්‍යාව | වාක්‍ය 2 -3 ක් ලියා ඇති සිසුන් සංඛ්‍යාව | මාතෘකාව පමණක් ලියා ඇති සිසුන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| A | 67 | 07 | 49 | 11 |
| B | 45 | 09 | 28 | 08 |
| C | 63 | 12 | 39 | 13 |

### දෙවන මැදිහත්වීම

මැදිහත්වීම දෙයාකාරයකින් සිදු කරන ලදී.

කලාප මැදිහත්වීම :
1.- power point presantion මගින් පාසල් තුනෙහි ගුරු භවතුන් රචනා වැඩසටහන පිළිබඳව දැනුවත් කිරීම .
2.- ගුරු භවතුන් සමඟ එක් වී ඉතිහාසය, බුද්ධ ධර්මය, විද්‍යාව, පුරවැසි අධ්‍යයනය, සංගීතය, භූගෝලය, සෞඛ්‍යය යන විෂයයන්ට අදාළ වන ලෙස රචනා මාතෘකා 30 ක් සකස් කිරීම. (ඇමුණුම 1)
3.- ඉන් මාතෘකා 10 ක් සඳහා රචනා සැකිළි සකස් කරවීම. (ඇමුණුම 2)
4.- සාර්ථක රචනයක ලක්ෂණ පිළාබඳ ව දැනුම්වත් කිරීම .(ඇමුණුම 3)
5.- රචනා ලිවීමේ කාර්යය හා සම්බන්ධ ජර්නලයක් පවත්වා ගෙන යාමට ගුරුභවතුන් දැනුම්වත් කිරීම .(ඇමුණුම 4 )
6.- එම පාසල් තුනෙහි රචනා වැඩසටහන ක්‍රියාත්මක වන ආකාරය සොයා බැලීම (පාසල් බාහිර නියාමනයේ දී හා සහාය ඉගැන්වීම් කටයුතුවල යෙදෙන අවස්ථාවේ දී)

ගුරු මැදිහත්වීම :
1.- සතියකට එක් රචනා මාතෘකාවක් ලබාදීම.
2. සිසුන් සමඟ එක් වී රචනා සැකිලි සකස් කිරීම හා අවශ්‍ය තොරතුරු සාකච්ඡා කිරීම.

3. - අවශ්‍ය තොරතුරු සොයා ගැනීමට විෂයයන්ට අදාළ අමතර පොත්පත් කියවීමට යොමු කිරීම
4. - සිසුන්ට සරල මාතෘකා සිට සංකීර්ණ මාතෘකා දක්වා රචනා මාතෘකා ලබාදීම.
5. - ප්‍රවෘත්ති, දේශන, රූපවාහිනී සම්මුඛ සාකච්ඡා, බුද්ධි මණ්ඩල සාකච්ඡාවලට සවන්දීමට යොමු කිරීම
6. - ලියන ලද රචනා වැරදි නිවැරදි කරමින් නිරීක්ෂණය කර ලකුණු පිරිනැමීම
7. - සිසු සාධන මට්ටම ඉහළ නැංවීමට රචනා මාතෘකා 30 ලියවීමට උත්සාහ දැරීම

## පර්යේෂණ ක්‍රමවේදය


හඳුනාගත් ගැටලුවට ක්‍රියාකාරකම් පාදකව විසඳුම් සෙවීමට "කාර්ය මූලික පර්යේෂණ ක්‍රමවේදය" යොදා ගැනීමට තීරණය කළෙමු.

## කාර්ය මූලික පර්යේෂණ උපකරණ

වගු හා ප්‍රස්තාර

වගුව 1 : රචනා ලිවීම ඉගැන්වීම ආරම්භ වීමෙන් පසු හය ශ්‍රේණියේ සිසුන්ගේ පළමු වාර පරීක්ෂණයෙන් සිංහල විෂය සඳහා ලබාගත් ලකුණු

| අ අ | පාසලේ නම | සිසුන් ගණන | පළමු වාරයෙහි සිංහල විෂය ලකුණු | | |
|---|---|---|---|---|---|
| | | | 40 ට වැඩි | 21 - 39 | 0 -20 |
| 1 | A | 67 | 10 | 22 | 35 |
| 2 | B | 45 | 12 | 05 | 28 |
| 3 | C | 63 | 08 | 12 | 43 |



## දත්ත රැස් කිරීම


1. සම්මුඛ සාකච්ඡා
2. ශිෂ්‍ය නාම ලේඛනය
3. ලකුණු වාර්තා ( පාසල් පාදක තක්සේරුකරණ , වාර විභාග)
4. බාහිර හා අභ්‍යන්තර ඇගයීම් වාර්තා
5. නිරීක්ෂණ
6. ගුරු භවතුන්ගේ ජර්නල
7. වාර විභාග ලකුණු


## දත්ත විශ්ලේෂණය

වාර විභාග ලකුණු වාර්තා


වගුව 2 : අහඹු ලෙස තෝරාගත් සිසුන් කිහිප දෙනෙකුගේ සිංහල විෂය වාර විභාග ලකුණු

| පාසල | අ අ | ශිෂ්‍යාගේ නම | වාර විභාග ලකුණු | | |
|---|---|---|---|---|---|
| | | | 1 වාරය | 2 වාරය | 3 වාරය |
| A | 1 | A | 26 | 40 | 58 |
| | 2 | B | 42 | 65 | 86 |
| | 3 | C | 33 | 56 | 84 |
| B | 1 | A1 | 15 | 28 | 32 |
| | 2 | B1 | 39 | 43 | 55 |
| | 3 | C1 | 29 | 36 | 48 |
| C | 1 | A2 | 41 | 53 | 60 |
| | 2 | B2 | 28 | 33 | 39 |
| | 3 | C2 | 45 | 57 | 63 |





රූපය 2 : B පාසලේ 2 හා 3 වාරවලට සිසුන් කිහිපදෙනෙකුගේ වාර විභාග ලකුණු අඩංගු ලකුණු පොත




රූපය 4 - C පාසලේ 2 වාරයේ සහ 3 වාරයේ සිසුන් කිහිප දෙනෙකුගේ වාර විභාග ලකුණු

වගුව 3 : සිසුන්ගේ රචනා ලිවීමේ හැකියාව - 10 වන රචනය


| අ අ | පාසල | සිසුන් ගණන | 10 වන රචනය සඳහා ලකුණු | | |
|---|---|---|---|---|---|
| | | | 13 -20 | 6 -12 | 0 - 5 |
| 1 | A | 67 | 18 | 36 | 13 |
| 2 | B | 45 | 20 | 12 | 13 |
| 3 | C | 63 | 26 | 26 | 11 |




රූපය 5 : සිසුන්ගේ රචනා ලිවීමේ හැකියාව - 10 වන රචනය

වගුව 4 : සිසුන්ගේ රචනා ලිවීමේ හැකියාව -: 20 වන රචනය


| අ අ | පාසල | සිසුන් ගණන | 20 වන රචනය සඳහා ලකුණු | | |
|---|---|---|---|---|---|
| | | | 13 - 20 | 6 - 12 | 0 - 5 |
| 1 | A | 67 | 23 | 33 | 11 |
| 2 | B | 45 | 24 | 09 | 12 |
| 3 | C | 63 | 31 | 21 | 10 |




රූපය 6 : සිසුන්ගේ රචනා ලිවීමේ හැකියාව - 20 වන රචනය

වගුව 5 : සිසුන්ගේ රචනා ලිවීමේ හැකියාව - 30 වන රචනය

| අ අ | පාසල | සිසුන් ගණන | 30 වන රචනය සඳහා ලකුණු | | |
|---|---|---|---|---|---|
| | | | 13 -20 | 6 -12 | 0 - 5 |
| 1 | A | 67 | 37 | 24 | 06 |
| 2 | B | 45 | 31 | 08 | 06 |
| 3 | C | 63 | 39 | 14 | 10 |




රූපය 7 : සිසුන්ගේ රචනා ලිවීමේ හැකියාව - 30 වන රචනය

## යෝජනා

- 2020 වර්ෂයේ සිට දෙනුවර අධ්‍යාපන කලාපයේ සියලුම පාසල්ව 6 ශ්‍රේණියේ සිට 9 ශ්‍රේණිය දක්වා මෙම රචනා වැඩ සටහන ක්‍රියාත්මක කිරීම.
- පාසල්වල 7, 8 හා 9 ශ්‍රේණිවලට අදාළ විෂයයන් සඳහා සුදුසු මාතෘකා සකස් කර සිසුන්ට ලබා දී මෙම රචනා වැඩ සටහන ක්‍රියාත්මක කිරීම.

## ආශ්‍රිත ග්‍රන්ථ හා ඇමුණුම්

අධ්‍යාපන අමාත්‍යාංශය (2014 ). ක්‍රියා මූලික පර්යේෂණ, බත්තරමුල්ල, කොළඹ

අධ්‍යාපන අමාත්‍යාංශය (2016 ). ක්‍රියා මූලික පර්යේෂණ, බත්තරමුල්ල, කොළඹ

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව (2017). "සදිස" අධ්‍යාපන පර්යේෂණ සංග්‍රහය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවඃ මහනුවර

දෙනුවර අධ්‍යාපන කලාපය (2015). "දෙනුවර අධ්‍යාපන පර්යේෂණ සාර සංග්‍රහය" ගිරාගම ගුරු මධ්‍යස්ථානය; මහනුවර

<u>ඇමුණුම 2</u>

1. මේ අපේ පාසලයි

රචනාවෙන් අපේක්ෂිත විෂය ආවරණය - සිංහල, ඉතිහාසය, පුරවැසි අධ්‍යනය, භූගෝල විද්‍යාව

ආරම්භය - පාසල පිළිබඳ හැඳින්වීම, පිහිටීම ආදිය - භූගෝල විද්‍යාව

අන්තර්ගතය -
පාසලේ ආරම්භය පිළිබඳ විස්තර කිරීම - පුරවැසි අධ්‍යනය
පාසලේ ඓතිහාසික තොරතුරු - ඉතිහාසය, පුරවැසි අධ්‍යනය
පාසලේ වර්තමාන තත්ත්වය - සිංහල
පාසලේ වර්තමාන තත්ත්වය සඳහා කැපවූවන් - සිංහල, පුරවැසි අධ්‍යනය

අවසානය - නිගමන හා යෝජනා

2. පරිසරය සුරකිමු

ආරම්භය - පරිසරය පිළිබඳ හැඳින්වීම

අන්තර්ගතය -
පරිසරයට අයත් සංරචකව අන්තර් සබඳතාවය විස්තර කිරීම
පරිසරයෙන් ඇති ප්‍රයෝජන විස්තර කිරීම
අද පරිසරයට අත් වී ඇති ඉරණම පැහැදිලි කිරීම
අතීතයේ සිටි මිනිසුන් පරිසරය රැකගත් ආකාරය
අද අප පරිසරය රැක ගන්නේ කෙසේද?

අවසානය - නිගමන හා යෝජනා

ඇමුණුම 1

## 6 ශ්‍රේණිය සඳහා රචනා මාතෘකා

පහත සඳහන් මාතෘකා යටතේ වචන 150 ට නොඅඩු රචනා ලියන්න

| සතිය | මාතෘකාව | අදාළ විෂයයන් | ලියවන ලද දිනය |
|---|---|---|---|
| 1 | මේ අපේ පාසලයි | ඉතිහාසය, බුද්ධ ධර්මය, පුරවැසි අධ්‍යනය සිංහල | |
| 2 | පරිසරය සුරකිමු | විද්‍යාව, භූගෝල විද්‍යාව, සිංහල, සෞඛ්‍යය | |
| 3 | මා ප්‍රීතියෙන් ගත කළ නිවාඩු කාලය | විද්‍යාව, භූගෝල විද්‍යාව, සිංහල, සංගීතය | |
| 4 | මුහුදු වෙරළ | විද්‍යාව, භූගෝල විද්‍යාව, සිංහල, සංගීතය | |
| 5 | වැඩිහිටියන්ට සළකමු | සිංහල, බුද්ධ ධර්මය | |
| 6 | සුන්දර සීගිරිය | භූගෝල විද්‍යාව ඉතිහාසය, පුරවැසි අධ්‍යනය සිංහල | |
| 7 | මා කැමති වීරයා | ඉතිහාසය, සිංහල | |
| 8 | වෙසක් අසිරිය | ඉතිහාසය, බුද්ධ ධර්මය, සිංහල | |
| 9 | දළදා පෙරහැර | ඉතිහාසය, බුද්ධ ධර්මය, සිංහල | |
| 10 | සමගිය බලය වේ | නැටුම් , සිංහල, බුද්ධ ධර්මය | |
| 11 | පොදු දේපල සුරකිමු | සිංහල, පුරවැසි අධ්‍යනය | |
| 12 | පුංචි අපේ යුතුකම | බුද්ධ ධර්මය, පුරවැසි අධ්‍යනය, සිංහල | |
| 13 | මා කියවූ හොඳම පොත | සිංහල, | |
| 14 | සුන්දර ගැමි පරිසරය | සිංහල, සංගීතය | |
| 15 | ජල සම්පත සුරකිමු | විද්‍යාව, භූගෝල විද්‍යාව, සිංහල, සෞඛ්‍යය | |
| 16 | සාරධර්ම අගයමු | සිංහල, බුද්ධ ධර්මය | |
| 17 | කියවීමෙන් දැනුම වඩමු | ඉතිහාසය, බුද්ධ ධර්මය, සිංහල | |
| 18 | ලෝකෙන් උතුම් රට ලංකාවයි | ඉතිහාසය, පුරවැසි අධ්‍යනය භූගෝල විද්‍යාව | |
| 19 | මා දුටු සුන්දර සිහිනය | සිංහල | |
| 20 | දිනෙන් දින වැඩි වන මාර්ග අනතුරු | සිංහල, නැටුම් | |
| 21 | අනගාරික ධර්මපාලතුමා | ඉතිහාසය, බුද්ධ ධර්මය, පුරවැසි අධ්‍යනය සිංහල | |
| 22 | ගුරුවරු අපේ දෙවිවරුය | සිංහල, බුද්ධ ධර්මය | |
| 23 | පිරිසිදුකම නිරෝගි බව සුරකී | විද්‍යාව, සිංහල, සෞඛ්‍යය, නැටුම් | |
| 24 | උත්සහවන්තයා ජය ගනියි | ඉතිහාසය, බුද්ධ ධර්මය, සිංහල | |
| 25 | මා අගය කරන ජාතික වීරයා | ඉතිහාසය, පුරවැසි අධ්‍යනය, සිංහල | |
| 26 | සඳ ඇති රැයක් | සිංහල, සංගීතය | |
| 27 | අප රටේ සුන්දර ඓතිහාසික ස්ථාන | ඉතිහාසය, බුද්ධ ධර්මය, සිංහල | |
| 28 | ජන කවිය හා බැඳුණු රැකියා | ඉතිහාසය, සිංහල, නැටුම්, සංගීතය | |
| 29 | අපි මව් බිමට ආදරය කරමු | බුද්ධ ධර්මය, සිංහල | |
| 30 | ලංකාවේ වන සත්ව සම්පත | විද්‍යාව, සිංහල, සෞඛ්‍යය | |

# ගුණාත්මක තත්ත්වය අනුව පාසල් ශ්‍රේණිගත කිරීම සඳහා විද්‍යාත්මක ප්‍රවේශයක්

ඩී.එච්.එස්.ඩී.සෝමරත්න (MSc.-Sci.Edu., PGDE)

නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

0714411127/0772061250 / samdenuka@gmail.com

## සංක්ෂිප්තය

මෙරට පාසල්වල ගුණාත්මක තත්ත්වය මැන බැලීම සඳහා පාසල් බාහිර ඇගයීම් ක්‍රියාවලිය යොදා ගනු ලබයි. පාසල් ඇගයීම් සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇතුළත් ප්‍රධාන ඇගයීම් ක්ෂේත්‍ර (තේමා) අටක් යටතේ දර්ශක සඳහා ලකුණු ලබා දීම පාසල් බාහිරව ඇගයීමේ දී සිදු වේ. එක් එක් ඇගයීම් ක්ෂේත්‍රයට ලැබී ඇති ලකුණුවල මධ්‍යනය්‍ය පාසලක අධ්‍යාපන ගුණාත්මක දර්ශකය School Education Quality Index (SEQI) ලෙස සැළකේ. බාහිර ඇගයීම් ප්‍රධාන වශයෙන් අධ්‍යාපන කලාප විසින් සිදු කරනු ලබයි. බාහිර ඇගයීම් ක්‍රියාවලිය තුළ එක් එක් ක්ෂේත්‍රවල නිර්ණායක හා දර්ශක සඳහා ලකුණු ලබා දීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී තිබුණ ද කලාප මට්ටමින් පාසල්වල ඇගයීම් ක්ෂේත්‍ර සඳහා ලකුණු ලබා දීමේ විවිධතා දක්නට ඇත. කලාප අනුව ප්‍රාදේශීය වශයෙන් පාසල්වල පවතින පහසුකම්, කලාප ඇගයුම්කරුවන්ගේ දැනුම හා අත්දැකීම් වැනි සාධකවල වෙනස්කම් නිසා කිසියම් කලාපයක පාසල් සඳහා එම කලාපයෙහි ඇගයුම්කරුවන් තමන්ට ආවේනික ආකාරයකට ලකුණු ලබා දීමක් දක්නට ලැබේ. එබැවින් පාසල්වල SEQI ලකුණු අනුව එම පාසල් ශ්‍රේණිගත කිරීම සාධාරණ වන්නේ කලාප මට්ටමින් කලාපය තුළ ඇගයීම් කළ පාසල් අතර පමණි. පාසල්වල SEQI ලකුණු අනුව ඒවා දිස්ත්‍රික්, පළාත් හෝ ජාතික මට්ටමින් ශ්‍රේණිගත කිරීමේ යෝග්‍යතාව පරීක්ෂා කරමින් එවැනි ශ්‍රේණිගත කිරීමක් සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයක් හඳුන්වා දීම මෙම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ විය. පර්යේෂණ නියැදිය ලෙස කොළඹ දිස්ත්‍රික්කය තුළ 2017, 2018 හා 2019 වර්ෂවල දී බාහිර ඇගයීමට ලක්කර ඇති 1AB වර්ගයේ පාසල් තෝරා ගෙන ඇත. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව පිළිබඳ වාර්ෂික වාර්තාවල ඇගයීම් තොරතුරු, දත්ත ලෙස මෙහි යොදා ගෙන ඇත. පර්යේෂණයේ පළමු පියවර ලෙස දිස්ත්‍රික්කය තුළ SEQI ලකුණු අනුව 1AB පාසල් ශ්‍රේණිගත කිරීමේ හැකියාව පිළිබඳ පරීක්ෂා කළ අතර දෙවන පියවර ලෙස පාසල් බාහිර ඇගයීම් ලකුණුවල ප්‍රමත අගය (Z ලකුණු) මත ගුණාත්මක තත්ත්වය අනුව පාසල් ශ්‍රේණිගත කිරීමට ඇති හැකියාව විමසා බලන ලදී. මේ අනුව පාසලක SEQI ලකුණුවල ප්‍රමත අගයයන් අනුව ඒවා කලාප අතර පාසල් ශ්‍රේණිගත කිරීම සඳහා සාධාරණ ක්‍රමයක් බව සංඛ්‍යාන ක්‍රමවේද මගින් පෙන්වා දිය හැකි විය. බාහිර ඇගයීමට ලක්කර ඇති පාසල් ඒවායේ වර්ගීකරණය අනුව දිස්ත්‍රික්ක, පළාත් හෝ ජාතික වශයෙන් ශ්‍රේණිගත කිරීම සඳහා පාසල් බාහිර ඇගයීම් ලකුණුවල ප්‍රමත අගයන් යොදා ගැනීම යෝග්‍ය උපාය මාර්ගයක් ලෙස මෙම පර්යේෂණය මගින් යෝජනා කළ හැකිය.

**මුඛ්‍ය වදන් : අධ්‍යාපන ගුණාත්මක දර්ශකය, ශ්‍රේණිගත කිරීම, ලකුණු සම්මතකරණය, ප්‍රමත ලකුණ**

# 1. පර්යේෂණ පසුබිම

පාසල්වල ගුණාත්මක තත්ත්වය සම්බන්ධයෙන් තීරණ ගැනීමේ දී කිසියම් අර්ථ දැක්වූ පරීක්ෂණ පිළිවෙතකට අනුකූලව පාසල සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම පිළිගත් ක්‍රමවේදය යි. ශ්‍රී ලංකාවේ පාසල්වල ගුණාත්මක බව මැනීම සඳහා ප්‍රමිති පාදක පාසල් ඇගයීම් ක්‍රමවේදයක් භාවිත කෙරේ. පාසල් ඇගයීමට ලක් විය යුතු ප්‍රධාන ක්ෂේත්‍ර හඳුනාගෙන එම ක්ෂේත්‍රවලට අදාළව නිර්ණායක හා දර්ශක හඳුන්වා දෙමින් 2015 වසරේ සිට 'අපේ පාසල කොතරම් ගුණාත්මකද?' නමින් පාසල් අභ්‍යන්තර හා බාහිර ඇගයීම් සඳහා මාර්ගෝපදේශයක් හඳුන්වා දී ඇත.

මෙම ඇගයීම් මාර්ගෝපදේශය තුළ පාසලක ක්‍රියාවලියට සම්බන්ධ සියලු කරුණු ආවරණය වන පරිදි 'ශිෂ්‍ය සාධනය', 'ඉගෙනුම ඉගැන්වීම හා ඇගයීම', 'විධිමත් විෂයමාලා කළමනාකරණය', 'විෂය සමගාමී කටයුතු', 'ශිෂ්‍ය සුබසාධනය', 'නායකත්වය හා කළමනාකරණය', 'භෞතික සම්පත් කළමනාකරණය' සහ 'පාසල හා ප්‍රජාව' යන ඇගයීම් ක්ෂේත්‍ර අටක් යටතේ දර්ශක 210ක් දක්වා ඇත. එක් එක් ක්ෂේත්‍රය ඇගයීමට ලක් කිරීමේ දී ඒ යටතේ ඇති සෑම දර්ශකයක් සඳහා ම ලයිකට් පරිමාන ආකෘතිය අනුව ලකුණු 1 සිට 6 දක්වා වූ නිශ්චිත ලකුණු පරිමාණයක් ඇති අතර, ඇගයුම්කරුවෙකුට එම පරිමාණය ඇතුළත දර්ශකයකට ලකුණු ප්‍රදානය කිරීමට අවස්ථාව ඇත. එසේ ලකුණු පිරිනැමීමේ දී දර්ශකවලට අදාළව පාසලෙහි ක්‍රියාකාරීත්වය හා ප්‍රගතිය විමසා බැලීම බාහිර ඇගයුම්කරුවන්ගේ වගකීම වන අතර ඇගයුම් කරන ක්ෂේත්‍රයේ ස්වභාවය අනුව දර්ශකවලට ලකුණු පිරිනමනු ලබයි. ඇගයීමට ලක් කරන ලද දර්ශක සංඛ්‍යාවට සාපේක්ෂව ඇගයීම් ක්ෂේත්‍රයක් සඳහා ලැබෙන ලකුණු ප්‍රමාණය ප්‍රතිශතයට හැරවීම සිදුකරනු ලබයි.

මෙම ඇගයීම් ක්ෂේත්‍ර සියල්ලම සඳහා ලැබෙන ලකුණු ප්‍රතිශතවල සරල සමාන්තර මධ්‍යන්‍ය ගණනය කිරීමෙන් එනම් සෑම ඇගයීම් ක්ෂේත්‍රයකටම ලබා ගත් ලකුණුවල එකතුව, ඇගයීම් කර ඇති ක්ෂේත්‍ර සංඛ්‍යාවෙන් බෙදීමෙන් පාසලක ගුණාත්මක තත්ත්වය ප්‍රමාණාත්මක අගයකින් 'පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය' (School Education Quality Index – SEQI) ලෙස ඉදිරිපත් කිරීම වර්තමාන පාසල් ඇගයීම් ක්‍රමයේ ස්වභාවය වේ. මෙම SEQI ලකුණු සළකා පාසල පිළිබඳ සමස්ත ඇගයීමක් හා පාසලේ ගුණාත්මක තත්ත්වය සංඛ්‍යාත්මකව නිරූපනය සිදු කිරීමක් සඳහා අවස්ථාව සලසා දී තිබේ.

කොට්ඨාස අධ්‍යාපන කාර්යාල, කලාප අධ්‍යාපන කාර්යාල හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු මෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ද පාසල් බාහිර ඇගයීම් සිදුකර SEQI ලකුණු ගණනය කරනු ලබයි. වාර්ෂිකව සිදු කරනු ලබන බාහිර ඇගයීම්වල ලකුණු අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 'පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව පිළිබඳ වාර්ෂික වාර්තාව' (Annual Report on Quality Assurance of School Evaluation) මගින් ඉදිරිපත් කෙරෙන අතර මෙම වාර්ෂික වාර්තාව තුළ පාසල් වර්ගීකරණය (1AB, 1C, 2 වර්ගය හා 3 වර්ගය) අනුව SEQI ලකුණු මත පාසල් එක් එක් කලාප මට්ටමින් ශ්‍රේණිගත කර ඇත.

## 2. තාර්කිකය හා ගැටලුව හැඳින්වීම

පාසලක් ඇගයීමෙන් පසු ගණනය කරනු ලබන පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක දර්ශකය හෙවත් SEQI ලකුණ හුදෙක් ම සරල සමාන්තර මධ්‍යයනයක් ලෙස සැලකේ. පෙරේරා, (1999) අනුව මෙවැනි සරල සමාන්තර මධ්‍යනය ලකුණු ගණනය කිරීම්වල දී ඒවා දළ ලකුණු හෝ අමු ලකුණු ලෙස සලකන අවස්ථා ද ඇත.

පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සම්බන්ධයෙන් ප්‍රජාව තුළ පවතින උනන්දුව, ජනප්‍රිය පාසල්වලට සිසුන් ඇතුළත් කිරීම සඳහා පවතින ඉල්ලුම, විවිධ ව්‍යාපෘතිවලට අදාළව සංවර්ධනය කිරීම සඳහා පාසල් තේරීම හා පාසල්වලට විදුහල්පතිවරුන් පත් කිරීම වැනි එකිනෙකට වෙනස් කාරණා සැලකීමේ දී එකම ජාතික විෂයමාලාවක් ක්‍රියාත්මක කෙරෙන පාසල්වල ගුණාත්මක තත්ත්වය / මට්ටම අනුව පාසල් ජාතික, පළාත් හෝ දිස්ත්‍රික් වශයෙන් ශ්‍රේණිගත කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම කාලෝචිත ය. පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව පිළිබඳ වාර්ෂික වාර්තාවන්හි දක්වා ඇති පරිදි පාසල් බාහිර ඇගයීම් සිදුකර සකස් කරනු ලබන SEQI ලකුණු පදනම් කර ගනිමින් කලාප මට්ටමින් පාසල් වර්ගීකරණය අනුව ඒවා ශ්‍රේණිගත කිරීම සිදු කර ඇත.

පාසල් ඇගයීම් සිදුකිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් හඳුන්වා දී ඇති ඇගයීම් ක්ෂේත්‍ර අනුව නිර්ණායක හා දර්ශක පදනම් කරගත් ප්‍රමාණාත්මක ලකුණු ලබාදීමේ පැහැදිලි ක්‍රමවේදයක් පවතී. නමුත් එකී ක්ෂේත්‍ර ඇගයීමට ලක්කරන කලාපීය ඇගයුම්කරුවන් දර්ශකවලට ලකුණු ලබාදීමේ දී පුද්ගලබද්ධ සාධක බලපාන නිසා ඇගයීම් ක්ෂේත්‍රයට ලැබෙන අවසන් ලකුණ තුළ වුව ද පුද්ගලබද්ධ ස්වභාවයක් පැවතිය හැකිය. පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව පිළිබඳ වාර්ෂික වාර්තා තුළ නිරීක්ෂණය වන පරිදි ඒ ඒ කලාපවල ඇගයීම් කර ඇති පාසල්වලින් වැඩි ප්‍රමාණයක SEQI ලකුණු අදාළ කලාපයට සුවිශේෂී වූ ලකුණු පරාසවල පැවතීමට එකී කලාප ඇගයුම්කරුවන්ගේ ලකුණු පිරිනැමීමේ පුද්ගලබද්ධ බව බලපා ඇතැයි පෙනී යයි.

මෙම SEQI ලකුණු පදනම් කර ගෙන පාසල් සැසඳීමේ යෝග්‍යතාව සම්බන්ධයෙන්, පාසල් බාහිර ඇගයීම් ලකුණු ලබා දීම පිළිබඳව 2018 දී පළාත්/කලාප ඇගයුම්කරුවන් යොදා ගනිමින් සිදු කරන ලද සමීක්ෂණයක පහත සඳහන් අනාවරණ පිළිබඳව ද අවධානය යොමු කළ හැකිය.

- එක් එක් කලාප / පළාත් මට්ටමින් සිදු කරනු ලබන පාසල් බාහිර ඇගයීම්වල දී දර්ශක සඳහා ලකුණු ලබා දෙන ස්වභාවය ඇගයීම් කණ්ඩායම්වල විවිධත්වය මත වෙනස් වේ.
- පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශක ලකුණු එක් එක් කලාපයක් සඳහා එම කලාප මට්ටමට අනන්‍ය වූ ස්වභාවයක් ගන්නා බව නිරීක්ෂණය වේ.
- පාසල් බාහිර ඇගයීම් සිදු කරන ආකාරය සම්බන්ධව පළාත් / කලාප / කොට්ඨාස කාර්යාල විසින් අනුගමනය කරන ඇගයීම් පිළිවෙත් ඇගයීම් ක්ෂේත්‍ර සඳහා ලකුණු ලබා දීමට බලපා ඇත.
- පාසලක විවිධ ඇගයීම් ක්ෂේත්‍ර සඳහා ලබා ගන්නා ලකුණු පරතර අතර විශාල විෂමතා පවතින බව පෙනී යයි.

පසුගිය වර්ෂයයන්හි ඇගයීම් ලකුණු වාර්තා නිරීක්ෂණයේ දී ද පෙනී යන්නේ පාසල් බාහිර ඇගයීම් අවස්ථාවල දි ඇගයීම් ක්ෂේත්‍රවලට ලකුණු පිරිනැමීමේ ස්වභාවය කලාපය හෝ ඇගයීම් කණ්ඩායම මත වෙනස් වන අවස්ථා ඇති බව යි. එබැවින් පාසල්වල ගුණාත්මක තත්ත්වය ජාතික, පළාත් හෝ දිස්ත්‍රික් මට්ටමින් පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය හෙවත් SEQI ලකුණු මත ශ්‍රේණිගත කිරීමට හැකියාවක් තිබේද යන්න විමසා බැලීම කාලෝචිත ය. එමෙන්ම එවැනි ශ්‍රේණිගත කිරීමක් සඳහා ප්‍රවේශ වීමට සුදුසු ක්‍රමවේදයක් හඳුනා ගැනීම පිළිබඳව ද අවධානය යොමු කළ යුතුය.

## 3. පර්යේෂණ සාහිත්‍ය විමර්ශනය

පාසලේ ගුණාත්මක තත්ත්වය නිවැරදිව මැනීම සඳහා වඩාත් පිළිගත හැකි පියවර අනුගමනය කිරීම වැදගත් වේ. එසේ නොමැති වුවහොත් වඩාත් ගුණාත්මක දත්ත පැවතියත් ඒවා විශ්ලේෂණය කිරීමේ දී ලැබෙන ප්‍රතිඵලයන්හි වටිනාකම අඩු වීමට හේතු වේ (NCES Monitoring School Quality : An Indicators Report, 2000) .

ශ්‍රී ලංකාවේ අ.පො.ස.(උසස් පෙළ) විභාගයෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන් තෝරා ගැනීමට 2000 වසර දක්වා ම භාවිත කරනු ලැබුවේ සිසුන් හදාරණ විෂය ධාරාව අනුව එක් එක් විෂයයට ලබා ගන්නා දළ ලකුණුවල එකතුව (Aggregate Marks) වේ. නමුත් දියුණු රටවල එම ක්‍රමය බහුලව යොදා ගන්නේ නැත. එයට හේතුව විවිධ විෂයන්හි ප්‍රශ්නපත්‍ර විවිධ දුෂ්කරතා මට්ටම්වලින් යුක්ත වීමයි. මේ නිසා විශ්වවිද්‍යාලවලට සිසුන් තේරීම සඳහා දළ ලකුණු යොදා ගැනීමේදී සමහර විෂයයන් හදාරණ සිසුන්ට වාසිදායක හෝ අවාසිදායක තත්ත්වයක් ඇතිවන බව පෙන්වා දිය හැකිය. මෙම ගැටලු සහගත තත්ත්වයන් නිරාකරණය කර ගැනීම සඳහා ලෝකයේ විවිධ රටවල් භාවිත කරන ලොව පිළිගත් එක් සම්මත ක්‍රමයක් වන්නේ සිසුන් ලබාගත් දළ ලකුණු සම්මත පරිමාණයකට (Standard Scale) පරිවර්තනය කිරීමයි. විභාග ලකුණු පදනම් කරගෙන සිසුන් පිළිබඳ තීරණ ගන්නා විට දළ ලකුණු යොදා ගෙන ගනු ලබන තීරණවලට වඩා ප්‍රමිත ලකුණු යොදා ගෙන ගන්නා තීරණ සාධාරණ වේ. සිසුන් පිළිබඳ තීරණ ගැනීම සඳහා පරීක්ෂකවරුන් කිහිප දෙනකු සම්බන්ධ වන අවස්ථාවන්හි දීත් විෂය කිහිපයක සාධනය යොදා ගනු ලබන අවස්ථාවල දීත් ප්‍රමිත ලකුණු භාවිත කරනු ලැබේ. ප්‍රමිත කිරීම තුළින් එක් පරීක්ෂකවරයකුගේ ලකුණුවල විසිරීමට අනෙක් පරීක්ෂකවරුන්ගේ ලකුණුවල විසිරීම් සහ එක් විෂයක ලකුණු විසිරීමට අනෙක් විෂයයන්ගේ ලකුණු විසිරීම් පරිවර්තනය කර ගැනීමටත් හැකිවේ (පූජිත, 2011).

පෙරේරා (1999) අනුව, ලෝකයේ දියුණු රටවල ප්‍රමිතිකරණයට භාජනය නොකර පන්ති කාමර දළ ලකුණක් හෝ භාවිතයට නොගනී. දළ ළකුණු කොතරම් විෂමතා වලින් යුක්ත ද එසේම ඒවා විවිධ විචල්‍යන්ගේ බලපෑමෙන් දූෂ්‍ය වීමට කොතරම් ඉඩ තිබේද යන්න පැහැදිලි හෙයින් එවැනි අවිනිශ්චිත හා අවිශ්වාසදායක තත්වයන් මගහැරවීම පිණිස ප්‍රතිකර්මයක් ලෙස සම්මත පරිමාණයකට ලකුණු පරිවර්තනය කිරීම වඩාත් සුදුසු ලෙස දැක්විය හැකිය.

Ash සහ Urqunola, (2020) අනුව රජයේ පාසල් සඳහා පර්යේෂණ පාදක ශ්‍රේණිගත කිරීම් ක්‍රමයේ අවශ්‍යතාවය විමසා බැලෙන පර්යේෂණ අනුව පාසල් සම්බන්ධව සුවිශේෂී ක්ෂේත්‍රවල ශ්‍රේණිගත කිරීම්වල සැළකිය යුතු වෙනසක් තිබී ඇත. එයට විවිධ පුද්ගල බද්ධ අත්දැකීම් පරිපාලනමය තත්ත්ව බලපා ඇත. එබැවින් පර්යේෂණාත්මක ශ්‍රේණිගත ක්‍රමයක් සඳහා කටයුතු කළ යුතු වේ. දළ ලකුණු වෙනුවට ප්‍රමිත ලකුණු භාවිතය  අධ්‍යාපන සංඛ්‍යාන  විද්‍යාවේ දී දක්නට ලැබේ. දළ ලකුණකට නියමිත ප්‍රමිත ලකුණ යනු එම ලකුණු මධ්‍යයනයෙන් කොතරම් ප්‍රමාණයක් ඇත් වේද යන්න සම්මත අපගමනයේ භාගයක් ලෙස ප්‍රකාශ කිරීම ය.

දළ ලකුණු ප්‍රමිත ලකුණුවලට හරවා ගැනීමෙන් කරනුයේ හැම ලකුණක්ම මධ්‍යනයේ සිට අපගමනය වන ප්‍රමාණය එම ලකුණු ශ්‍රේණියේ මධ්‍යස්ථ සම්මත අපගමනය පදනම් කර ගෙන ප්‍රකාශ කිරීමයි. මේ පරිවර්තනය නිසා විවිධ ලකුණු ශ්‍රේණිවල නැතිනම් විවිධ පරීක්ෂකයින් දෙන ලකුණුවල මට්ටම් හා විසිරීම් එකිනෙකට වෙනස් වුව ද එක එක ලකුණ එම ලකුණු ශ්‍රේණිය තුළ පිහිටා ඇති ස්ථාන නිගමනය කිරීමට හැකි වේ. හැම ලකුණක් ම ලකුණු ශ්‍රේණිය තුළ පිහිටා ඇති ස්ථානය පිළිබඳ අවබෝධයක් ප්‍රමිත ලකුණෙන් ලැබෙන නිසා ලකුණු සංසන්දනයට හා ලකුණු සංයෝජනයට එමඟින් ශාස්ත්‍රීය පදනමක් සැපයේ. ප්‍රමත වක්‍රයට සමපාත වන ලකුණු ව්‍යාප්ති කිහිපයක් සැලකූ විට ඒවායේ මධ්‍යන්‍යය හා සම්මත අපගමන ප්‍රමත ලකුණින් දක්වා ඇති නිසා එම ලකුණු ව්‍යාප්තිවල ලකුණු විසිරී ඇති ආකාරය පිළිබඳ පොදු මිනුමකින් නිගමනය කිරීමට හැකියාව ලැබේ. දළ ලකුණු පමණක් සැලකිල්ලට ගන්නා විට පරීක්ෂකයින්ගේ ලකුණු දීමේ විෂමතා ඉවත් කිරීමක් සිදු නොවේ. නමුත් ප්‍රමත ලකුණු සඳහා පර්වර්තනය කල විට සෑම ලකුණක්ම මධ්‍යනයේ සිට අපගමනය වී තිබෙන අන්දම අනුව ගොඩනැගෙන අගයන් ලබා ගන්නා නිසා පරීක්ෂකයින්ගේ විෂමතා ඉවත් වී යයි. එම නිසා දළ ලකුණු භාවිතයට වඩා තීරණ ගැනීම පිණිස Z ලකුණු  භාවිතය විද්‍යානුකුල වේ. (පෙරේරා, 1999).

අනුමිති සංඛ්‍යානයේ දී නියදුම් ව්‍යාප්ති විස්තර කිරීම සඳහා ප්‍රමිත ව්‍යාප්තිය  ඉතාමත් වැදගත් වේ. මෙම ව්‍යාප්තිය නිරූපණය වන පරිදි ගොඩනගනු ලබන ප්‍රමත  වක්‍රය සතු ප්‍රධානතම ලක්ෂණය වනුයේ වක්‍රයේ මධ්‍යන්‍ය සිරස් රේඛාවේ සිට වෙනත් ඕනෑම නිෂ්චිත සම්මත අපගමන ඒකක ගණනක් ඇතින් පිහිටි අගයක් ඔස්සේ අඳිනු ලබන සිරස් රේඛාවක් අතර ක්ෂේත්‍රඵලය මුළු වක්‍රයට දක්වන අනුපාතය සෑම විටම සමාන වීමයි. විවිධ සංඛ්‍යා ව්‍යාප්ති සඳහා විවිධ මධ්‍යන්‍යය අගයන් හා විවිධ සම්මත අපගමනයන් සහිත ප්‍රමත වක්‍ර තිබිය හැකිය. නමුත් වඩාත් වැදගත් වන්නේ සම්මත ප්‍රමත වක්‍රය යි. එනම් මධ්‍යන්‍යය 0 හා සම්මත අපගමනය 1 ලෙස සැලකෙන ප්‍රමත වක්‍රය වේ. මෙම වක්‍රය Z වක්‍රය ලෙස ද හැඳින්වේ. මෙමඟින් නිරූපණය කෙරෙන ව්‍යාප්තියේ විවිධ අගයන් Z අගයන් ලෙස හැඳින්වෙන අතර කිසියම් Z අගයක් මඟින් එම අගය මධ්‍යනයේ සිට සම්මත අපගමනය ඒකක කීයක් ඇතින් පිහිටා ඇතිද යන්න නිරූපණය කෙරේ (වන්නිගම, 2004).

# 4. පර්යේෂණ ක්‍රමවේදය

## 4.1 පර්යේෂණයේ අරමුණු

- පාසල්වල ගුණාත්මක තත්ත්වය ප්‍රමාණාත්මක ලෙස සැසඳීම සඳහා අධ්‍යාපන ගුණාත්මක දර්ශකය (SEQI) යොදා ගැනීමෙහි යෝග්‍යතාව විශ්ලේෂණය කිරීම
- පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය සාධාරණ හා ප්‍රමිතිගත ලකුණක් බවට පත්කර ගැනීමට හැකි අවස්ථා පිළිබඳ සොයා බැලීම
- ගුණාත්මක තත්ත්වය අනුව පාසල් ශ්‍රේණිගත කිරීමට සුදුසු ක්‍රම ශිල්ප යෝජනා කිරීම

## 4.2 සංගහනය හා නියැදිය

මෙම පර්යේෂණයෙහි සංගහනය වශයෙන් කොළඹ දිස්ත්‍රික්කයෙහි සියලුම 1AB වර්ගයේ පාසල් ප්‍රමාණය සළකනු ලබයි. මෙම පර්යේෂණය සඳහා නියැදිය තෝරා ගැනීමේ දී සහේතුක නියැදිකරණ පිළිවෙත අනුගමනය කර ඇති අතර එය තුළ නියැදි පොකුරු තේරීමට කටයුතු කර ඇත. එනම් සහේතුක වශයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ ඇති සියලුම 1AB පාසල් අතුරින් මෙම පර්යේෂණය සඳහා අදාළ කරගෙන ඇත්තේ බාහිර ඇගයීමට ලක්කර අධ්‍යාපන ගුණාත්මක දර්ශකය සකස් කර ඇති පාසල් පමණි. ඒ අනුව කොළඹ දිස්ත්‍රික්කයෙහි කොළඹ, ශ්‍රී ජයවර්ධනපුර, හෝමාගම හා පිළියන්දල යන අධ්‍යාපන කලාප හතර තුළ 2017, 2018 හා 2019 වර්ෂයන්හි දී බාහිර ඇගයීමට ලක්කර ඇති 1AB පාසල් පොකුරු නියැදි ලෙස තෝරා ගැනීමට කටයුතු කර ඇත. එසේ තෝරාගත් නියැදියට ඇතුළත් පාසල් සංඛ්‍යා පහත පරිදි වේ.

වගුව 1 : තෝරාගත් නියැදිය නියෝජනය කරන පාසල් සංඛ්‍යාව

| | අධ්‍යාපන කලාපය | 1AB පාසල් සංඛ්‍යාව | බාහිරව ඇගයීම් කර ඇති 1AB පාසල් සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|
| | | | 2017 | 2018 | 2019 |
| 1 | කොළඹ | 30 | 17 | 30 | 17 |
| 2 | ශ්‍රී ජයවර්ධනපුර | 22 | 20 | 20 | 11 |
| 3 | හෝමාගම | 09 | 05 | 07 | 04 |
| 4 | පිළියන්දල | 16 | 15 | 16 | 14 |
| | එකතුව | 77 | 57 | 73 | 46 |

## 4.3 අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උපායමාර්ග

මෙම අධ්‍යයනයේ දී හුදෙක් ම පාසල්වල සිදු කර ඇති බාහිර ඇගයීම්වලට අදාළ ලේඛනගත සංඛ්‍යාත්මක දත්ත පමණක් උපයෝගී කර ගැනේ. එබැවින් මෙය සම්පූර්ණයෙන් ම ප්‍රමාණාත්මක වර්ගයේ පර්යේෂණයක් ලෙස සළකා අනුමිතික සංඛ්‍යාන ක්‍රම භාවිත කර ඇත.

පර්යේෂණයේ දී නියැදි පොකුරුවල පාසල්වලට අදාළ අධ්‍යාපන ගුණාත්මක දර්ශක (SEQI) ස්වායත්ත විචල්‍යයන් ලෙස සළකා ඒවා මධ්‍යන්‍යය හා සම්මත අපගමනය යන පරාමිතීන් ආශ්‍රයෙන් විශ්ලේෂණය කරනු ලබයි. එක් එක් නියැදියෙහි SEQI ලකුණුවල මධ්‍යන්‍යය හා සම්මත අපගමනය යන සංඛ්‍යාති භාවිත කරමින් සිදු කරන අනුමිතීන්වල ප්‍රතිඵල 'අධ්‍යාපන කලාප' හා 'වර්ෂ' අනුව සංසන්දනය කරමින් පරීක්ෂා කෙරේ. තව ද, SEQI ලකුණු හා එම ලකුණුවල සම්මත Z අගයන්හි සංඛ්‍යාති සංසන්දනය කරමින් පරීක්ෂා කරන බැවින් මෙම පර්යේෂණය සංසන්දනාත්මක පර්යේෂණ ගණයට අයත් බව දැක්විය හැකි ය.

පර්යේෂණ දත්ත විශ්ලේෂණයේ දී පියවර දෙකක දී අනුමිතික සංඛ්‍යාන ක්‍රම යොදා ගෙන ඇත. පළමු පියවරේ දී, කලාප මට්ටමෙන් 1AB පාසල් බාහිර ඇගයීම් සිදු කර ලබා දී ඇති SEQI ලකුණු වෙනත් කලාපයක එම වර්ගයේ පාසල් ඇගයීමේ දී ලබා දී ඇති SEQI ලකුණු සමග සැසඳීම සාධාරණ වේද යන්න සොයා බැලීම සිදු කරනු ලබයි. එනම් යම්කිසි කලාපයක 1AB පාසලක් ලබා ඇති SEQI ලකුණ එම වසර තුළ වෙනත් කලාපවල 1AB පාසල් ලබා ඇති SEQI ලකුණ සමග සැසඳීම මගින් පාසලට හිමි ස්ථානය නිගමනය කිරීමට SEQI ලකුණ පොදු ලකුණක් සේ සැලකිය හැකිද යන්න විමසීම් කෙරේ.

ඒ සඳහා නියැදි ලෙස තෝරා ගෙන ඇති එක් එක් කලාපවලට අයත් 1AB පාසල්වල SEQI ලකුණු මධ්‍යන්‍යය හා සම්මත අපගමනය ගණනය කර ඒවා සැසඳීම් කරමින් පරීක්ෂාවට ලක් කෙරේ. එසේ පරීක්ෂාවට ලක් කිරිමේ දී ස්වායත්ත කුඩා නියැදි සඳහා භාවිත කළ හැකි SEQI ලකුණුවල මධ්‍යන්‍යය අතර වෙනස පිළිබඳව කල්පිත පරීක්ෂාවක් t පරීක්ෂා සංඛ්‍යාතිය යොදා ගනිමින් සිදු කරනු ලබයි.

$$t = \frac{(\bar{x}_1 - \bar{x}_2) - (\mu_1 - \mu_2)}{\sqrt{\frac{(n_1-1)s_1^2 + (n_2-1)s_2^2}{n_1+n_2-2}\left[\frac{1}{n_1} + \frac{1}{n_2}\right]}} \; ;$$

$\bar{x}_1 - \bar{x}_2$ - නියැදි මධ්‍යන්‍ය අන්තරය,

$\mu_1 - \mu_2$ - ජනගහන මධ්‍යන්‍ය අන්තරය,

$n_1 , n_2$ - නියැදි තරම,

$s_1 , s_2$ - නියැදිවල සම්මත අපගමනය

දෙවන පියවරේ දී, SEQI ලකුණු එම ලකුණුවල සම්මත ප්‍රමත වටිනාකමට හැර වූ පසු එය ස්වායත්ත කලාප දෙකක පාසල් ගුණාත්මක තත්ත්වය අනුව ශ්‍රේණිගත කිරීම සඳහා සාධාරණ මිණුමක් ද යන්න පිළිබඳව පරීක්ෂා කෙරේ.

SEQI ලකුණු සඳහා Z අගයන් තාරා කෝඩුවකින් මිනුම් කළ හැකි බැවින්, විචල්‍යයක් සම්බන්ධයෙන් ස්වායත්ත නියැදි දෙකක් අතර වෙසෙසි වෙනසක් ඇතිද යන්න පරීක්ෂා කිරිමේ මාන් විට්නි පරීක්ෂාව (Maan Whitney Test) මෙම පියවරේ දී භාවිත කෙරේ. නියැදි දෙකම එකම ජනගහනයෙන් තෝරාගත් ඒවා නම් එක් එක් නියැදියට තාරාවන් බෙදී යාම අහඹු ලෙස විය යුතුය.

යන අදහස මාන් විට්නි පරික්ෂාවේ මූලික තර්කය වේ. මෙම තර්කය පදනම් කර ගෙන පාසල්වල ගුණාත්මක තත්ත්වය පිළිබඳ නියැදි දෙකේම පාසල් පොදු තාරාවක් යටතට පමුණුවා ගැනීමට ඇති හැකියාව පිළිබඳ සොයා බැලීම සඳහා U සංඛ්‍යාතිය ගණනය කෙරේ.

මෙහි දී නියැදි දෙකක SEQI ලකුණුවල Z අගයන් තනි නියැදියක් ලෙස ගෙන තාරා කිරීම හා එම තාරා අගයයන් එක් එක් නියැදිවලට වෙන් කර තාරා ඓක්‍යය ලබා ගැනීම සිදු කළ යුතු වේ. පහත දැක්වෙන සූත්‍රය යොදා ගනිමින් එක් එක් නියැදිය සඳහා U ගණනය කරනු ලැබේ.

පළමු නියැදිය සඳහා;

$$U_1 = n_1 n_2 + \frac{n_1(n_1+1)}{2} - \sum R_1$$

දෙවන නියැදිය සඳහා;

$$U_2 = n_1 n_2 + \frac{n_2(n_2+1)}{2} - \sum R_2$$

මෙහි $n_1, n_2$ යනු නියැදි තරම වන අතර $\sum R_1$ හා $\sum R_2$ යනු නියැදියේ පාසල්වල තාරාවන්ගේ ඓක්‍යය වේ.

$n_1, n_2 < 20$ වන විට ඉහත $U_1$ හා $U_2$ අතුරින් අවම අගය, U වගුවෙහි නියැදි තරමට අදාළ අවධි අගය සමඟ සංසන්දනය කර තීරණවලට එළැඹිය හැකි වේ.

$n_1, n_2 > 20$ වන විට, $Z = \dfrac{U - n_1 n_2/2}{\sqrt{n_1 n_2(n_1+n_2+1)/12}}$ මගින් පරීක්ෂා කළ හැකිය.

ඉහත සංඛ්‍යාන අනුමිතීන් සිදු කිරීමේ දී අවශ්‍ය ගණනය කිරීම් පහසුවෙන් සිදු කර ගැනීම සඳහා මෙවලමක් ලෙස මයික්‍රොසොෆ්ට් එක්සෙල් මෘදුකාංගය (Microsoft Excel package) භාවිතයට යොදා ගෙන ඇත.

## 5. දත්ත ඉදිරිපත් කිරීම, සාකච්ඡාව හා අනාවරණ

පාසල් බාහිර ඇගයිමේ දී එක් එක් ඇගයීම් ක්ෂේත්‍රය සඳහා පාසල අයත් අධ්‍යාපන කලාපය තුළ ඇගයීම්කරුවන් විසින් ලබා දී ඇති ලකුණු මෙම දත්ත විශ්ලේෂණයේ දී සැලකිල්ලට ලක් කර තිබේ. ඒ අනුව, එක් එක් ඇගයීම් ක්ෂේත්‍රය සහ පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක දර්ශකය (SEQI) සඳහා නියැදියේ පාසල් ලබා ගෙන ඇති ලකුණුවල මධ්‍යන්‍යය හා සම්මත අපගමනය නියැදියෙහි කලාප අනුව වෙන වෙනම ගණනය කර 2 වගුවෙන් ඉදිරිපත් කර ඇත. ඒ අනුව ඇගයීමට ලක්කර ඇති පාසල්වල සෑම ඇගයීම් ක්ෂේත්‍රයකම හා අධ්‍යාපන ගුණාත්මක දර්ශකය අදාළව මධ්‍යන්‍යය හා සම්මත අපගමනය මගින් එම ලකුණුවල විසිරීම සංසන්දනාත්මකව විමසිය හැකිය.

වගුව 2: පාසල් බාහිර ඇගයීම් සඳහා ක්ෂේත්‍ර වශයෙන් ලබා ගෙන ඇති ලකුණුවල මධ්‍යනායය හා සම්මත අපගමනය

| කලාපය | වර්ෂය | ශිෂ්‍ය සාධනය | ඉගෙනුම ඉගැන්වීම, ඇගයීම | විෂයමාලා කළමනාකරණය | විෂය සමගාමී ක්‍රියා | ශිෂ්‍ය සුබසාධනය | නායකත්වය හා කළමනාකරණය | භෞතික සම්පත් කළමනාකරණය | පාසල හා ප්‍රජාව | SEQI |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **මධ්‍යනායය $\bar{x}$** | | | | | | | | | | |
| කොළඹ | 2017 | 73.29 | 66.94 | 63.00 | 72.41 | 61.18 | 69.56 | 65.35 | 66.38 | 67.29 |
| | 2018 | 72.38 | 65.40 | 68.47 | 71.47 | 67.59 | 70.63 | 68.24 | 68.79 | 69.77 |
| | 2019 | 71.56 | 67.31 | 68.19 | 68.82 | 68.06 | 71.06 | 68.82 | 72.18 | 69.35 |
| ශ්‍රී ජ'පුර | 2017 | 62.30 | 63.10 | 67.21 | 70.11 | 66.42 | 65.58 | 67.00 | 68.47 | 66.05 |
| | 2018 | 66.85 | 64.95 | 65.35 | 69.00 | 62.63 | 64.40 | 65.25 | 68.25 | 65.95 |
| | 2019 | 67.18 | 67.70 | 68.00 | 71.00 | 63.80 | 71.36 | 68.09 | 70.45 | 68.36 |
| හෝමාගම | 2017 | 62.00 | 63.20 | 59.20 | 63.40 | 60.80 | 60.00 | 60.80 | 66.60 | 62.00 |
| | 2018 | 59.86 | 63.50 | 62.14 | 63.86 | 61.29 | 55.14 | 66.14 | 60.43 | 61.43 |
| | 2019 | 65.80 | 63.00 | 60.30 | 64.50 | 60.50 | 65.30 | 66.30 | 65.00 | 63.80 |
| පිළියන්දල | 2017 | 65.13 | 64.67 | 61.13 | 71.27 | 54.93 | 61.00 | 71.00 | 74.21 | 65.33 |
| | 2018 | 64.44 | 64.94 | 59.06 | 70.00 | 60.63 | 64.81 | 70.69 | 73.88 | 65.63 |
| | 2019 | 64.86 | 67.50 | 65.21 | 74.21 | 60.57 | 67.86 | 71.50 | 74.50 | 68.36 |
| **සම්මත අපගමනය $\sigma$** | | | | | | | | | | |
| කොළඹ | 2017 | 12.559 | 7.206 | 10.105 | 11.586 | 8.445 | 7.314 | 11.463 | 11.168 | 6.085 |
| | 2018 | 15.821 | 8.329 | 13.047 | 9.639 | 12.181 | 11.223 | 14.170 | 11.724 | 8.313 |
| | 2019 | 9.930 | 5.451 | 9.560 | 17.510 | 12.547 | 9.549 | 12.701 | 13.435 | 9.486 |
| ශ්‍රී ජ'පුර | 2017 | 12.458 | 4.784 | 5.346 | 8.142 | 11.600 | 7.206 | 10.540 | 5.245 | 5.343 |
| | 2018 | 10.762 | 4.104 | 5.960 | 8.735 | 9.985 | 7.479 | 6.171 | 5.411 | 4.283 |
| | 2019 | 10.043 | 6.603 | 7.567 | 5.672 | 10.637 | 4.597 | 7.254 | 7.177 | 5.068 |
| හෝමාගම | 2017 | 8.000 | 2.481 | 4.166 | 11.429 | 8.795 | 8.025 | 8.423 | 12.224 | 5.865 |
| | 2018 | 11.618 | 3.201 | 6.423 | 11.703 | 11.385 | 6.727 | 6.599 | 6.608 | 5.900 |
| | 2019 | 10.685 | 4.183 | 5.717 | 4.609 | 3.570 | 5.068 | 3.562 | 6.964 | 3.789 |
| පිළියන්දල | 2017 | 11.080 | 1.885 | 8.122 | 8.062 | 11.891 | 9.208 | 6.985 | 9.652 | 5.699 |
| | 2018 | 11.645 | 2.749 | 8.385 | 12.816 | 10.728 | 10.187 | 6.007 | 12.313 | 6.872 |
| | 2019 | 9.210 | 1.893 | 6.394 | 8.001 | 7.138 | 11.096 | 7.038 | 8.441 | 4.319 |

වගුවට අනුව එක් එක් ඇගයීම් ක්ෂේත්‍රයන්හි ලකුණුවල මධ්‍යනායය සැලකීමේ දී එම ලකුණු සඳහා කලාපයෙන් කලාපයට වෙනස්වන සුවිශේෂීතා ඇති බව පෙනී යයි. නිදසුනක් ලෙස කොළඹ කලාපයෙහි ශිෂ්‍ය සාධනය ක්ෂේත්‍රය සඳහා ලබා ඇති මධ්‍යනායය ලකුණු වසර තුන සඳහාම 71-73 පරාසයේ පිහිටන අතර එය අනිකුත් කලාපවල එම ක්ෂේත්‍රයේ මධ්‍යනායය ලකුණුවලට වඩා ඉහළින්

පිහිටයි. ඉගෙනුම, ඉගැන්වීම හා ඇගයීම ක්ෂේත්‍රය සඳහා සෑම කලාපයකම මධ්‍යනය්‍ය ලකුණු පවතින්නේ 63-67 වැනි පටු පරාසයක බව දකින්නට තිබේ. කොළඹ හා ශ්‍රී ජයවර්ධනපුර කලාපවල විධිමත් විෂයමාලා කළමනාකරණය ක්ෂේත්‍රයෙහි මධ්‍යනය්‍ය ලකුණු පරාසය 65-68 අතර පිහිටන නමුත් හෝමාගම හා පිළියන්දල කලාපවල එය 59-65 පරාසයේ පවතී. විෂය සමගාමී කටයුතු ක්ෂේත්‍රයෙහි හෝමාගම කලාපය තුළ මධ්‍යනය්‍ය ලකුණු පරාසය 63-65 වුවත් අනිකුත් සියලුම කලාපවල සෑම වසරකම එම ලකුණු 68-74 පරාසයේ පිහිටයි. ශිෂ්‍ය සුබසාධනය ක්ෂේත්‍රයෙහි පිළියන්දල කලාපයේ ලකුණු මධ්‍යනය්‍ය 54-60 පරාසයේ පිහිටිය ද 2018 හා 2019 දෙවර්ෂයේ එම ලකුණු 60 මට්ටමේ පවතී. මෙම ක්ෂේත්‍රය සඳහා ඉහත දෙවර්ෂ තුළ අනිකුත් කලාපවල මධ්‍යනය්‍ය ලකුණු 60 ට ඉහළින් පිහිටන බව පෙනී යයි. නායකත්වය හා කළමනාකරණය ක්ෂේත්‍රය සඳහා වසර තුන සඳහා ම කොළඹ කලාපයෙහි මධ්‍යනය්‍ය ලකුණු 69-71 තරම් ඉහළ පරාසයක පිහිටන නමුත් අනිකුත් කලාපවල එම ලකුණු 55-67 පරාසයේ පවතී. භෞතික සම්පත් කළමනාකරණය ක්ෂේත්‍රය සඳහා පිළියන්දල කලාපය ලබා ඇති මධ්‍යනය්‍ය ලකුණු 70-71 අතර පැවතිය ද කොළඹ හා ශ්‍රී ජයවර්ධනපුර කලාපවල එම පරාසය 65-68 වේ. පිළියන්දල කලාපයෙහි පාසල හා ප්‍රජාව ක්ෂේත්‍රය සඳහා මධ්‍යනය්‍ය ලකුණු පරාසය 73-74 වැනි ඉහළ අගය පරාසයක පවතින නමුත් අනිකුත් කලාපවල සෑම වසරක දී ම ඒ සඳහා මධ්‍යනය්‍ය ලකුණු 70ට වඩා අඩු පරාසයක පවතී. පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකයෙහි (SEQI) අගයයන්හි මධ්‍යනය්‍ය සැළකූ විට 2017-2019 තෙවසරට අදාළව හෝමාගම කලාපය සඳහා එය 61-63 අතර පරාසයක පවතී. එය අනිකුත් කලාප සමග සංසන්දනය කිරීමේ දී අඩු අගය පරාසයකි. කොළඹ, පිළියන්දල හා ශ්‍රී ජයවර්ධනපුර කලාපවල තෙවසරෙහි SEQI අගයයන්හි මධ්‍යනය්‍ය 65-69 පරාසයේ පවතී. මේ අනුව කලාප අනුව ඇගයීම් ක්ෂේත්‍ර සඳහා ලකුණු ලැබී ඇති ආකාරයේ විවිධ වෙනස්කම් දක්නට ලැබේ.

එක් එක් කලාපය විසින් 2017-2019 වසරවල ලබා ඇති සම්මත අපගමන සැළකීමේ දී සමහර ඇගයීම් ක්ෂේත්‍රවල ලකුණු අපගමනය වීම සම්බන්ධයෙන් ද විශේෂ ලක්ෂණ දැකිය හැකිය. නිදසුනක් ලෙස පිළියන්දල කලාපයෙහි ඉගෙනුම ඉගැන්වීම ක්ෂේත්‍රය සඳහා වසර තුන සඳහාම සම්මත අපගමනය 3.0ට වඩා අඩු අගයක් පවතියි. නමුත් අනෙකුත් කලාපවල එම අගය සෑම වසරකම 3.0ට වඩා වැඩි මට්ටමක් පෙන්වයි. විෂයමාලා කළමනාකරණයේ දී ද කොළඹ කලාපය සෑම වසරකම සම්මත අපගමන අගය 9.0ට වඩා ඉහළ අගයක් පෙන්නුම් කළ ද අනිකුත් කලාප සියල්ලෙහිම එය 8.0 හෝ ඊට අඩු මට්ටමක දැක්වේ. එමෙන්ම භෞතික සම්පත් කළමනාකරණය හා පාසල හා ප්‍රජාව වැනි ඇගයීම් ක්ෂේත්‍ර සඳහා ද කොළඹ කලාපයෙහි ලකුණුවල සම්මත අපගමන අගය අනිකුත් කලාපවලට වඩා ඉහළ අගයක් පෙන්වයි. නමුත් එම ක්ෂේත්‍ර සඳහා පිළියන්දල හා ශ්‍රී ජයවර්ධනපුර කලාප ලබා ඇති ලකුණුවල සම්මත අපගමන අගයයන් 5.0 - 8.0 පරාසයේ පිහිටන බව පෙනී යයි. ඒ අනුව සළකා බැලීමේ දී දැකිය හැකි වන්නේ ඇගයීම් ක්ෂේත්‍ර ලකුණුවල සම්මත අපගමන අගයයන් එක් එක් කලාපවලට සුවිශේෂී වන පරාසවල පිහිටන බවයි. SEQI ලකුණුවල

සම්මත අපගමන අගයයන් සැළකූ විට පෙනී යන්නේ ඒවා ශිෂ්‍ය සාධනය ඇගයීම් ක්ෂේත්‍රය හැර අනිකුත් ඇගයීම් ක්ෂේත්‍ර ලකුණුවල සම්මත අපගමන අගයයන්ට වඩා අඩු ලකුණු මට්ටමක පිහිටන බවයි. එම සම්මත අපගමන අගයයන් සියල්ල 3.0 හා 9.0 යන අගය පරාසය තුළ පිහිටයි. නමුත් ඇගයීම් ක්ෂේත්‍ර වශයෙන් එම සම්මත අපගමන අගයයන් 1.0 සිට 17.0 ටත් ඉහළ අගය පරාසයක් දක්වා විහි දී ඇත. ඉගෙනුම ඉගැන්වීම ක්ෂේත්‍රයෙහි එම පරාසය විහිදී ඇත්තේ 1.0 සිට 8.0 දක්වා ය.

මේ අනුව අනාවරණය වන්නේ, සෑම වසරකම එක් එක් අධ්‍යාපන කලාපය විසින් පාසල් ඇගයීම සිදුකිරීමේ දී  ඇගයීම් ක්ෂේත්‍ර සඳහා පිරිනමා ඇති ලකුණු බොහෝ දුරට එම කලාපයට අනන්‍ය වූ ලකුණු පරාසයක පිහිටා ඇති බවයි. තව ද, වර්ෂ තුනෙහිම SEQI ලකුණුවල මධ්‍යන්‍යය අගයෙහි විසිරීම ද එක් එක් කලාපයට ආවේනික ලකුණු පරාසයක පිහිටන ආකාරය දකින්නට තිබේ. වසර තුනක් සඳහා එක් එක් කලාපවල පාසල් ලබාගෙන ඇති SEQI ලකුණුවලට අදාළ සම්මත අපගමන අගයයන් ද බොහෝ දුරට එම කලාපවලට ආවේනික පරාසවල පිහිටන බව ද පෙනී යයි.

එබැවින් කලාප කිහිපයක් අතර පාසල්වල ගුණාත්මක තත්ත්වය මැනීම සඳහා මිණුම් දණ්ඩක් නිශ්චය කිරීමේ දී SEQI ලකුණු මෙන්ම එම ලකුණු සකස් කෙරෙන ඇගයීම් ක්ෂේත්‍ර ලකුණුවලට අදාළ මධ්‍යන්‍යය අගයයන් සහ ඒවායේ සම්මත අපගමන අගයයන් ද වැදගත් වන බව පෙනී යයි.

**පරීක්ෂණ පියවර 1:**

කලාප කිහිපයක පාසල් ඇගයීම් කර ඇති ලකුණු අනුව ඒවා ශ්‍රේණිගත කිරීමේ දී  එක් එක් නියැදිවල මධ්‍යන්‍යය අතර වෙනස පිළිබඳ සංඛ්‍යාන අනුමිතීන් සිදු කර පරීක්ෂා කිරීම මගින් කලාප මට්ටමින් පාසල්වල සිදුකර ඇති බාහිර ඇගයීම්වල දී ප්‍රදානය කර ඇති ලකුණු කලාප කිහිපයක් සඳහා පොදු ලකුණක් ලෙස සැලකීමට ඇති හැකියාව පිළිබඳව සොයා ගැනීමට හැකි වේ. ඒ අනුව එක් එක් කලාපයෙන් තෝරාගත් පාසල් ස්වායත්ත කුඩා නියැදි ලෙස සළකා SEQI ලකුණුවල මධ්‍යන්‍යය අතර වෙනස පිළිබඳව කල්පිත පරීක්ෂාවක් සිදු කිරීම යෝග්‍ය වේ.

මෙහි දී ජනගහනය ප්‍රමතව ව්‍යාප්ත වන බව සළකා, කලාප දෙකක් අතර SEQI ලකුණුවල මධ්‍යන්‍යයන් අතර වෙනසක් නැත යන නල් කල්පිතය ($H_o$) $\alpha = 0.05$ මට්ටමින් විමසා බැදීම සිදු කළ හැකිය.

ඒ අනුව නල් කල්පිතය : $H_o : \mu_1 - \mu_2 = 0$

විකල්ප කල්පිතය : $H_1 : \mu_1 - \mu_2 \neq 0$

$n < 30$ බැවින් ස්වායත්ත කුඩා නියැදි සඳහා පරීක්ෂා සංඛ්‍යාතිය ඃ

$$t = \frac{(\bar{x}_1 - \bar{x}_2) - (\mu_1 - \mu_2)}{\sqrt{\frac{(n_1-1){s_1}^2 + (n_2-1){s_2}^2}{n_1+n_2-2}\left[\frac{1}{n_1} + \frac{1}{n_2}\right]}}$$

නියැදි තරම කුඩාවන බැවින් අගයයන් වැඩි ප්‍රමාණයක් 90% ක සීමාවෙහි පිහිටන බව සැලකූ විට, $\alpha = 0.1$ අනුව, අවධි ප්‍රදේශය තීරණය ලබා ගත හැකි වේ.

එවිට 2017 වසරේ කොළඹ හා ශ්‍රී ජයවර්ධනපුර කලාපවල SEQI සඳහා,

$$\bar{x}_1 = 67.2941 \qquad S_1 = 6.0853\ ;\ n_1 = 17$$

$$\bar{x}_2 = 66.05 \qquad S_2 = 5.343\ ;\ n_2 = 20$$

$$t = \frac{(67.2941 - 66.05) - (0)}{\sqrt{\frac{16(6.0853)^2 + 19(5.343)^2}{35}\left[\frac{1}{17} + \frac{1}{20}\right]}} = 0.662292$$

අවධි පෙදෙසට අදාළ t හි අගය $\alpha/2 = 0.05$, $t_{(n1 + n2 - 2,\ 0.05)} = t_{(35,\ 0.05)} = 1.69$

ඒ අනුව නල් කල්පිතය $H_o$ පිළිගැනීමට සිදු වේ. එනම් 2017 වසරේ දී කොළඹ හා ශ්‍රී ජයවර්ධනපුර කලාපවල පාසල් බාහිර ඇගයීම්වල දී ප්‍රතිපල ලෙස ගණනය කර ඇති SEQI ලකුණු කලාප දෙකම සඳහා පොදු ලකුණු ලෙස භාවිත කළ හැකිය. එබැවින් එම වසරෙහි ඉහත කලාප දෙකෙහිම 1AB පාසල්වල බාහිර ඇගයීම් ලකුණු මිනුමක් ලෙස සළකා ඒ අනුව එම වර්ගයේ පාසල් ශ්‍රේණිගත කළ හැකි වේ.

මේ ආකාරයට 2017, 2018 හා 2019 වර්ෂ සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ සියලුම අධ්‍යාපන කලාප යුගල සම්බන්ධයෙන් පරීක්ෂා කළ හැකි අතර එහි ප්‍රතිපල පහත දැක්වෙන පරිදි ඉදිරිපත් කළ හැකිය.

වගුව 3 : පාසල්වල අධ්‍යාපන ගුණාත්මක දර්ශක (SEQI) ලකුණු කලාප අතර පොදුවේ භාවිත කිරීමට ඇති හැකියාව පිරික්සා බැලීම

| | සංසන්දනය කරන කලාප | $\bar{X}$ | s | n | t | අවධි පෙදෙස $\alpha/2 = 0.05$ | $H_o$ |
|---|---|---|---|---|---|---|---|
| 2017 | කොළඹ<br>ශ්‍රී ජයවර්ධනපුර | 67.2941<br>66.05 | 6.0853<br>5.343 | 17<br>20 | 0.662292 | ∓ 1.69 | පිළිගැනේ. |
| | කොළඹ<br>හෝමාගම | 67.2941<br>62.0 | 6.0853<br>5.8652 | 17<br>05 | 1.722325 | ∓ 1.721 | ප්‍රතික්ෂේප වේ. |
| | කොළඹ<br>පිළියන්දල | 67.2941<br>65.3333 | 6.0853<br>5.6999 | 17<br>15 | 0.936797 | ∓ 1.697 | පිළිගැනේ. |
| | ශ්‍රී ජයවර්ධනපුර<br>හෝමාගම | 66.05<br>62.0 | 5.343<br>5.8652 | 20<br>05 | 1.489677 | ∓ 1.714 | පිළිගැනේ. |
| | ශ්‍රී ජයවර්ධනපුර<br>පිළියන්දල | 66.05<br>65.3333 | 5.343<br>5.6999 | 20<br>15 | 0.381697 | ∓ 1.69 | පිළිගැනේ. |
| | හෝමාගම<br>පිළියන්දල | 62.0<br>65.3333 | 5.8652<br>5.6999 | 05<br>15 | -1.12513 | ∓ 1.734 | පිළිගැනේ. |
| 2018 | කොළඹ<br>ශ්‍රී ජයවර්ධනපුර | 69.7667<br>65.95 | 8.3134<br>4.2834 | 30<br>20 | 1.888428 | ∓ 1.68 | ප්‍රතික්ෂේප වේ. |
| | කොළඹ<br>හෝමාගම | 69.7667<br>61.4286 | 8.3134<br>5.9005 | 30<br>07 | 2.498063 | ∓ 1.69 | ප්‍රතික්ෂේප වේ. |
| | කොළඹ<br>පිළියන්දල | 69.7667<br>65.625 | 8.3134<br>6.8727 | 30<br>16 | 1.703883 | ∓ 1.68 | ප්‍රතික්ෂේප වේ. |
| | ශ්‍රී ජයවර්ධනපුර<br>හෝමාගම | 65.95<br>61.4286 | 4.2834<br>5.9005 | 20<br>07 | 2.180235 | ∓ 1.708 | ප්‍රතික්ෂේප වේ. |
| | ශ්‍රී ජයවර්ධනපුර<br>පිළියන්දල | 65.95<br>65.625 | 4.2834<br>6.8727 | 20<br>16 | 0.173774 | ∓ 1.69 | ප්‍රතික්ෂේප වේ. |
| | හෝමාගම<br>පිළියන්දල | 61.4286<br>65.625 | 5.9005<br>6.8727 | 07<br>16 | -1.40104 | ∓ 1.721 | පිළිගැනේ. |
| 2019 | කොළඹ<br>ශ්‍රී ජයවර්ධනපුර | 69.35<br>68.364 | 9.4865<br>5.0681 | 17<br>11 | 0.316704 | ∓ 1.706 | පිළිගැනේ. |
| | කොළඹ<br>හෝමාගම | 69.35<br>63.81 | 9.4865<br>3.7899 | 17<br>04 | 1.128398 | ∓ 1.729 | පිළිගැනේ. |
| | කොළඹ<br>පිළියන්දල | 69.35<br>68.357 | 9.4865<br>4.3195 | 17<br>14 | 0.360139 | ∓ 1.699 | පිළිගැනේ. |
| | ශ්‍රී ජයවර්ධනපුර<br>හෝමාගම | 68.364<br>63.81 | 5.0681<br>3.7899 | 11<br>04 | 1.62234 | ∓ 1.771 | පිළිගැනේ. |
| | ශ්‍රී ජයවර්ධනපුර<br>පිළියන්දල | 68.364<br>68.357 | 5.0681<br>4.3195 | 11<br>14 | 0.003728 | ∓ 1.714 | පිළිගැනේ. |
| | හෝමාගම<br>පිළියන්දල | 63.81<br>68.357 | 3.7899<br>4.3195 | 04<br>14 | -1.89814 | ∓ 1.746 | ප්‍රතික්ෂේප වේ. |

ඉහත වගුවෙන් නිරූපනය වන පරිදි t පරීක්ෂාව අනුව, 2017 වසරේ දී කොළඹ, ශ්‍රී ජයවර්ධනපුර හා පිළියන්දල යන කලාපවල 1AB පාසල් විසින් ලබා ඇති පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශක (SEQI) ලකුණු පොදුවේ විශ්ලේෂණය කිරීමට හෝ එම ලකුණු අනුව පාසල් ශ්‍රේණිගත කිරීමට හැකියාව ඇත. නමුත් හෝමාගම කලාපය හා කොළඹ කලාපය එක්ව ගතහොත් ඒවායේ 1AB පාසල් SEQI ලකුණු පදනම්ව ශ්‍රේණිගත කිරීම දෝෂ සහිත විය හැකි බව පෙනී යයි. මේ අනුව 2017 වර්ෂයේ දී කොළඹ දිස්ත්‍රික්කයෙහි සියලුම අධ්‍යාපන කලාපවල ඇති 1AB පාසල්වල SEQI අගයයන් සියල්ල සඳහා තනි මධ්‍යන්‍යයක් පවතින ලෙස සැළකීම හෝ ඒවා එකම ජනගහනයකින් ලබා ගත් බව සැළකීම නුසුදුසු වේ. 2018 වසරේ දී හෝමාගම - පිළියන්දල කලාප යුගලයේ පමණක් පාසල්වල SEQI ලකුණු පොදු ලෙස සලකා කටයුතු කළ හැකි වුව ද, එම වසරේ දී අනිකුත් කලාප යුගල පහ සඳහා SEQI අගයයන් පොදු ලකුණු ලෙස පැවතීමට හැකියාවක් නැත. එම නිසා 2018 වසරේ දී පාසල්වල SEQI ලකුණු සමස්ත දිස්ත්‍රික්කය තුළ විශ්ලේෂණය සඳහා පොදුවේ සැලකිය නොහැකි වේ. 2019 වසරේ දී ද හෝමාගම හා පිළියන්දල කලාප එක්ව ගත් විට එම කලාපවල පාසල් ලබා ඇති SEQI ලකුණු එම කලාප දෙක අතර පොදු ලකුණු ලෙස සලකා විශ්ලේෂණ සිදු කළ නොහැකි වේ. 2017 හා 2019 වර්ෂවල දී කොළඹ හා ශ්‍රී ජයවර්ධනපුර කලාපවලට අදාළ SEQI ලකුණු එම කලාප දෙක අතර පොදු ලකුණු ලෙස සලකා කටයුතු කළ හැකි වුව ද, 2018 වසර සඳහා එසේ සැලකීමට නොහැකිය. එසේම 2017 හා 2018 වසරවල හෝමාගම හා පිළියන්දල කලාපවල SEQI ලකුණු පොදු ලෙස පිළිගෙන කටයුතු කළ හැකි වුව ද, 2019 වසර සඳහා එසේ කළ නොහැකි බව තහවුරු වන බැවින් එම ලකුණු කලාප දෙක අතර පොදුවේ සලකා විශ්ලේෂණ සිදු කළ නොහැකි වේ. මේ ආකාරයට ම කොළඹ - හෝමාගම, කොළඹ - පිළියන්දල, ශ්‍රී ජයවර්ධනපුර - හෝමාගම සහ ශ්‍රී ජයවර්ධනපුර - පිළියන්දල යන කලාප යුගල අතර 2018 වසරට අදාළ SEQI ලකුණු ද කලාප සියල්ල සඳහා පොදු ලකුණු ලෙස සැලකිය නොහැකි වේ.

මේ අනුව කිසියම් වසරක එක් එක් කලාප මඟින් සිදු කර ඇති පාසල් බාහිර ඇගයීම්වලට අදාළව එම පාසල්වලට ලැබී ඇති SEQI ලකුණු සමහර කලාප අතර පොදු ලකුණක් ලෙස සැලකිය හැකි අවස්ථා දැකිය හැකි මෙන්ම සමහර කලාප අතර ඒවා පොදු ලකුණු ලෙස සැලකිය නොහැකි බව පෙනී යයි. තව ද කිසියම් වර්ෂයක කලාප දෙකක් අතර පාසල් ලබා ඇති SEQI ලකුණු අනුව එම ලකුණු කලාප දෙකටම පොදු ලකුණු ලෙස සලකා එම පාසල්වල ගුණාත්මක තත්ත්වය සංසන්දනය කළ හැකි සම්භාවිතාවක් පැවතිය ද, ආසන්න වෙනත් වසරක දී එම කලාප දෙක අතර එසේ SEQI ලකුණු පොදුවේ සැලකීමට නොහැකි අවස්ථා ඇති බව ද දැකිය හැකිය.

**පරීක්ෂණ පියවර 2:**

මෙම පියවර තුළ අධ්‍යාපන ගුණාත්මක තත්ත්වයට අනුව පාසල් තාරා කිරීමේ දී SEQI වටිනාකමෙහි ප්‍රමත අගය (Z) පදනම් කර ගැනීමේ යෝග්‍යතාව පරීක්ෂා කෙරේ. පාසල්වල SEQI ලකුණුවලට අදාළ Z අගයයන් අනුව තාරාව ලබා ගැනීම හා මාන් විට්නි U පරීක්ෂාව සඳහා සූදානම් කිරීම කොළඹ හා

ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපවලින් 2017 ලබා ගත් තොරතුරු ආශ්‍රයෙන් පහත දැක්වෙන පරිදි ඉදිරිපත් කිරීමට හැකිය.

වගුව 4 : කලාප දෙකක 1AB පාසල්වල Z අගයයන් අනුව ඒවාට අයත් තාරාව

| | කොළඹ කලාපය | | | ශ්‍රී ජයවර්ධනපුර කලාපය | | |
|---|---|---|---|---|---|---|
| | SEQI ලකුණු | Z ලකුණු | තාරාව | SEQI ලකුණු | Z ලකුණු | තාරාව |
| 1 | 79 | 1.20266337 | 37 | 74 | 0.99825876 | 36 |
| 2 | 75 | 0.72019541 | 33 | 73 | 0.66047750 | 32 |
| 3 | 71 | 0.27439473 | 22 | 72 | 0.76672010 | 35 |
| 4 | 71 | 0.41353105 | 28 | 72 | 0.75333085 | 34 |
| 5 | 70 | 0.34134622 | 25 | 70 | 0.48419631 | 30 |
| 6 | 70 | 0.31937530 | 24 | 70 | 0.39969275 | 26 |
| 7 | 70 | 0.28090731 | 23 | 70 | 0.50087366 | 31 |
| 8 | 69 | 0.12338392 | 19 | 70 | 0.44971907 | 29 |
| 9 | 68 | 0.04093882 | 16 | 69 | 0.40083608 | 27 |
| 10 | 68 | 0.09277409 | 18 | 67 | 0.15000535 | 20 |
| 11 | 68 | 0.07054734 | 17 | 67 | 0.16014608 | 21 |
| 12 | 66 | -0.16487638 | 15 | 65 | -0.24885881 | 13 |
| 13 | 64 | -0.29274103 | 12 | 65 | -0.20478156 | 14 |
| 14 | 63 | -0.47710308 | 11 | 61 | -0.62294739 | 7 |
| 15 | 62 | -0.49751709 | 10 | 61 | -0.50913758 | 9 |
| 16 | 58 | -0.98136714 | 3 | 61 | -0.75840656 | 6 |
| 17 | 52 | -1.45749203 | 1 | 60 | -0.57629585 | 8 |
| 18 | | | | 59 | -0.89618784 | 5 |
| 19 | | | | 59 | -0.93655732 | 4 |
| 20 | | | | 56 | -1.43299677 | 2 |
| | $n_1 = 17$ | $\sum R_1$ | 314 | $n_2 = 20$ | $\sum R_2$ | 389 |

$H_o$ : කලාප දෙකෙහි පාසල්වල ගුණාත්මක දර්ශකවල ප්‍රමත අගය එකම ජනගහනයෙන් ලබාගත් නියැදීන් ලෙස සලකා පොදු තාරා කිරීමක් යටතට පත් කළ හැකිය.

$H_1$ : කලාප දෙකෙහි පාසල්වල ගුණාත්මක දර්ශකයන්හි ප්‍රමත අගය එකම ජනගහනයෙන් ලබාගත් නියැදීන් ලෙස සලකා පොදු තාරා කිරීමක් යටතට පත් කළ නොහැකිය.

$$U_1 = n_1 n_2 + \frac{n_1(n_1+1)}{2} - \sum R_1 = 340 + 153 - 314 = 179$$

$$U_2 = n_1 n_2 + \frac{n_2(n_2+1)}{2} - \sum R_2 = 340 + 210 - 389 = 161$$

$U_2 < U_1$ නිසා $U_2 = 161$ සැළකේ.

නමුත් එක් පැති පරීක්ෂාව සඳහා U වගුවෙහි $\alpha = 0.05$ අදාළ අවධි අගය = 115

$161 > 115$ බැවින් $H_o$ පිළිගැනේ.

මේ ආකාරයට 2017, 2018 හා 2019 වර්ෂවල කොළඹ, ජයවර්ධනපුර, පිළියන්දල හා හෝමාගම යන කලාපවල පාසල් බාහිර ඇගයීම් ලකුණුවල ප්‍රමත අගයයන් සම්බන්ධව ඉහත පරීක්ෂාව සිදු කිරීමට හැකිය.

නමුත් $n > 20$ වන විට, $Z = \frac{U - n_1 n_2/2}{\sqrt{n_1 n_2(n^1 + n^2 + 1)/12}}$ මඟින්

$\alpha = 0.05$ අදාළ අවධි ප්‍රදේශය $-1.96 > Z > 1.96$ ට අනුව පරීක්ෂා කරනු ලැබේ.

ඒ අනුව පහත සඳහන් වගුවෙන් එම පරීක්ෂා කිරීම්වල අනාවරණ ඉදිරිපත් කළ හැකිය.

වගුව 5 : කලාප අතර U සංඛ්‍යාතිය අනුව කල්පිත පරීක්ෂාවේ ප්‍රතිපල දැක්වීම

| වසර | කලාපය 1 | $n_1$ | කලාපය 2 | $n_2$ | U | අවධි අගය | $H_o$ පිළිබඳ තීරණය |
|---|---|---|---|---|---|---|---|
| 2017 | කොළඹ | 17 | පිළියන්දල | 15 | 122 | 83 | පිළිගැනේ. |
| | කොළඹ | 17 | හෝමාගම | 05 | 35 | 20 | පිළිගැනේ. |
| | ශ්‍රී ජ'පුර | 20 | පිළියන්දල | 15 | 148 | 100 | පිළිගැනේ. |
| | ශ්‍රී ජ'පුර | 20 | හෝමාගම | 05 | 48 | 25 | පිළිගැනේ. |
| | පිළියන්දල | 15 | හෝමාගම | 05 | 33 | 18 | පිළිගැනේ. |
| 2018 | කොළඹ | 30 | ශ්‍රී ජ'පුර | 20 | -1.20798 | $\pm$ 1.96 | පිළිගැනේ. |
| | කොළඹ | 30 | පිළියන්දල | 16 | -0.83028 | $\pm$ 1.96 | පිළිගැනේ. |
| | කොළඹ | 30 | හෝමාගම | 07 | -0.62045 | $\pm$ 1.96 | පිළිගැනේ. |
| | ශ්‍රී ජ'පුර | 20 | පිළියන්දල | 16 | 154 | 107 | පිළිගැනේ. |
| | ශ්‍රී ජ'පුර | 20 | හෝමාගම | 07 | 64 | 39 | පිළිගැනේ. |
| | පිළියන්දල | 16 | හෝමාගම | 07 | 54 | 30 | පිළිගැනේ. |
| 2019 | කොළඹ | 17 | ශ්‍රී ජ'පුර | 11 | 90 | 57 | පිළිගැනේ. |
| | කොළඹ | 17 | පිළියන්දල | 14 | 116 | 77 | පිළිගැනේ. |
| | කොළඹ | 17 | හෝමාගම | 04 | 29 | 15 | පිළිගැනේ. |
| | ශ්‍රී ජ'පුර | 11 | පිළියන්දල | 14 | 75 | 46 | පිළිගැනේ. |
| | ශ්‍රී ජ'පුර | 11 | හෝමාගම | 04 | 21 | 08 | පිළිගැනේ. |
| | පිළියන්දල | 14 | හෝමාගම | 04 | 27 | 11 | පිළිගැනේ. |

ඉහත වගුවට අනුව අප්‍රතිෂ්ඨයෙය කල්පිතය ($H_o$) නිරූපිත මෙම පරීක්ෂාවේ ප්‍රතිපල මඟින් පෙනී යන්නේ සෑම වසරක් තුළම එක් එක් කලාපයට අයත් පාසල්වල අධ්‍යාපන ගුණාත්මක දර්ශකයේ ප්‍රමත අගය සැසඳීමේ දී එම නියැදි අතර වෙසෙසි වෙනසක් නොපවතින බවයි.

ඒ අනුව එක් එක් වසර සඳහා අධ්‍යාපන කලාප යුගල වශයෙන් ගත් කළ ඒවායේ අධ්‍යාපන ගුණාත්මක දර්ශකවල ප්‍රමත අගය කලාප දෙක ම යටතේ භාවිත කළ හැකි අගයක් බවට පත් වී ඇති බව පෙනී යයි. එනම් වෙනස් කලාපවල පාසල්වල අධ්‍යාපන ගුණාත්මක දර්ශකයේ ප්‍ර මත අගයයන් වෙන වෙනම ගණනය කළ ද ඒවා එකම ජනගහනයකින් ලබා ගත් අගයයන් ලෙස සළකා කටයුතු කළ හැකිය. එබැවින් දිස්ත්‍රික්කයට අයත් සියලුම අධ්‍යාපන කලාප තුළ පාසල්වල ගුණාත්මක තත්ත්වය සංසන්දනය කිරීම හෝ ඒ අනුව පාසල් ශ්‍රේණිගත කිරීම සඳහා පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක දර්ශකය පදනම් කරගත් ප්‍රමත අගය භාවිතයට හැකියාව ඇති බව පෙනී යයි. තව ද එක් එක් වර්ෂයට අදාළව මෙම පර්යේෂණය සඳහා යොදාගත් අධ්‍යාපන කලාපවල ඇගයීම් කර ඇති පාසල් සංඛ්‍යා වෙනස් වුව ද, අධ්‍යාපන ගුණාත්මක දර්ශකයෙහි ප්‍රමත ලකුණ සැලකූ විට එම සෑම වර්ෂයක් සඳහා ම වෙන වෙනම කෙරෙන පරීක්ෂාවේ දී අප්‍රතිෂ්ඨය කල්පිතය ($H_o$) පිළිගැනීමට හැකිවන ප්‍රතිපලයෙහි වෙනසක් නොවන බව දක්නට ඇත.

කිසියම් කලාපයක හෝ කලාප කිහිපයක පාසල් වැඩි සංඛ්‍යාවක් එකම අධ්‍යාපන ගුණාත්මක දර්ශක ලකුණක් ලැබීමට ඇති අවස්ථා පවතින නමුත් ගුණාත්මක දර්ශකය ප්‍රමත ලෙස ලබා ගැනීමේ දී කිසිඳු පාසල් දෙකක් එකම ලකුණු ලබා ගත් අවස්ථා දක්නට නැත.

පාසල් ඇගයීමෙන් පසු අධ්‍යාපන ගුණාත්මක දර්ශකය මධ්‍යන්‍යය ප්‍රතිශතයක් ලෙස සකස් කිරීම අතින් සිදු කළ හැකි ගණනය කිරීමක් වුවත් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය ප්‍රමත අගයක් ලෙස ගණනය කිරීම අතින් කිරීම තරමක් අසිරු හා කාලය ගතවන කාර්යයකි. එවැනි ගණනය කිරීම් සිදු කිරීම සඳහා පරිගණකයක් මෙවලමක් ලෙස යොදා ගැනීමට අවශ්‍ය වේ.

## 6. නිගමන ፡

- කිසියම් අධ්‍යාපන කලාපයක් තුළ සිදු කරනු ලබන පාසල් බාහිර ඇගයීම්වල දී ඇගයීම් ක්ෂේත්‍ර වලට ලබා දෙන ලකුණු සඳහා, කලාපයෙහි පාසල් ඇගයීම් කණ්ඩායම් දක්වන ආකල්ප, ලකුණු ලබා දීමේ පුද්ගලබද්ධ ස්වභාවය හා එම කලාපවලට ආවේනික සුවිශේෂී ලක්ෂණ වැනි විවිධ සාධක බලපායි. එබැවින් කොළඹ දිස්ත්‍රික්කය තුළ එක් එක් අධ්‍යාපන කලාපයට අදාළව පාසල්වල ඇගයීම් ක්ෂේත්‍රවලට පිරිනමන ලකුණු හා පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශක (SEQI) ලකුණු සඳහා එම කලාපවලට අනන්‍ය වන ලකුණු පරාස පැවතිය හැකි ය.

- කොළඹ දිස්ත්‍රික්කයෙහි කිසියම් අධ්‍යාපන කලාපයක් තුළ ගුණාත්මක තත්ත්වය මත 1AB පාසල් ශ්‍රේණිගත කිරීම සඳහා පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය (SEQI) භාවිත කිරීම සාධාරණ වුව ද, දිස්ත්‍රික්කයෙහි අධ්‍යාපන කලාප සියල්ලේ ම ඇති 1AB පාසල් ඒවායේ ගුණාත්මක තත්ත්වය අනුව සංසන්දනය කිරීමේ දී එම පාසල් ලබා ඇති SEQI ලකුණු පදනම් කර ගැනීම සාධාරණ වන ප්‍රමාණාත්මක මිණුමක් ලෙස සැලකිය නොහැකි ය.

- කොළඹ දිස්ත්‍රික්කයෙහි වසරක් තුළ 1AB පාසල් බාහිර ඇගයීමට ලක්කර ලබා දී ඇති අධ්‍යාපන ගුණාත්මක දර්ශක අගයයන් (SEQI) සියල්ල එම දිස්ත්‍රික්කයේ සෑම කලාපයකටම පොදු ගුණාත්මක දර්ශකයක තත්ත්වය පත් කර ගැනීම සඳහා එම SEQI ලකුණු සම්මතකරණය කර පොදු මිණුම් දණ්ඩක් තෝරා ගැනීම යෝග්‍ය වේ.
- දිස්ත්‍රික්කයක් තුළ පාසල්වල ගුණාත්මක තත්ත්වය මැනීම/සංසන්දනය කිරීම සඳහා පොදු මිණුම් දණ්ඩක් නිශ්චය කිරීමේ දී පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශක ලකුණු (SEQI) මත ගණනය කරනු ලබන මධ්‍යන්‍යය හා සම්මත අපගමනය යන පරාමිතීන් නියෝජනය කරන ප්‍රමත අගය එනම් Z අගය යොදා ගැනීම වඩාත් සාධාරණ වේ.
- කොළඹ දිස්ත්‍රික්කයේ 1AB පාසල් ඒවායේ ගුණාත්මක මට්ටම අනුව ශ්‍රේණිගත කිරීමේ දී යෝග්‍ය හා සාධාරණ මිණුම් දණ්ඩක් ලෙස පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශක සම්මිතකරණයට ලක්කළ විට ලැබෙන ප්‍රමත අගය ( Z ) යොදා ගැනීමට හැකියාව පවතී.
- දිවයින තුළ ඕනෑම දිස්ත්‍රික්කයක හෝ පළාතක ඇති සියලුම 1AB පාසල් ඒවායේ බාහිර ඇගයීම් ලකුණු පදනම් කර ගනිමින් සකස් කරනු ලබන ප්‍රමත අගය අනුසාරයෙන් දිස්ත්‍රික් මට්ටමින් හෝ පළාත් මිටටමින් ශ්‍රේණිගත කිරීමට ලක්කළ හැකි වේ.
- පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය සම්මතකරණයට ලක් කළ පසු පාසල් දෙකක් සඳහා එකම ප්‍රමත වටිනාකම ලැබීමට ඇති හැකියාව ඉතාමත්ම සීමිත වේ. එමගින් පාසල් ශ්‍රේණිගත කිරිමේ දී ප්‍රමත අගය ( Z ) භාවිතයට ගැනීමේ යෝග්‍යතාව තවදුරටත් තහවුරු වේ.

## 7. යෝජනා :

- පළාත් /ජාතික මට්ටමින් පාසල්වල ගුණාත්මක තත්ත්වය මත එම පාසල් ශ්‍රේණිගත කිරීම සඳහා පාසල් ඇගයීම් ක්ෂේත්‍ර ලකුණු අනුව සකස් කරනු ලබන ප්‍රමත වටිනාකම ( Z ) භාවිතයට ගැනීම සඳහා අධ්‍යාපන කළමනාකරණ ක්‍රියාවලිය දැනුවත් කිරීම අවශ්‍ය වේ.
- දිස්ත්‍රික් / පළාත් / ජාතික මට්ටමින් 1AB පාසල් මෙන්ම 1C පාසල්, 2 වර්ගයේ පාසල් හා 3 වර්ගයේ පාසල් ද අධ්‍යාපනයේ ගුණාත්මක බව අනුව ශ්‍රේණිගත කිරීම සඳහා වාර්ෂිකව බාහිර ඇගයීම්වල දී එම පාසල් ඇගයීම් ක්ෂේත්‍ර සඳහා ලබා ඇති ලකුණුවල ප්‍රමත අගය භාවිත කිරීම සුදුසු වේ.
- පාසල්වල ඇගයීම් ක්ෂේත්‍ර සඳහා පිරිනමා ඇති ලකුණු ඇතුලත් කරන විට එම ලකුණු අනුසාරයෙන් ප්‍රමත වටිනාකම ( Z ) ගණනය කිරීම සඳහා සුදුසු හා පහසු පරිගණක මෘදුකාංගයක් අධ්‍යාපන පද්ධතියට හඳුන්වා දීම වැදගත් වේ.
- වාර්ෂිකව පාසල් දිස්ත්‍රික්ක / පළාත් මට්ටමින් ශ්‍රේණිගත කිරීම සඳහා සෑම පාසලක්ම වසරකට වරක් බාහිර ඇගයීමට ලක්කර SEQI ලකුණු සකස් කිරීම අත්‍යාවශ්‍ය වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ :


ජයසූරිය, සී. (2017). අධ්‍යාපන පර්යේෂණ ක්‍රමශිල්ප. කොට්ටාව; සාර ප්‍රකාශන.

පෙරේරා, එල්. (1999). විස්තරාත්මක අධ්‍යාපනික සංඛ්‍යානය, කොට්ටාව; සාර ප්‍රකාශන.

ලලිතධීර, කේ.ඒ. (2010). පර්යේෂණ ක්‍රමවේදය 2. හෝමාගම.

වන්නිගම, සී. (2004). අධ්‍යාපන හා මනෝවිද්‍යාත්මක පර්යේෂණ සඳහා අනුමිතික සංඛ්‍යානය. කොට්ටාව; සාර ප්‍රකාශන.

Chicago Public Schools (2019). School Quality Rating Policy (SQRP) Handbook. Chicago: Department of School Quality Measurement and Research.

Ministry of Education (2014). Our School, How good is it?; Evaluation process for quality assurance in school education, Battaramulla, Sri Lanka: Government Press.

Ministry of Education (2017). Annual Report, Quality Assurance in School Education, Battaramulla, Sri Lanka.

Ministry of Education (2018). Annual Report, Quality Assurance in School Education, Battaramulla, Sri Lanka.

Ministry of Education (2019). Annual Report, Quality Assurance in School Education, Battaramulla, Sri Lanka.

National Education Commission (2016). Enhancing the Quality of Education – Proposals for the National Policy on General Education in Sri Lanka, Nugegoda, Sri Lanka.

Poojitha, S. (2011). Gurusitha 01/[photograph].Retrieved from www.divaina.com/2011/12/26/gurusitha01.html.

U.S.Department of Education. National Center for Education Statistics.(2000). Monitoring School Quality: An Indicators Report, NCES 2001–030 by Daniel P. Mayer, John E. Mullens, and Mary T. Moore Washington,DC: Office of Educational Research and Improvement.

# ප්‍රමිති පාදක ඇගයීම් ක්‍රියාවලියට අදාළව පාසලක තොරතුරු වාර්තාකරණය සඳහා සරල හා ක්‍රමවත් යාන්ත්‍රණයක් හඳුන්වා දීම

කේ.ටී.ඩී.විමලසිරි (MA, PGDE , PGDW&C, BA)
නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන කාර්යාලය, හොරණ
0713070724 / ktdwimalasiri@yahoo.com

කේ.එස්.විජේසුන්දර (MEd, PGDE, DSM, B.Sc)
කළමනාකරු (විශ්‍රාමික), ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය, හොරණ
071237373801 / kswijesundhara@gmail.com

## සංක්ෂිප්තය

ප්‍රමිති පාදක බාහිර හා අභ්‍යන්තර පාසල් ඇගයීම් ක්‍රියාවලිය මගින් ඵලදායී හා කාර්යක්ෂම පාසල් පද්ධතියක් පැවතීම තහවුරු කරනු ලබයි. ලිපි ගොනු කළමනාකරණයේ පවතින දුර්වලතා පාසල්වල අධ්‍යාපන ගුණාත්මක දර්ශකය පහළ අගයක් ගැනීමට බලපාන ප්‍රධාන සාධකයකි. මෙම පර්යේෂණයේ අරමුණ වූයේ ලිපි ගොනු කළමනාකරණයේ දුර්වලතා සහිත පාසලක ප්‍රමිති පාදක ඇගයීම් ක්‍රියාවලියට අදාළව තොරතුරු වාර්තාකරණය සඳහා සරල හා ක්‍රමවත් යාන්ත්‍රණයක් හඳුන්වාදීමයි. පර්යේෂණය ආරම්භයේදී ප්‍රමිති පාදක ඇගයීම් වැඩපිළිවෙල සම්බන්ධයෙන් පර්යේෂණයට බඳුන් වූ පාසලේ විදුහල්පතිවරයා මෙන්ම ගුරුභවතුන් සතුව පැවති අවබෝධය ප්‍රමාණවත් මට්ටමක නොවිණි. ඇගයීම් වැඩපිළිවෙලෙහි අරමුණු, එමගින් පාසලට ලබාගත හැකි ප්‍රයෝජන හා ලිපි ගොනු සකස් කරගන්නා ආකාරය පිළිබඳව ඔවුන් සතු දැනුම, ආකල්ප හා කුසලතා පහළ මටට්මක පැවතිණ. පිරික්සුම් ලැයිස්තු, ව්‍යුහගත සම්මුඛ සාකච්ජා නියමාවලි, නිරීක්ෂණ පත්‍රිකා මගින් පෙර ඇගයීමක් ආශ්‍රිතව ඉහත තොරතුරු තහවුරු කරගන්නා ලදි. ප්‍රමිති පාදක ඇගයීම් ක්‍රියාවලිය සාර්ථකව ක්‍රියාත්මක වන තෝරාගත් පාසල් කිහිපයක ක්ෂේත්‍ර අධ්‍යයන වැඩමුළු ක්‍රියාත්මක කර මැදිහත්වීමේ අවස්ථා තුනක් යටතේ මෙම පාසලේ විදුහල්පතිවරයා සහ ගුරු මණ්ඩලයට ඒ පිළිබඳ පූර්ණ අවබෝධයක් න්‍යායාත්මක හා ප්‍රායෝගික මට්ටමින් ලබාදීමට කටයුතු කරන ලදි. මාස කිහිපයකට පසු සිදු කරන ලද පසු ඇගයීම හා ප්‍රමිති පාදක බාහිර ඇගයීම මගින් විදුහල්පතිතුමා සහ ගුරු මණ්ඩලය විසින් ලබාගත් අත්දැකීම් තුළින් පාසලේ සමස්ත ලේඛන කළමනාකරණය හා තොරතුරු ගොනුගත කිරීමේ තත්ත්වය ඉහළ මට්ටමකට ළඟා වී ඇති බව තහවුරු විය. ප්‍රමිති පාදක ඇගයීම් ක්ෂේත්‍ර අටෙන් හයක ලකුණු සහ පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය ද වර්ධනය වී තිබුණි. ඉතුරු ක්ෂේත්‍ර දෙකෙන් එකක් පෙර පැවති තත්ත්වයේ ම වූ අතර එක් ක්ෂේත්‍රයක් පසුබෑමට ලක්ව තිබිණි. පසුබෑමට ලක්ව තිබූ ක්ෂේත්‍රය සඳහා පෙර ඇගයීම සිදු කළ ඇගයුම්කරුගේ පුද්ගලබද්ධතාව බලපා ඇති බව තහවුරු විය. මෙම පර්යේෂණයේ පර්යේෂකයින් වශයෙන් ප්‍රමිති පාදක ඇගයීමට අදාළ ලිපි ගොනු කළමනාකරණය සම්බන්ධ නව ප්‍රවණතා හඳුනාගැනීම, බාහිර ඇගයීම් ක්‍රියාවලිය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නිපුණතා ළඟා කරගැනීමට හා අගැයුම්කරුවන් වශයෙන් උපදේශනාත්මක භූමිකාව ශක්තිමත් කරගැනීම සඳහා මෙමගින් අවස්ථාව සැලසිණ.

**මුඛ්‍ය පද : ලිපි ගොනු කළමනාකරණය, තොරතුරු වාර්තාකරණය, පුද්ගලබද්ධභාවය**

## 1. අධ්‍යයන ගැටලුව

ඉහළ ඵලදායිතාවයකින් හා කාර්යක්ෂමතාවයකින් යුත් පාසල් පද්ධතියක් නිර්මාණය කිරීමේ අරමුණ ඇතිව අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව මගින් 2001 වර්ෂයේ සිට පාසල් පද්ධතියට හඳුන්වා දෙන ලද ප්‍රමිති පාදක බාහිර හා අභ්‍යන්තර ඇගයීම් ක්‍රියාවලිය මේ දක්වා ක්‍රියාත්මක තලයේ පවතී. විවිධ සංශෝධනවලට භාජනය වීමෙන් පසු 2015 වර්ෂයේ හඳුන්වා දෙන ලද "අපේ පාසල කොතරම් ගුණාත්මකද?" යන නව මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව දැනට සමස්ත පාසල් පද්ධතිය තුළ ම මෙම ඇගයීම් වැඩපිළිවෙල ක්‍රියාත්මක වේ.

2018 සහ 2019 වර්ෂවලට අදාළ අධ්‍යාපනයේ ගුණාත්මක දර්ශකය 70% ට වඩා පහළ අගයන් ගන්නා හොරණ අධ්‍යාපන කලාපයට අයත් පාසල්වල ඇගයීම් වාර්තා කෙරෙහි අවධානය යොමු කිරීමේ දී පැහැදිළි වූයේ ලිපි ගොනු කළමනාකරණයේ දුර්වලතා ඊට  බලපා ඇති ප්‍රධාන සාධකයක් වන බවයි. මෙම පසුබිම හමුවේ හොරණ අධ්‍යාපන කලාපයේ බණ්ඩාරගම අධ්‍යාපන කොට්ඨාසයට අයත් බප/හො/ ඉඹුලහේන ප්‍රාථමික විද්‍යාලය කේන්ද්‍ර කොට ප්‍රමිති පාදක ඇගයීම්  ක්‍රියාවලියට අදාළව තොරතුරු වාර්තාකරණය සඳහා සරල හා ක්‍රමවත් යාන්ත්‍රණයක් හඳුන්වා දීමේ මූලික අරමුණ ඇතිව මෙම ක්‍රියාමූලික පර්යේෂණය ක්‍රියාත්මක කරන ලදී. මෙම පාසලේ 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා බාහිර ඇගයීම් ප්‍රතිඵල මත සකස් කළ පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක දර්ශක පිළිවෙලින් 70%, 72%, 65%, 67% සහ 65% අගයන් පෙන්නුම් කරයි.

1964 වර්ෂයේ දී සිසුන් 13 දෙනෙකු ගෙන් ආරම්භ කරන ලද මෙම පාසල ක්‍රමයෙන් පරිහානියට පත්ව 2001 වර්ෂයේ දී වසා දැමීමෙන් අනතුරුව 2012 වර්ෂයේ දී නව මුහුණුවරකින් නැවත ආරම්භ කරන ලදී. වර්තමානයේ ප්‍රජාව අතර ජනප්‍රියත්වයට පත්ව ඇති මෙම පාසලේ පළමුවන ශ්‍රේණියේ සිට පහ ශ්‍රේණිය දක්වා සිසුහු 225 දෙනෙක් අධ්‍යාපනය ලබති. මේ වන විට පහ වසර ශිෂ්‍යත්ව විභාගයෙන් සාධනීය  ප්‍රතිඵල මෙන්ම  ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් හා අත්‍යාවශ්‍ය සම්පත් රාශියක් පාසල විසින් ළඟාකර ගෙන ඇත. ශිෂ්‍ය සුභසාධන සේවා රැසක් ද ස්වෙච්ඡා සංවිධාන සහ සුභපතන්නන්ගේ අධාර උපකාර මත ක්‍රියාත්මක වේ.

මෙම  පර්යේෂණය 2019 ජනවාරි මාසයේ  සිට නොවැම්බර් මාසය දක්වා කාල රාමුවකට අනුව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ අතර ගැටලුවේ පසුබිම හඳුනා ගැනීම, සාහිත්‍ය විමර්ශනය (සාහිත්‍ය සංදර්භය), ගැටලුව නිර්මාණය වී ඇති සැබෑ ස්වරූපය අනාවරණය කර ගැනීම (සමීප සංදර්භය), පාසලේ විදුහල්පතිතුමාට සහ ගුරුමණ්ඩලයට ඇගයීම් ක්‍රියාවලියට අදාළ ව තොරතුරු වාර්තාකරණය සම්බන්ධ සරල හා ක්‍රමවත් යාන්ත්‍රණයක් සකස් කර ගැනීමට අවශ්‍ය න්‍යායාත්මක හා ප්‍රායෝගික අවබෝධයක් ලබා දීමට මැදිහත්වීම, ඒ තුළින් පාසල ළඟාකර ගන්නා සාධනීය තත්ත්වයන් තක්සේරු කිරීම හා තවදුරටත් අවශ්‍ය මගපෙන්වීම් ලබාදීම සහ පර්යේෂණ වාර්තාව සකස් කිරීම යන ක්‍රියාකාරකම් අදාළ කර ගන්නා ලදී.

## 2. දත්ත රැස් කිරීමේ ක්‍රම

මෙම පාසලේ ඇගයීම් ක්ෂේත්‍ර ආශ්‍රිත ලිපි ගොනු කළමනාකරණයේ වර්තමාන තත්ත්වය අනාවරණය කර ගැනීම සඳහා දත්ත රැස් කිරීමේ උපකරණ තුනක් භාවිත කරන ලදී. ඉන් පළමුවන උපකරණය වන පිරික්සුම් ලැයිස්තුව භාවිත කොට ප්‍රධාන ලිපි ගොනුව හා ඇගයීම් ක්ෂේත්‍රවලට අදාළ ලිපිගොනු සකස් කිරීමේ තත්ත්වය පිළිබඳව පරීක්ෂා කරන ලදී. දෙවන උපකරණය ලෙස ප්‍රධාන තේමා අටක් ඔස්සේ සකස් කළ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා ප්‍රශ්නාවලියක් භාවිත කොට මෙම ඇගයීම් ක්‍රියාවලිය පාසල තුළ ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව සොයා බලන ලදී. සියලුම ඇගයීම් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි අදාළ ගොනු තුළ ට අත්‍යාවශ්‍ය තොරතුරු ඇතුළත් කිරීමේ තත්‍ය ස්වරූපය හඳුනා ගැනීම සඳහා තෙවන උපකරණය ලෙස නිරීක්ෂණ පත්‍රිකාවක් යොදා ගන්නා ලදී.

## 3. ගැටලුවේ සැබෑ ස්වරූපය

පරීක්ෂණ උපකරණ හරහා ලබාගත් දත්ත හා තොරතුරු වලට අනුව මෙම පාසලේ ඇගයීම් ක්‍රියාවලිය සම්බන්ධ ගැටලු ගණනාවක් උද්ගතව පවතින බවට නිරීක්ෂණය විය. ප්‍රමිති පාදක ඇගයීම් ක්‍රියාවලිය විධිමත් ව පවත්වා ගැනීම සඳහා පාසලේ පවත්වා ගත යුතු ප්‍රධාන ලිපි ගොනුව සකස් කිරීමේ තත්ත්වය 14% ක ඉතා පහළ මට්ටමක පවතී. ඇගයීම් ක්ෂේත්‍රවලට අදාළ ගොනු සකස් කිරීමේ තත්ත්වය 57% ක මධ්‍යස්ථ මට්ටමක පවතින අතර ඒවායේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක බව පිළිබඳව සෑහීමකට පත්විය නොහැකිය. මෙම පාසලේ කාර්යාල පිරියත හා ලිපි ගොනු කළමනාකරණය යහපත් මට්ටමක නොපවතී. විදුහල්පතිතුමා ඇතුළු ගුරු මණ්ඩලයට ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳ පවතින අවබෝධය පහළ මට්ටමක පවතින අතර මේ සම්බන්ධව ගුරුභවතුන් තුළ පවතින ආකල්ප ද සතුටුදායක මට්ටමක නොමැත. ඇගයීම් ක්‍රියාවලිය සාර්ථකව පවත්වා ගෙන යාම සඳහා පාසලේ පවතින මූල්‍ය ප්‍රතිපාදන ද ප්‍රමාණවත් නොවේ.

ඇගයීම් වැඩපිළිවෙල සඳහා විදුහල්පතිතුමාගෙන් ගුරුමණ්ඩලයට දැනට වඩා වැඩි සහයෝගයක් හා මගපෙන්වීමක් ලැබිය යුතුව ඇත. පාසල් කාලය තුළ මෙම වැඩපිළිවෙලට අදාළ ලිපි ගොනු සකස් කර ගැනීම සහ තොරතුරු ගොනු කර ගැනීමේ සරල ක්‍රමවේදයක් පිළිබඳ ව විදුහල්පතිතුමා ප්‍රමුඛ ආචාර්ය මණ්ඩලයට ප්‍රමාණවත් අවබෝධයක් නොමැත. ඇගයීම් වැඩපිළිවෙල සඳහා ප්‍රජාවගෙන් සහාය ලබා ගැනීමේ විවිධ බාධක පවතී.

මෙම වැඩපිළිවෙලට අදාළ ව ගොනු සකස් කර ගැනීම සඳහා සැලසුම් සහගත විධිමත් වූ සරල යාන්ත්‍රණයක් පාසල තුළ ක්‍රියාත්මක වී නොමැත. පාසලේ ගුණාත්මක සංවර්ධනය ඉලක්ක කර මෙම ඇගයීම් වැඩපිළිවෙල පාසල තුළ ක්‍රියාත්මක කිරීම සඳහා විදුහල්පතිතුමා ඇතුලු කාර්ය මණ්ඩලය සතු අවබෝධය ප්‍රමාණවත් නොවේ. ඇගයීම් ක්‍රියාවලියේ ක්‍රියාකාරිත්වය නියාමනය සඳහා පාසල තුළ ක්‍රමවත් වැඩපිළිවෙලක් ද ක්‍රියාත්මක වී නොමැත.

## 4.0 සාහිත්‍ය විමර්ශනය

අපේ පාසල කොතරම් ගුණාත්මක ද? (අධ්‍යාපන අමාත්‍යාංශය, 2014) මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව බාහිර හා අභ්‍යන්තර ඇගයීම් ක්‍රියාවලිය ක්ෂේත්‍ර අටක් යටතේ ක්‍රියාත්මක කළ යුතුව ඇති අතර ඒ යටතේ පාසලේ සමස්ත ක්‍රියාකාරීත්වය වාස්තවිකව ඇගයීම සඳහා ඇගයීම් ක්ෂේත්‍ර 08 ක් තුළ ප්‍රමිති 10 ක් , ප්‍රමිතියට ළඟා වීම සඳහා සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා 30 ක්, නිර්ණායක 60 ක් සහ දර්ශක 210 ක් හඳුන්වා දී තිබේ.

අධ්‍යාපන ලේකම් ගේ අංක 31/ 2014 හා 2014.12.02 දිනැති චක්‍රලේඛය මගින් පාසල් මට්ටමේ සිට කොට්ඨාස , කලාප හා පළාත් මට්ටම දක්වා මෙම ඇගයීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳව අවශ්‍ය උපදෙස් ලබාදී ඇති අතර පාසල් මට්ටමේ දී සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කළ යුතුව තිබේ. විදුහල්පති විසින් පාසල් අභ්‍යන්තර ඇගයීම් වැඩසටහන අනිවාර්යයෙන් ම ක්‍රියාත්මක කිරීම, හඳුන්වා දී ඇති ඇගයීම් ක්ෂේත්‍රවලට අදාළව කමිටු පත් කිරීම, සෑම වර්ෂයක් ආරම්භයේ දී ම සියලුම ඇගයීම් ක්ෂේත්‍රවලට අදාළව අභ්‍යන්තර ඇගයීම් සැලැස්මක් සකස් කිරීම, සෑම ක්ෂේත්‍රයක් සඳහා ම ලිපි ගොනුවක් නඩත්තු කිරීම, සියලුම ඇගයීම් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි අවම වශයෙන් වසරකට වරක් හෝ අභ්‍යන්තර ඇගයීමක් සිදු කිරීම, සෑම ඇගයීමක් අවසානයේ දී ම අදාළ පාර්ශ්වයන් ගේ සහභාගීත්වය ඇතිව ප්‍රගති සමාලෝචනයක් සිදු කිරීම, ඇගයීමෙන් අනාවරණය වන තොරතුරු සාරාංශ වාර්තාවක් ලෙස සකස් කොට කලාප හා කොට්ඨාස අධ්‍යාපන කාර්යාල වෙත යොමු කිරීම, වසර පහක පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය ට අදාළ අගයන් පාසලේ ප්‍රදර්ශනය කිරීම සහ සංවර්ධන අවශ්‍යතා ප්‍රමුඛතාකරණය කොට පාසල් සැලසුම්කරණ කාර්යය සඳහා යොදා ගැනීම යන වගකීම් ඊට අයත් වේ.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව (2016) ගුරුවරුන් අතර ගුණාත්මකබව සහතිකකරණය පිළිබඳ දැනුම්වත්බව ප්‍රමාණවත් නොවීම, දර්ශකවල අධික බව හා මාර්ගෝපදේශය තේරුම් ගැනීමේ අපහසු බව ඇගයීම් වැඩපිළිවෙල තුළ පවතින ප්‍රමුඛ ගැටලු ලෙස හඳුනා ගෙන ඇත. වීරසිංහ (2013) ගුරු මණ්ඩලය සඳහා ඇගයීම් කටයුතු පිළිබඳ විධිමත් පුහුණුවක් ලබා දී නොමැති බැවින් විවිධ නිලධාරීන් ගෙන් ලැබෙන විවිධ උපදෙස් මත ක්‍රියා කරනු ලබන බව දක්වයි. විදුහල්පතිවරුන් ට ද සිලුම නිර්ණායක පිළිබඳ පූර්ණ අවබෝධයක් නොමැති බැවින් අභ්‍යන්තර ඇගයීම් ක්‍රියාවලියේ දී ගුරුවරුන්ට මතුවන ගැටලු සඳහා මගපෙන්වීමට නොහැකි වී ඇත. සෙනවිරත්න (2013) මාර්ගෝපදේශ සංග්‍රහයේ අඩංගු කරුණු පිළිබඳව තවදුරටත් අදාළ පාර්ශ්වයන් දැනුම්වත් කිරීමේ අවශ්‍යතාව පැනනැගී ඇති බවත් ඒ සඳහා පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන් මගින් එම අවශ්‍යතා සපුරාගතහැකි බව පෙන්වා දෙයි. එසේ ම පද්ධතියට අලුතින් ඇතුළත්වන පාසල්, කලාප, කොට්ඨාස කාර්ය මණ්ඩල කලාප මට්ටමින් පිහිටුවනු ලබන පුහුණු සංචිතයක් මගින් දැනුම්වත් කළ හැකි බව පෙන්වා දෙයි.

අභ්‍යන්තර ඇගයීම් ක්‍රියාවලිය සඳහා සිසුන්ගේ ඉගෙනුම් ඉගැන්වීම් කාර්යයට ගත කරන කාලය යොදා ගැනීමට බොහෝ ගුරුවරු පෙළඹී ඇත (වීරසිංහ, 2013). විශේෂයෙන් ප්‍රාථමික පන්තිභාර ගුරුභවතුන් ට මේ සඳහා යොමු වීමට කාලය නොමැත. ආර්ථික අපහසුතා පවතින පාසල්

සඳහා ලිපි ගොනු පවත්වා ගැනීමට අවශ්‍ය පහසුකම් ලබා ගැනීමේ අවස්ථා සම්පාදනයට කලාප හා කොට්ඨාස මට්ටමින් සහාය ලබා දීම කළ යුතුව ඇත. බාහිර ඇගයීම් ලකුණු පදනම් කර ගෙන උපකාර අවශ්‍ය පාසල් සඳහා ප්‍රතිපෝෂණ ලබාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුව ඇත. ඇගයීම් වැඩ-සටහනේ තොරතුරු වාර්තාකරණය පහසු කරලීම සඳහා ජාතික මට්ටමින් තාක්ෂණය යොදා ගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුව තිබේ (සෙනවිරත්න, 2013).

ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව (2016) ට අනුව වැඩි සහයෝගයක් අවශ්‍ය පාසල් සඳහා වැඩි වාර ගණනක් බාහිර සමාලෝචන ක්‍රියාත්මක කළ හැකිවන පරිදි සැලසුම් සකස් විය යුතුව ඇත. ඇගයීම් වැඩපිළිවෙලෙහි ගුණාත්මකබව සහතිකකරණය සඳහා ප්‍රතිඵල වාර්තා තැබීමේ අරමුණින් පමණක් නොව පාසල් කළමනාකරණය, විෂයමාලා ක්‍රියාත්මක කිරීම හා තක්සේරුව, විෂය සමගාමී සහ වෙනත් ක්‍රියාකාරකම් යන ක්ෂේත්‍රවල තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා යොමු විය යුතු ව ඇත. ශිෂ්‍ය ප්‍රතිපෝෂණ නොසලකා හැරීමේ තත්ත්වයක් ද මෙම ඇගයීම් ක්‍රියාවලිය තුළ දක්නට ලැබේ. විශේෂයෙන් පූර්ණ පෞරුෂයකින් හෙබි ශිෂ්‍යයකු බිහි කිරීමේ ඉලක්ක මෙම ක්‍රියාවලිය තුළ අන්තර්ගත වීමේ ඌණතා ද ඇත.

# 5. සුවිශේෂී අරමුණු හා පර්යේෂණ ප්‍රශ්න

## 5.1 සුවිශේෂී අරමුණු

i. තෝරාගත් පාසලේ ප්‍රමිති පාදක ඇගයීම් ක්ෂේත්‍ර ආශ්‍රිතව තොරතුරු වාර්තාකරණය පිළිබඳ වර්තමාන තත්ත්වය අනාවරණය කරගැනීම.

ii. තොරතුරු වාර්තාකරණය සම්බන්ධව සරල හා ක්‍රමවත් යාන්ත්‍රණයක් සකස් කරගැනීම සඳහා එම පාසලට අවශ්‍ය මගපෙන්වීම ලබා දීම.

iii. මේ සම්බන්ධයෙන් පාසල විසින් ළඟාකර ගන්නා කාර්ය සාධනය ඇගයීමට ලක් කිරීම හා සාධනීය ලක්ෂණ ප්‍රවර්ධනය සඳහා අඛණ්ඩව මගපෙන්වීම.

## 5.2 පර්යේෂණ ප්‍රශ්න

පර්යේෂණය සඳහා පහත සඳහන් ප්‍රශ්න ත්‍රිත්වය අදාළ කර ගන්නා ලදී.

- අදාළ පාසලේ ප්‍රමිති පාදක ඇගයීම් ක්ෂේත්‍ර ආශ්‍රිත තොරතුරු වාර්තාකරණය සම්බන්ධ වර්තමාන තත්ත්වයේ සැබෑ ස්වරූපය කෙබඳුද?
- එම පාසලේ ප්‍රමිති පාදක ඇගයීම් ක්ෂේත්‍රවලට අදාළව තොරතුරු වාර්තාකරණය ප්‍රවර්ධනය සඳහා කුමන ආකාරයේ මගපෙන්වීම් හඳුන්වා දිය යුතුද ?
- ඒ තුළින් පාසල ළඟාකරගන්නා සාධනීය ලක්ෂණ ඇගයීමට ලක්කර තහවුරු කරන්නේ කෙසේද ?

# 6. මැදිහත්වීමේ ක්‍රියාවලිය

## 6.1 පළමුවන මැදිහත්වීම

2019.01.28 දින බප/හො/ මීවනපලාන මහා විද්‍යාලය කේන්ද්‍ර කර පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක දර්ශකය 70% ට අඩු ඉඹුලහේන ප්‍රාථමික විද්‍යාලයේ විදුහල්පතිතුමා ඇතුලු හොරණ අධ්‍යාපන කලාපයේ පාසල් 24 ක විදුහල්පතිවරුන් ගේ සහභාගීත්වය ඇතිව ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳව න්‍යායාත්මක හා ප්‍රායෝගික වැඩමුලුවක් ක්‍රියාත්මක කරන ලදී. මෙහි දී ඇගයීම් ක්‍රියාවලියෙන් අපේක්ෂිත අරමුණු හා එහි ප්‍රයෝජන පිළිබඳවත් ගොනු සකස් කළ යුතු ආකාරය පිළිබඳව න්‍යායාත්මක කරුණු මෙන්ම මීවනපලාන විද්‍යාලයේ මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව ප්‍රායෝගික අත්දැකීම් ලබාදීමට ද කටයුතු සලසන ලදී.

මීවනපලාන මහා විද්‍යාලයේ මෙම ඇගයීම් වැඩපිළිවෙල ක්‍රියාත්මකවන ආකාරය පිළිබඳව වැදගත් තොරතුරු රැසක් හඳුනා ගැනීමට හැකි විය. ඇගයීම් ක්ෂේත්‍ර සියල්ල සඳහා නිර්ණායකවලට අදාළව ලිපි ගොනු 60 ක් සකස් කර ඇත. ඇගයීම් ක්ෂේත්‍ර භාර ගුරුභවතුන් විසින් අදාළ තොරතුරු සාමූහිකව හුවමාරු කර ගනු ලබයි. ඇගයීම් ක්ෂේත්‍ර භාර ප්‍රධාන ගුරුභවතා විසින් තමාට අයත් ක්ෂේත්‍රයට අදාළව බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ වැඩසටහනක් සකසා ඇති අතර ඒ හරහා තම කණ්ඩායම දැනුවත් කරනු ලබයි.

විදුහල්පතිතුමා විසින් අභ්‍යන්තර ඇගයීම් ක්‍රියාවලිය නියාමනයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබේ. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට බාධාවක් ඇති නොවන පරිදි පාසල් කාලය තුළ ම අදාළ තොරතුරු ඒකරාශී කර ගනු ලබයි. ඇගයීම් ක්‍රියාවලිය තුළින් ඔවුන් ලබා ගන්නා අනාවරණ පාසල් සංවර්ධන සැලසුම් ක්‍රියාවලියට යොදා ගනු ලබන අතර එක් එක් ක්ෂේත්‍රයට අදාළ අභ්‍යන්තර හා බාහිර ඇගයීම් තොරතුරු පාසල් කාර්යාලයේ ප්‍රදර්ශනයට පියවර ගෙන ඇත.

## 6.2 දෙවන මැදිහත්වීම

පළමුවන මැදිහත්වීමෙන් හා ප්‍රත්‍යවේක්ෂණය තුළින් ලද අත්දැකීම් පදනම් ව ඉඹුලහේන ප්‍රාථමික විද්‍යාලයේ විදුහල්පතිතුමා ඇතුලු පළමුවන වැඩමුලුව ට සහභාගී වූ සියලුම විදුහල්පතිවරුන් සඳහා ප්‍රගති සමාලෝචන ක්‍රියාකාරකම් සහිතව ප්‍රායෝගික අත්දැකීම් හුවමාරු කර ගැනීමේ වැඩමුලුවක් 2019.03.08 දින බප/හො/රයිගම්වත්ත ශ්‍රී පරාක්‍රමබාහු ප්‍රාථමික විද්‍යාලයේ දී ක්‍රියාත්මක කරන ලදී. එම පාසල් ළඟාකර ගෙන ඇති සාධනීය තත්ත්වයන් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දී එම තත්ත්වයන් සමාලෝචනයට භාජනය කර අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම් ලබා දෙන ලදී. මීට සමගාමීව 2019.05.09 දින ඉඹුලහේන ප්‍රාථමික විද්‍යාලයේ සහ පරාක්‍රමබාහු විද්‍යාලයේ ගුරු සහභාගීත්වය ඇතිව ඇගයීම් ක්‍රියාවලියට අදාළ ලිපි ගොනු කළමනාකරණය සම්බන්ධ අත්දැකීම් හුවමාරු කරගැනීම සඳහා පරාක්‍රමබාහු විද්‍යාලයේ දී තත්ත්ව කවයක් පවත්වන ලදී. මෙම අවස්ථා දෙකේ දීම ලබා දෙන ලද අත්දැකීම් පිළිබඳ තොරතුරු පහතින් දැක්වේ.

ප්‍රධාන ලිපි ගොනුවක් සහ ඇගයීම් ක්ෂේත්‍රවලට අදාළ ලිපි ගොනු සකස් කිරීමේ දී නිර්ණායක සඳහා ලිපි ගොනු 60 ක් සකස් කර ඇත. නායකත්වය හා කළමනාකරණය සහ ඉගෙනුම, ඉගැන්වීම සහ ඇගයීම යන ඇගයීම් ක්ෂේත්‍ර දෙකෙහි වගකීම විදුහල්පතිතුමිය විසින් ද අනෙකුත් ක්ෂේත්‍රවල වගකීම් ගුරුභවතුන් වෙත ද පවරා දී තිබේ. කිසියම් නිර්ණායකයකට අදාළ තොරතුරු දර්ශක අංකය හා සාක්ෂි සහිතව ගොනු තුළ ඇතුළත් කර ඇති අතර අමතර තොරතුරු කාර්යාලය හරහා ලබාගැනීමට පහසුවන පරිදි මගපෙන්වීම් සිදුකර ඇත. ඇගයීම් ක්ෂේත්‍රවලට අදාළව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සාරාංශ ලෙස සකස් කර එම තොරතුරු ගොනු තුළට ඇතුළත් කර ඇත. කාර්යාල ලිපි ගොනු කළමනාකරණය සඳහා එස් පහ (5S) ශිල්පීය ක්‍රම අනුගමනයකර ඇති අතර ඇගයීම් ප්‍රතිඵල පාසල් සැලසුම්කරණ ක්‍රියාවලියට ඵලදායීව යොදා ගනී. ඇගයීම් ක්‍රියාවලිය සාර්ථකව පවත්වා ගෙන යාම සඳහා විදුහල්පතිතුමිය විසින් ගුරුභවතුන්ට පැහැදිලි මාර්ගෝපදේශකත්වයක් ලබාදෙන අතර ගොනු සකස් කර ගැනීමේ කාර්යයන් සඳහා දෙමාපියන් ගේ සහාය ද ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දී ඇත. මෙම වැඩසටහනට අදාළ තොරතුරු ගුරුභවතුන් විසින් සාමූහිකව බෙදා හදා ගනු ලබන අතර පැරණි ගොනු ක්ෂේත්‍ර අනුව කුඩා පොත් පිංචක් ලෙස සකස්කර සංරක්ෂණය කිරීමට කටයුතු කරනු ලබයි.

### 6.3 තෙවන මැදිහත්වීම

2019.06.30 දින ඉඹුලහේන ප්‍රාථමික විද්‍යාලයේ විදුහල්පතිතුමා ට ලිපි ගොනු කළමනාකරණය පිළිබඳ අත්දැකීම් හුවමාරු කරගැනීම ට අවස්ථාවක් ලබාදීම සඳහා බප/හො/ තක්ෂිලා මහා විද්‍යාලයට ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවක් සංවිධානය කරන ලදී. ඒ හරහා ප්‍රමිති පාදක ඇගයීම් ක්‍රියාවලිය ඇතුළුව පාසලක සියලුම ලිපි ගොනු කළමනාකරණය කිරීමේ ශිල්ප ක්‍රම පිළිබඳව අවබෝධයක් ලබාදීමට අවස්ථාව ලැබිණ.

## 7. මැදිහත්වීම තුළින් ඇති වූ වෙනස්කම් පිළිබඳ ඇගයීම

### 7.1 පළමුවන අවස්ථාව

2019.02.28 ඉඹුලහේන ප්‍රාථමික විද්‍යාලය ට ගොස් මේ පිළිබඳව සොයා බැලීමේ දී අනාවරණය වූයේ, ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳව ඔහු විසින් ලබාගත් අත්දැකීම් ගුරු මණ්ඩලය සමඟ හුවමාරු කරගැනීමට කටයුතු කර ඇති අතර ලේඛන කළමනාකරණය සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය හා අනෙකුත් අවශ්‍යතා සම්පාදනය කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බවයි.

### 7.2 දෙවන අවස්ථාව

2019.06.14 දින පාසලට ගොස් මේ පිළිබඳව සොයා බැලීමේ දී පෙර තත්ත්වයට වඩා සාධනීය ලක්ෂණ කිහිපයක් හඳුනා ගැනීමට හැකි විය. ඇගයීම් වැඩපිළිවෙල සම්බන්ධව විදුහල්පතිවරයා සහ ආචාර්ය මණ්ඩලය විසින් විශේෂ උනන්දුවකින් කටයුතු කරනු ලබන බව පැහැදිලි විය.

ලිපි ගොනු කවර හා බහාලුම් භාවිතාකර වර්ණ හා කේතාංක යොදා ගෙන ප්‍රධාන ගොනුව හා ඇගයීම් ක්ෂේත්‍ර අට සඳහා ගොනු අටක් ද නිර්ණායකවලට අදාළ දර්ශක සඳහා ලිපි ගොනු කවර 60 ක් ද සකස් කර ඇත. මෙම ඇගයීම් වැඩපිළිවෙලට අදාළ ගැටලු, අවශ්‍යතා හා තොරතුරු හුවමාරු කරගැනීම සඳහා විදුහල්පතිතුමාගේ භාරකාරිත්වය යටතේ වෙනම ගොනුවක් යාවත්කාලීන කරනු ලබයි. මෙම වැඩපිළිවෙල නියාමනය සඳහා අවම වශයෙන් වාරයකට එක් වතාවක් බැගින් ඇගයීම් ක්ෂේත්‍ර භාර ගුරුභවතුන් ගේ සහභාගීත්වය ඇතිව සාකච්ඡා පවත්වා වාර්තා තබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ද ගෙන ඇත. අප විසින් ලබාදෙන ලද උපදෙස් පරිදි 2019.06.01 දින පැවැත් වූ මහා සභා වේ අනුමැතිය මත පාසල් සංවර්ධන සමිති සාමාජික මුදල් ලෙස රුපියල් 100 ක ගාස්තුවක් එකතු කිරීමට කටයුතු කර ඇත. මේ සම්බන්ධව පැවති අඩුපාඩු පෙන්වා දී ඉදිරි ක්‍රියාමාර්ග සඳහා උපදෙස් ලබා දෙන ලදී.

## 7.3 තෙවන අවස්ථාව

2019.09.05 දින ඉඹුලහේන ප්‍රාථමික විද්‍යාලයට ගොස් මුල් අවස්ථාවේ දී භාවිත කළ පිරික්සුම් ලැයිස්තුව අනුව ප්‍රධාන ගොනුව හා ඇගයීම් ක්ෂේත්‍රවලට අදාළ ගොනු සකස් කිරීමේ තත්ත්වය පරීක්ෂාවට ලක් කරන ලදී. ඒ අනුව ප්‍රධාන ගොනුව සකස් කිරීම, එම ගොනුව තුළට 2014 වර්ෂයේ දී හඳුන්වා දෙන ලද අපේ පාසල කොතරම් ගුණාත්මක ද ? යන උපදෙස් සංග්‍රය හා අංක 31/2014 චක්‍රලේඛය, ඇගයීම් ක්ෂේත්‍ර භාරව පත්කිරීමේ ගුරු නාම ලේඛනය, චක්‍රලේඛයේ ඇමුණුම අංක 01 ට අදාළ වාර්ෂික අභ්‍යන්තර ඇගයීම් සැලැස්ම සහ ඇමුණුම අංක 02 ට අදාළ අභ්‍යන්තර ඇගයීම් ලකුණු සාරාංශ (2018 වර්ෂයට අදාළ) චක්‍රලේඛයේ ඇමුණුම අංක 03 ට අදාළ වර්ෂ පහකට අදාළ පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශක පිළිබඳ වාර්තාව සකස් කිරීම සහ එම තොරතුරු වගු හා ප්‍රස්තාර ආශ්‍රිතව නිරූපණය කිරීම, එම තොරතුරු කාර්යාලයේ ප්‍රදර්ශනය කිරීම, චක්‍රලේඛයේ ඇමුණුම අංක 04 ට අදාළ පාසල පිළිබඳ අනාවරණ ඇතුළත් වාර්තාව සකස් කිරීම, ආසන්නම වර්ෂයට අදාළ බාහිර ඇගයීම් පිළිබඳ වාර්තාව, කොට්ඨාස, කලාප, පළාත් හා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ලබාදෙන ලද උපදෙස් ලිපි, එක් එක් ඇගයීම් ක්ෂේත්‍ර ආශ්‍රිතව පාසල පිළිබඳ අනාවරණය කරන ලද ප්‍රබලතා, ගැටලු හා ඒ සඳහා ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා සහිත සාරාංශ වාර්තා සහ ඇගයීම් ක්ෂේත්‍ර භාර ප්‍රධානීන් සමග පවත්වන ලද සමාලෝචන වාර්තා යන සියලු තොරතුරු ඇතුළත් කිරීමේ තත්ත්වය 100% ක සතුටුදායක මට්ටමක පවතී. එක් එක් ඇගයීම් ක්ෂේත්‍රවලට අදාළව ගොනු සකස් කිරීම හා එම ගොනු තුළට ඇගයීම් ක්ෂේත්‍ර සඳහා පත් කරන ලද අභ්‍යන්තර ඇගයීම් කමිටු නාමලේඛන, ඇගයීම් ක්ෂේත්‍ර සඳහා පිළියෙල කරන ලද වාර්ෂික සැලැසුම්, ඇගයීම් පත්‍රිකා, පාසලේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති හා විශේෂ ක්‍රියාකාරකම් ඇතුළත් සංක්ෂිප්ත තොරතුරු, ඇගයීම් ක්ෂේත්‍ර ආශ්‍රිතව පාසල පිළිබඳ අනාවරණය කරන ලද ප්‍රබලතා, ගැටලු හා ඒ සඳහා ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා සහිත සාරාංශ වාර්තා, ඇගයීම් ක්ෂේත්‍ර ආශ්‍රිතව පවත්වන ලද කමිටු රැස්වීම් වාර්තා සහ පෙර වර්ෂයේ ඇගයීම් ගොනු සංරක්ෂණයට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු ඇතුළත් කිරීමේ තත්ත්වය 100% ක මට්ටමක පවතින බවට තහවුරු කර ගන්නා ලදී.

හොරණ ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානයේ කථිකාචාර්යවරුන්, කලාප අධ්‍යාපන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් සහ ගුරු උපදේශකවරුන් ගෙන් සැදුම් ලත් කණ්ඩායමක් විසින් 2019.10.01 දින ඉඹුලහේන ප්‍රාථමික විද්‍යාලයට ගොස් කලාප මට්ටමේ බාහිර ඇගයීමක් ක්‍රියාත්මක කරන ලද අතර එම ප්‍රතිඵල 2019.01.08 දින කලාප මට්ටමේ බාහිර ඇගයීම් ප්‍රතිඵල සමග සංසන්දනය කරන ලදී.

වගුව 1 - ඇගයීම් ලකුණු සාරාංශය

| අනු අංකය | ප්‍රමිතිය | ලබාගත් ලකුණු % | | වෙනස |
|---|---|---|---|---|
| | | 2019.01.08 | 2019.10.01 | |
| 01 | ශිෂ්‍ය සාධනය | 79% | 79% | නොවෙනස්ව පවතී |
| 02 | ඉගෙනුම ඉගැන්වීම හා ඇගයීම | 48% | 67% | 19% |
| 03 | විධිමත් විෂයමාලා කළමනාකරණය | 71% | 72% | 01% |
| 04 | විෂය සමගාමී කටයුතු | 50% | 69% | 19% |
| 05 | ශිෂ්‍ය සුබසාධනය | 76% | 80% | 04% |
| 06 | නායකත්වය හා කළමනාකරණය | 76% | 66% | -10% |
| 07 | භෞතික සම්පත් කළමනාකරණය | 54% | 68% | 14% |
| 08 | පාසල හා ප්‍රජා සම්බන්ධතා | 64% | 68% | 04% |
| පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය | | 65% | 71% | 06% |

ඒ අනුව සමස්ත පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක දර්ශකය 65% සිට 71% දක්වා 06% ක වර්ධනයක් පෙන්නුම් කරයි. ශිෂ්‍ය සාධනය කෙරෙහි ගතවූ මාස කිහිපය තුළ විශේෂ බලපෑමක් සිදුවී නොමැති අතර නායකත්වය හා කළමනාකරණය යන ඇගයීම් ක්ෂේත්‍රය ඇගයීමේදී පෙර ඇගයීම සිදුකළ මාණ්ඩලික නිලධාරියාගේ පුද්ගලබද්ධතාවය බලපා ඇති බව තහවුරු කරගන්නා ලදී.

### 7.4 පර්යේෂකයින්ගේ වෘත්තීය භූමිකාවට පර්යේෂණය තුළින් ලැබුණු පර්යාලෝකය

- ප්‍රමිති පාදක ඇගයීම් ක්‍රියාවලියට අදාළ ලිපි ගොනු කළමනාකරණය සම්බන්ධව නව ප්‍රවණතා හඳුනාගැනීමට අවස්ථාව උදාවීම.
- බාහිර ඇගයීම් ක්‍රියාවලිය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නිපුණතා ළඟා කරගැනීමට අවස්ථාවක් උදාවීම.
- මෙම ඇගයීම් ක්‍රියාවලියට අවශ්‍ය උපදේශනාත්මක භූමිකාව ශක්තිමත් වීම.
- කාර්ය මූලික පර්යේෂණ ක්‍රියාවලිය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබාගැනීමට හැකියාව ලැබීම.
- සාර්ථකව අවසන් කළ හැකි කාර්යයක නියැලීම තුළින් ආත්ම තෘප්තියක් ලැබීම.

### 7.5 පර්යේෂණය තුළින් පාසලට ලැබුණු ප්‍රතිලාභ

මෙම පර්යේෂණය තුළින් පොදුවේ පාසලට ලැබුණු ප්‍රතිලාභ ලෙස විදුහල්පතිතුමා සහ ගුරු මණ්ඩලය විසින් ලබාදෙන ලද ප්‍රතිචාර පහතින් දක්වා ඇත.

**විදුහල්පතිතුමාගේ අදහස් :**

- පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ අධීක්ෂණ කටයුතු ක්‍රමවත්ව ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශකත්වයක් ලැබීම.
- පන්ති කාමර තුළ යහපත් ඉගෙනුම් ඉගැන්වීම් පරිසරයක් සකස් කරගැනීමට හැකි වීම.
- ලේඛන කළමනාකරණ කටයුතු ඇතුලුව කාර්යාල පරිසරය දැකුම්කලු හා ක්‍රමවත් ස්ථානයක් බවට පත්කර ගැනීමට හැකි වීම
- පාසලේ කළමනාකරණ කටයුතු පහසුවෙන් කරගෙන යාමට සුදුසු පසුබිමක් නිර්මාණය වීම.
- පාසලේ භෞතික පරිසරය ක්‍රමවත්ව පවත්වාගෙන යාමට හැකියාව ලැබීම.
- මූල්‍ය කටයුතු ක්‍රමවත්ව හා විධිමත්ව පවත්වාගෙන යාමට අවස්ථාව ලැබීම.
- පස් අවුරුදු හා වාර්ෂික සැලසුම් සකස් කිරීමට අදාළ යාන්ත්‍රණය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය යහපත් පසුබිමක් නිර්මාණය වීම.
- පොදුවේ පරිපාලන හා කළමනාකරණ කටයුතු විධිමත්ව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පසුබිමක් නිර්මාණය වීම.

**ගුරුභවතුන්ගේ අදහස් :-**

- ඇගයීම් ක්ෂේත්‍ර පිළිබඳ මනා අවබෝධයක් ලබාගැනීමට හැකියාව ලැබීම.
- ප්‍රමිති ලිපිගොනු විධිමත්ව සකස් කරගැනීමට අවශ්‍ය න්‍යායාත්මක හා ප්‍රායෝගික මට්ටමින් හොඳ අවබෝධයක් ලැබීම.
- ඇගයීම් ක්ෂේත්‍ර ඔස්සේ පාසලේ පවතින ගැටලු විධිමත්ව හඳුනාගෙන එම ගැටලු විසඳා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට අවස්ථාව උදාවීම.
- පාසලේ සියලු පාර්ශ්වයන්ගේ සහයෝගය මත පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට යහපත් පසුබිමක් පාසල තුළ නිර්මාණය වීම.
- පාසලේ අනෙකුත් ලිපි ලේඛන විධිමත්ව සකස් කරගැනීමට අවශ්‍ය අවබෝධය ලබාගැනීමට හැකි වීම.
- පාසලේ කාර්යාල පරිශ්‍රය ක්‍රමවත්ව සකස් කරගැනීමට අවශ්‍ය පහසුකම් හා මාර්ගෝපදේශකත්වය ලබාගැනීමට අවස්ථාව උදාවීම.

## 8. නිගමන

විදුහල්පතිතුමාට හා ගුරු මණ්ඩලයට ප්‍රමිති පාදක ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳව ප්‍රාමාණික අවබෝධයක් ලබාදීමට ද, ලේඛන කළමනාකරණය පිළිබඳ ව මනා කුසලතාවයක් හා ඇගයීම් ක්ෂේත්‍රවලට මෙන්ම පාසලේ අනෙකුත් සියලුම ලේඛන කටයුතු ක්‍රමවත්ව සකස් කර ගැනීමට ද, ඇගයීම් ක්ෂේත්‍ර බහුතරයක හා ගුණාත්මක දර්ශකයේ ලකුණුවල ප්‍රගතියක් ළඟාකර දීමට ද, පාසලේ කාර්යාල පිරියත ක්‍රමවත් කරගැනීමට අවශ්‍ය මගපෙන්වීම් හා බාහිර ආයතන හරහා කාර්යාල උපකරණ සම්පාදනයට ද, මූල්‍ය කළමනාකරණ කටයුතු නිවැරදි කර ගැනීමට ද හැකියාව ලැබිණ. විශේෂයෙන් බාහිර ඇගයීම් ක්‍රියාත්මක කිරීමේ දී පුද්ගලබද්ධතාවය ඇති විය හැකි බව ද අනාවරණය විය. එසේ ම ප්‍රමිති පාදක ඇගයීම් ක්‍රියාවලියට අදාළ ලේඛන කළමනාකරණය පිළිබඳව ආදර්ශයට ගත හැකි පාසලක් නිර්මාණය කිරීමට ද හැකියාව ලැබිණ.

## 9. යෝජනා

ප්‍රමිති පාදක ඇගයීම් ක්‍රියාවලියට අදාළ ලේඛන කළමනාකරණයේ ඌනතා පවතින පාසල් බාහිර ඇගයීම් තුළින් නිවැරදිව හඳුනාගෙන ඒවා විධිමත් ක්‍රමවේදයකට සකස් කර ගැනීමට අවශ්‍ය මගපෙන්වීම් කලාප මට්ටමේ පුහුණු සංචිතයක් හරහා ලබා දීමට ක්‍රියා කළ යුතු අතර එම ක්‍රියාවලියේ දී න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික අත්දැකීම් ලබා දීමට හැකිවන පරිදි වැඩමුලු සංවිධානය කළ යුතු වේ. පාසල මුහුණ දෙන භෞතික සම්පත් ඌනතා පිළිබඳ ගැටලුවල දී බාහිර සම්පත්දායකයින් සොයා දීමේ ක්‍රියාවලිය සඳහා කලාප අධ්‍යාපන කාර්යාල මට්ටමින් යම් ආකාරයක මැදිහත් වීමක් ලබාදීම සුදුසු වේ. බාහිර ඇගයීම් ක්‍රියාත්මක කිරීමේ දී පුද්ගල බද්ධතාවයෙන් තොරව එම කාර්යය කරවා ගැනීමට ඇගයීම් ක්ෂේත්‍ර පිළිබඳ මනා අවබෝධයක් ඇති නිලධාරීන් හඳුනා ගෙන ඒ අයට කාර්යය පවරා දීම කණ්ඩායම් භාර නිලධාරියා ගේ වගකීම වේ. බාහිර ඇගයීම් ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව ලබාදෙන නියෝගවල ක්‍රියාකාරිත්වය නැවත පසු විපරමකට ලක් කළ යුතු වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ

අපේ පාසල කොතරම් ගුණාත්මකද? (2014), පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව සඳහා වූ ඇගයීම් ක්‍රියාවලිය, බත්තරමුල්ල, කොළඹ, රජයේ මුද්‍රණාලය.

සෙනවිරත්න එස්.එම්.එල්.කේ. (2013), පාසල් ඇගයීම් සඳහා භාවිත කරනු ලබන "පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය iii මාර්ගෝපදේශ සංග්‍රහය" පිළිබඳ විශ්ලේෂණය, අධ්‍යාපන පර්යාලෝකය, වෙලුම 2, කලාපය, 2, පි. 59- 69, අධ්‍යාපන අමාත්‍යාංශය, බත්තරමුල්ල, කොළඹ.

වීරසිංහ අයි. (2013) පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සඳහා අභ්‍යන්තර ඇගයීම් ක්‍රියාවලියේ ඵලදායිත්වය, අධ්‍යාපන පර්යාලෝකය, වෙලුම 2, කලාපය, 2, පි.91-104, අධ්‍යාපන අමාත්‍යාංශය, බත්තරමුල්ල, කොළඹ.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව (2016), ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා යෝජනා, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, නුගේගොඩ, කොළඹ.

# ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් බව වැඩිවීමෙන් පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය ඉහළ නැංවීමක් සිදුවන්නේද යන්න පිළිබඳ අධ්‍යයනය

පී.ඩී.ඉරෝෂිණී පරණගම (BA., PGDE, MA-Ling., MA-Econ)
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන කාර්යාලය, කැළණිය
0718619473 / paranagama.iroshi@gmail.com

## සංක්ෂිප්තය

පාසල් බාහිර අධික්ෂණ ක්‍රියාවලියේදී පාසලක් වෙත ලබා දෙන පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය (School Education Quality Index – SEQI) ඕනෑම පාසලක ගුණාත්මක බව මනින ප්‍රධාන දර්ශකය වේ. ඒ සඳහා බලපාන සාධක එහි ගුණාත්මක හා ප්‍රමාණාත්මක බව ඉහළ නැංවීමට බලපායි. මෙහිදි ඇගයීමේ දී අවධානය යොමු කරන ප්‍රධාන ක්ෂේත්‍රවල ඇගයීම් නිර්ණායකවලට ලකුණු පිරිනැමෙන ආකාරය හා ලකුණු උපයා ගන්නා ආකාරය පිළිබඳව ඇගයීමට ලක්වන පාර්ශ්වයේ දැනුවත්භාවය මඳවීම SEQI අගය අඩුවීමට බලපායි. මෙම ගැටලුව අප අධ්‍යාපන කලාපයේ පාසල් බොහෝමයක දක්නට තිබෙන බව සෑම අධීක්ෂණ වැඩසටහනකදීම පිළිබිඹු විය. අධීක්ෂණයට ලක්වන පාර්ශ්වයේ නිසි දැනුවත්භාවයේ අවශ්‍යතාවය මෙම පාර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. මෙම ක්‍රියාවලියේ දී මූලිකම වගකීම් දරන්නා වූ පාසල් කළමනාකාරීත්වයේ දෙවන පෙළ නායකත්වය මේ සම්බන්ධව ලබා ගන්නා දැනුවත්භාවය තුළින් පාසල මෙහෙයවීමට අවශ්‍ය මඟ පෙන්වීම ලබාදීම තවත් එක් අරමුණකි. අධීක්ෂණ ක්‍රියාවලියේ දී සුවිශේෂි කාර්යයක් ඉටු කරන පාසල්වල දෙවන පෙළ නායකත්වය වන නියෝජ්‍ය විදුහල්පතිවරුන් 99ක් කණ්ඩායම් වශයෙන් SEQI අගය වැඩි ගුණාත්මක බවින් ඉහළ පාසල් හතරට වර්ෂ දෙකක දී මැදිහත් වීමේ ක්‍රියාවලී 4ක් සිදු කරන ලදි. මෙම ක්‍රියාවලියට නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් ද සහභාගී විය. මෙහිදි ප්‍රායෝගිකවම පාසලක් අධික්ෂණය කරන අයුරු අදාළ දත්ත, සාක්ෂි විධිමත්ව වාර්තාකරණය තුළ ලකුණු උපයා ගන්නා ආකාරය, අධීක්ෂණයට මනා සූදානමකින් යුතුව මුහුණදීම තුළින් ලකුණු උපයා ගත හැකි ආකාරය අත්දැකීමෙන්ම අවබෝධ කර ගැනීමට අවස්ථාව ලබා දෙන ලදි. මෙම පර්යේෂණයේ දි ප්‍රායෝගිකව ලබන ක්ෂේත්‍රගත අත්දැකීම් තුළින් පාසල්වල අධික්ෂණ කාර්යය ඍජුවම සිදු කරනු ලබන නියෝජ්‍ය විදුහල්පතිවරුන්ට හොඳ අවබෝධයක් ලබා දීමෙන් පාසලේ SEQI අගය වැඩිකර ගැනීමට හැකි බව දත්ත විශ්ලේෂණයේ දී නිගමනය විය. පාසලක අභ්‍යන්තර ඇගයීම වඩා ඵලදායී බවද කෙසේ වෙතත් පාසල්වලට වඩා බලපෑමක් සිදු කළ හැක්කේ බාහිර ඇගයීමකින් බවත් හෙළිදරව් විය. පාසලක් ඇගයීමට මෙම ඇගයීම් ක්‍රියාවලිය තව දුරටත් යොදා ගැනීම මෙන්ම යොදා ගන්නා දර්ශක හා නිර්ණායක තව දුරටත් සුවිශේෂී විය යුතු බව යෝජනා වශයෙන් ඉදිරිපත් කළ හැකිය. මෙම පර්යේෂණය තුළින් අප දෛනිකව සිදුකරන වැඩසටහන් පිළිබඳව වුව ද පර්යේෂකයකු වශයෙන් විමසා බැලීම මගින් එම ක්‍රියාවලියේ ඵලදායිතාවය ඉහළ නැංවිය හැකි බව පසක් විය.

**මුඛ්‍ය පද : පාසල් ඇගයීම, දෙවන පෙළ නායකත්වය, පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය**

## ගැටළුව හැඳින්වීම

බාහිර අධීක්ෂණ ක්‍රියාවලියේදී පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය (School Education Quality Index –SEQI) සඳහා බලපාන සාධක එහි ගුණාත්මක හා ප්‍රමාණාත්මක ව ඉහළ නැංවීමට බලපායි. ශිෂ්‍ය සාධනය, ඉගෙනුම, ඉගැන්වීම හා ඇගයීම, විධිමත් විෂය මාලා කළමණාකරණය, විෂය සමගාමී කටයුතු, ශිෂ්‍ය සුබසාධනය, නායකත්වය හා කළමනාකරණය, භෞතික සම්පත් කළමණාකරණය හා පාසල හා ප්‍රජාව යන ක්ෂේත්‍ර 8 ඔස්සේ නිර්ණායක 60 ක් හා දර්ශක 210 ක් ඔස්සේ මෙම ඇගයීම සිදු කරනු ලබයි. SEQI අගය ඉහළ නැංවීමට මෙම ක්ෂේත්‍ර 8 ඔස්සේ එම ක්ෂේත්‍ර ඇගයීමට යොදා ගන්නා ඇගයීම් හා නිර්ණායක වලට අදාළ සාක්ෂි, ලේඛන සහ නිරීක්ෂණ බාහිර මෙන්ම අභ්‍යන්තර ඇගයීමකදී ද ප්‍රබලව බලපායි. දිගු කාලීනව මෙම අධීක්ෂණ ක්‍රියාවලියේ නිරතවන්නෙකු ලෙස පර්යේෂකයා බොහෝ පාසල් වල පවතින ලේඛන, වාර්තා නිසි පරිදි ගොනු නොවීම සහ ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳ ඇගයීමට ලක් වන පාසලේ විදුහල්පතිවරු, නියෝජ්‍ය විදුහල්පතිවරු, ගුරුවරුන්, අනධ්‍යයන කාර්ය මණ්ඩලවල පවතින නොදැනුවත්භාවය SEQI අගය අඩු වීම කෙරෙහි බලපාන බව නිරීක්ෂණය කර හඳුනා ගෙන ඇත.

මෙහිදී බොහෝ පාසල් වර්ෂයක් තුළ විවිධ වූ වැඩසටහන්, ව්‍යාපෘති, ක්‍රියාකාරකම් සිදු කළත් ඒවා නිසි ලෙස වාර්තාකරණය නොවීම පොදුවේ දක්නට ලැබෙන ලකුණු උපයාගත හැකි නොවන අවස්ථාවකි. උදා: දිනපතා දරුවන්ගේ පෝෂණය උදෙසා පෝෂ්‍යදායී කැඳ වීදුරුවක් ලබා දෙන ව්‍යාපෘතියක් වසර පුරා ක්‍රියාත්මක කළද ඊට අදාල ඡායාරූප හෝ කැඳ ලබා දුන් සිසුන්ගේ ලේඛණ හෝ එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ ආකාරය පිළිබඳ වෙනත් දත්ත හෝ වාර්තා නොමැති වීම ලකුණු ලබා දීමේදී අධීක්ෂකවරුන් මුහුණපාන ගැටලුවකි. එසේම බොහෝ විදුහල්පතිවරු හෝ වැඩසටහන් ක්‍රියාත්මක කරන ගුරුවරු වාර්තාකරණය නීරස හා ඵලක් නොමැති ක්‍රියාවක් සේ සිතයි. එම නිසා වාර්තාකරණය පිළිබඳ සරල ආකෘති භාවිත කිරීමට විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් උනන්දු කළ යුතු වේ. වාර්තාකරණයේදී ඡායාරූපයක් / පරිගණකයේ පවතින විස්තර, දත්ත ආදිය ද සලකා බලා ලකුණු පිරිනැමිය යුතු බව අධීක්ෂණ කණ්ඩායමද දැනුම්වත් විය යුතුය.

මේ ආකාරයෙන්ම පාසල්හි පවත්වා ගෙන යන අනෙකුත් ලේඛන නිසියාකාර පරිදි නඩත්තුව සහ යාවත්කාලීන විය යුතු වේ. පාසලේ පවතින සියලුම ලේඛන නිසි පරිදි නඩත්තු විය යුතු වේ. නිදසුන් ලෙස ශිෂ්‍යයන් ඇතුළත් කිරීමේ ලේඛනය, නිවාඩු පොත හා විශේෂයෙන් මූල්‍ය ලේඛන වැනි මේවා යාවත්කාලීනව පවත්වාගෙන නොයාම තුළ ලකුණු උපයා ගැනීමට ඇති අවස්ථාව නැති වේ. මෙය පාසලේ විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති, ගුරුවරුන්, අනධ්‍යයන කාර්ය මණ්ඩල ඇතුළු සියලු දෙනාගේ වගකීමකි.

## මැදිහත් වීමේ ක්‍රියාවලිය

අධීක්ෂණ ක්‍රියාවලියේදී පාසල් වල නියෝජ්‍ය විදුහල්පතිවරුන් සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කරයි. සමස්ත බාහිර හා අභ්‍යන්තර ඇගයීම් ක්‍රියාවලියේදී ඔවුන්ගේ භූමිකාව තීරණාත්මක වේ. විශේෂයෙන් පාසලක ඉහත දැක්වූ ඇගයීම් ක්‍රියාවලියට අදාළ ක්ෂේත්‍ර 8ට අදාල ලිපිගොනු, සාක්ෂි පවත්වා ගෙන

යාම අධීක්ෂණ කණ්ඩායමට ඉදිරිපත් කිරීමේදී විදුහල්පතිට වඩා ප්‍රමුඛව මෙම ක්‍රියාවලිය ගැන මනා අවබෝධයක් ඇතිව කටයුතු කරන්නේ නියෝජ්‍ය/සහකාර විදුහල්පතිවරුන් ය. එම නිසා හෝමාගම අධ්‍යාපන කලාපයේ පාසල් 99 යේ නියෝජ්‍ය/සහකාර විදුහල්පතිවරුන් 99 සඳහා මෙම ප්‍රායෝගික මැදිහත් වීමේ ක්‍රියාවලිය සිදු කරන ලදී. නියෝජ්‍ය/සහකාර විදුහල්පතිවරුන් කණ්ඩායම් 2 ට බෙදන ලදී. (ක්‍රියාකාරකමේ පහසුව තකා හා භූගෝලීය සහ ප්‍රවාහන දුෂ්කරතා සැළකිල්ලට ගෙන) අධ්‍යාපන කලාපයේ SEQI අගය වැඩි ඵලදායීතාවයෙන් ඉහළ මනා ව්‍යවහාරයක් ක්‍රියාත්මක වන පාසල් 2 ක් වන ඉළුක්ඕවිට ක. වි. හා සුභාරතී ම. වි. යන පාසල් වෙත ඉහත කණ්ඩායම් 2018 වර්ෂයේ දී යොමු කරන ලද අතර 2019 දී සිරි පියරතන ක. වි. හා හෝමාගම ම. වි. යන පාසල් වෙත යොමු කරන ලදී. මෙම පාසල් වාර්තාකරණය, ලිපිගොනු නඩත්තුව සහ යාවත්කාලීනව පවත්වා ගෙන යාම මෙන්ම විවිධ වු යහ ව්‍යවහාරයන් භාවිත වන අධ්‍යාපන කලාපයේ පාසල් අතර කැපී පෙනෙන පාසල් වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

2018 වර්ෂයේදී හෝමාගම අධ්‍යාපන කලාපයේ SEQI අගය වැඩි මනා ව්‍යහාරයන් පවත්වා ගෙන යන පාසල් 02ක් වන බප/හෝ/ ඉළුක්ඕවිට ක.වි. හා බප/හෝ/ සුභාරතී ම.වි. වෙත කලාපයේ නියෝජ්‍ය/ සහකාර විදුහල්පතිවරු 45 දෙනා බැගින් අධ්‍යාපන සංවර්ධන අංශයේ විෂය අධ්‍යක්ෂවරුන් හා නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ලෙස පර්යේෂකයාද ක්ෂේත්‍ර 8ට අදාලව නියෝජ්‍ය/සහකාර විදුහල්පතිවරු කණ්ඩායම් කර එක් එක් විෂය අධ්‍යක්ෂවරුන් යටතට පත් කර අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම මත අධීක්ෂණය සිදු කරන ලදී.

මෙහිදී ප්‍රායෝගිකව පාසලක් අධීක්ෂණය කරන අයුරු අත්දැකීමෙන්ම අවබෝධ කර ගැනීමට අවස්ථාව ලබා දෙන ලදී. දත්ත, සාක්ෂි, විධිමත්ව වාර්තා තබා ගැනීම තුළ ලකුණු උපයා ගන්නා ආකාරය ඡායාරූපයක්, සටහනක්, සහභාගීත්ව අත්සන් ලේඛනයක් යම් කාර්යයක් සිදු වූ බවට සාක්ෂියක් වන ආකාරයත්, එසේම විධිමත් වාර්තාකරණයේ ඇති අවශ්‍යතාවද අවබෝධ කර ගත හැකි විය. විධිමත්ව ලේඛන නඩත්තුව තුළින් අධීක්ෂණයට මනා සූදානමකින් යුතුව මුහුණදිය හැකි බව අත්දැකීමෙන්ම පසක් කර ගන්නා ලදී. එසේම ඒ ඒ ක්ෂේත්‍ර යටතේ වූ දර්ශක හා නිර්ණායක පිළිබඳ මනා අවබෝධය ක්ෂේත්‍ර 8 ට අදාලව ලිපිගොනු නඩත්තුව පිළිබඳ ප්‍රායෝගිකවම අවබෝධයට අවස්ථාව ලබා දෙන ලදී. සාමාන්‍යයෙන් අධීක්ෂකවරු සේ කටයුතු කරන විෂය අධ්‍යක්ෂවරු තම අත්දැකීම් මත නියෝජ්‍ය විදුහල්පතිවරුන්ට මනා මඟපෙන්වීමක් ලබා දෙන ලදී. විශේෂයෙන් ලකුණු පිරි නැමීමේදී අවිනිශ්චිත වන අවස්ථා වලදී ලකුණු ලබා දිය යුතු ආකාරය පිළිබඳ මඟ පෙන්වීමක් ඔවුන් විසින් ලබා දෙන ලදී. ඒ ඒ ක්ෂේත්‍රයට අයත් ලිපි ගොනුවල අඩංගු විය යුතු නොවිය යුතු ලේඛන පිළිබඳ දැනුවත් කරන ලදී.

## දත්ත එක් රැස් කිරීම

ඉහත සඳහන් කළ ක්ෂේත්‍ර අධ්‍යයනයන්හිදී පැවරුණු ක්ෂේත්‍රය තුළ පාසලේ තත්ත්වය අවබෝධ කර ගෙන ලකුණු ලබා දීමේ ක්‍රමවේදය අනුව ලකුණු දීමට මඟ පෙන්වන ලදී.

එම ක්ෂේත්‍ර භාර අධ්‍යක්ෂවරයා මගින් ක්ෂේත්‍රයන්ට අදාල දත්ත ගොනු කිරීමේදී ඊට අදාළ ක්ෂේත්‍ර /නිර්ණායක නිවැරදිව හඳුනා නොගැනීම, නිසි පරිදි ගොනු නොකිරීම විවිධ ක්ෂේත්‍ර සඳහා අදාළ වන එකම කරුණු ගොනු කර ඇති ස්ථාන පිළිබඳ සටහන් නොතිබීම දක්නට ලැබුණි.

අභ්‍යන්තර අධීක්ෂණයේ දී නිසි අවබෝධයකින් තොරව උපරිම ලකුණු අදාළ නිර්ණායක සඳහා පිරිනමා තිබීම නිසා බාහිර අධීක්ෂණයේ දී ලබා දෙන ලකුණු හා අභ්‍යන්තර අධීක්ෂණයේ දී ලබා දී ඇති ලකුණු අතර වෙනසක් පැවතීම දැකිය හැකිය. එම නිසා බාහිර හා අභ්‍යන්තර පාසල් ගුණාත්මක දර්ශකයේ අගය ගණනයේ දී එම දෝෂය ප්‍රබලව බලපා ඇති බව පෙණුනි.

අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියවලිය බොහෝ විට නියෝජ්‍ය/සහකාර විදුහල්පතිවරු හා අංශ ප්‍රධාන ගුරු භවතුන් හා ක්ෂේත්‍ර 8 ට අදාළව තෝරාගත් කමිටු හරහා සිදු වේ. එම නිසා පෙර සඳහන් කළ ප්‍රායෝගික අත්දැකීමේ දී මේ පිළිබඳව ද අවධානය යොමු කොට නිසි පරිදි පාසලක අභ්‍යන්තර අධීක්ෂණය සිදු කළ හැකි ආකාරය පිළිබඳ දැනුවත් කරන ලදී. එසේම අධ්‍යාපන කලාපය තුළ අභ්‍යන්තර අධීක්ෂණ සතියක් නම් කර එම කාලය තුළ සියලු පාසල් අභ්‍යන්තර අධීක්ෂණය සිදු කර අදාළ වාර්තා අධ්‍යාපන සංවර්ධන අංශය වෙත යොමු කරවීමට පියවර ගන්නා ලදී.

## දත්ත විශ්ලේෂණය කිරීම

වගුව 1 ඃ පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය - 2018

| පාසල් වර්ගය | පාසල් සංඛ්‍යාව | 2018 වර්ෂයේ දී අධීක්ෂණයට ලක් වූ සංඛ්‍යාව | ලකුණු 70 හෝ ඊට වැඩි | ලකුණු 60-69 අතර | ලකුණු 60 ට අඩු |
|---|---|---|---|---|---|
| 1AB | 05 | 04 | 01 | 01 | 02 |
| 1C | 14 | 14 | 00 | 12 | 02 |
| 2 වර්ගය | 46 | 43 | 03 | 34 | 06 |
| 3 වර්ගය | 33 | 30 | 11 | 18 | 01 |
| වෙනත් | 01 | 01 | 00 | 00 | 01 |
| එකතුව | 99 | 92 | 15 | 65 | 12 |

වගුව 2 ඃ පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය - 2019

| පාසල් වර්ගය | පාසල් සංඛ්‍යාව | 2019 වර්ෂයේ දී අධීක්ෂණයට | ලකුණු 70 හෝ ඊට වැඩි | ලකුණු 60-69 අතර | ලකුණු 60 ට අඩු |
|---|---|---|---|---|---|
| 1AB | 07 | 07 | 01 | 05 | 01 |
| 1C | 13 | 10 | 02 | 07 | 01 |
| 2 වර්ගය | 34 | 15 | 03 | 09 | 03 |
| 3 වර්ගය | 45 | 39 | 18 | 19 | 02 |
| වෙනත් | 00 | 00 | 00 | 00 | 00 |
| එකතුව | 99 | 71 | 24 | 40 | 00 |

## නිගමන

- ඇගයිම්/අධීක්ෂණ ක්‍රියාවලිය ප්‍රායෝගිකව ලබන ක්ෂේත්‍රගත අත්දැකීම් තුළින් විශේෂයෙන් පාසල්වල මෙම කාර්යය සෘජුවම සිදු කරනු ලබන නියෝජ්‍ය/සහකාර විදුහල්පතිවරුන්ට හොඳ අවබෝධයක් ලබා දීම තුළින් තම පාසලේ SEQI අගය වැඩි කර ගුණාත්මකභාවය හා ඵලදායිතාව වැඩිකර ගත හැකි බව මෙන්ම එම අධීක්ෂණ ඇගයීම් ක්‍රියාවලිය හොඳින් සිදු වන පාසල්වල ක්ෂේත්‍රගත අත්දැකීම් වඩාත් බලපෑම් සිදු කළ හැකි බවයි.
- පාසලක් ඇගයීමේදී අභ්‍යන්තර ඇගයීම වඩා ඵලදායී බව හා එම කාර්යය මනා අවබෝධයකින් සිදු කළ යුතු බවයි.
- අභ්‍යන්තර ඇගයීමට වඩා බාහිර ඇගයීම පාසලට වඩා බලපෑමක් කළ හැකි බව හා එමගින් පෙන්වා දෙන දුර්වලතා, ප්‍රබලතා කෙරෙහි පාසල සංවේදී බව

## යෝජනා

- සමස්තයක් වශයෙන් මෙම ඇගයීම් ක්‍රියාවලිය පාසලක් ඇගයීමේදී වඩාත් උචිත බව.
- සමහර දර්ශක නිර්ණායක තුළින් කරුණු කිහිපයක් කෙරෙහි අවධානය යොමු කරන නිසා ලකුණු පිරිනැමීම අවිනිශ්චිත බැවින් පැහැදිලි ලකුණක් ලබාදිය හැකි ආකාරයට දර්ශකය හෝ නිර්ණායකය සුවිශේෂී කිරීම.

## ආශ්‍රිත ග්‍රන්ථ

අබේපාල, ආර්. (2010), **අධ්‍යාපනයේ මනෝ විද්‍යාත්මක පදනම**, සාර ප්‍රකාශන, කොට්ටාව

අබේපාල, ආර්. (2014) දත්ත රැස් කිරීමේ උපකරණය, සාර ප්‍රකාශන, කොට්ටාව

අධ්‍යාපන අමාත්‍යාංශය, (2014) අපේ පාසල කෙතරම් ගුණාත්මකද?, කොළඹ, රජයේ මුද්‍රණාලය

# පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක දර්ශකය "විශිෂ්ටයි" මට්ටමට සංවර්ධනය කිරීම

පී. ජී. කේ. කේ. එස්. විමලවීර (MA, PGDE, BA)

නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන කාර්යාලය, බණ්ඩාරවෙල

*071 2006254 / pgkksw@gmail.com*

## සංක්ෂිප්තය

පාසලක අධ්‍යාපනයේ ගුණාත්මක බව තහවුරු කර ගැනීම සඳහා පාදක කර ගන්නා ප්‍රධාන මෙවලම වන්නේ ඒ සඳහා හඳුන්වා දී ඇති පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක දර්ශකය යි. මෙම දර්ශකය ක්ෂේත්‍ර අටක් ඔස්සේ මැනෙන අතර පාසලක් අභ්‍යන්තර ඇගයීම් ක්‍රියාවලිය මගින් ඉහත ක්ෂේත්‍ර 8 පාදක කරගනිමින් ස්වයං තක්සේරුවක් සිදුකරයි. කොට්ඨාස, කලාප හා අමාත්‍යාංශ පාසල් නියාමනය තුළ බාහිරව ද එම ක්ෂේත්‍ර ඔස්සේ ම පාසල ඇගයීමට ලක් කරයි. මෙම ඇගයීම මගින් සියලු පාසල්හි අධ්‍යාපනයේ ගුණාත්මක දර්ශකය ලබා ගෙන පාසල් තක්සේරුකරණය සිදු කරනු ලබන අතර එහි දී මට්ටම් හතරකට වර්ගීකරණයක් සිදු කරයි. එම වර්ගීකරණයේ දී බණ්ඩාරවෙල අධ්‍යාපන කලාපයේ "විශිෂ්ටයි" මට්ටමට ලඟා වූ එකදු පාසලක් හෝ නොතිබුණු බැවින් ඒ සඳහා හේතු පරීක්ෂා කිරීමට හා කළ හැකි දේ සොයා බැලීමට අරමුණු 6 ක් ඔස්සේ එක් පාසලක් "විශිෂ්ටයි" මට්ටමට සංවර්ධනය කිරීමට ගත් වෑයමක් ලෙස මෙම පර්යේෂණය හඳුන්වමි. මේ සඳහා තෝරා ගනු ලැබුවේ බණ්ඩාරවෙල කලාපය තුළ පිහිටි "ඉතා හොඳයි" මට්ටමේ පැවති පාසලකි. එම පාසලෙහි වර්ෂ තුනක සංඛ්‍යා දත්ත පාදක කොට ගෙන නිරීක්ෂණ හා සම්මුඛ සාකච්ඡා ඇසුරින් දත්ත විශ්ලේෂණය කර, පවතින තත්ත්වය අනාවරණය කර ගැනීමට කටයුතු කළෙමි. සාකච්ඡා හා සංවාද ඇසුරෙන් අගය කිරීම් හා පෙළඹවීම් සිදු කිරීම් මගින් ප්‍රතිපෝෂණ හා ඉදිරි පෝෂණ ලබා දීමට මැදිහත් වුණෙමි. අභ්‍යන්තර ඇගයීම ශක්තිමත් කිරීමට අවස්ථා උදා කර ගත් අතර ඇගයීම පිළිබඳ දැනුම බලගැන්වීම මගින් නිර්මාණශීලී ව්‍යවහාරයන් සඳහා ගුරු යොමු වීම ක්‍රමයෙන් වර්ධනය කර ගත හැකි විය. මෙතෙක් හුදකලාව තිබූ පාසල වෙත අධ්‍යාපන නිලධාරීන්ගේ අවධානය යොමුකරවීම හා ඔවුන් වෙත පාසල හඳුන්වා දීමේ ප්‍රබලතාව විදුහල්පති හා ගුරු මණ්ඩලය සුබදායක පෙළඹවීමකට යොමු කරන්නක් විය. නිරන්තරව පාසල වෙත මැදිහත්වීම් හේතුවෙන් විශ්වාසනීය බව තහවුරු වීම මත නිසි තැන් ගැන්විය යුතු අවස්ථා පහසුවෙන් හඳුනාගත හැකි විය. පුද්ගල අගය කිරීම් කාර්ය සාධනය කෙරෙහි බලපාන්නකි. පසුවිපරම් ක්‍රියාවලිය මගින් ගුරු භවතුන් සක්‍රීය කර ගත හැකි වේ. පවතින තත්ත්වයන් හා නිර්මාණශීලීත්වයන් අගය කරමින් මිත්‍රශීලීව සංවාදයෙහි යෙදෙමින් අඛණ්ඩ මැදිහත්වීම හේතුවෙන් පාසලෙහි අධ්‍යාපන ගුණාත්මක දර්ශකය "විශිෂ්ටයි" මට්ටම කරා ළඟා වීමට පාසල වෙත දායකත්වය දිය හැකි විය. මෙම කාර්යයෙහි නියැලීම තුළින් වෘත්තීය ජීවිතයට අදාළව නිලධාරියෙකු පාසල වෙත මැදිහත්වීමේ ප්‍රමාණය මත පාසලේ ගුණාත්මක බවෙහි වන වෙනස මා හට හඳුනා ගත හැකි විය. මාගේ වෘත්තියෙහි ඉදිරි කටයුතු ඉටුකරගෙන යාම සඳහා මේ මගින් ලැබුණු අත්දැකීම හා දිරිය පාසල් පද්ධතියේ ගුණාත්මක සංවර්ධනයෙහි උන්නතිය සඳහා භාවිතයට ගැනීම මාගේ අපේක්ෂාවයි.

**මුඛ්‍ය පද : අධ්‍යාපන ගුණාත්මක දර්ශකය, අභ්‍යන්තර ඇගයීම, විශිෂ්ටයි මට්ටම**

# 1. හැඳින්වීම

## 1.1 ගැටළුවෙහි පසුබිම

පාසල් පද්ධතියෙහි කටයුතු ආයතන මගින් පරීක්ෂා කිරීම 1950 දශකයේ සිට ආරම්භ වී ඇත. පාසලට අවශ්‍ය පරිදි නොව ඉහළ ස්ථර වලට අවශ්‍ය පරිදි සිදු කළ මෙම කටයුත්ත කළමනාකරණ විෂයය අධ්‍යාපනයට එකතු වීමත් සමඟ 1980 වර්ෂයෙන් පසු පාසල් පාදකව තීරණ ගැනීමට පාසලට ඉඩ හසර ලැබුණි. 1990 වර්ෂයෙන් පසුව ස්වයංව පාසල තක්සේරු කර ගැනීමට අවස්ථාව ලැබුණි. එමෙන්ම බාහිර නියාමනයක්ද සිදු විය.

ශ්‍රී ලංකාවේ පාසල්වල වත්මන් ඇගයීම් ක්‍රමවේදය සම්බන්ධයෙන් විමසා බැලීමේදී 2001 වර්ෂයෙහි අධ්‍යාපන අමාත්‍යංශයෙහි ඇගයීම හා ප්‍රමිති ඒකකය පිහිටුවීම වැදගත් සන්ධි ස්ථානයක් ලෙස හැඳින්විය හැකිය. 2004 වර්ෂයේ එම ඒකකය කළමනාකරණ ප්‍රමිති ඒකකය වශයෙන් ප්‍රතිව්‍යුහගත කිරීමත් 2005 වර්ෂයේ පාසල් අභ්‍යන්තර ඇගයීම් පිළිබඳව මාර්ගෝපදේශ සංග්‍රහය හා 2007 වර්ෂයේදී අධ්‍යාපන ප්‍රමිති හා බාහිර ඇගයීම් මාර්ගෝපදේශ සංග්‍රහය අධ්‍යාපන පද්ධතියට හඳුන්වා දීමත්, නිසා වර්තමාන ඇගයීම් ක්‍රියාවලියට සුභවාදී ප්‍රවේශයක් ඇති විය. 2009 වර්ෂයේදී ජාතික අධ්‍යාපන ප්‍රමිති මාර්ගෝපදේශය හඳුන්වා දීමෙන් පාසල් අභ්‍යන්තර හා බාහිර ඇගයීම් සම්බන්ධව විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කර ඇත. 2009 වර්ෂයේ මෙම නව ඇගයීම් හා නියාමන වැඩපිළිවෙළ (චක්‍රලේඛ අංක 2008/06) ඔස්සේ පාසල්වල ස්වයං ඇගයීම බලවත්ත කිරීමට කිසියම් සහයක් ලබා දී තිබේ. ඒ ඔස්සේ පාසල් අභ්‍යන්තර ඇගයීම් කමිටු පිහිටුවමින් පාසල් මට්ටමින් සරල අභ්‍යන්තර ඇගයීම් සැලැස්මක් සකස් කිරීම, පාසල් තත්ත්ව කව පිහිටුවීම, පන්ති කාමර නිරීක්ෂණය, ශිෂ්‍ය සාධන මට්ටම් විශ්ලේෂණය හා වාර්ෂික සමස්ත ඇගයීමක් මගින් පාසලේ ප්‍රබලතා හා ගැටළු හඳුනා ගැනීම සඳහා මාර්ගෝපදේශ සපයා ඇත (අධ්‍යාපන අමාත්‍යංශය, 2014, පි. 06).

2015 වර්ෂයේ සිට ක්ෂේත්‍ර මූලිකත්වය දී අධ්‍යාපනයේ පොදු අරමුණු සහ නිපුණතා වලට අදාළ අපේක්ෂිත ඉලක්ක කරා පාසල් කටයුතු මෙහෙයවන්නේද යන්න සොයා බැලීම සඳහා අභ්‍යන්තර වශයෙන් පාසල, පාසල විසින්ම සහ බාහිර වශයෙන් පළාත්, කලාප, කොට්ඨාස සහ කේවල ලෙස පාසල් නිරන්තර ඇගයීමට ලක් වේ. දර්ශක හා නිර්ණායක පදනම්ව සිදු කෙරුණු පාසල් ඇගයීම් ක්‍රියාවලිය තවදුරටත් සංවර්ධනය වෙමින් පහත ඇගයීම් ක්ෂේත්‍ර 8ක් ඔස්සේ වර්තමානය වන විටත් අධ්‍යාපන පද්ධතිය තුළ අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ.

1. ශිෂ්‍ය සාධනය
2. ඉගෙනුම ඉගැන්වීම හා ඇගයීම
3. විධිමත් විෂයමාලා කළමනාකරණය
4. විෂය සමගාමී කටයුතු
5. ශිෂ්‍ය සුභසාධනය
6. නායකත්වය හා කළමනාකරණය
7. භෞතික සම්පත් කළමනාකරණය
8. පාසල හා ප්‍රජාව

(අධ්‍යාපන අමාත්‍යංශය, 2014, පි. 07)

මේ ඔස්සේ සලකා බැලෙන දර්ශක සියල්ල පාසල තුළ පවත්වාගෙන යන ආකාරය අනුව පාසල ලබා ගන්නා ලකුණු තීරණය වේ. ඒ ඒ ඇගයීම් ක්ෂේත්‍රවලට ලකුණු පිරිනමා පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය (School Education Quality Index– SEQI) සකස් කිරීමෙන් පසු පාසලක සමස්ත ඇගයීම තීරණය සඳහා පහත සඳහන් ලකුණු පරිමාණ සලකා බැලේ.

| | |
|---|---|
| ලකුණු 80% හෝ ඊට වැඩි | - විශිෂ්ටයි |
| ලකුණු 70% - 79% | - ඉතා හොඳයි |
| ලකුණු 60% - 69% | - හොඳයි |
| ලකුණු 50% - 59% | - සාමාන්‍යයි |
| ලකුණු 40% - 49% | - සංවර්ධනය විය යුතුයි |
| ලකුණු 40%ට වඩා අඩු | - ඉතා ඉක්මණින් සංවර්ධනය විය යුතුයි. |

(අධ්‍යාපන අමාත්‍යංශය, 2014, පි. 42)

පාසල්වලට මෙන්ම අධ්‍යාපනික ආයතනවලට ද මෙම හඳුන්වාදීම ඉතා වැදගත් වේ. පාසලේ පවත්නා තත්ත්වයන් හඳුනා ගැනීමට, පවත්වාගෙන යාමට, තීරණ ගැනීමට හා ඔසවා තැබීමට මෙහි දී අනාවරණය කර ගන්නා කරුණු ඉවහල් කර ගත හැකි වේ. ඉහත ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීමට මෙතෙක් ක්‍රියාත්මක වූ 2008/06 චක්‍රලේඛ අවලංගු කොට 31/2014 චක්‍රලේඛය අධ්‍යාපන අමාත්‍යංශය මගින් හඳුන්වා දෙන ලදී (අධ්‍යාපන අමාත්‍යංශය, 2014, පි. 46).

මා දීර්ඝ කාලීනව පාසල් බාහිර ඇගයීම් කාර්ය සඳහා සම්බන්ධ වීමේ දී ගුණාත්මක තහවුරුවට අදාළව යම් යම් ගැටළු පවතින බව අනාවරණය විය.

- විදුහල්පතිවරුන්, ගුරුභවතුන් හා ඇතැම් නිලධාරීන් හට ස්වයං තක්සේරුකරණය පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොමැතිකම.
- ගුරුභවතුන් විෂය නිර්දේශය අවසන් කිරීම සඳහා පමණක් සිය අවධානය යොමුවීම.
- ආයතනික බලපෑම් මත අනවබෝධයෙන් ලකුණක් ප්‍රදානය කිරීම.
- අවිධිමත් ලෙස ලිපිගොනු නඩත්තුව.
- බාහිර අධීක්ෂණ නිලධාරීන්ගේ ලකුණු ලබා දීමේ විෂමතා හා උපදෙස් ලබා දීමේ පරස්පරතා

මෙවැනි ගැටළු මතුවීම හේතුවෙන් පාසල ලබා ගන්නා SEQI අගයෙහි වෙනස්කම් මතු වේ. මෙය තුලනය කර පාසල් විශිෂ්ට මට්ටමට ගෙන ඒමට මැදිහත්වීමේ අවශ්‍යතා පවතී. මා විසඳුම් සෙවීමට උත්සාහ ගන්නා ගැටළුව ද මෙයම වන අතර පාසල්හි ගුණාත්මක බව ඉහළ නැංවීමට සුදුසු ක්‍රමවේද සොයා බලා ක්‍රියාත්මක කිරීමට මෙම පර්යේෂණ යොදා ගනිමි.

### 1.2 ගැටළුව ඉස්මතු වූ පසුබිම

බණ්ඩාරවෙල අධ්‍යාපන කලාපය කොට්ඨාස 4කින් සමන්විත පාසල් 144 ක භාරකාරත්වය දරමින් ගුරු උපදේශකවරුන් 55ක් හා අධ්‍යක්ෂකවරුන් 11 දෙනෙකුගෙන් යුක්තව "ලංකාවේ විශිෂ්ටතම අධ්‍යාපන කලාපය බවට පත් වීම" යන දැක්ම සහිතව ඉදිරි ගමනක යෙදෙයි. සැලසුම් සකස් කිරීමේදී ගැනෙන "සාමාන්‍ය අධ්‍යාපනයේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම" යන ප්‍රමුඛ පරාසයට අදාළව කේවල හා බාහිර ඇගයීම්වල දී අනාවරණය වූ පරිදි කලාපයේ එකදු පාසලක් හෝ 2015, 2016, 2017 වර්ෂවල දී අධ්‍යාපනයේ ගුණාත්මක දර්ශකය "විශිෂ්ටයි" මට්ටමට ලකුණු ලබාගෙන නොතිබුණි.

පාසල් පාදකව අභ්‍යන්තර ඇගයීම් අඛණ්ඩව සිදු කිරීම, කොට්ඨාස මට්ටමින් අඛණ්ඩව බාහිර ඇගයීම් සිදු කිරීම, වාර්ෂිකව කලාප මට්ටමින් බාහිර ඇගයීම් සිදු කිරීම වැනි ස්ථර කිහිපයක් යටතේ විවිධ අවස්ථාවන්හිදී ඇගයීම් වලට ලක් වූ විට අනිවාර්යෙන්ම පාසල් විශිෂ්ටත්වය කරා යා යුතු වන්නේ නිසි මගපෙන්වීම් ප්‍රබලතා දුබලතා හා සංවර්ධනය විය යුතු අංශ හඳුනාගෙන ඒවාට නිසි පිළියම් යොදන බැවිනි. එසේම පසු විපරම් ක්‍රියාවලියක් මගින් ප්‍රතිපෝෂණ ක්‍රියාවලිය ශක්තිමත් කෙරෙන බැවිනි. එහෙත් ලකුණු පරිමාණ අනුව සලකා බැලීමේදී 2015, 2016 වර්ෂයන්හි ලකුණු 80% ක් ලබා ගත් පාසලක් බණ්ඩාරවෙල කලාපයෙහි නොමැති විය. 2017 වසරේ බාහිර ඇගයීම් වාර්තාව අනුව ලකුණු 70% ත් 79% ත් අතර ලකුණු ලබා ගත් පාසල් 8ක් කලාපය තුළ හඳුනා ගත හැකි විය. අඛණ්ඩ ඇගයීම් ක්‍රියාවලියක් තුළ මෙවැනි තත්ත්වයක් මතු වීමට හේතු සොයා බැලීම සඳහා මේ ආකාරයේ කාර්ය මූලික පර්යේෂණයකට යොමු වීමට අදහස් කර ගතිමි.

### 1.3 පර්යේෂණ නියැදිය

මෙම අධ්‍යයනය සඳහා තෝරා ගත් පාසල බණ්ඩාරවෙල නගරයෙන් කි.මී. 25 ක පමණ දුරින් පිහිටි මෙම විදුහලෙහි බොහෝමයක් සිසුන් ගම්බද ව ජීවත් වෙති. 1969 දී ආරම්භ කරන ලද මෙම විදුහල පසුකාලීනව මධ්‍ය මහා විද්‍යාලයක්, නවෝදය විද්‍යාලයක් ලෙසත්, වර්තමානය වන විට 1AB ද්විතියික පාසලක් ලෙසත් සංවර්ධනය වූ අතර ඇල්ල කොට්ඨාසයේ උසස් පෙළ විෂය ධාරා පහම ක්‍රියාත්මක වන එකම පාසල ලෙසත් හඳුනා ගත හැකිය. නගරයෙන් දුරස්ථව පිහිටා ඇතත් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීමක් එහි දක්නට ලැබේ. 2017 වසරේ බාහිර ඇගයීම් වාර්ෂික වාර්තාව අනුව "ඉතා හොඳයි" (ලකුණු 70% - 79% අතර) මට්ටමෙහි පාසල් 8ක් අතරින් ඇල්ල කොට්ඨාසයට අදාළ මෙම පාසල 2017-10-24 දින කලාප ඇගයීමේදී SEQI අගය 70% ක් ලබා ගෙන තිබූ බැවින් ඉහත සඳහන් ගැටළුව විසඳා ගැනීම සඳහා අදාළ පාසල යොදා ගැනීමට අපේක්ෂා කළෙමි. ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් හඳුන්වා දෙනු ලැබූ Knowledge Tower ව්‍යාපෘතියෙහි මෙම පාසලට අදාළව නියාමන නිලධාරිනිය ලෙස මා පත් කර ඇත. ඒ සඳහා නිතර පාසල වෙත යා යුතු බැවින් මෙම පාසල මගේ කාර්ය මූලික පර්යේෂණය සඳහා යොදා ගත්තෙමි.

### 1.4 පර්යේෂණයේ අරමුණු

- පවතින තත්ත්වය හඳුනා ගැනීම සඳහා SWOT විශ්ලේෂණයක් කිරීම.
- විශිෂ්ට මට්ටම කරා පාසල ළඟා නොවීමට පවතින බාධා හඳුනා ගැනීම.
- හඳුනාගත් දර්ශක සංවර්ධනය සඳහා සුදුසු පියවර ගැනීම.
- පාසල් අභ්‍යන්තර ඇගයීම විධිමත් කිරීමට සහය වීම.
- පාසල විශිෂ්ට මට්ටමට ගෙන ඒමට මැදිහත් වීම.
- අභ්‍යන්තර ඇගයීමක් මගින් ප්‍රගතිය පරීක්ෂා කිරීම.

## 2. සාහිත්‍ය විමර්ශනය

### 2.1 සමීප සන්දර්භය

1 ශ්‍රේණියේ විදුහල්පතිවරවයකු, 111 ශ්‍රේණියේ නියෝජ්‍ය විදුහල්පති වරයෙකු ඇතුළුව ගුරු සංඛ්‍යාව 42 ක් සහ අනධ්‍යනය කාර්යය මණ්ඩලය 10කින් යුතු කාර්යය මණ්ඩලයක් මෙම විදුහලේ සේවය කරති. විදුහලේ ශිෂ්‍ය සංඛ්‍යාව 530කි. දෙමාපිය ප්‍රජාව බහුතරයක් කෘෂි ආර්ථිකය තම ජීවනෝපාය කරගනිමින් ජීවත් වෙති. පාසලෙහි පෝෂිත ප්‍රදේශය මාර්ග දුෂ්කරතා සහිත ප්‍රවාහන පහසුකම් නොමැති ගම්බද ප්‍රදේශවලින් යුක්ත වේ.

කලාප අධ්‍යාපන කාර්යාලයේ මූලිකත්වයෙන් පවත්වන ලද අභ්‍යන්තර ඇගයීම් ශක්තිමත් කිරීමේ පුහුණු වැඩමුළුව සඳහා විදුහල්පති සක්‍රිය සහභාගීත්වයක් දක්වන ලද අතර එය පාසල තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ගුරු සාකච්ඡා මගින් දැනුවත් කර දිශානුගත කර තිබුණි. පාසලෙහි අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලය පාසල් අභ්‍යන්තර ඇගයීම් සම්බන්ධයෙන් තම තමන් දැනුවත් වූ පරිදි කාර්යය භාරය ඉටු කර තිබුණි. පාසල, කොට්ඨාස, කලාප, පළාත් වශයෙන් 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා බාහිර ඇගයීමට ලක්ව තිබූ වාර ගණන පහත පරිදි වේ.


වගුව 1 : පාසල, කොට්ඨාස, කලාප, පළාත් වශයෙන් 2015 සිට 2017 වර්ෂය දක්වා බාහිර ඇගයීමට ලක්වූ අවස්ථා

| වර්ෂය | කොට්ඨාස මට්ටම | | කලාප මට්ටම | | පළාත් මට්ටම |
|---|---|---|---|---|---|
| | ඇගයීම් සංඛ්‍යාව | දිනය | ඇගයීම් සංඛ්‍යාව | දිනය | |
| 2015 | 1 | 2015.02.24 | 1 | 2015.11.03 | නැත |
| 2016 | 1 | 2016.07.07 | 1 | 2016.11.01 | නැත |
| 2017 | 1 | 2017.02.14 | 1 | 2017.10.24 | නැත |

ඒ අනුව 2015, 2016, 2017 වර්ෂයන්හි බාහිර අධීක්ෂණය වාර්තා අනුව අනාවරණය කරගත් සංඛ්‍යාත්මක කරුණු සාරාංශය පහත පරිදි වේ.

වගුව 2 : පාසල 2015 සිට 2017 දක්වා බාහිර ඇගයීමට ලක්කර ලබා දී ඇති ලකුණු

| වර්ෂය | දිනය | ආයතනය | ක්ෂේත්‍රය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | SEQI |
| 2015 | 2015.02.24 | කොට්ඨාස | 69 | 50 | 57 | 50 | 55 | 61 | 50 | 50 | 55% |
| | 2015.11.03 | කලාප | 59 | 64 | 60 | 51 | 55 | 64 | 61 | 62 | 60% |
| 2016 | 2016.07.07 | කොට්ඨාස | 57 | 65 | 59 | 48 | 47 | 59 | 51 | 64 | 56% |
| | 2016.11.01 | කලාප | 56 | 64 | 61 | 45 | 67 | 66 | 71 | 60 | 61% |
| 2017 | 2017.02.14 | කොට්ඨාස | 61 | 60 | 50 | 65 | 70 | 56 | 62 | 47 | 59% |
| | 2017.10.24 | කලාප | 71 | 62 | 58 | 80 | 73 | 70 | 68 | 77 | 70% |




රූපය 1 : 2015, 2016, 2017 වර්ෂයන්හි කොට්ඨාස හා කලාප මට්ටමෙන් පාසල ලබා ගත් SEQI අගයෙහි සාරාංශය

පාසල නිරීක්ෂණයෙන්, සම්මුඛ සාකච්ඡා හා ඉහත තොරතුරු අනුව පවතින තත්ත්වය පිළිබඳ අනාවරණය කර ගත් කරුණු :

- කාර්යාලය තුළ පවත්වාගෙන යා යුතු ලිපි ගොනු 9ක් විධිමත්ව ඇත.
- කාර්යය මණ්ඩලයට වගකීම් පවරා ඇත.
- ඒ ඒ වර්ෂයන්ට අදාළව වාර්ෂික සැලැස්ම සකස් කර ඇත.
- සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන ඇත.
- ගුණාත්මක සංවර්ධන වැඩසටහන්, ක්ෂේත්‍ර ලිපි ගොනු සම්බන්ධ සියලු ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට මෙහෙයුම් ඒකකයක් ඇත.
- වාර විභාග ලකුණු විශ්ලේෂණ අනුව කේවල සිසු ප්‍රගතිය පිළිබඳව පංති කව මට්ටමින් දෙමව්පියන් දැනුවත් කිරීම. (Powerpoint presentation යොදා ගනිමින්)
- කැපී පෙනෙන දෙවන පෙළ නායකත්වයක් දක්නට ඇත.
- ගුරු ඇගයීම් අවසාන ලකුණු සාරාංශයක් සකසා ඇත.

- ක්‍රියාකාරකම් නියාමනය සඳහා පැහැදිලි ක්‍රමවේදයක් නැත.
- ඇතැම් ගුරුභවතුන් කාර්යයන් පැවරීමේදී පීඩාවට ලක්ව සිටීම.
- භෞතික පරිසරය මෙන්ම පන්ති කාමර ඉගෙනුම් පරිසරය තව දුරටත් සංවර්ධනය විය යුතුය.
- පුස්තකාල පරිසරය සහ සැලසුම්ගත ක්‍රියාකාරකම් තව දුරටත් සංවර්ධනය විය යුතුය.
- ඉහළ අධ්‍යාපන ආයතන හා නිලධාරීන්ගේ සහභාගීත්වය හා ඔවුන් පාසල කෙරෙහි දක්වන අවධානය, අවම මට්ටමක පැවතීම නිසා පාසලේ කාර්යය මණ්ඩලය කාර්යය සඳහා පෙළඹවීමේ අඩුවක් පැවතීම.

### 2.2 ශාස්ත්‍රීය සන්දර්භය

අනාගත සමාජයේ කැඩපත වන පාසලෙහි සංවර්ධනය, සමස්ත සමාජයේම සංවර්ධනය ලෙස හඳුනාගත හැකිය. ගුණාත්මක සමාජයක් සඳහා ගුණාත්මක බවින් පිරිපුන් දරුවෙකු ලෝකයට දායාද කිරීමේදී පාසලේ කටයුතුවල ගුණාත්මකභාවය පිලිබඳ මෙන්ම වඩා යහපත් ඉගෙනුම් වාතාවරණයක් සම්පාදනය කිරීම අවශ්‍යව ඇත.ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යංශයේ කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව පහත පරිදි තොරතුරු හා සාක්ෂි පදනම්ව නිර්ණායක මූලික ලකුණු ප්‍රදානයක් මගින් පාසල ස්ව තක්සේරුවකට ලක් කිරීමට ඉඩ සාදා දී ඇත.

වගුව 3 : අධ්‍යාපනයේ ගුණාත්මක භාවය තහවුරු කිරීම සඳහා වූ නව ඇගයීම් වැඩපිළිවෙල

| අනු අංක | ඇගයීම් ක්ෂේත්‍ර | ප්‍රමිති | ප්‍රමිතියට ළඟා වීම සඳහා සම්පූර්ණ කල යුතු | නිර්ණායක | දර්ශක | ගුණාත්මක තත්ත්වය තහවුරු කිරීම සඳහා ප්‍රශ්න |
|---|---|---|---|---|---|---|
| 1 | ශිෂ්‍ය සාධනය | 02 | 03 | 05 | 35 | 05 |
| 2 | ඉගෙනුම, ඉගැන්වීම හා ඇගයීම | 02 | 05 | 04 | 30 | 07 |
| 3 | විධිමත් විෂයමාලා | 01 | 03 | 08 | 25 | 05 |
| 4 | විෂය සමගාමී කටයුතු | 01 | 03 | 05 | 14 | 04 |
| 5 | ශිෂ්‍ය සුබසාධනය | 01 | 04 | 09 | 22 | 04 |
| 6 | නායකත්වය හා | 01 | 07 | 16 | 45 | 07 |
| 7 | භෞතික සම්පත් කළමනාකරණය | 01 | 02 | 08 | 26 | 04 |
| 8 | පාසල හා ප්‍රජාව | 01 | 03 | 05 | 13 | 04 |
| | මුලු ගණන | 10 | 30 | 60 | 210 | 40 |

මූලාශ්‍රය : "අපේ පාසල කොතරම් ගුණාත්මකද?" පාසල් ඇගයීම් පිළිබඳ මාර්ගෝපදේශය

පාසලේ අභ්‍යන්තර ඇගයීම අඛණ්ඩව සිදු කිරීම මෙන්ම සෑම අභ්‍යන්තර ඇගයීමකින් පසුව පාසලේ විදුහල්පති ඇතුළු ගුරු මණ්ඩලය විසින් පාසලේ ගුණාත්මක තත්ත්වය පිළිබඳ සමාලෝචනයක යෙදී තම ශක්තීන් මෙන්ම සංවර්ධන අවශ්‍යතා සාමූහිකව හඳුනා ගැනීම වැදගත් වේ. එහිදී ශක්තීන් ඇගයීමටත් හඳුනාගත් සංවර්ධන අවශ්‍යතා සඳහා පිළියම් යෙදීමටත් අවකාශය ලැබේ. ජාතික, පළාත්, කලාප හා කොට්ඨාස මට්ටමින් සිදු කරන බාහිර ඇගයීම වල නිර්දේශ වලින් ද පාසල සංවර්ධනය කරා ගෙන යාමට මනා දායකත්වයක් සපයයි (අධ්‍යාපන අමාත්‍යාංශය, 2014, පි. 02).

ගුණාත්මක බව වඩා තහවුරු කර ගැනීම සඳහා විදුහල්පති සහ කාර්ය මණ්ඩලය කරුණු සාකච්ඡා කර සංවර්ධනය විය යුතු කරුණු තෝරා ගෙන ඉදිරි වර්ෂයේ සැලැස්මට ඇතුළත් කර අඛණ්ඩව සංවර්ධන කටයුත්තට දායකත්වය ලබා දිය යුතුය.

මෙවැනි කාර්යයකදී අරමුණ ඉටු කර ගැනීම සහ ඵලදායී වීම සඳහා අභ්‍යන්තර ඇගයීම විධිමත් වූ සැලැස්මකට අනුව ක්‍රියාත්මක කිරීම කළ යුතුය.

මෙම අභ්‍යන්තර ඇගයීම ඵලදායි කර ගැනීම සඳහා විධිමත් බාහිර ඇගයීම් ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත්ය. 31/2014 චක්‍රලේඛයට අනුව පාසල් මට්ටම, කොට්ඨාස හා කලාප මට්ටමට අදාළ කාර්ය භාරයන් හඳුන්වා දී ඇත. සංවිධානයක් අපේක්ෂිත අරමුණු කරා ගමන් කරන්නේද යන්න අඛණ්ඩව සොයා බලමින් නිසි තැන් ගැන්වීම සඳහා කටයුතු කිරීමේදී එක් එක් පාර්ශවයන්හි දී පවතින ගැටළු හඳුනාගෙන මැදිහත්වීම් සිදුකල යුතුව ඇත.

බාහිර අධීක්ෂකවරුන් පාසල් කළමනාකාරීත්වයට සුසාධ්‍යකාරකයෙකු ලෙස මැදිහත්වීම් සිදුකළ යුතුය. කළමනාකරණය දුර්වල වීමේදී ඒ සඳහා මග පෙන්වීම් කළ යුතු අතර සාර්ථක කළමනාකාරීත්වය තුළ පාසලේ විශිෂ්ට ව්‍යවහාර හඳුනාගත හැකි වේ. කළ යුතු කාර්යය සඳහන් අදාළ පොතපත පරිශීලනයෙන් එක්රැස් කරගත් දැනුමෙන් යුතුව, ප්‍රායෝගිකව කළ හැකි දේ හඳුනා ගැනීම සඳහා මාගේ අධ්‍යයන වාර්තාව වැදගත් වේ යැයි සිතමි.

## 3. මැදිහත් ක්‍රියාවලිය

### 3.1 මැදිහත්වීමේ ක්‍රියාවලිය සැලසුම් කිරීම

හඳුනාගත් ගැටලු සඳහා පිළියම් වශයෙන් පහත මැදිහත්වීම සිදු කළෙමි.

- පාසලෙහි අභ්‍යන්තර ඇගයීම් විධිමත් කිරීම සඳහා සියලු දෙනාගේ අදහස් අනුව ක්ෂේත්‍ර 8 භාර නායකත්වය දැනුවත් කර බල ගැන්වීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- ක්ෂේත්‍ර 8 න් ඉගෙනුම-ඉගැන්වීම හා ඇගයීම, විධිමත් විෂය මාලා කළමනාකරණය, භෞතික සම්පත් කළමනාකරණය, නායකත්වය හා කළමනාකරණය, ශිෂ්‍ය සුබසාධනය, විෂය සමගාමී කටයුතු, පාසල හා ප්‍රජාව හා ශිෂ්‍ය සාධනය ක්ෂේත්‍ර මූලික කොට ගෙන සියලු ක්ෂේත්‍රයන්හි හඳුනා ගත් ගැටලු නිරාකරණය සඳහා පිළියම් යෙදීමට ක්‍රියා කිරීම හා පසු විපරම් සිදු කිරීම.

- ඉහළ කළමනාකාරීත්වයන් වෙත පාසල හඳුන්වා දීම.
- පාසල් ක්‍රියාකාරීත්වයන් අගය කිරීම.
- බාහිර ඇගයීමක් මගින් ප්‍රගතිය පරීක්ෂා කිරීම.

## 3.2 මැදිහත්වීම

### 3.2.1 පළමු පියවර

පාසලෙහි ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා ආරම්භක අවධියේ සිට මේ දක්වා කලාප හා කොට්ඨාස මට්ටමෙන් විටින් විට සිදු කරන ලද දැනුවත් කිරීම් හා බාහිර හා කේවල ඇගයීම් සඳහා සහභාගී වන නිලධාරීන් විසින් කරන ලද දැනුවත් කිරීම් අනුව විවිධ වූ පරස්පරතා සමග ගැටෙමින් ක්ෂේත්‍ර 8 සඳහා ලිපිගොනු සකස් කර තිබූ අතර විදුහල්පති හා ගුරු මණ්ඩලය සමග කරන ලද සාකච්ඡා අනුව නිවැරදි වූ විධිමත් ක්‍රමවේදය පිළිබඳ දැනුවත් වීම අවශ්‍ය බවට පාසලෙන් අදහස් මතු විය. ඒ අනුව 2019.02.01 දින විදුහල්පති එකඟතාවයෙන් ක්ෂේත්‍ර 8 භාර නියමුවන් 8 දෙනා තත්ත්ව කවයක් ලෙස පාසලෙහි අධ්‍යාපන සංවර්ධන අංශය වෙත කැඳවා චක්‍රලේඛ, උපදෙස් සංග්‍රහය, ගොනු කළ යුතු ලේඛන, ගොනු නොකළ යුතු ලේඛණ හා පාසලෙහි දියත් කළ යුතු ආකාරය අදහස් විමසමින් පැය 4ක පමණ කාලයක් වැය කරමින් පැහැදිලි අවබෝධයක් ලබා දීමට කටයුතු කළෙමි. කණ්ඩායමක් ලෙස මෙම ක්‍රියාකාරකම්හි යෙදීම වඩා යහපත් ප්‍රතිඵල ළඟා කර ගැනීම සඳහා ඉවහල් වන බවට සාකච්ඡා කෙරුණි.

**තත්ත්ව කවයේදී අභ්‍යන්තර ඇගයීම සම්බන්ධව විදුහල්පති හා ගුරුභවතුන් ඉදිරිපත් කළ කරුණු**

- මෙතෙක් පැහැදිලි හා නිවැරදි දැනුවත් වීමක් සිදු නොවූ බව
- දර්ශක සඳහා ලකුණු උපයා ගැනීමේ ක්‍රමවේද පිළිබඳ අදහසක් නොතිබීම.
- කොළ පිරවීම් වලට කාලය වැය කළ නොහැකි බව.
- පොත්පත්වල සටහන් කර ඇති දේ, පන්ති කාමර වල ප්‍රදර්ශනය වන දේ සහ තිබෙන තැනට ගොස් නිරීක්ෂණය කොට තක්සේරු කළ හැකි දේ පවා ඡායාරූප ගෙන ලිපි ගොනුවලට ඇතුළත් කළ බව.
- ක්ෂේත්‍රවලට අදාළ නිවැරදි සාක්ෂි හා තොරතුරු මොනවාද යන්න පිළිබඳ වික්ෂිප්ත බව.
- ක්ෂේත්‍ර කිහිපයකම එකම තොරතුර ගොනු ගත කර තිබීම.
- සෑම ගොනුවකම ප්‍රධාන ගොනුවට අමතරව කුඩා ලිපිගොනු කිහිපයක් එකතු කොට තිබීම.
- කොට්ඨාස හා කලාප ලකුණු ලබාදීමේ පරස්පරතා
- අභ්‍යන්තර ඇගයීම් ලකුණ ඉහල අගයක් ගැනීම.

දැනට සිටින තැන සහ ළඟා විය යුතු තැනට ළඟා වීම සඳහා උපයා ගත යුතු ලකුණු ප්‍රමාණය පිළිබඳ තොරතුරු ලබා ගත් අතර ඒ ළඟා වීම කළ හැකි බැවින් සියලු දෙනා ඒ සඳහා ක්‍රියාකාරකම් දියත් කිරීමට සහ සහයෝගය දැක්වීමට එකඟ විය.

වගුව 4: ඇගයීම තුළ ක්ෂේත්‍රවලට **80%** සඳහා ළඟා වීමට සපුරා ගත යුතු ලකුණු

| ඇගයීම් ක්ෂේත්‍රය | අවසන් ඇගයීමේ දී හිමි කරගත් ලකුණු | 80% ළඟා වීමට ලබා ගත යුතු ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ශිෂ්‍ය සාධනය | 71 | 09 |
| ඉගෙනුම, ඉගැන්වීම හා ඇගයීම | 62 | 18 |
| විධිමත් විෂයමාලා කළමනාකරණය | 58 | 22 |
| විෂය සමගාමී කටයුතු | 80 | - |
| ශිෂ්‍ය සුබසාධනය | 73 | 07 |
| නායකත්වය හා කළමනාකරණය | 70 | 10 |
| භෞතික සම්පත් කළමනාකරණය | 68 | 12 |
| පාසල හා ප්‍රජාව | 77 | 03 |

සියලු දෙනාගේ අදහස වූයේ පාසල තුළ ක්‍රියාත්මක වන සියලු ක්‍රියාකාරකම් හා පාසල සකස් කිරීම් සම්බන්ධ තොරතුරු පහසුවෙන් හා සැහැල්ලුවෙන් වඩාත් ප්‍රියජනක ලෙස වාර්තාකරණය කළ හැකිව තිබියදී එම අවස්ථාවන් ඇතැම් ක්ෂේත්‍රයන්හි තමන් අතින් ගිලිහී ගොස් ඇති බවයි.

### 3.2.2 දෙවන පියවර

ක්ෂේත්‍ර 8 න් ඉගෙනුම-ඉගැන්වීම හා ඇගයීම, විධිමත් විෂයමාලා කළමනාකරණය, භෞතික සම්පත් කළමනාකරණය හා නායකත්වය හා කළමනාකරණය මූලික කොට ගෙන ක්ෂේත්‍රවල ලකුණු අවම මට්ටමක පැවති දර්ශක හඳුනාගෙන ඒවා සංවර්ධනය සඳහා කළ හැකි ක්‍රියාකාරකම් පිළිබඳව අධ්‍යාපන සංවර්ධන අංශයෙහි සම්බන්ධීකාරක හා නියෝජ්‍ය විදුහල්පති සමඟ කෙටි සාකච්ඡාවක් පවත්වා ඒ පිළිබඳ අදහස් දක්වන ලදි. එහිදී මතු වූ අදහස වූයේ පසු විපරම් ක්‍රියාවලියක් විධිමත්ව සිදු විය යුතු බවයි. පසු විපරම් ක්‍රියාවලිය අභ්‍යන්තර අධීක්ෂණවල දී නියාමනය විය යුතු බවටත්, පිරික්සුම් ලැයිස්තුවක් විදුහල විසින් සකසා ගන්නා බවටත් අදහස් මතු විය. මෙවැනි වූ යාවත්කාලීන සාකච්ඡා විදුහලට ඉතා වැදගත් බව නියෝජ්‍ය විදුහල්පතිගේ අදහස විය.

**සාකච්ඡා කරන ලද කරුණු**

- ඉගෙනුම් ක්‍රමවේද සංවර්ධනය
- අ.පො.ස (සා.පෙළ) හා අ.පො.ස (උ.පෙළ) සාධන මට්ටම් ඉහළ නැංවීම සඳහා අතිරේක පන්ති පැවැත්වීම
- විධිමත් පුහුණුවකින් තොරව පාසලට පැමිණෙන ගුරුභවතුන් සඳහා උපාධ්‍යායවරයකු යොමු කිරීම
- ගුරු අධීක්ෂණවල දී පාඩම් සටහන අනිවාර්ය කිරීම
- පසු විපරම නියෝජ්‍ය විදුහල්පති විසින් සිදු කිරීම
- කාර්ය මණ්ඩල වෘත්තීය සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීම.

- අභ්‍යන්තර අධීක්ෂණ දත්ත විශ්ලේෂණය කර හඳුනාගත් සංවර්ධන අවශ්‍යතා වාර්ෂික සැලැස්මට ඇතුළත් කිරීම.
- ශිෂ්‍ය උපදේශන හා මාර්ගෝපදේශ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ශිෂ්‍ය ගැටළු හඳුනා ගැනීමට පැහැදිලි ක්‍රමවේදයක් සැකසීම.
- ආපදා අවම කර ගත හැකි උපාය මාර්ග හඳුනා ගැනීම.
- විෂයමාලා කළමනාකරණය හා විෂය සමගාමී කටයුතු සඳහා අංශ ස්ථාපිත කිරීම.
- කේවල ශිෂ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- භෞතික පරිසරය, පන්තිකාමර ආකර්ෂණී වීම සහ ගුරු සිසු නිර්මාණවලින් සැදුම්ලත් ඉගෙනුම් පරිසරයක් සංවර්ධනය කර ගැනීම.
- විධිමත්ව ලිපි ගොනු නඩත්තුව.
- සහන කාලඡේද සඳහා යොමු කිරීම් වලදී ඇගයීම් කටයුතු සංවර්ධනය සඳහා ගුරු භවතුන් යෙදවීම.

පාසල වෙත නැවත වරක් පැමිණීමේදී නිරීක්ෂණය වූයේ සාකච්ඡා කර ගත් පරිදි පසු විපරම් ක්‍රියාවලියක් මගින් ඉහත කරුණු සංවර්ධනයට ඉතා සාර්ථක උත්සාහයක යෙදෙන බවයි. ගුරු භවතුන්ගේ ක්‍රියාශීලීත්වය ඉහල මට්ටමක පවතින බව අනාවරණය වූ අතර ගුරු භවතුන් තමන්ගේ පාඩම් අධීක්ෂණයට නියමිත දිනයෙහි පාඩම් සටහන් ලිවීමට එතරම් කැමැත්තක් නොදක්වන බවක් නිරීක්ෂණය විය.

### 3.2.3 තුන් වන පියවර

කොට්ඨාස මට්ටමෙන් ගුරු උපදේශකවරුන් විටින් විට පාසලට පැමිණියද පාසලෙහි විවිධ උත්සව හෝ විෂය සමගාමී වැඩසටහන්, අධ්‍යාපනික වැඩසටහන් සඳහා කලාප හෝ පළාත් නිලධාරීන්ගේ පැමිණීම අවම මට්ටමක පැවතුනි. KNOWLEDGE TOWER වැඩසටහනෙහි සංවර්ධනය කළ යුතු වූ එක් අවශ්‍යතාවක් වූයේ පාසල හොඳින් හඳුනාගෙන ගුරු අඩුපාඩු සම්පූර්ණ කිරීමයි.

ඒ අනුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මෙන්ම පළාත් සැලසුම් අධ්‍යක්ෂ, පාලන අධ්‍යක්ෂ, පළාත් අධ්‍යක්ෂ හා විෂය අධ්‍යයක්ෂවරුන් සහභාගී වන විවිධ රැස්වීම් වලදී මෙම විදුහලේ ප්‍රබලතා පිළිබඳ ඔවුන් හට ඉදිරිපත් කිරීම් සඳහා මා හට අවස්ථාව ලැබිණි. ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශය දක්වා පාසලේ නම ඉදිරිපත් කරන්නට මා පෙළඹින . මෙතෙක් නොලද භාග්‍යයක් පාසලට උදා විය. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ පාසලට පැමිණ නියෝජ්‍ය විදුහල්පති සමඟ අධ්‍යාපන සංවර්ධන අංශය වෙත ගොස් තොරතුරු එකින් එක නිරීක්ෂණය කරන්නට යෙදී ඇත. එහිදී ශිෂ්‍ය සාධන මට්ටම් විශ්ලේෂණය එතුමා ගැඹුරින් අධ්‍යයනය කර ඇත. "EXCELLENT" යන වචනය එතුමාගේ මුවින් පිට වූ බව නියෝජ්‍ය විදුහල්පතිතුමා මා සමඟ පැවසීය. මේ අතරම දෙවන පෙළ නායකත්වය ද අගයා තිබුණි. ඉහල නිලධාරීන් හඳුනාගැනීම මත පාසල විසින් සිදුකරනු ලබන ක්‍රියාදාමයන් වඩවඩාත් කාර්යක්ෂමව ඉටු කිරීමට කාර්ය මණ්ඩලය පෙළඹී තිබුණි. තවත් වරක කොළඹ විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරුන් සමඟ ඉගෙනුම ලබන සිසු පිරිසක් ද පාසලට පැමිණ පාසල් කටයුතු

අධ්‍යයනය කර තිබුණි. එමෙන්ම ප්‍රදේශයේ මෙන්ම ප්‍රදේශයෙන් පිටත විදුහල් කීපයක්ම පාසල නිරීක්ෂණයට විදුහල්පතිවරුන් හා ගුරුභවතුන් පැමිණ තිබිණ. බොහෝ දෙනෙකුගේ අවධානයට පත් නොවී තිබුණ පාසල ඒ අනුව සියලු දෙනා අගය කරන්නට පටන් ගැනීම පාසල ශක්තිමත් කිරීමට මහත් රුකුලක් විය . පාසලට විටින් විට පැමිණි නිලධාරීන් විසින් තබන ලද ලේඛනයේ ඔවුන් පාසල අගය කර ඇති ආකාරය අනුව මෙම කරුණු වල සත්‍ය අසත්‍යතාව මනාව අවබෝධ කර ගත හැකිය (ඇමුණුම 3).

### 3.2.4 සිව් වන පියවර

පාසල සමඟ කරන ලද සාකච්ඡාවල දී නිරන්තරව මා පාසලට පැමිණීම විදුහල්පති හා නියෝජ්‍ය විදුහල්පතිහට ද අධ්‍යාපන සංවර්ධන අංශය භාර ගුරුභවතුන් දෙදෙනා හට ද මනා ශක්තියක් වූ බව අනාවරණය විය. ඔවුන්ගේ අදහස් අනුව මා වටහා ගත්තේ නිරන්තර සොයා බැලීම සඳහා පාසලට පැමිණීම සිදු කළ යුතු බවත්, ඉන් අතුරුව ද පාසලට පැමිණෙන සියලු අවස්ථාවන් හි දී ඔවුන් අගය කිරීම පෙළඹවීම ඉහළ නිධාරීන්ට මෙම පාසලේ විශිෂ්ට ව්‍යවහාර සහ දක්ෂතා තව දුරටත් හඳුන්වා දීම කළ යුතු බැවින් එහි ප්‍රතිඵලයක් ලෙස සිදු වූ පුද්ගල අභිප්‍රේරණය මෙම පාසලේ අධ්‍යාපන ගුණාත්මක සංවර්ධනය ඉහල මට්ටමකට ගෙන ඒමට ඉවහල් වන බව මම තේරුම් ගතිමි. ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබන සාමාන්‍යය අධ්‍යාපන නවීකරණ වැඩසටහන (GEMP) සඳහා මෙම පාසල මා විසින් යෝජනා කරන ලදි. එසේ යෝජනා කිරීමට හේතු හා සුවිශේෂතා පිළිබඳ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන සංවර්ධන භාර අතිරේක සංවර්ධන අධ්‍යක්ෂ දැනුවත් කළෙමි.

2019-05-19 දින නැවත පාසල නිරීක්ෂණය සඳහා ගියෙමි. ඇගයීම හා යහපත් ව්‍යවහාර හඳුන්වා දීම තුළින් සාර්ථකත්වය කරා පෙළඹවිය හැකි බව පැහැදිලි විය. මෙදින මා සමඟ පාසලට ගිය කාර්යාලයේ නිලධාරීයෙකු පාසල් ප්‍රවේශයේදීම පැවසුවේ, "අපේ කලාපයේ මේ වගේ තැනක මේච්චර හොඳ ඉස්කෝලයක් තිබෙන බව දන්නේ අදයි. ලොකු වෙනසක්".

2019.10.24 දින අධ්‍යාපන අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් පැවති GEMP ප්‍රගති සමාලෝචන රැස්වීමේ දී කලාපය වෙනුවෙන් සිදු කරන ඉදිරිපත් කිරීමේ අවස්ථාව මා මෙම පාසලට ලබා දෙන ලදි. එය ඉතා හොඳින් කණ්ඩායම් දායකත්වය සහිතව සිදු කිරීමට ඔවුන්ට හැකි වූ අතර මෙහිදී අනෙක් පාසල්වල ද අවධානය දිනා ගැනීමට මෙම පාසලට හැකි විය.

### 3.2.5 පස් වන පියවර

ඉහත මැදිහත් වීම් වලින් පසුව බාහිර කණ්ඩායමක් මගින් පාසල අධීක්ෂණය කිරීමෙන් පසුව පාසල කොතෙක් දුරට අපේක්ෂිත තත්ත්වය කරා ළඟා වී ඇත්දැයි සොයා බැලීමට හැකි විය. එහි දී නවක විදුහල්පතිවරුන් ලෙස පුහුණුව ලබන තිදෙනෙක් විසින් 2019/10/18 සිදු කරන ලද ඇගයීම වාර්තාව, මේ සඳහා පාදක කර ගත්තෙමි. එහිදී ඔවුන් පාසලේ අධ්‍යාපන ගුණාත්මක දර්ශකය අපේක්ෂිත ලකුණු මට්ටමට ඉතා ආසන්න ලකුණක් ලෙස ලබා දී තිබුණු අතර එය 79% කි.

## 4. නිගමන හා යෝජනා

### 4.1 නිගමන

- පාසල ඉහල ප්‍රමිතියක් කරා ගෙන ඒමට ඇගයීම වැදගත්ම සාධකය බව තහවුරු කර ගතිමි.
- පසු විපරම් ක්‍රියාවලිය මගින් ගුරු භවතුන් සක්‍රීය කර ගත හැකි වේ.
- නිරන්තර මිත්‍රශීලී මග පෙන්වීම සාර්ථකත්වය කරා ලගා වීමේ මං සලකුණකි.
- පාසල විසින්ම පාසලට අදාළ සංවර්ධන ක්‍රියාකාරකම් සකසා ගැනීම තුළින්, සංවර්ධනය කරා යා හැකි වේ.
- පාසල සමග පවතින සමීප සම්බන්ධතා මගින් පාසල නිවැරදිව අනාවරණය කර ගත හැකි වීම හා ඒ අනුව පාසලට අවශ්‍ය පිළියම් සහෘදයෙකු ලෙස ඉටු කළ හැකි වීම.

### 4.2 යෝජනා

- පාසල් හුදකලා නොකර නිලධාරී නෙත් පාසල් වෙත නිරන්තර යොමු කළ යුතුය.
- ධනාත්මක පෙළඹවීම් පාසල් කාර්යය මණ්ඩල වෙත යොමු කළ යුතුය.
- බාහිර අධීක්ෂණ කණ්ඩායම් තක්සේරුකරණය පිළිබඳ නිවැරදි දැනුවත් වීමකින් පාසල වෙත සම්බන්ධ කිරීමට කටයුතු කළ යුතුය.

## 5. අවසන් සමාලෝචනය

- පාසල නිරීක්ෂණය සඳහා පැමිණෙන බාහිර කණ්ඩායම් පිළිබඳ පාසල විසින් නිරතුරුව මා දැනුවත් කරන අතර මා ගේ දැනුවත් භාවයකින් තොරව ඔවුන්ගේ පැමිණීම් ප්‍රතික්ෂේප කරන තරමට ම පාසල හා මා අතර සුහදතාව වර්ධනය වී ඇත.
- මා මැදිහත් වීමත් සමග පාසල නිර්මාණශීලිව නව අත්හදා බැලීම් සඳහා යොමු වෙමින් ඌව පළාත තුළ ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනයට අදාළ ඇගයීම් ක්ෂේත්‍රයන් ඉහල මට්ටමින් ක්‍රියාත්මක කෙරෙන ආදර්ශ පාසලක් ලෙස අද වන විටත් සාර්ථක ගමනක යෙදේ.
- මෙම පාසලට මා ලබා දෙන දායකත්වය හා මැදිහත්වීම මෙතෙකින් අවසන් කළ නොහැකි අතර පාසල විශිෂ්ටත්වය කරා ලගා වීමට උපරිම මැදිහත් වීම් ඉදිරියටත් අවශ්‍ය බව හැඟේ.

## 6. අවසන් ප්‍රත්‍යාවේක්ෂණය .

- පාසලේ ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනය ඉහළ මට්ටමකට ගෙන ඒමට ගත් උත්සහය සාර්ථක වීමේ සතුට තුළින් තවදුරටත් මෙවන් වූ පර්යේෂණයන් සඳහා මා යොමු වීම.
- කාර්ය මූලික පර්යේෂණ වාර්තාවක් නිවැරදිව සකස් කිරීමට ප්‍රායෝගිකව පුහුණු වීමට හැකි වීම.
- ගැටළු දෙස පර්යේෂණාත්මකව බැලීමට යොමු වීම.
- සමීපව සිදුකරන නිරන්තර ඇගයීම තුළින් පාසල් සාර්ථකත්වය කරා මෙහෙය විය හැකි වීම.
- පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය ඉහළ නැංවීම සඳහා පුද්ගල අභිප්‍රේරණය මූලික සාධකයක් බව අවබෝධ වීම.

## ආශ්‍රිත ග්‍රන්ථ

අධ්‍යාපන අමාත්‍යාංශය, (2006), පාසල් අධ්‍යාපන ක්‍රියාවලියේ ගුණාත්මක සංවර්ධනය - අධ්‍යාපන ප්‍රමිති සහ බාහිර ඇගයීම් පිළිබඳ මාර්ගෝපදේශය,බත්තරමුල්ල , කොළඹ, රජයේ මුද්‍රණාලය.

අධ්‍යාපන අමාත්‍යාංශය, (2010), පාසල් අධ්‍යාපන ක්‍රියාවලියේ ගුණාත්මක සංවර්ධනය 111 - ජාතික අධ්‍යාපන ප්‍රමිති මාර්ගෝපදේශය සහ ගුරු උපදේශක නිපුණතා, බත්තරමුල්ල, කොළඹ, රජයේ මුද්‍රණාලය.

අධ්‍යාපන අමාත්‍යාංශය, (2014), අපේ පාසල කෙතරම් ගුණාත්මකද? - පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව සඳහා වූ ඇගයීම් ක්‍රියාවලිය, බත්තරමුල්ල, කොළඹ, රජයේ මුද්‍රණාලය.

අධ්‍යාපන අමාත්‍යාංශය, (2014), ක්‍රියාමූලික පර්යේෂණ, බත්තරමුල්ල , කොළඹ, රජයේ මුද්‍රණාලය.

ජර්මන් තාක්ෂණ සහයෝගීතා ආයතනය. (2002), පාසල් පාදක කාර්ය මූලික පර්යේෂණ පුහුණු අත්පොත, ගුරු සේවාස්ථ පුහුණු ව්‍යාපෘතිය, මහනුවර.

## අනිකුත් මූලාශ්‍ර ලේඛන

- බණ්ඩාරවෙල අධ්‍යාපන කලාපයේ 2015, 2016, 2017, 2018 වාර්ෂික වාර්තා අනුව SEQI අගය සාරාංශය
- පාසල් බාහිර ඇගයීම් සාරාංශ වාර්තාව - 2017 (කොට්ඨාස ඇගයීම්)
- බාහිර පාර්ශවයන් පාසල නිරීක්ෂණය කළ අවස්ථාවලදී යෙදූ සටහන්
- ප්‍රත්‍යාවේක්ෂණ ජර්නලයේ කොටසක්
- පුහුණුව සඳහා පැමිණි නවක විදුහල්පතිවරුන් විසින් සිදුකළ ඇගයීමේ, ඇගයීම් සාරාංශ ලකුණු විස්තරය.

# ප්‍රායෝගික දැනුවත් කිරීමේ වැඩමුළු මගින් දෙවන වර්ගයේ පාසල් තුනක අභ්‍යන්තර ප්‍රමිති ඇගයීම ඉහළ මට්ටමකට ගෙන ඒම

එස්. ඒ. පුෂ්පමාලා සමන්කාන්ති ජයමහ (MPhill., MEd)
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන කාර්යාලය, නිකවැරටිය
0718255445/sapsjayamaha@gmail.com

ඩබ්ලිව්.චන්ද්‍රිකා කුලදේව (MEd, PGDE)
කථිකාචාර්ය (SLTES), ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය, කුරුණෑගල
0727886481 / chandrikatckuru@gmail.com

## සංක්ෂිප්තය

ශිෂ්‍ය ප්‍රජාව ඉහළ ගුණාත්මක බවින් යුක්ත පිරිසක් බවට පත් කිරීමට පාසල් පද්ධතියෙහි ගුණාත්මක බව තහවුරු කළ යුතුය. 2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන "අපේ පාසල කොතරම් ගුණාත්මකද?" ප්‍රමිති මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව ඇගයීම් කේෂ්ත්‍ර අටක් (08) නිර්ණායක හැටක් (60) හා දර්ශක දෙසිය දහයක් (210) හඳුන්වා දී ඵලදායී පාසලක් ගොඩනැංවීමට අභ්‍යන්තර ඇගයීම විධිමත් සැලැස්මකට අනුව ක්‍රියාත්මක කිරීම නිර්දේශ කර ඇත. බාහිර ප්‍රමිති නියාමනයේ දී අභ්‍යන්තර ඇගයීම් නියාමනය සිදු නොකළ පාසල් තුනක් හඳුනා ගැනුණි. එම පාසල් තුනෙහි අභ්‍යන්තර ඇගයීම් නියාමනය ඉහළ මට්ටමකට ගෙන ඒම අරමුණු විය. එම පාසල්වල ඇගයීම් ක්ෂේත්‍ර ප්‍රධාන ගොනුව හා ක්ෂේත්‍ර අටෙහි ගොනු නිරීක්ෂණය හා ලේඛන පරීක්ෂාවේ දී දර්ශක හා නිර්ණායක අනුව සංවර්ධනය විය යුතු පැතිකඩයන් විය. ඒ අනුව විදුහල්පතිවරුන්, නියෝජ්‍ය විදුහල්පතිවරුන් හා පාසල් තුනෙහි ඇගයීම් කමිටු කුඩා කණ්ඩායම් වශයෙන් දැනුවත් කිරීමත් දෙවනුව පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක දර්ශකය ලකුණු 80 ඉක්මවූ පාසල් තුනක විශිෂ්ට ව්‍යවහාරවල ප්‍රායෝගික අත්දැකීම් ලබා දෙන ලදී. මැදිහත්වීමෙන් පසු පාසල් තුනෙහි ඇගයීම් කෙෂ්ත්‍ර අටෙහි වගකීම් බෙදා දී නියාමනය කර පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය (SEQI) ගණනය කර වාර්තා කිරීම හා ප්‍රදර්ශනය කර තිබුණි. විශිෂ්ට ව්‍යවහාර ක්‍රියාත්මක කිරීම හා ඇගයීම් කෙෂ්ත්‍රයන් හි ධනාත්මක වෙනසක් දක්නට ලැබුණි. අභ්‍යන්තර ඇගයීම ක්‍රියාත්මක වීම පිළිබඳ පාසල් ප්‍රජාව දැනුවත් කිරීම හා නියාමනය අඛණ්ඩ ව සිදු විය යුතුය. පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය ඉහළ නැංවීම සඳහා ඇගයීම් නියාමනය බලගන්වමින් ගත් ව්‍යායාමයෙන් පාසල් විශිෂ්ටත්වය කරා ළඟා වූ අතර පර්යේෂකයින් ලෙස අප තුළ ද ගුණාත්මක වෙනසක් ඇති විය.

**මුඛ්‍ය පද : ඇගයීම් , නියාමනය , පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය.**

## 1. ගැටලුව හැඳින්වීම

ශිෂ්‍ය ප්‍රජාව ඉහළ ගුණාත්මක බවින් යුක්ත පිරිසක් බවට පත් කිරීම සඳහා පාසල් පද්ධතියෙහි ගුණාත්මක බව තහවුරු කළ යුතුය. ඒ සඳහා පාසලෙහි අභ්‍යන්තර ප්‍රජාව විසින් පුළුල් දර්ශනයක් තුළ ක්‍රියාකාරී ව ඒකරාශී ව කාර්යක්ෂම කළමනාකරණ ක්‍රියාවලියක් දියත් කළ යුතුය. ඒ සඳහා පාසලෙහි අභ්‍යන්තර ඇගයීම විධිමත් සැලැස්මකට අනුව ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ. එමගින් වෙනස්වන සමාජ අවශ්‍යතාවලට ගැළපෙන පරිදි පාසලේ කටයුතු දිශානුගත කිරීමට හැකි වීම, මානව හා භෞතික සම්පත්වල කාර්යක්ෂම භාවිතය, ගුරු සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීම සහ පාසල් ප්‍රජාව සම්බන්ධ කර ගැනීමට මග පෙන්වීම වැනි වාසි රැසක් අත් කර ගත හැකිය. එසේ ම ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියෙහි ඵලදායි බව සඳහා ද අභ්‍යන්තර ඇගයීම් ක්‍රියාවලිය වැදගත් වේ. ඒ අනුව කුරුණෑගල අධ්‍යාපන කලාපය තුළ බාහිර ඇගයීම් ක්‍රියාවලියේ දී අභ්‍යන්තර ඇගයීම් ක්‍රියාවලිය නිසි පරිදි සිදු නොවන 2 වර්ගයේ පාසල් තුනක් හඳුනා ගත හැකි විය. සාමාන්‍ය කාර්යාල කළමනාකරණයේ දී ලිපි ගොනු නිසි පරිදි තබා නොගැනීම, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ඇගයීම සඳහා නිසි සැලැස්මක් සකස් කර නොතිබීම. සංවර්ධන අවශ්‍යතා වාර්ෂික සැලැස්මට ඇතුළත් කර නොතිබීම, වාර විභාග ලකුණු සෑම විෂයක ම නිසි පරිදි විශ්ලේෂණය නොකිරීම, ගුරුවරුන්ගේ වාර සටහන්, දින සටහන් නිසි පරිදි නියාමනයක් කර නොතිබීම, විවිධ ව්‍යාපෘති සකස් කර ක්‍රියාත්මක නොකිරීම හා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල පවා විධිමත් ලිපි ලේඛන තබා නොගැනීම, ශිෂ්‍ය සුබසාධනය විධිමත් නොවීම, වැසිකිළි කැසිකිළි පද්ධතිය විධිමත් නොවීම, පාසල් පිරියත කෙරෙහි වැඩි අවධානයක් යොමු නොකිරීම යන කරුණු ප්‍රධාන වශයෙන් දක්නට තිබිණි. මෙම පාසල් තුනෙහි ඉහත කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු වී නොතිබීම ප්‍රධාන වශයෙන් ම පාසලේ අභ්‍යන්තර ඇගයීම් ක්‍රියාවලිය නිසි පරිදි සිදු නොවීම හේතු වී ඇති බව අනාවරණය විය. එම නිසා අභ්‍යන්තර ඇගයීම් ක්‍රියාවලිය බල ගැන්වීම තුළින් පාසලේ අභ්‍යන්තර ගුණාත්මක දර්ශකය (SEQI) ඉහළ නැංවීමේ අරමුණින් අප විසින් මෙම ක්‍රියාමූලික පර්යේෂණය සිදු කරනු ලැබුවෙමු.

## 2. ශාස්ත්‍රීය සන්දර්භය

අධ්‍යාපන පද්ධතියට යෙදවුම් වශයෙන් යොමු කරන භෞතික හා මානව සම්පත් නිසි ප්‍රමිතියකින් යුතුව කළමනාකරණය කරමින් ගුණාත්මක අධ්‍යාපනය තහවුරු කළ යුතුය. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන උපාධිය සඳහා "දුෂ්කර පාසල්වල විදුහල්පතිවරුන් මුහුණපාන කළමනාකරණ ගැටලු පිළිබඳ අධ්‍යයනය" යන මැයෙන් ඉදිරිපත් කර ඇති පර්යේෂණ වාර්තාවේ (දයානන්ද, 2005) පාසල පිරිහීමට හේතු වූ අඩු පාඩු රැසක් දක්වා ඇත. නියැදිය සමස්තයක් ලෙස ගත් විට අභ්‍යන්තර ඇගයීම කිසිසේත් ම සිදු වී නොතිබුණි. බාහිර ඇගයීම මගින් ලබා ගත් ලකුණු ප්‍රතිශතය 57% කි. එයින් ද නිගමනය වී ඇත්තේ අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලියක අවශ්‍යතාවයි.

2015 වර්ෂයේ සිට අපේ පාසල කොතරම් ගුණාත්මක ද? මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව පාසලක ශිෂ්‍ය සාධනය,ඉගෙනුම- ඉගැන්වීම හා ඇගයීම, විෂයමාලා කළමනාකරණය, විෂය සමගාමී කටයුතු,

ශිෂ්‍ය සුසාධනය, නායකත්වය හා කළමනාකරණය භෞතික සම්පත් කළමනාකරණය පාසල හා ප්‍රජාව යන ප්‍රධාන ක්ෂේත්‍ර 8 ක් නිර්ණායක 60 ක් හා දර්ශක 210 ක් හඳුනාගෙන ඇත. තත්ත්ව සහතිකකරණය සංකල්පය ඔස්සේ පාසල්වල ගුණාත්මක බව තහවුරු කිරීමට හා පාසල්වල අභ්‍යන්තර හා ස්වයං ඇගයීම ශක්තිමත් කිරීමටත් බාහිර පාර්ශව විසින් ඇගයීමට ලක් කිරීමක් සිදු කරයි.

පාසල තුළ ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනයක් උදෙසා සංකීර්ණතාවලින් තොර නියාමන ක්‍රමවල භාවිතය වැදගත් වන බව යුනිසෙෆ් වාර්තාව (2007) මගින් පෙන්වා දී ඇත. පාසල් නගාසිටුවීමේ වැඩසටහන යටතේ නියාමනය හා ඇගයීම අත්‍යවශ්‍ය වේ. ප්‍රමාණාත්මක නියාමනය හා ඇගයීම මගින් පාසලක කටයුතු ඵලදායී ව සැලසුම් කිරීම හා කළමනාකරණය කිරීම වැදගත් වේ. (අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් නගාසිටුවීමේ වැඩසටහන මාර්ගෝපදේශ සංග්‍රහය-2014) පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨය සිදු කර ඇති "ශ්‍රී ලංකාවේ පාසල්වල ගුණාත්මක තහවුරුව පිළිබඳ විදුහල්පති ව්‍යවහාර" යන මැයෙන් ඉදිරිපත් කර තිබෙන පර්යේෂණ වාර්තාවේ විදුහල්පතිවරුන් පාසල තුළ ක්‍රියාත්මක කරනු ලබන ඇගයීම් ක්‍රියාවලියේ දී එහි ප්‍රතිඵල පිළිබඳ නිසි අවබෝධයක් සහිතව එය සිදු නොකරන ලද බව අනාවරණය කරගෙන ඇත (සෙනෙවිරත්න හා යටිගම්මන, 2018)

## 3. අරමුණු

1 .පාසල තුළ අභ්‍යන්තර ඇගයීම් සිදු වීම පිළිබඳ ව වර්තමාන තත්ත්වය විමසා බැලීම

2. අභ්‍යන්තර ඇගයීම් ක්‍රියාවලිය සම්බන්ධව ප්‍රායෝගික දැනුවත් කිරීමේ වැඩමුළු දියත් කිරීම

3. ප්‍රායෝගික වැඩමුළු දියත් කිරීමෙන් පසු අභ්‍යන්තර ඇගයීම් ක්‍රියාවලියේ සාර්ථක අසාර්ථක භාවය සොයා බැලීම

## 4. පර්යේෂණ අදියර හා ක්‍රියාවලිය

කුරුණෑගල අධ්‍යාපන කලාපයේ පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව සඳහා වූ ඇගයීම් ක්‍රියාවලිය සඳහා සැලසුම්සහගත කාල රාමුවක් සහිත අත් පොතක් ලබා දීම සිදු කෙරුණි. තෝරා ගත් පාසල් තුනෙහි අභ්‍යන්තර ඇගයීම් විධිමත් ව සිදු කර නොමැති බව අනාවරණය විය

මෙහි දී තෝරා ගත් පාසල් 3 හි ම විධිමත් අභ්‍යන්තර ඇගයීම් සැලැස්මක් සකස් කර නොතිබුණි. අධ්‍යයනයේ පහසුව සඳහා අප විසින් එම පාසල් තුන A B C යනුවෙන් නම් කළ අතර 2017 වර්ෂයෙහි කලාප අධ්‍යාපන කාර්යාලයෙන් සිදු කළ නියාමනයේ දී A B C යන පාසල් එක් එක් ඇගයීම සඳහා ලබා ගත් ලකුණු පහත සඳහන් වේ.

වගුව 1: A, B හා C පාසල්වල 2017 වර්ෂයේ දී බාහිර ඇගයිමේ දී ලබා ගත් ලකුණු සංඛ්‍යා

| අනු අංකය | ක්ෂේත්‍ර | A පාසල | B පාසල | C පාසල |
|---|---|---|---|---|
| 1 | ශිෂ්‍ය සාධනය | 75% | 68% | 74% |
| 2 | ඉගෙනුම ඉගැන්වීම හා ඇගයීම | 72% | 68% | 76% |
| 3 | විධිමත් විෂයමාලා කළමනාකරණය | 78% | 68% | 70% |
| 4 | විෂය සමගාමී කටයුතු | 68% | 70% | 68% |
| 5 | ශිෂ්‍ය සුබසාධනය | 71% | 70% | 68% |
| 6 | නායකත්වය හා කළමනාකරණය | 70% | 70% | 71% |
| 7 | භෞතික සම්පත් කමනාකරණය | 68% | 72% | 68% |
| 8 | පාසල හා ප්‍රජා සම්බන්ධතා | 70% | 70% | 70% |

A පාසලේ අභ්‍යන්තර ඇගයීම් ක්‍රියාවලිය නිසි පරිදි සිදු නොවීය. A පාසලේ විදුහල්පතිවරයා පැවසුවේ "මම හිතුවෙ ගුරුවරුන්ගේ පාඩම් බලන එක කියල" යනුවෙනි. එම විදුහල්පතිතුමාට අභ්‍යන්තර ඇගයීම පිළිබඳ නිසි අවබෝධයක් නොතිබෙන බව අනාවරණය විය. මෙම පාසල් 3 හි ම බාහිර හෝ අභ්‍යන්තර පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය ප්‍රදර්ශනය කර නොතිබුණි. එක් පාසලක ඇගයීම් ක්ෂේත්‍රවල වගකීම ද නිසි ලෙස ගුරුවරුන්ට පවරා නොතිබුණි. "ඔය ගුරුවරයා මාරු වෙලා ගියානෙ. ඊට පස්සෙ ටික කාලයක් ගියා කෙනෙක් පත් කරන්න" B විදුහල්පතිවරයාගේ පිළිතුර විය. අභ්‍යන්තර ඇගයීම් දත්ත විශ්ලේෂණය කර සංවර්ධන අවශ්‍යතා වාර්ෂික සැලැස්මට ඇතුළත් කළ යුතු නමුත් ඒවා පිළිවෙළකට සැලසුම් කර නොතිබුණි. ඇගයීම් ක්ෂේත්‍ර නියාමනයේ දි ලිපි ගොනු සෙවීමට දැඩි වෙහෙසක් දැරීමට සිදු විය. මෙලෙස ගැටලුවේ ස්වභාවය පැහැදිළිව අධ්‍යයනය කිරීමට හැකි විය.

## 5. පළමු මැදිහත් වීම

කුඩා කණ්ඩායම් වශයෙන් විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පතිවරු සමග ඇගයීම් ක්ෂේත්‍ර පිළිබඳව සාකච්ඡා කළ අතර .එම සාකච්ඡාවේ දී ඇගයීම් නියාමනයෙන් ලකුණු අඩු ඇගයීම් කේෂ්ත්‍ර පිළිබඳ වැඩි අවධානයක් යොමු කළෙමු. එහි දී විෂය සමගාමී කටයුතු, භෞතික සම්පත් කළමනාකරණය, නායකත්වය හා කළමනාකරණය, ශිෂ්‍ය සාධනය, ඉගෙනුම ඉගැන්වීම හා ඇගයීම, විධිමත් විෂයමාලා කළමනාකරණය හා ශිෂ්‍ය සුබසාධනය කෙරෙහි වැඩි අවධානයකින් දැනුවත් කිරීම් සිදු විය. "මේ විදියට කියා දෙද්දි තමයි වාර්තා ටික හදන හැටි තේරුණේ. අපේ පාසලේ වාර්ෂික සැලැස්ම හදද්දි හැමෝගෙම යෝජනා ගත්තා නම් හොඳයි" යනුවෙන් විදුහල්පතිවරුන් පැවසීය. තවදුරටත් සංවර්ධනය විය යුතු ක්ෂේත්‍ර පෙන්වා දෙමින් දැනුවත් කළ අතර ප්‍රායෝගික අත්දැකීම් ලබා දීමට තීරණය කළේ ඉන් පසුව යි.

## 6. දෙවන මැදිහත් වීම

පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය 80 ඉක්ම වූ පාසල් 3 ක විශිෂ්ට ව්‍යවහාරයන්හි අත්දැකීම් ලබා දීමට විදුහල්පතිවරු කැඳවා ගත් අතර .පෙ.ව 7.00 ට පෙර දැනුම් දුන් පාසල් වෙත ඔවුන් පැමිණ සිටියහ. පන්තිකාමර වෙත යමින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය නියාමනය කළහ. "පන්ති කාමර හරිම පිළිවෙලයි. ලස්සනයි. මේ විධියට ඉගෙනුම් උපකරණ අපිත් හදා ගන්න ඕනෑ. අපේ පාසල්වලත් ඉඩ කඩ තියනව .පිළිවෙල මදි." C විදුහල්පති තුමාගේ ප්‍රකාශය විය. "අපේ ගුරුවරු දැනුවත් කළොත් අපි කරන වැඩ මීට වඩා පිළිවෙලට කරන්න පුළුවන්" B විදුහල්පති තුමාගේ ප්‍රකාශය විය. ඔවුන් ප්‍රකාශ කළේ ඒ පාසල්වලට දෙමාපියන් උදවු කරන බවත් ඒ පාසල්වල සිසුන් වඩා සුහග බවත් ගුරුවරුන් ද නගරයේ බැවින් වඩා උනන්දුවෙන් විෂය හා විෂය බාහිර ක්‍රියාවල නිරතවන බවත් ය. ඔවුන්ගේ පාසල් සඳහා අඩු පහසුකම් පවතින බව ප්‍රකාශ කළහ. එහෙත් අප ඔවුනට ධනාත්මක සිතුවිලි ඇති කරමින් කතා කළ අතර .ඒ අනුව ඔවුන් පැවසුවේ විෂය සමගාමී වැඩසටහන් ආරම්භ කළ යුතු බවත් අභ්‍යන්තර පාසල් පද්ධතිය විධිමත් හා පිළිවෙළට තබා ගැනීමට යොමු විය යුතු බවයි. මෙම දැනුවත් කිරීම් අතරතුර වාර තුනක දී නියාමනය කළ අතර එහි දී විදුහල්පතිවරුන්ට ඇති වූ ඇතැම් ගැටලු සඳහා විසඳුම් ලබා දෙමින් ඔවුන් දිරිමත් කිරීම අප විසින් සිදු කරනු ලැබුවෙමු.

## 7. මැදිහත් වීමේ ප්‍රතිඵල පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණය

තම පාසලෙහි ඇගයීම් ක්ෂේත්‍ර අටෙහි ( 08 ) හි වගකීම් බෙදා දීම, නියාමනය කර අභ්‍යන්තර ඇගයීම් ලකුණු ගණනය කර අප වෙත වාර්තා කළ අතර එම අගයන් පාසලේ ප්‍රදර්ශනය කර තිබුණි. පාසලේ ගුරුභවතුන් කැඳවා සියලුදෙනා දැනුවත් කර ලොග් සටහන් තබා තිබුණි. ඔවුන්ගේ මෙම ස්වයං පෙළඹුම අප ලැබූ ජයග්‍රහණයකි. අනෙකුත් පාසල්වල විශිෂ්ට ව්‍යවහාරයන් කිහිපයක් තම පාසලට බද්ධ කර ගැනීමට යොමු වීම කැපී පෙනුණි.

වගුව 2 : මැදිහත් වීමෙන් පසු පාසල් ලබා ගෙන ඇති ප්‍රගතිය පිළිබඳ සැසඳීම

| අනු අංකය | ක්ෂේත්‍ර | පාසල | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | A | | | B | | | C | | |
| | | 2017 වර්ෂය | 2018 වර්ෂය | මැදිහත් වීමෙන් පසු ප්‍රගතිය | 2017 වර්ෂය | 2018 වර්ෂය | මැදිහත්වීමෙන් පසු ප්‍රගතිය | 2017 වර්ෂය | 2018 වර්ෂය | මැදිහත් වීමෙන් පසු ප්‍රගතිය |
| 1 | ශිෂ්‍ය සාධනය | 75% | 78% | 3% | 68% | 72% | 4% | 74% | 78% | 4% |
| 2 | ඉගෙනුම ඉගැන්වීම හා ඇගයීම | 72% | 75% | 3% | 68% | 74% | 6% | 76% | 80% | 4% |
| 3 | වීධිමත් විෂයමාලා කළමනාකරණය | 78% | 82% | 4% | 68% | 75% | 7% | 70% | 81% | 11% |
| 4 | විෂය සමගාමී කටයුතු | 68% | 81% | 13% | 70% | 78% | 8% | 68% | 80% | 12% |
| 5 | ශිෂ්‍ය සුබසාධනය | 71% | 74% | 3% | 70% | 76% | 6% | 68% | 76% | 8% |
| 6 | නායකත්වය හා කළමනාකරණය | 70% | 79% | 9% | 70% | 80% | 10% | 71% | 78% | 7% |
| 7 | භෞතික සම්පත් කමනාකරණය | 68% | 80% | 12% | 72% | 78% | 6% | 68% | 78% | 10% |
| 8 | පාසල හා ප්‍රජා සම්බන්ධතා | 70% | 81% | 11% | 70% | 75% | 5% | 70% | 78% | 8% |

A පාසල පන්ති කාමර හොඳින් සකස් කර තිබුණි. දරුවන්ගේ දෙමාපියන් සම්බන්ධ කර ගනිමින් කැඩී බිඳී ගිය බිම හා ඩෙස් පුටු පිළිසකර කර තිබුණි. සෙල්ලම් මිදුල පිළිසකර කර තිබූ අතර ඒ වටා ආරක්ෂිත දැල් ආවරණයක් සකසා තිබුණි. පාසලේ වැට පිළිසකර කර තිබූ අතර පෙර දී ඕනෑම ස්ථානයකින් පාසලට ඇතුළත් විය හැකිව තිබූ ස්ථාන වසා දමා තිබුණි. පිවිසුම හා පිටවීම පමණක් විධිමත් ව සකසා අනෙක් සියල්ල ආවරණය කර තිබුණි. A පාසලේ විදුහල්පතිතුමා තරමක අත්දැකීම් සහිත වැඩබලන විදුහල්පති වරයෙකු නමුත් ඇගයීම් පිළිබඳ ඔහුට එතරම් අවබෝධයක් නොතිබුණි.

එහෙත් ඔහු කියා සිටියේ අපගේ සොයා බැලීම තුළ තමා ඒ සියල්ල විධිමත් කර ගන්නා බවයි. A පාසලේ 2017 වර්ෂයේ සිදු කළ කලාප ඇගයීම් ක්ෂේත්‍ර නියාමනයේ දී භෞතික සම්පත් කළමනාකරණය සඳහා ලබා ගත් ලකුණ වූයේ 68% කි. එහෙත් අපගේ මැදිහත් වීම තුළ එම ඇගයීම් ක්ෂේත්‍රය ඉහළ අගයකට රැගෙන ඒමට හැකි විය. සැබැවින් ම විදුහල්පතිතුමා පමණක් නොව විශේෂයෙන් අවම සාධනයක් පෙන් වූ ප්‍රමිති ක්ෂේත්‍ර භාරව සිටි ගුරුභවතුන්ට ද අදාළ ඇගයීම පිළිබඳ ව දැනුවත් භාවය ලබා දීම වැදගත් ව බව විදුහල්පති තුමා පැවසීය. දර්ශක කිහිපයක් එක් ගුරුභවතෙකුට ලබා දී ඒ ඒ ගුරුභවතා මගින් එම කටයුතු නියාමනය කරමින් 2018 වර්ෂයේ මැද භාගය වන විට භෞතික සම්පත් කළමනාකරණයෙහි විශාල වෙනසක් කිරීමට විදුහල්පතිවරයාට හැකි වීම පිළිබඳ ඔහුගේ ප්‍රතිචාර ප්‍රසංශනාත්මක විය. ඒ අනුව A පාසල භෞතික සම්පත් කළමනාකරණය ඇගයීම තුළ 12% ක ප්‍රතිශතාත්මක වර්ධනයක් පෙන්වීමට සමත් විය.

A පාසලෙහි නිර්ණායක පුවරු කිහිපයක් සකසා තිබුණි. පෝතක බාලදක්ෂ ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. පාසල විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ලබාගෙන තිබූ විශේෂ ජයග්‍රහණ පොතක වාර්තා කර තිබුණි. පාසලේ විෂය බාහිර ක්‍රියාකාරකම් රැසක් ක්‍රියාත්මක වුව ද ඒවා පිළිබඳ වාර්තා පිළිවෙළට සකසා නොතිබුණි. සම්පත් පුද්ගල නාම ලේඛන, ඒ ඒ ක්‍රීඩාව සඳහා ඉදිරිපත් වන සිසුන්ගේ ලේඛන, අදාළ ක්‍රීඩාව භාරව සිටින පාසලේ ගුරුභවතා කවුරුන් ද යන්න පවා කලාප නියාමනයේ දී නොදැන සිටි බවට සටහන් වී තිබුණි. ඒ සියල්ල ප්‍රායෝගික අත්දැකීම් මගින් ලබා දීමට අපගේ පර්යේෂණ මැදිහත්වීම මගින් හැකියාව ලැබුණි. ඒ නිසා ම විදුහල්පති තුමා එම වැඩපිළිවෙළ හොඳින් සකසා තිබෙනු අප වරින් වර සිදු කළ ක්ෂේත්‍ර චාරිකාවල දී නිරීක්ෂණය විය. ඒ අනුව 2017 වර්ෂයේ කලාප නියාමනයේ දී 68% ක් වූ අධ්‍යාපන ගුණාත්මක දර්ශකය 2018 වර්ෂයේ දී 81% දක්වා වර්ධනය කිරීමට හැකියාව ලැබුණි. එය 13% වර්ධනයකි.

B පාසලේ ප්‍රධාන වශයෙන් ශිෂ්‍ය සාධනය, ඉගෙනුම් ඉගැන්වීම හා ඇගයීම, විධිමත් විෂයමාලා කළමනාකරණය යන ඇගයීම් කෙෂ්ත්‍ර තුනෙහි අඩු සාධනයක් පෙන්වීය. නමුත් අපගේ මැදිහත් වීමෙන් පසු B පාසලේ ගුරුවරුන්ගේ වාර සටහන්, සූදානම් සටහන් ගොනු විධිමත් විය. ඉගැන්වීම් උපකරණ සැකසීමට දෙමාපියන් සම්බන්ධ කර ගැනීමට විදුහල්පති විශේෂ වැඩසටහන් සැලසුම් කර තිබුණි. පාසලේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය නියාමනය කර තිබුණි. පන්ති වාර්තා පොත් මැනවින් පවත්වා ගැනීමට මෙන් ම ව්‍යාපෘති කිහිපයක් සෑම පාසලේ ක්‍රියාත්මක විය. ප්‍රාථමික පන්තිවල ඉගෙනුම් පරිසරය ප්‍රියජනක ලෙස සකසා තිබුණි. විශේෂයෙන් නිරීක්ෂණය වූයේ B පාසලේ සහන කාලච්ඡේද සඳහා පැවරුම් ගෙනුවක් සෑම ගුරුවරයෙකු සඳහා ම සකසා තිබූ අතර පෙ.ව 7.45 ට පෙර එම සහන කාලච්ඡේදය අදාළ ගුරුභවතාට දැනුවත් කර අත්සනක් තබා ගැනීම ත් ගුරුවරයාට ද අදාළ තුණ්ඩුවක් ලබා දීම සිදු වී තිබුණි. එය නියාමනය කළ බව නිරීක්ෂණය වූ අතර පැවරුම සිදු කළ ගුරුභවතා එය සිදු කළ බවට අදාළ පැවරුමෙහි දිනය හා අත්සන යොදා තිබුණි. අත්සන් පොත් සතියකට වරක් නියෝජ්‍ය විදුහල්පති (සංවර්ධන) විසින් අධීක්ෂණය කර සටහන් යොදා තිබෙනු නිරීක්ෂණය විය.

විෂය සමගාමී කටයුතු සඳහා ද මෙම පාසල යොමු වී තිබුණි. ඒ පාසලෙහි නිර්ණායක පුවරු කිහිපයක් සකසා තිබුණි. පෝතක බාලදක්ෂ ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. පාසල ලබා ගෙන තිබූ විශේෂ ජයග්‍රහණ පොතක වාර්තා කර තිබුණි.

C පාසල 2017 වර්ෂයේ කලාප ඇගයීම් ක්ෂේත්‍ර නියාමනයේ දී හා අපගේ නිරීක්ෂණ මගින් හඳුනාගත් තොරතුරු අනුව විෂය සමගාමී ක්‍රියාකාරකම්, ශිෂ්‍ය සුබසාධනය හා භෞතික සම්පත් කළමනාකරණය යන ක්ෂේත්‍ර කෙරෙහි අඩු සාධනයක් පෙන්වීය. ඒ අනුව අපගේ පර්යේෂණ මැදිහත්වීමෙන් පසු විදුහල්පතිවරයා විසින් එම ක්ෂේත්‍රයන්හි ගුණාත්මක සංවර්ධනය සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකසා තිබුණි. ඒ අනුව වැසිකිළි කැසිකිළි පද්ධතිය ක්‍රමවත් කර තිබුණි. ලිපි ගොනු පිළිවෙළකට නොතිබීම මෙම පාසලේ තිබූ ප්‍රධාන අඩු පාඩුවකි. ප්‍රායෝගික අත්දැකීම් මගින් ලිපි ගොනු සකසා ගැනීම පිළිබඳව දැනුවත් වීම මගින් ලිපි ගොනු පිළිවෙළට සකසා ගැනීමට යොමු වී තිබුණි. ක්ෂේත්‍ර අට (08) සඳහා ම ලිපි ගොනු සැකසීම පිළිවෙළට සිදු විය.

සුබසාධන සේවා අතර පාසලේ පෝෂණ වැඩසටහන ක්‍රියාත්මක විය. කොළ කැඳ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණි. ශිෂ්‍ය පැමිණීම වර්ධනයටත් , ශිෂ්‍ය ප්‍රමාද වී පැමිණීම වළක්වා ගැනීමටත් ව්‍යාපෘති සැලසුම් කර තිබුණි. පාසලේ ගුරු කැපකරු ක්‍රමය ක්‍රියාත්මක වූ අතර එක් ගුරුවරයෙකු සඳහා සිසුන් තිදෙනෙකු පවරා තිබුණි. එය විශේෂයෙන් ක්‍රියාත්මක වූයේ අ.පො.ස (සා.පෙළ) පන්ති සඳහා ය. එහි දී සිසුන්ගේ ගැටලු හඳුනා ගැනීමට ත් ඒවා සඳහා උපදේශන සේවාවන් සැපයීමටත් අපගේ සහාය ද ලබා දුණි. පර්යේෂණයේ ම අතුරු ඵලයක් ලෙස සිසුන්ට අවශ්‍ය උපදේශන සේවා සැපයීම වෙනුවෙන් සංවර්ධන අධ්‍යක්ෂතුමිය විසින් ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය තුළ උපදේශන සේවාවක් ආරම්භ කිරීමට ද කටයුතු කරන ලදී. කලාපයේ උපදේශන විෂය භාර ගුරු උපදේශකවරිය සෑම සිකුරාදා දිනක ම කලාපයේ සෑම සිසුවකුට ම එම සේවාව සපයයි.

විදුහල්පතිවරුන් කාර්යාල ලිපි ගොනු විධිමත් කිරීම ආරම්භ කර තිබුණි. පාසල් පිරියත සැකසීමට විධිමත් ව්‍යාපෘති සැලසුම් කර තිබුණි. පාසල් පුස්තකාල විධිමත් කර තිබුණි . පාඨක තොරතුරු විධිමත් ලෙස පවත්වාගෙන යාම හා විවිධ තරග සංවිධානයට නැඹුරු වී තිබුණි. පාසල් තුනෙහි ම ගුරුවරුන්ගේ හා විදුහල්පතිවරුන්ගේ කාර්යයන් අවබෝධ කරගෙන තිබුණි. අභ්‍යන්තර ඇගයීමේ දී විදුහල්පතිවරුන් විධිමත් පරිදි නියාමනය කර ඇති අතර ගුරුවරුන් ද ඊට අනුගතව තිබෙනු නිරීක්ෂණය විය.

කුරුණෑගල අධ්‍යාපන කලාපයේ 2 වර්ගයේ පාසල් 3 ක අධ්‍යාපන ගුණාත්මක දර්ශකය (SEQI) ඉහළ නැංවීම සඳහා අප ගත් ව්‍යායාමය තුළින් එම පාසල් ලබා ගත් ජයග්‍රහණ 2017 වර්ෂයට සාපේක්ෂ ව 2018 වර්ෂයේ කලාප ඇගයීම නියාමනයේ දී සංඛ්‍යාත්මකව පැහැදිළි ලෙසම දැක ගත හැකි විය. .එය අපි ලද භාග්‍යයක් යැයි සිතමු.

## 8. නිගමන

- පාසල් මට්ටමේ දී අඩු ලකුණු ලබාගත් ඇගයීම් ක්ෂේත්‍ර සම්බන්ධව විදුහල්පති හා ගුරුවරුන් මුහුණ දෙන සීමා හඳුනා ගැනීම අවශ්‍ය වේ.
- පාසල තුළ ඇගයීම් ක්ෂේත්‍ර ක්‍රියාත්මක වීමේ දී පවතින ගැටලු හඳුනා ගැනීම

## 9. යෝජනා

### 9.1 අභ්‍යන්තර නියාමනයේ දී ඇති විය යුතු වෙනස්කම් :-

- පාසලේ සමස්ත ගුණාත්මකභාවය තීරණය වනුයේ ඇගයීම් ක්‍රියාවලිය හොඳින් ක්‍රියාත්මක වීම මගින් වන බැවින් ගුරුවරුන් දැනුවත් කළ යුතුය.
- සෑම ගුරුවරයෙකු ම පාසලේ බාහිර වැඩ සඳහා සහයෝගය ලබා දිය යුතු බවට විදුහල්පති මගින් ගුරුවරුන් දැනුවත් කළ යුතුය.
- බාහිර ක්‍රියාකාරකම් පිළිබඳ ගුරුභවතුන් සඳහා පුහුණුවක් ලබා දිය යුතුය.

**9.2 බාහිර නියාමනයේ දී ඇති විය යුතු වෙනස්කම් :-**

- ඇගයීම් පිළිබඳව ප්‍රාමාණික දැනුමක් සහිත පුද්ගලයන් මගින් විදුහල්පතිවරුන් හා ගුරුවරුන් නිරන්තරයෙන් බල ගැන්විය යුතුය.
- පාසලේ ඒ ඒ ඇගයීම් පිළිබඳ ප්‍රාමාණිකයින් විසින් අභ්‍යන්තර ඇගයීම සඳහා කණ්ඩායම් පුහුණු කළ යුතුය.
- බාහිර නියාමනයේ දී බාහිර ඇගයීම් මණ්ඩල මගින් පාසල් සඳහා නිසි මාර්ගෝපදේශනය ලබා දිය යුතුය.
- බාහිර ඇගයීම්කරුවන් විසින් ඵලදායී පාසල් හඳුනා ගනිමින් එම පාසල් ආදර්ශනය සඳහා යොමු කළ යුතුය.

## ආශ්‍රිත ග්‍රන්ථ

අධ්‍යාපන අමාත්‍යංශය, (2014). අපේ පාසල කොතරම් ගුණාත්මකද?, බත්තරමුල්ල, කොළඹ, රජයේ මුද්‍රණාලය

අධ්‍යාපන අමාත්‍යංශය, (2010). පාසල් අධ්‍යාපන ක්‍රියාවලියේ ගුණාත්මක සංවර්ධනය 111. බත්තරමුල්ල, කොළඹ, රජයේ මුද්‍රණාලය

අධ්‍යාපන අමාත්‍යංශය, (2014) පාසල් නගාසිටුවීමේ වැඩසටහන මාර්ගෝපදේශ සංග්‍රහය බත්තරමුල්ල, කොළඹ

ජාතික අධ්‍යාපන ආයතනය, (2004) ඵලදායි පාසල අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානයඃ මීපේ, කොළඹ

ජාතික අධ්‍යාපන ආයතනය, (1992) හොඳ පාසලක්, අධ්‍යාපන පර්යේෂණ දෙපාර්තමේන්තුව මහරගම, කොළඹ

පෙරේරා ආර්.සී , (2013). අධ්‍යාපන සැලසුම්කරණය. ඇස් ගොඩගේ සහ සහෝදරයෝඃ කොළඹ

Senevirathne S.M.L.K and Yatigammana T.M.S.S.K (2019) Principal practices towards the Quality Assuarance process in Sri Lanka, Annual Research Congress, PGIHS, University of Peradeniya: Sri Lanka

# හඟුරන්කෙත අධ්‍යාපන කලාපයේ තෝරාගත් පාසල් දහයක පහසු වාර්තාකරණය සඳහා පහසු ක්‍රමවේද භාවිතයෙන් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය ඉහළ නැංවීම පිළිබඳ අධ්‍යයනය

ටී.බී.එම්.එස්.ඩී.තෝරදෙණිය (MEd., PGDE, BSc.)
අධ්‍යාපන අධ්‍යක්ෂ , කලාප අධ්‍යාපන කාර්යාලය, හඟුරන්කෙත
0716609222 / sepalidthora@gmail.com

**සංක්ෂිප්තය**

ශ්‍රී ලංකාවේ පාසල්වල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් දැනට පිළිගත හැකි දර්ශකයක් ලෙස පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය (SEQI) සැලකේ. 2017 පාසල් බාහිර ඇගයීම් වාර්තාවලට අනුව හඟුරන්කෙත කලාපයේ SEQI අගය 50% අඩු පාසල් දහහතරක් පැවතීම ගැටලුවක් විය. එම පාසල්වල නියාමන වාර්තා නිරීක්ෂණයේදී පෙනී ගියේ ලකුණු අඩුවීමට ප්‍රධාන හේතුව ලිපිගොනු හා වාර්තා පවත්වා ගැනීමේ අඩුපාඩුකම් බවයි. එබැවින් මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ වාර්තා තබා ගැනිමේ පහසු ක්‍රමවේද භාවිතයෙන් SEQI අගය ඉහළ නැංවීමයි. එකී පාසල් දහහතරෙන් දහයක් තෝරාගෙන මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේද යටතේ සිදුකළ මෙම අධ්‍යයනයට දත්ත එකතු කිරීම සඳහා ලිපිගොනු විමර්ශන, සමීක්ෂණ පත්‍රිකා හා සාකච්ඡා යොදා ගැනිණි. පෙර පරීක්ෂණයක් මගින් පවතින තත්ත්වය අනාවරණය කරගන්නා ලදි. එයට ගුණාත්මක ඇගයීම් ක්ෂේත්‍ර පහක් හා 5S ක්‍රමවේදයේ පිරික්සුම් ලැයිස්තුවක්ද ඇතුළත් විය. පාසල් දහයම එහි දී ලබාගත්තේ අඩු ලකුණු ප්‍රමාණයකි. විදුහල්පති හා ගුරුවරුන්ගේ සමීක්ෂණ පත්‍රිකා හා සාකච්ඡාවලින් දැනට වාර්තා තබා ගන්නා ආකාරය මෙන්ම එහි ගැටලු හා යෝජනා හඳුනා ගත හැකි විය. තොරතුරු විශ්ලේෂණයේ දී ප්‍රස්ථාර ද, ප්‍රතිශතයන් ද, ගුණාත්මක දත්ත ද යොදා ගැනිණ. එහි දී බොහෝ පාසල්වල ලිපි ගොනු හිස්ව පැවතීම, එකම දේ නැවත ලිවීම, දීර්ඝ වාර්තා ලිවීම, අදාළ නොවන තොරතුරු තිබීම, ආදිය දක්නට ලැබිණි. හඳුනාගත් ගැටළු අයත් වූයේ පාසල් ඇගයීම් පිළිබඳ ආකල්ප හා දැනුම, පුද්ගලබද්ධ සහ පද්ධතිමය ඒවාටය. ඒ අතුරින් ගුරු මණ්ඩලයේ අඩුකම, අවබෝධය හා උනන්දුව මඳකම, තාක්ෂණය භාවිත නොකිරීම යනාදිය කැපී පෙනුනි. ගැටලු සඳහා යෝජනා ලෙස ඇගයීම් ගැන දැනුවත් වීම, පාසලක් නැරඹීම, අත්දැකීම් හා උදව් ලබාගැනීම හා තාක්ෂණය භාවිත කිරීම යනාදිය දක්වා තිබුණි. ඒ අනුව පහසු වාර්තාකරණ ක්‍රම හා අනෙකුත් යෝජනා ක්‍රියාත්මක කිරීමට කාලය ලබා දී, තරගයකින් පාසල් තේරීමට පෙර පරීක්ෂණයට සමාන පසුපරීක්ෂණයක් පැවැත්විණ. එහිදී පාසල් දහයේම ලකුණු වැඩි වී තිබුණි 2018 වර්ෂයේ එම පාසල් දහයෙන් අටක SEQI අගය පණහට වැඩිවිය. එම පාසල්වල වාර්තා තැබීමේ විවිධ ක්‍රම, තාක්ෂණය භාවිත කිරීම, දැනුවත්භාවය, 5S සංකල්පය හා තරගකාරිත්වය නිසා ලිපි ගොනු නිවැරදිව සැකසිණ. මෙම අධ්‍යයනයෙන් පාසල් ඇගයීම යනු හුදෙක් ලිපිලේඛන පමණක්ම නොවන බවට කාර්ය මණ්ඩලයේ දැනුම යාවත් කාලීන වියයුතු බව පසක් විය.

**මුඛ්‍ය පද : පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය, ලිපි ගොනු , වාර්තාකරණ ක්‍රම**

# 1. හැඳින්වීම

## 1.1 පර්යේෂණයේ පසුබිම

ලංකාවේ අධ්‍යාපන දිස්ත්‍රික්ක අතුරින් දුෂ්කර මෙන්ම විවිධත්වය අතින් සුවිශේෂ වූ නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත කලාපය එහි අනෙකුත් කලාප වලට වඩා සාපේක්ෂව අධ්‍යාපන මට්ටම අතින් තරමක් ඉදිරියෙන් වූ කලාපයක් ලෙස සැලකිය හැකිය. එහි සිංහල මාධ්‍ය පාසල් 57ක් හා දෙමළ මාධ්‍ය පාසල් 12 ක් ඇත. ප්‍රධාන වශයෙන් ග්‍රාමීය හා අර්ධ නාගරික සුළුතරයක් මෙන්ම වතුකරයේ දූදරුවන් 22000 ක් පමණ මෙහි පාසල් තුළ අධ්‍යාපනය ලබන අතර මොවුනට අධ්‍යාපනය ලබා දීම සඳහා 880 ක පමණ ගුරු පිරිසක් සේවයේ යෙදී සිටිති. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ඇතුළු නිලධාරීන් 9 දෙනෙකු  විසින් එක් අයෙකු විෂය කීපයක් ආවරණය කරමින් කලාපයේ අධ්‍යාපන සංවර්ධනයට දායක වේ. කලාපයේ විෂය සංවර්ධන කටයුතු හා නියාමනය සඳහා සිටිනුයේ ගුරු උපදේශකවරුන් 10ක් පමණි. ඉතිරි විෂයයන් සම්පත්දායකයින් මගින් ආවරණය කෙරේ.

## 1.2 පර්යේෂණ ගැටලු

කලාප කාර්යාලයකින් කෙරෙන ප්‍රධාන කාර්යන් අතරට ගැනෙන පාසල් නියාමයේදී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් හඳුන්වා දී ඇති ඇගයීම් ක්ෂේත්‍ර ඔස්සේ පාසල් බාහිර ඇගයීම සිදු කරනු ලබයි. මෙය සාමාන්‍යයෙන් වසරකට වරක් හෝ දෙවරක් සිදුවේ. එහිදී සලකා බැලෙන ඇගයීම් ක්ෂේත්‍ර 8 සඳහා ලැබෙන ලකුණුවල සාමාන්‍ය අගය මගින් පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය (SEQI) සකස් කරනු ලබයි. එමගින් පාසල්වල සමස්ත ගුණාත්මක තත්ත්වය පිළිබඳ අදහසක් ගත හැකිය.

2017 වර්ෂයේදී හඟුරන්කෙත කලාපයේ පාසල් 69 ක සිදු කරන ලද බාහිර ඇගයීම්වලට අනුව පාසල් 14 ක SEQI අගය 50 ට අඩුවිය. මේ සඳහා විගණන විමසුම්ද ලැබී තිබුණි. එබැවින් එම පාසල්වල ගුණාත්මක තත්ත්වය නංවාලීම සඳහා කුමක් හෝ වැඩ පිළිවෙලක් යෙදිය යුතු විය. ඒ සඳහා කලාපයේ බාහිර ඇගයීම් නියාමන කණ්ඩායම සමග සාකච්ඡා කළවිට දැනගන්නට ලැබුනේ බොහෝ පාසල් වල ඇගයීම් ක්ෂේත්‍ර වලට අදාළ කරුණු ප්‍රායෝගිකව සම්පූර්ණ කර ඇති බව පැවසුව ද, ඒ පිළිබඳ සාක්ෂි විධිමත් ලෙස නඩත්තු නොවන බවයි.

ඒ අනුව එම පාසල් වල නියාමන වාර්තා නැවත විමසුමට ලක්කරන ලදි. එවිට පෙනී ගියේ ඇගයීම් ක්ෂේත්‍ර සම්බන්ධ ප්‍රධාන ගොනුව හෝ එක් එක් ක්ෂේත්‍රය සඳහා සකස් කළ ගොනු හා ලේඛන නොමැති බව අවසන් වාර්තාවල සඳහන් කර තිබෙන බවයි. ඒ සම්න්ධයෙන් සෑම නියාමනයක් අවසානයේදීම උපදෙස් දී ඇතත් එහි ප්‍රතිඵලයක් වී නොමැති බව පෙනුණි. පාසල් වලින් ඒ පිළිබඳව විමසීමේ දී විවිධ අදහස් ඉදිරිපත් විය. එනම් ඉතා විශාල ලිපිගොනු ප්‍රමාණයක් නඩත්තු කිරීමට සිදුවීම, ක්ෂේත්‍ර කිහිපයකට එකම ලිපිය නැවත නැවත යෙදීමට සිදුවීම, එක් කරුණක් වෙනුවෙන් වාර්තා ලිවීමට විශාල කාලයක් වැයවන මුත් එහි කිසිදු ඵලදායී බවක් නොමැතිවීම යනාදි කරුණු එහිදී ඉදිරිපත් වූ ඒවාය.

තවද ගුරුවරුනට ඇති අධික ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු නිසා බොහෝ පාසල්වලින් මෙය අතපසු වන බවට ඔවුන් අදහස් දැක්වූ අතර මෙය අනවශ්‍ය කොළ පිරවීමක් බව කිවූ පිරිසක් ද විය. ඇතැම් තේමා කමිටුවල ගුරුවරු පැවසුවේ තමන්ට තේමා ඇගයීම පිළිබඳ නිවැරදි දැනුමක් නොමැති බවයි. කෙසේ වුවද එමගින් පාසලට ලැබිය යුතු ලකුණු ප්‍රමාණයක් නොලැබී යනවා මෙන්ම කලාපයේ පාසල් 14 ක SEQI අගය 50 ට අඩුවීම කලාප අධ්‍යාපන කාර්යාලයටද ගැටළුවකි. මෙය කලාපයේ පාසල් අතුරින් 20.28% ක් වීමද සැලකිය යුතු තත්වයකි. එම පාසල් සංවර්ධනය වියයුතු තත්වයේ පවතියි. මෙම ගැටළුව විසඳීම සඳහා වාර්තාකරණය හා ලිපිගොනු සැකසීම පහසු කිරීමේ ක්‍රමවේද භාවිත කිරීම මගින් පාසලේ ලකුණු ප්‍රමාණය වැඩිකිරීමට හැකිවේද යන්න පිළිබඳව අධ්‍යයනයක් කිරීම සුදුසු බව පෙනුණි. ඒ අනුව මෙම පර්යේෂණය තෝරා ගන්නා ලදි.

## 2. සාහිත්‍ය විමර්ශනය

පාසල් වල ගුණාත්මක තහවුරුව පිළිබඳ කරන ලද පර්යේෂණ බොහෝ ඇතත් ඒවායේ පර්යේෂණ වපසරිය ඉතා විශාලය. ඒවා මගින් පාසල් වල ගුණාත්මක තහවුරුව සිදු කරන ආකාරය, සංසන්දනාත්මක වෙනස්කම්, සිදුවිය යුතු ආකාරය වැනි මාතෘකා යටතේ විය. ඒ අතුරින් කිහිපයක් මෙම අධ්‍යනයේ සාහිත්‍ය විමර්ශනයට යොදා ගන්නා ලදි.

Perera and Hettiarachchi (2016) සිදුකරන ලද අධ්‍යාපනයෙන් ලංකාවේ ප්‍රමිති හා ප්‍රතිමානයන් වෙනත් රටවල් සමග සංසන්දනය කිරීම හා විශ්ලේෂණය කිරීමත්, ක්‍රියාත්මක කිරීමට මැදිහත් වීම සහ දැනට ඇති ක්‍රමවේදය විශ්ලේෂණය කර ශ්‍රී ලංකාව සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමක් සිදුකර ඇත. එම අධ්‍යයනයෙන් එවකට පැවති උපදෙස් ආශ්‍රිත ගැටළු 6 ක්ද, ක්‍රමවේද ආශ්‍රිත ගැටළු 10 ක්ද හඳුනාගෙන තිබේ. අධ්‍යයනය ඇසුරින් නිගමන 20 ක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව ශ්‍රී ලංකාව සඳහා ප්‍රතිපත්තිමය නිර්දේශ 9 ක් ලබා දී ඇත.

Moutakis (2004) සිද්ධි අධ්‍යයනයක් ලෙස ග්‍රීන්විච් සරසවියේ අධ්‍යාපනපති නිබන්ධනයක් සඳහා ස්වීඩන් අධ්‍යාපන පද්ධතියේ පාසල් වල ගුණාත්මක තහවුරුවට ප්‍රමිති හා ප්‍රතිමානයන් ඉදිරිපත් කිරීම මගින් නගර සහා මට්ටමටම විමධ්‍යගත කිරීම සම්බන්ධයෙන් පාසල තුළ ගුණාත්මක තහවුරුවේ උපාය මාර්ගවල ගැටලු හා එය පාසලේ ඵලදායිතාවයට බලපාන අයුරු ස්වීඩන් පාසලක් හා ඉංග්‍රීසි පාසලක් ඇසුරින් සංසන්දනය කර ඇත. එහි නිගමනය වන්නේ සියලුම සිසුන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලැබෙන පරිදි ජාතික මට්ටමේ ක්‍රමවේදයක් අවශ්‍ය බවයි.

හේවගේ (2018) දී පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය ( SEQI) හා පාසල් සාධන දර්ශකය (SPI) අතර සම්බන්ධතාවයක් පවතීද යන්න පාසල් 16 ක් ඇසුරින් සොයා බැලීම සිදුකර ඇත. ප්‍රමිති ඇසුරින් සකස් කෙරෙන පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය හා විභාග ප්‍රතිඵල මත පදනම්ව සැකසෙන පාසල් සාධන දර්ශකය සහ සම්බන්ධතාවයක් පවතීද යන්න සංඛ්‍යාන විද්‍යාත්මකව විශ්ලේෂණය කර ඇත.

එහිදී ගුණාත්මක ක්ෂේත්‍ර 8 න් ඉගෙනුම ,ඉගැන්වීම හා ඇගයීම යන තේමාවේ සහ-සම්බන්ධතා සංගුණකය ඍණ අගයක්ද, ඉතිරි තේමා වල සහ-සම්බන්ධතා සංගුණකය ධන අගයක්ද, ලැබී ඇත. පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය (SEQI) හා පාසල් සාධන දර්ශකය (SPI) උපයෝගී කරගෙන සිදුකළ සපියර්මන්ගේ තරාපටිපාටි සහ-සම්බන්ධතා සංගුණකය + 0.3 ක් වී ඇත. එම නිසා එම දර්ශක දෙක අතර සහ-සම්බන්ධතාවයක් ඇති බව පෙන්වා දී ඇත.

## 3.0 පර්යේෂණ අරමුණු හා පර්යේෂණ ප්‍රශ්න

ගැටළුව විසඳීම සඳහා වාර්තාකරණය හා ලිපිගොනු සැකසීම පහසු කිරීමේ ක්‍රමවේද භාවිත කිරීම මගින් පාසලේ ලකුණු ප්‍රමාණය වැඩිකිරීමට හැකිවේද යන්න අරමුණු කරගෙන පර්යේෂණයේ සුවිශේෂ අරමුණු හා පර්යේෂණ ප්‍රශ්න සකස් කරන ලදි.

### 3.1 ප්‍රධාන අරමුණු

පහසු වාර්තාකරණ ක්‍රමවේද භාවිත කිරීමෙන් තෝරා ගත් පාසල් 10 ක SEQI අගය ඉහළ නැංවීමට හැකිවේද යන්න සොයා බැලීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණයි.

### 3.2 සුවිශේෂ අරමුණු

1. SEQI අගය අඩු පාසල්හි දැනට භාවිත කරන ලිපිගොනු හා වාර්තා පවත්වා ගැනිමේ තත්වය හා ක්‍රමවේද හඳුනා ගැනීම.
2. එම වාර්තා හා ලිපිගොනු ක්‍රමවේද වල පවත්නා දුර්වලතා අනාවරණය කර ගැනීම.
3. ලිපිගොනු හා වාර්තා විධිමත්ව පවත්වා ගැනිමට යොදා ගත හැකි පහසු ක්‍රම හඳුනා ගැනීම.
4. පහසු වාර්තාකරණ ක්‍රම භාවිතය SEQI අගයට බලපෑමක් ඇති කරන්නේදැයි සොයා බැලීම.

### 3.3 පර්යේෂණ ප්‍රශ්න

1. SEQI අගය අඩු පාසල් හි දැනට භාවිත කරන ලිපිගොනු හා වාර්තා පවත්වා ගැනිමේ තත්වය හා ක්‍රමවේද මොනවාද ?
2. එම වාර්තා හා ලිපිගොනු ක්‍රමවේදවල පවත්නා දුර්වලතා මොනවාද ?
3. ලිපිගොනු හා වාර්තා විධිමත්ව පවත්වා ගැනිමට යොදා ගත හැකි පහසු ක්‍රම මොනවාද ?
4. ලිපිගොනු හා වාර්තා විධිමත්ව පවත්වා ගැනිම SEQI අගයට බලපෑමක් ඇති කරන්නේද?

# 4.0 පර්යේෂණ ක්‍රමවේදය

## 4.1 පර්යේෂණ ක්‍රමය

පර්යේෂණයන් ක්‍රියාත්මක කරන ක්‍රමවේදය අනුව ගුණාත්මක හා ප්‍රමාණාත්මක වශයෙන් කොටස් දෙකක් ඇත. මෙම පර්යේෂණයේදී පාසල් වල දැනට පවතින තත්ත්වය අනාවරණය කර ගැනීම සඳහා සමීක්ෂණයන්ද, පෙර පරීක්ෂණයක් ද, වෙනස හඳුනා ගැනීම සඳහා පසු පරීක්ෂණයක් ද යොදා ගත් අතර ඒවා විශ්ලේෂණය හා නිරූපණය කිරීමට සරල සංඛ්‍යාන ක්‍රම භාවිත කෙරිණි. විවිධ ක්‍රම මගින් ලැබුණු ගුණාත්මක දත්ත ත්‍රිකෝණීකරණයෙන් විශ්ලේෂණය කරන ලදි. එම නිසා මෙය සමීක්ෂණ වර්ගයට අයත් මිශ්‍ර පර්යේෂණයන් ලෙස ක්‍රියාත්මක විය.

## 4.2 නියැදිය

SEQI අගය අඩු පාසල් 10 ක් තෝරා ගන්නා ලදි. මෙහි දී නිතර නියාමනයට යා හැකි, ගමන් පහසුව සහිත පාසල් තෝරා ගන්නා ලදි. සිංහල හා දෙමළ මාධ්‍ය දෙකෙහිම පාසල් එයට අයත් විය.

## 4.3 පර්යේෂණ උපකරණ

වගුව 1: අධ්‍යයනයේ අරමුණු හා ප්‍රශ්න වලට අනුව යොදා ගත් උපකරණ

| අරමුණු අංකය | ප්‍රශ්න අංකය | **පර්යේෂණ උපකරණ** |
|---|---|---|
| 1 | 1 | බාහිර ඇගයීම් වාර්තා විශ්ලේෂණය, ලිපි ගොනු විමර්ශන වගු, සාකච්ඡා ෂෙඩ්‍යුලය, සමීක්ෂණ පත්‍රිකා ,පෙර පරීක්ෂණය |
| 2 | 2 | බාහිර ඇගයීම් වාර්තා විශ්ලේෂණය, ලිපි ගොනු විමර්ශන වගු, සාකච්ඡා ෂෙඩ්‍යුලය, නිරීක්ෂණ පත්‍රිකා, පෙර පරීක්ෂණය |
| 3 | 3 | සාකච්ඡා ෂෙඩ්‍යුලය, සමීක්ෂණ පත්‍රිකා, විශ්ලේෂණ වගු |
| 4 | 4 | පසු පරීක්ෂණය, සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රම |

## 4. 4 දත්ත රැස්කිරීම

මෙම අධ්‍යයනයේදී පවතින ලේඛනවල තත්වය සොයා බැලීමට බාහිර ඇගයීම් වාර්තා විශ්ලේෂණය, ලිපි ගොනු විමර්ශන වගු, සාකච්ඡා ෂෙඩ්‍යුලය, සමීක්ෂණ පත්‍රිකා හා නිරීක්ෂණ පත්‍රිකා භාවිත කරන ලදී. ආරම්භක තත්වය තීරණය කිරීමට පූර්ව පරීක්ෂණය යොදා ගැනුණි. පහසු ක්‍රම පිළිබඳ යෝජනා ලබා ගත්තේ සාකච්ඡා ෂෙඩ්‍යුලය හා සමීක්ෂණ පත්‍රිකා මගිනි. SEQI අගයට බලපෑමක් ඇති කරන්නේද යන්න සොයා බැලීමට පසු පරීක්ෂණය සහ සරල සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රම භාවිත කරන ලදී.

### 4.4 දත්ත රැස් කිරීම

දත්ත රැස්කිරීම පූර්ව පර්යේෂණ අවධියේ සිට සිදු කරනු ලැබිණි. ඒ සඳහා කාර්යාලයේ ඇති බාහිර ඇගයීම් වාර්තා විමර්ශනය කරන ලදි. එමගින් සිදු කළේ තෝරා ගත් පාසල්වල දක්නට ලැබෙන සංවර්ධනය විය යුතු අංග යටතේ දක්වා ඇති නිරීක්ෂණ පත්‍රිකාවල වගුවල සටහන් කරගැනීම යි. බාහිර ඇගයීම් වාර්තාවල ක්ෂේත්‍ර 8 හි සඳහන් කරුණු අතුරින් "ලිඛිත සාක්ෂි නොමැත", "තහවුරු කරගත හැකි සාධක නොමැත ˜ ආදි වශයෙන් ලියන ලද නිරීක්ෂණ සලකා බලන ලදී. මෙයින් අඩුපාඩු වැඩියෙන්ම ඇති ඇගයීම් ක්ෂේත්‍රයන් සොයා ගැනීමට බලාපොරොත්තු විය. ඒවා පාසල් වශයෙන් හා ඇගයීම් ක්ෂේත්‍ර වශයෙන් වෙන වෙනම වගුගත කරගන්නා ලදී. එමෙන්ම SEQI අගය ඉහළ වූ පාසල් දෙකක ඇගයීම් වාර්තා ප්‍රධාන ගොනුව හා අනෙක් ක්ෂේත්‍ර ගොනු වල තත්වය ද, ඒවායේ භාවිත කරනු ලබන සාර්ථක වාර්තාකරණ ක්‍රම පිළිබඳව ද සොයා බලන ලදි. තව ද තෝරා ගත් පාසල්වල දැනට පවතින ගොනුවල තත්ත්වය ද වාර්තා කර ගැනිණි. ඒ තොරතුරු ලබා ගැනුනේ නිරීක්ෂණ පත්‍රිකා මගිනි.

ඉහත තොරතුරු මගින් වැඩිම අඩුපාඩු සහිත ක්ෂේත්‍ර 5 ක් හඳුනාගන්නා ලදි. ඒ ආශ්‍රිතව සකස් කළ සමීක්ෂණ පත්‍රිකා 2 ක් තෝරා ගත් පාසල්වල විදුහල්පතිවරුන්ට හා ගුරුවරුන්ට ලබා දී පාසල් ගුණාත්මක ක්ෂේත්‍ර ඇගයීම සම්බන්ධ දැනුම, අදහස්, ආකල්ප,ගැටළු හා යෝජනා ලබා ගැනිණි. ඊට අමතරව එම පාසල්වල විදුහල්පතිවරුන් හා ඇගයීම් ක්ෂේත්‍ර භාර ගුරුවරුන් සමඟ සිදු කළ විධිමත් හා අවිධිමත් සාකච්ඡා මගින් ද තොරතුරු ලබා ගන්නා ලදී. එමගින් ද ඔවුනට වාර්තා සකස් කිරීමේ දී ඇතිවූ ගැටලු, ප්‍රමිති ඇගයීම සම්බන්ධ ආකල්ප, අදහස් හා යෝජනා ඍජුවම ලබා ගැනීමට බලාපොරොත්තු විය.

තෝරා ගත් පාසල්වල දැනට පවත්නා තත්වය විධිමත්ව අනාවරණය කර ගැනීමට සැලසුම් අංශය සමග එක්ව පෙර පරීක්ෂණයක් සකස් කරන ලදී. මෙම පරීක්ෂණය සඳහා 2015 ට පෙර තිබූ පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය 111, ජාතික ඇගයීම් ක්ෂේත්‍ර මාර්ගෝපදේශයේ සඳහන් නිර්ණායක හා දර්ශක සහිත ආකෘති පත්‍රයක් යොදා ගැනිණි. එයින් බලාපොරොත්තු වූයේ කුඩා දර්ශක යොදා ගෙන ඒ අනුව ලකුණු පැවරීමෙන් ගැටලු ඇති තැන් නිශ්චිතව හඳුනා ගැනීමයි . එහි දී සලකා බලනු ලැබුවේ වැඩිම අඩුපාඩු සහිත ක්ෂේත්‍ර 5 කි. ඒ සමඟම එස් පහ (5 S) පරික්සුම් පත්‍රිකාවක් ද ලබා දුනි. එමගින් පාසල්වල පවත්නා ලිපිගොනු ක්‍රමවේදය ගැඹුරින් සොයා බැලීමට අපේක්ෂා කෙරිණ. පෙර පරීක්ෂණයට ලකුණු 200ක් ලබාගත හැකි ආකාරයට සකස් කරන ලදි.

තෝරා ගත් පාසල්වලට ලිපිගොනු හා වාර්තා විධිමත්ව පවත්වා ගැනිමට යොදා ගත හැකි පහසු ක්‍රම හඳුනා ගැනීමෙන් පසු පාසල්වල ලිපි ගොනු පවත්වා ගැනිම වෙනසකට භාජනය වූයේද යන්න සොයා ගැනීම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ යි. එම නව තත්වය විධිමත්ව අනාවරණය කර ගැනීමට පසු පරීක්ෂණයක් පවත්වන ලදී. පසු පරීක්ෂණය සඳහා යොදා ගත්තේ ද පෙර පරීක්ෂණයට සමාන ආකෘති පත්‍රයකි. එමගින් අඩුපාඩු සහිත ලිපිගොනු නිවැරදි වීමේ ප්‍රමාණය ලකුණු 200 න් කොපමණක් ගත්තේදැයි යන්න මගින් සොයා බලන ලදී.

## 5. දත්ත විශ්ලේෂණය

බාහිර ඇගයීම් වාර්තා විමර්ශනය කිරීමෙන් සංවර්ධනය කළයුතු ක්ෂේත්‍ර සොයා ගත හැකි විය. ඒ අනුව ඇගයීම් ක්ෂේත්‍ර 5ක් පමණක් පර්යේෂණයට භාජනය කිරීමට තෝරා ගන්නා ලදී. එම ක්ෂේත්‍ර හා ඒවායේ දක්නට ලැබුණු දුර්වලතා ප්‍රතිශතයන් පහත වගුවේ දක්වා ඇත.

වගුව 3 : පර්යේෂණයට තෝරා ගන්නා ලද ක්ෂේත්‍ර හා ඒවායේ දුර්වලතා ප්‍රතිශතයන්

| ඇගයීම් ක්ෂේත්‍ර | දුර්වලතා ප්‍රතිශතය |
|---|---|
| පාසල හා ප්‍රජාව | 79 % |
| ශිෂ්‍ය සුබසාධනය | 73 % |
| විෂය සමගාමී කටයුතු | 68 % |
| භෞතික සම්පත් කළමණාකරණය | 57 % |
| නායකත්වය හා කළමණාකරණය | 46 % |

තෝරා ගත් පාසල් 10 හි ඇගයීම් ක්ෂේත්‍රවලට අදාළ ප්‍රධාන ගොනුව හා අනෙක් ක්ෂේත්‍ර ගොනුවල තත්වය ද, ඒවායේ භාවිත කරනු ලබන සාර්ථක වාර්තාකරණ ක්‍රම පිළිබඳව ද නිරීක්ෂණ පත්‍රිකා මගින් සොයා ගත් තොරතුරු විශ්ලේෂණය කරන ලදී. එහි දී ප්‍රධාන ලක්ෂණ කිහිපයක් හඳුනා ගැනීමට හැකි විය.

- ඇගයීම් ක්ෂේත්‍ර ප්‍රධාන ගොනුව සකස් කර නොතිබීම නැතහොත් ප්‍රධාන ගොනුවේ අන්තර්ගත වියයුතු ලේඛන කීපයක් පමණක් තිබීම හෝ කිසිවක්ම නොතිබීම.
- ක්ෂේත්‍ර ගොනු හිස්ව පැවතීම හෝ අදාළ නිර්නායක හා දර්ශකය පමණක් අතින් ලියා තිබීම.

  උදා: ශිෂ්‍ය සුබසාධන කටයුතු

- කිසියම් අවස්ථාවක් පිළිබඳ වාර්තාවක් වෙනමම ලියා ගොනුවට ඇතුළත් කළ අවස්ථා

  උදා: ක්‍රීඩා උත්සවය තිබුනේ නම් ඒ පිළිබඳ වෙනම වාර්තාවක් නැවත එම කමිටුව විසින් ලියා ගොනුවට ඇතුළත් කර තිබීම.

- විවිධ වාර්තා ලියා ඇතත් ඒවායේ අදාළ නොවන තොරතුරු තිබූ අවස්ථා

  උදා: ශ්‍රමදාන පැවැත්වූ අවස්ථාවල එය සිදුකිරීමේ අරමුණ, සහභාගිත්වය ප්‍රගතිය වෙනුවට උනන්දුව, කැපවීම වැනිදෑ හා පුද්ගල වර්ණනා ආදිය ගොනු ගත කර තිබීම.

- කිසියම් අවස්ථාවකට අදාළ ඡායාරූප විශාල සංඛ්‍යාවක් මුද්‍රණය කොට දීර්ඝ වාර්තා ලියා ලිපි ගොනුවට ඇතුළත් කර තිබීම.

  උදා: ශිෂ්‍ය නායක දිනය පැවැත්වූ අවස්ථාවක ඒ සම්බන්ධ දිගු විස්තර ඇතුළත් කිරීම.

තෝරා ගත් පාසල් 10 හි විදුහල්පතිවරුන්ගේ හා ගුරුවරුන්ගෙ ඇගයීම් ක්ෂේත්‍ර සම්බන්ධ දැනුම, අදහස් හා යෝජනා ලබා ගැනීමට සමීක්ෂණ පත්‍රිකා 2ක් ලබා දී ගත් තොරතුරුද විශ්ලේෂණය කරන ලදි. එම සමීක්ෂණ පත්‍රිකාවලට ඔවුන් ලබා දුන් ප්‍රතිචාර කේත කිරීමෙන් දැනුම, අදහස්, ආකල්ප, ගැටලු හා යෝජනා දැන ගත හැකිවිය.

විදුහල්පතිවරුන්ට හා ගුරුවරුන්ට ඇගයීම් ක්ෂේත්‍ර පිළිබඳ නිවැරදි දැනුමක් නොමැති බව එහිදී දක්නට ලැබුණි. එය ප්‍රතිශතයක් ලෙස විදුහල්පතිවරුන්ගේ 90% ක් හා ගුරුවරුන්ගේ 68% ක් විය. එහි ලේඛන සකස් කිරීමට වැඩි කාලයක් ගතවන බවත් ඉගැන්වීම් කටයුතු සමඟ ඇගයීම් ක්ෂේත්‍රවල වාර්තා තැබීමට කාලය ඉතා වැඩියෙන් වැය වන බව ගුරුවරුන්ගෙන් 72% ක් ප්‍රකාශ කර තිබුණි. එය විදුහල්පතිවරුන්ගේ 60% කි. එමගින් සොයා බැලූ වෙනත් කරුණු විදුහල්පතිවරුන් හා ගුරුවරුන් එක්ව ගත් කළ පහත ආකාරයට දැක්විය හැකිය.

වගුව 4 : සමීක්ෂණ පත්‍රිකාවේ ආකල්ප සඳහා ගුරු හා විදුහල්පතිවරු ලබා දුන් ප්‍රතිචාර ප්‍රතිශතයන්

| අනු අංකය | අදහස / ආකල්පය ට අදාල කේතය | ප්‍රතිශතය |
|---|---|---|
| 1 | SEQI අගය පාසලක ගුණාත්මකභාවය මැනීමේ සාධකයක් ලෙස පිළිගැනීම | 48 % |
| 2 | බාහිර නියාමනයට පැමිණෙන පුද්ගලයින් මත ලකුණු රඳා පවතී | 62 % |
| 3 | ඇගයීම් ක්ෂේත්‍ර පිළිබඳ නිවැරදි දැනුම ලබා ගෙන පාසලේ SEQI අගය නැංවීමට කැමතිය | 89 % |
| 4 | ඇගයීම් ක්ෂේත්‍ර පිළිබඳ නිවැරදි දැනුමක් ලබා නොමැත | 56 % |
| 5 | ප්‍රධාන ගොනුව හා ක්ෂේත්‍ර ගොනු සැකසීමට නිරවුල් අදහසක් නැත | 71 % |
| 6 | ඇගයීම් ක්ෂේත්‍ර පිළිබඳ නිවැරදි දැනුම අධ්‍යාපනයේ සියලු දෙනාට තිබිය යුතුය. | 92 % |
| 7 | පහසු ලිපිගොනු ක්‍රමවේද හඳුන්වා දෙන්නේනම් ක්‍රියාත්මක කළ හැකිය. | 78 % |

සමීක්ෂණ පත්‍රිකා මගින් සොයා බැලූ කරුණු අතර විදුහල්පතිවරුන් හා ගුරුවරුන් ඇගයීම් ක්ෂේත්‍ර වල වාර්තා තැබීමේදී ඇතිවන ගැටලු විශ්ලේෂණයෙදී ඒ පිළිබඳව ඔවුන් දැක්වූ අදහස් සංක්ෂිප්ත කොට පහත දක්වා ඇත.

- සිසුන් වැඩි පාසල් වල ක්‍රියාත්මක කිරිමේදී ගැටලු ඇතිවේ.
- ගුරුහිගයක් ඇති පාසල් වල ක්‍රියාත්මක කිරිමේදී ගැටලු ඇතිවේ.
- අතිරේක කාර්ය මණ්ඩලයක් හෝ අතිරික්ත ගුරුවරු නොමැති විට ගැටලු ඇතිවේ.

- විදුහල්පතිගේ ඇගයීම් ක්ෂේත්‍ර පිළිබඳ දැනුම හා උනන්දුව අඩුකම
- ගුරුවරුන්ගේ ඇගයීම් ක්ෂේත්‍ර පිළිබඳ දැනුම හා උනන්දුව අඩුකම
- පාසලක ඇති බොහෝ කාර්යන් වල තොරතුරු ලිඛිතව තබා ගැනීම ගැටළුවකි.
- බොහෝ ලිපි ලේඛන ඡායා පිටපත් කිරීමට සිදුවීම දුෂ්කර පාසල් වලට අපහසුය.
- භෞතික සම්පත් කළමනාකරණයේදී ඇතැම් දර්ශක වල ලකුණු වෙනස් කරගත නොහැකිවීම.
- ප්‍රාථමික පාසල් වලට ලකුණු ලබා දීමේදී වැඩි වාසි ලැබීම.
- පාසලේ සත්‍ය තොරතුරු වසන් කිරීමට උත්සහ කිරීම.

සමීක්ෂණ පත්‍රිකා මගින් සොයා බැලූ කරුණු අතර ඇගයීම් ක්ෂේත්‍රවල වාර්තා තැබීමේ දී ඇතිවන ගැටලු විසඳීම පිළිබඳව ඔවුන් දැක්වූ යෝජනා මෙන්ම වෙනත් යෝජනා කෙරෙහිද විශේෂ අවධානයක් යොමු කරන ලදි. ඒ අතුරින් පළමුවෙන් පහත දක්වා ඇත්තේ විදුහල්පතිවරුන් හා ගුරුවරුන් දක්වා තිබූ විවිධ වෙනත් යෝජනා කරුණු වශයෙනි.

- විදුහල්පතිවරුන් හා ගුරුවරුන් "අපේ පාසල කොතරම් ගුණාත්මකද?" පොත පිළිබඳව දැනුවත් කිරීම.
- ඇගයීම් ක්ෂේත්‍ර ඉතා හොඳින් ක්‍රියාත්මක වන පාසලක් නැරඹීමට යාම.
- විදුහල්පතිවරුන් හා ඇගයීම් ක්ෂේත්‍ර භාර ගුරුවරයා ලවා වෙනත් පාසලක් ඇගයීම් කිරීම.
- පාසල් පාදකව ගුරුමණ්ඩලය ඇගයීම් ක්‍රියාවලිය ගැන දැනුවත් කිරීම.
- බාහිර ඇගයුම්කරුවන් නිවැරදිව දැනුවත් කිරීම.
- ප්‍රධාන ගොනුව හා ඇගයීම් ක්ෂේත්‍ර ගොනු සකස් කිරීමට පාසල භාර කලාප නියෝජිතයාගේ උදව් ලබාදීම.
- පාසල් තුළ කඩිනමින් ක්‍රියාත්මක කිරීමට පාසල් ඇගයීම් සතියක් ප්‍රකාශ කිරීම.
- පාසල් අතර උනන්දුව ඇති කිරීම පිණිස පාසල් ඇගයීම් තරගයක් සංවිධානය කිරීම.
- පාසල් තුළ 5 S සංකල්පය ක්‍රියාත්මක කිරීමට පෙළඹවීම.
- ප්‍රාථමික පාසල් වලටද අනෙක් පාසල් හා සමබර වනසේ ආකෘති ලබාදීම.
- ප්‍රාථමික පාසල් වෙනම කණ්ඩායමක් ලෙස ඇගයුම් කිරීම.
- ලකුණු වැඩි පාසල්වල භාවිත වන වාර්තා තබාගැනීමේ පහසු ක්‍රමවේද මෙම පාසල් වලටද හඳුන්වා දීම.

සමීක්ෂණ පත්‍රිකා මගින් සොයා බැලූ කරුණු අතර පාසල් ඇගයීම් ක්ෂේත්‍රවල වාර්තා තැබීමේ දී ඇතිවන ගැටලු විසඳීම පිළිබඳව ඔවුන් දැක්වූ යෝජනා විශේෂයෙන් වෙන් කර ගන්නා ලදී. ඒවා පහත පරිදි විය.

- පාසලේ සිදුකරන විවිධ ක්‍රියාකාරකම් වල අවස්ථාවන් ඡයාරූප ගතකර මාතෘකා යොදා පරිගණක මෘදු පිටපත් ගොනුවක් ලෙස පවත්වා ගැනීම.
- ඕනෑම පාසල් කටයුත්තක් වෙනුවෙන් සකස් කරන ගොනුවට අංකයක් යොදා ඒ වෙනුවෙන් ක්ෂේත්‍ර ගොනුවේ අංකය බැලීමට සටහනක් යෙදීම.
- පාසලේ භෞතික සම්පත්, ශිෂ්‍ය සාධනය වැනි තොරතුරු පරිගණක EXCEL SHEET ලෙස පවත්වා ගැනීම.
- ප්‍රජාව සමග සිදු කරන කාර්යයන් ඒ අවස්ථාවේ දී ම කෙටි මාතෘකා හා ඡායාරූප සහිතව පරිගණක ගොනුවක් ලෙස තබා ගැනීම.
- ප්‍රජාව සමග සිදු කරන කාර්යයන් ඒ අවස්ථාවේ දී ම කෙටි මාතෘකා හා අරමුණ සහිතව එදින අත්සන් ලේඛනයට අමුණා තැබීම.
- ප්‍රස්ථාර, වගු, ගැලීම් සටහන්, චාට් සටහන්, සංකල්ප සිතියම් වැනි දේ සුදුසු අවස්ථාවල භාවිත කිරීම.
- ශිෂ්‍ය සුබසාධනය, පාසල හා ප්‍රජාව, විෂයසමගාමී වැනි ක්ෂේත්‍රවල දී පාසලේ ක්‍රියාත්මක වන ක්‍රමයන්ට අදාළ යාවත්කාලීන වන පොත්පත්, ආකෘති හා ලිපිගොනුවල ලැයිස්තුවක් පමණක් එම ගොනුවට එකතු කිරීම.
- අභ්‍යන්තර නියාමනය පහසු කිරීමට සුදුසු ආකෘති පත්‍ර හා පිරික්සුම් ලැයිස්තු පාසල්වලට සපයා දීම.

ඊට අමතරව එම පාසල් 10 හි විදුහල්පතිවරු හා එක් එක් ඇගයීම් ක්ෂේත්‍ර භාර ගුරුවරු සමග සිදු කළ විධිමත් හා අවිධිමත් සාකච්ඡා මගින් ලබාගත් ගුණාත්මක තොරතුරු විශ්ලේෂණය කරන ලදි. එමගින්ද ඔවුනට වාර්තා සකස් කිරීමේදී ඇතිවූ ගැටලු, ක්ෂේත්‍ර ඇගයීම සම්බන්ධ ආකල්ප, අදහස් හා යෝජනා ඍජුවම හඳුනා ගැනීමට හැකි විය.

එහිදී විදුහල්පතිවරු 10 න් 9 ක්ම පැවසුවේ "මම ගුරුවරු සියලු දෙනා කමිටු වලට බෙදලා වගකීම් පවරලා තියෙනවා .ඒත් එයාලා ඒක හරියට කරන්නේ නෑ" යන්න හෝ ඊට සමාන අදහසකි. ඔවුන් කුමන අවස්ථාවකදී හෝ අභ්‍යන්තර ඇගයීමකට දායක වී ඇත්ද යන්නට ලැබුණු පිළිතුර වූයේ "මට මේ තියෙන වැඩත් එක්ක ඒකට වෙලාවක් නෑ" යන්නයි. විදුහල්පතිවරු 10 දෙනාම පුහුණු අවස්ථාවේ හැර "අපේ පාසල කොතරම් ගුණාත්මකද?" පොත කිසිඳු අවස්ථාවක කියවා නොමැති බව ද, ඒ පිළිබඳ පැහැදිළි හා නිවැරදි අවබෝධයක් නොමැති බව ද ප්‍රකාශ කළහ.

තම ගුරු මණ්ඩලය සම්පූර්ණ කාලයම ඉගැන්වීම සඳහා යොමු කර ඇති බැවින් ලිපි ගොනු සැකසීමට ඔවුන්ට කාලයක් නොමැති බවද එක් විදුහල්පතිවරයෙකු පැවසීය. "අපි වගේ දුෂ්කර පාසල්වලට ඔය ප්‍රමිති හරියන්නේ නැහැ. මානව සම්පතත් නෑ. භෞතික සම්පතුත් නෑ ඒ නිසා කවදාවත් ලකුණු වැඩිවෙන්නෙත් නෑ" යි ආවේගයෙන් පැවසූ විදුහල්පතිවරයෙකු ද විය. මෙම අදහස් වලට අමතරව පහත දැක්වෙන අදහස් ද විදුහල්පතිවරු විවෘතව පළ කළහ.

"බාහිර ඇගයීමට එන අය ලකුණු දාන්නේ එක එක විදියට"

"ගුරුවරු වැඩිපුර ඉන්න ඉස්කෝලවලට නම් හොඳයි"

"මම අලුතින් ආවෙ, දැනුවත් කිරීමට ඉඳලත් නෑ. කලින් ඉස්කෝලේ කමිටුවකට නම් හිටියා ඒත් මුකුත් කළේ නම් නෑ"

"ඔය ෆයිල් අටක් හදන්න ෆොටෝ කොපි කරන්න සැහෙන ගාණක් යනවනේ"

"අපේ විභාග ප්‍රතිඵලත් හොඳයි. පන්තිවල සාධන මට්ටමත් හොඳයි. ඉතින් තව මොනවද ප්‍රමිති"

"ඉස්කෝලවල කරන්න වෙන කොයි තරම් දේවල් තියෙනවද?"

"අලුතින් එන හැමෝටම ප්‍රමිති උගන්නන්න ඕන. අපිවත් නිතර දැනුවත් කරන්න ඕන"

"මොන දෙයක් හරි සරලව ලේසියෙන් කරන විදියක් තියෙනවනම් හොඳයි "

"අපේ ටීචලානම් කියන්නේ කරන කරන හැමදේම ලියලියා දානවා කිසි වැඩක් නෑ කියලයි ˜

"ඉස්කෝලේ මොනවා වුනත් කමක් නෑ. ෆයිල් ටික ගානට හදලා තිබුනොත් ඇති කියලයි මට හිතෙන්නෙ"

ඇගයීම් ක්ෂේත්‍ර භාර ගුරුවරු සමඟ සිදු කළ විධිමත් හා අවිධිමත් සාකච්ඡා මගින් ලබාගත් ගුණාත්මක තොරතුරු ද විශ්ලේෂණය කරන ලදුව පෙනී ගියේ විදුහල්පතිවරු තරම් ඍජුව අදහස් දැක්වීමට මැලිවූ බව යි. ඔවුන් සියලු දෙනාම පුහුණු අවස්ථාවට අමතරව "අපේ පාසල කොතරම් ගුණාත්මකද?" පොත කියවා තිබුණි. නමුත් ඔවුන් කියවා ඇත්තේ තමන්ට අදාළ ක්ෂේත්‍රය පමණි. එසේම සමස්ත ක්‍රියාවලිය පිළිබඳ අවබෝධය අඩු බවද ප්‍රකාශ කළහ. නමුත් ලිපි ගොනු පවත්වා ගෙන යාම ගැන නිරවුල් අවබෝධයක් නොමැති බව ඔවුන්ගෙන් 75% කටත් වැඩි පිරිසක් පැවසීය.

ප්‍රමිති සම්බන්ධයෙන් විදුහල්පතිවරුන්ගේ තරම් ඍණාත්මක ආකල්ප නොමැති බව පෙනුණි. ගුරුවරු ඉදිරිපත් කළ අදහස් කිහිපයක් පහත දැක්වේ.

"අපිට මේක කරන්නෙ කොහොමද කියල හරියටම කියලා දීල නැහැ තේරෙන්නෙත් නැහැ"

"අපි සරල ක්‍රම වලට කරන්න හැදුවත් විදුහල්පතිතුමා කියන්නෙ වාර්තා ලියලා පුරවන්න කියලයි."

"කම්පියුටරයේ තියෙන ඒවා පෙන්නන්න පුලුවන් බව දැනගෙන හිටියේ නැහැ"

"හරියට කරනවනම් ඉස්කෝලේ පිළිවෙලකට ගන්න පුලුවන් කියලා හිතෙනවා."

"අපේ ඉස්කෝලෙට ඇවිල්ලා මේ ගැන දැනුවත් කරනවා නම් ගොඩක් හොඳයි"


"අපිට අමතර වැඩක් වුනත් පාසලේ ලකුණු වැඩි කරගන්න කැමතියි"

"අලුත් ක්‍රම කියලා දෙන්න එතකොට අපිට කරගෙන යන්න පුලුවන් "

"ප්‍රමිති හොඳට තියන පාසලක් බලන්න අපිව එක්කරගෙන යන්න"


"මම පාසල් තුනක හිටියා ඒ විදුහල්පතිවරු නම් අපි තරම් වත් ප්‍රමිති ගැන දන්නෙම නැති තරම්"

ඉහත සඳහන් දත්ත විශ්ලේෂණයන්ට අමතරව පෙර පරීක්ෂණයේ ලකුණු වාර්තා ද සංඛ්‍යාත්මකව විශ්ලේෂණය කරන ලදි .එම පරීක්ෂණයට ලබා දුන් මුලු ලකුණු ගණන 200 කි. එසේ වුවද පෙර පරීක්ෂණය සඳහා පාසල් 10ටම ලබා ගත හැකි වූයේ ලකුණු 100 ට අඩුවෙනි. එය පහත ප්‍රස්තාරයෙන් දක්වා ඇත.




රූපය 1 ෑ පෙර පරීක්ෂණය සඳහා පාසල් 10 ලබා ගත් ලකුණු

තෝරා ගත් පාසල් වලට ලිපිගොනු හා වාර්තා විධිමත්ව පවත්වා ගැනිමට යොදා ගත හැකි පහසු ක්‍රම හා යෝජනා හඳුනා ගැනීමෙන් පසු පාසල්වල ඒවා ක්‍රියාත්මක වීමට කාලයක් ලබා දී, ලිපි ගොනු පවත්වා ගැනිම වෙනසකට භාජනය වූයේද යන්න සොයා ගැනීම සඳහා පසු පරීක්ෂණයක් පවත්වන ලදි. පසු පරීක්ෂණය සඳහා යොදා ගත්තේද පෙර පරීක්ෂණයට සමාන ආකෘති පත්‍රයක් බැවින් එයද ලකුණු 200 න් කොපමණක්දැයි සොයා බැලිණ. ඉන් පසු පෙර පරීක්ෂණයේ හා පසු පරීක්ෂණයේ ලකුණු සංසන්දනය කරන ලදි .එය පහත ප්‍රස්ථාරයෙන් දක්වා ඇත.




රූපය 2 : පෙර හා පසු පරීක්ෂණය සඳහා පාසල් 10 ලබා ගත් ලකුණු

ඒ අනුව පෙනී යන්නේ පාසල් 10 ම ලකුණු 100 ට වඩා වැඩි වී ඇති බවයි. එනම් පෙර පරීක්ෂණයට ගත් ලකුණුවලට වඩා සෑම පාසලක්ම තම තත්ත්වය වැඩි දියුණු කරගෙන ඇති බව පෙනේ. ලකුණු 60 කටත් වඩා වැඩි කරගත් පාසල් 4 ක් ඇති අතර ලකුණු 40 ට වඩා අඩුවෙන් වැඩි කරගත් පාසල් 3 ක් ද තිබිණි. ඒ අනුව එක් එක් පාසල විවිධ ප්‍රමාණවලින් තම ලකුණු වැඩි කරගෙන ඇත.

## 6. පර්යේෂණ අනාවරණ

පාසල් බාහිර ඇගයීමේ දී ඇගයීම් ක්ෂේත්‍රවලට ලකුණු අඩුවන හේතු අතුරින් ප්‍රධාන හේතුවක් ලෙස ලිපි ගොනු නිවැරදිව සකස් නොවීම බව හඳුනාගන්නා ලදි. දැනට පවත්නා ලිපිගොනු ක්‍රමවේදවල දුර්වලතා ලෙස ලිපිගොනු තුළ ලිපි නොමැති වීමත්, දීර්ඝ වාර්තා ලිවීමත්, අදාළ නොවන තොරතුරු ඇතුළත් කිරීමත් යනාදිය අනාවරණය කර ගැනිණ. එයට හේතු ලෙස විදුහල්පතිවරුන්ගේ ඍණ ආකල්ප ද, ගුරුවරුන්ගේ නොදැනුවත්භාවය ද, තාක්ෂණය භාවිත නොකිරීම ද, ප්‍රධාන වශයෙන් බලපා ඇති බව සොයා ගත හැකිවිය. වාර්තා හා ලිපි ගොනු සකස් කිරීමට පහසු ආකෘති හා ඵලදායිතා සංකල්ප භාවිත නොවීම දක්නට ලැබුණි.

දැනුවත් කිරීම් හා පහසු ක්‍රමවේද පාසල් තුළ ක්‍රියාත්මක වීමෙන් පසු ලිපිගොනු ක්‍රමවේදවල දුර්වලතා අඩු වූ බව දැකගත හැකිවිය. පාසල් අතර තරගකාරී බවක් ඇති කිරීම තුළින් ස්වයං පෙළඹවීමක් ඇති වූ බව දැකගත හැකි විය. මෙම පාසල් දහයේම 2018 වසරේ දී SEQI අගය 50 ට වැඩි විය.

## 7. නිගමන හා යෝජනා

SEQI අගය 50 ට අඩු සංවර්ධනය වියයුතු තත්වයේ පැවති වූ පාසල් 14 ක වාර්තාකරණය හා ලිපිගොනු සැකසීම පහසු කිරීමේ ක්‍රමවේද භාවිත කිරීම මගින් පාසලේ ලකුණු ප්‍රමාණය වැඩිකිරීමට හැකිවේද යන්න පිළිබඳව සිදු කළ මෙම අධ්‍යයනය මගින් කිරීම පහත නිගමනවලට එළඹිය හැකි විය.

- ලිපි ගොනු නිවැරදිව සකස් නොවීමට විදුහල්පතිවරුන්ගේ ඍණ ආකල්ප ද, ගුරුවරුන්ගේ නොදැනුවත්භාවය ද, තාක්ෂණය භාවිත නොකිරීම ද, ප්‍රධාන වශයෙන් බලපා ඇත.
- විදුහල්පති සහ ගුරුමණ්ඩලය ඇගයීම් ක්ෂේත්‍ර පිළිබඳ දැනුවත් කිරීම මගින් ඔවුන්ගේ දැනුම හා ආකල්ප වැඩි දියුණු කළ හැකිය.
- ජංගම දුරකථන, ටැබ් හා පරිගණක මගින් පහසුවෙන් හා වේගයෙන් අංග සම්පූර්ණ වාර්තා සකස් කළ හැකිය.
- පාසල්වල SEQI අගය වැඩි කර ගැනීමට ඵලදායිතා සංකල්ප වල 5S ක්‍රමය භාවිත කිරීම අතිරේක පිටුවහලක් වේ.
- පාසල් අතර ඇගයීම් ක්ෂේත්‍රවල ලකුණු ඉහළ නංවා ගැනීමට ඉහළ තත්වයේ පාසලක් නැරඹීම,
- වෙනත් පාසලක් ඇගයුම් කිරීම, ඇගයීම් සතිය හා විවිධ ආකෘති හඳුන්වා දීම මගින් මෙය අපහසු කාර්යක් නොවන බව පෙන්වා දිය හැක.
- පාසල් අතර ඇගයීම් ආශ්‍රිත තරග පැවැත්වීම තුළින් අභ්‍යන්තර ගුණාත්මක බව සංවර්ධනය සඳහා පාසලේ ස්වයං පෙළඹවීමක් ඇතිකළ හැකිය.
- කලාප බාහිර ඇගයීම් කණ්ඩායමද ප්‍රමිති පිළිබඳ දැනුවත් කිරීම මගින් ඔවුන්ගේ ඇගයීම් වඩා සාධාරණ ලෙස කළ හැකිය.
- ප්‍රාථමික අංශය පමණක් ඇති පාසල්වල ලකුණු මට්ටම ඇතැම් අවස්ථාවල දී වැඩි වීමට ඉඩකඩ ඇත. මෙම අධ්‍යයනය මගින් ලබා ගන්නා ලද දැනුම තුළින් පාසල්වල ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් පහත දැක්වෙන යෝජනා ඉදිරිපත් කළ හැකිවිය.
- වාර්ෂිකව විදුහල්පති සහ ගුරු මණ්ඩලය පමණක් නොව කලාප බාහිර ඇගයීම් කණ්ඩායම ද ප්‍රමිති පිළිබඳ දැනුවත් කිරීම මගින් ඔවුන්ගේ දැනුම හා ආකල්ප යාවත්කාලීන කිරීම.
- වාර්ෂිකව පාසල් අතර ඇගයීම් ක්‍රියාවලිය ආශ්‍රිත තරග පැවැත්වීම හා ඒ අනුව පාසල් ඇගයීම.
- කලාප කාර්යාල මගින් බාහිර ඇගයීම් වාර්තා විශ්ලේෂණය කර දුර්වලතා සුවිශේෂව අනාවරණය කරගෙන එම පාසල් වල තත්වය උසස් කිරීමට මැදිහත් වීම.
- පාසල් ඇගයීම් යනු හුදෙක් ලිපිලේඛන පමණක්ම නොවන බවට ආකල්ප සංවර්ධනය වන පරිදි අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ග්‍රන්ථයක් සම්පාදනය කිරීම.
- ප්‍රාථමික අංශයේ ශිෂ්‍ය සාධනය හා ගුරු ඇගයීම සඳහා යොදා ගන්නා ආකෘති සමාලෝචනය

මෙම පර්යේෂණය එක් කලාපයක සුවිශේෂව තෝරා ගන්නා ලද පාසල් 10 ක් යොදා ගෙන සිදු කරන ලදි. එබැවින් මෙය සමස්ත පාසල් පද්ධතිය සඳහා සාධාරණීකරණය කළ නොහැකිය. පර්යේෂණවල නියැලෙන්නන්ට එවන් පුළුල් අධ්‍යනයක් වෙනුවෙන් තව දුරටත් අවස්ථාව විවෘතව පවතී.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අධ්‍යාපන අමාත්‍යාංශය (2006). පාසල් අධ්‍යාපන ක්‍රියාවලියේ ගුණාත්මක සංවර්ධනයඃ අධ්‍යාපන ප්‍රමිති සහ බාහිර ඇගයීම් පිළිබඳ මාර්ගෝපදේශය, බත්තරමුල්ල ,කොළඹ. ශ්‍රී ලංකා රජයේ මුද්‍රණාලය.

අධ්‍යාපන අමාත්‍යාංශය (2010). පාසල් අධ්‍යාපන ක්‍රියාවලියේ ගුණාත්මක සංවර්ධනය 111ඃ ජාතික අධ්‍යාපන ප්‍රමිති මාර්ගෝපදේශය හා ගුරු උපදේශක නිපුණතා, බත්තරමුල්ල, කොළඹ. ශ්‍රී ලංකා රජයේ මුද්‍රණාලය.

අධ්‍යාපන අමාත්‍යාංශය (2014). "අපේ පාසල කොතරම් ගුණාත්මකද?"ඃ පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව සඳහා වූ ඇගයීම් ක්‍රියාවලිය. බත්තරමුල්ල, කොළඹ. ශ්‍රී ලංකා රජයේ මුද්‍රණාලය.

ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය (2017). ජාතික ඵලදායිතා සම්මාන - අයදුම්පත, උපදෙස් හා ඇගයීමේ ක්‍රියාවලිය - පාසල් අංශය. බත්තරමුල්ල, කොළඹ. ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයීය මුද්‍රණාලය.

ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය (2015). ඵලදායිතාව පිළිබඳ පංචවිධ සංකල්පය ඃ බත්තරමුල්ල, කොළඹ. ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයීය මුද්‍රණාලය.

# ජාතික පාසල්වල නායකත්වය හා කළමනාකරණය ඇගයීම් ක්ෂේත්‍ර යෙහි ගුණාත්මක තත්වය සඳහා බලපාන සාධක පිලිබඳ අධ්‍යයනය කිරීම

ඩී.එම්. ආර්.ඩබ්. එම්. දිවාකර (L.L.B, PGD (Sociology), PGDE)
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය
*0773122244 / roshinidivakara@gmail.com*

වී.එන්.ඩබ්.ඩබ්. දිසානායක (BSc, PGDE)
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය
*0772331026 / vinoshi17@gmail.com*

**සංක්ෂිප්තය**

පාසලක ගුණාත්මක තත්වය ඉහළ නැංවීම සඳහා නායකත්වය හා කළමනාකරණ කටයුතු විධිමත්ව සිදු කිරීම අත්‍යවශ්‍යවන අතර පාසල් ඇගයීම් ක්‍රියාවලිය මගින් එහි සාර්ථකත්වය තක්සේරු කළ හැකි වේ. පාසලක සැලසුම් සකස් කිරීම, කාලසටහන ක්‍රියාත්මක කිරීම, මූල්‍ය කළමනාකරණය, ඇගයීම් ක්‍රියාත්මක කිරීම මෙන්ම විනය කළමනාකරණ කටයුතු විධිමත්ව පවත්වා ගෙන යාම නායකත්වය හා කළමනාකරණය ක්ෂේත්‍රය ඉහළ ගුණාත්මක මට්ටමට ඔසවා තබන ප්‍රධාන සාධකයක කිහිපයකි. එම නිර්ණායකයන් සඳහා ඉහළ ලකුණක් ලබා ගැනීම සඳහා බලපාන සාධක හඳුනා ගැනීම මෙම අධ්‍යයනය මගින් සිදු කරන ලදී. අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ඇගයීමට ලක්කරන ලද ජාතික පාසල් 12 ක අහඹු නියැදියක් තෝරාගෙන පාසල් බාහිර ඇගයීම් වාර්තා ඇසුරෙන් ලබාගත් දත්ත විශ්ලේෂණය කර ඉහත සාධක සඳහා විදුහල්පති අයත්වන සේවාව, ස්ත්‍රී පුරුෂ භාවය, සේවා කාලය සහ පාසලේ පිහිටීම යන විචල්‍යයන් බලපෑමක් සිදු කරයිද යන්න හඳුනා ගෙන අනාවරණ ඇසුරෙන් සංවර්ධන යෝජනා ඉදිරිපත් කිරීම මෙම අධ්‍යයනය මඟින් සිදු කර ඇත.

**මුඛ්‍ය පද - පාසල් නායකත්වය, අධ්‍යාපනයෙහි ගුණාත්මකබව ,ඇගයීම් ක්‍රියාවලිය**

# 1. හැඳින්වීම

පුද්ගලයකුගේ ජීවිතය නිවැරදි සහ යහපත් ආකාරයෙන් සකස් කිරිමෙහි ප්‍රධාන වගකීම පාසලට පැවරී ඇති අතර පාසල් ගත වන සියලුම දරුවන්හට සම අධ්‍යාපනික අවස්ථා ලබා දෙමින් ඔවුන්ගේ අනාගතය හැඩ ගැස්වීමේලා පාසලට පැවරෙන කාර්යභාරය සුවිශේෂී වේ.

පාසලේ අඛණ්ඩ ගුණාත්මක සංවර්ධනයට උපකාරීවන ප්‍රධාන මෙවලමක් වශයෙන් අභ්‍යන්තර හා බාහිර ඇගයීම හැඳින්විය හැකිය. ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් හඳුන්වා දී ඇති 31/2014 චක්‍රලේඛය සහ "අපේ පාසල කෙතරම් ගුණාත්මකද?" මාර්ගෝපදේශය අනුව ශිෂ්‍ය සාධනය, ඉගෙනුම ඉගැන්වීම හා ඇගයීම, විධිමත් විෂයමාලා කළමනාකරණය, විෂය සමගාමී කටයුතු, ශිෂ්‍ය සුභසාධනය, නායකත්වය හා කළමනාකරණය, භෞතික සම්පත් කළමනාකරණය හා පාසල හා ප්‍රජාව යන ඇගයීම් ක්ෂේත්‍ර 08 ට අනුව පාසල් ඇගයීම් ක්‍රියාත්මක කිරීම තුළින් පාසලෙහි තත්වය අනාවරණය කරගනිමින් ප්‍රබලතා ඇගයීමටත් සංවර්ධනය විය යුතු ක්ෂේත්‍ර සම්බන්ධව අවශ්‍ය පියවර ගැනීමටත් අවකාශ සැලසේ.

පාසලෙහි නායකත්වය සහ කළමනාකරණය පාසල් ඇගයීම් ක්‍රියාවලියේදී අවධානය යොමු කරන ප්‍රධාන ක්ෂේත්‍රයක් වන අතර ඒ යටතේ පාසලේ සමස්ත ක්‍රියාවලිය විධිමත්ව පවත්වා ගෙන යාමේ දී අවධානය යොමු කලයුතු ක්ෂේත්‍ර රාශියක් නිර්ණායක වශයෙන් දක්වා ඇත.

පාසලක නායකත්වය පිළිබඳව සලකා බැලීමේ දී පාසලෙහි විදුහල්පති, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සහ සිසුන් යන සමස්ත කණ්ඩායමෙහි නායකත්වය පාසලෙහි සංවර්ධනයට ඉතාම වැදගත් වේ. එහිදී පාසලෙහි නියමුවා වශයෙන් සියලුදෙනාගේ සහයෝගය ලබාගනිමින් සහභාගීත්ව කළමනාකරණ ශෛලියක් ඔස්සේ පාසල සාර්ථකත්වය කරා මෙහෙයවීම විදුහල්පතිවරයාගේ ප්‍රධාන වගකීමකි. එහිදී විදුහල්පතිවරයා මනා කළමනාකරුවකු, සංවිධායකයකු හා පරිපාලකයෙකු වශයෙන් කටයුතු කරමින් පාසල අපේක්ෂිත ගුණාත්මක තත්වයට ළඟා කරවීම සඳහා කටයුතු කළ යුතුවේ (ගුණසේකර , 2011).

පාසල අපේක්ෂිත ගුණාත්මක තත්වය කරා සංවර්ධනය කිරීමේදී පස් අවුරුදු සහ වාර්ෂික සැලසුම් සකස් කිරීම, පාසල් කාල සටහන ක්‍රියාත්මක කිරීම, මූල්‍ය කළමනාකරණය, ඇගයීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාම සහ විනය කලමනාකරණ කටයුතු ඉතාමත්ම වැදගත්වන අතර එම කාර්යයන්හීදී විදුහල්පති වෙත සුවිශේෂි කාර්යභාරයක් පැවරේ. පාසලේ නායකත්වය හා කළමනාකරණය ක්ෂේත්‍රය යටතේ ඉහත නිර්ණායකවලට අදාළව පාසලෙහි තත්ත්වය එම නිර්ණායකවලට ලබා දෙන ලකුණු ප්‍රමාණය අනුව හඳුනාගත හැකි අතර ඒ සඳහා විදුහල්පතිගේ සේවා කාලය, ස්ත්‍රී පුරුෂභාවය, විදුහල්පතිවරයා අයත්වන සේවාව ආදී පුද්ගල සාධක මෙන්ම පාසලේ පිහිටීම වැනි සාධක ද බලපාන ආකාරය පිළිබඳ අධ්‍යයනය කිරීම ඉතා වැදගත් වේ.

## 1.1 ගැටලුව හැඳින්වීම

අධ්‍යාපනය සඳහා යෙදවුම් වශයෙන් විශාල භෞතික, මානව මෙන්ම මූල්‍ය සම්පත් ප්‍රමාණයක් ආයෝජනය කරනු ලබයි. එම යෙදවුම් ප්‍රමාණයට සාපේක්ෂව පාසල ගුණාත්මක වශයෙන් සංවර්ධනය වීම අත්‍යාවශ්‍ය වේ. පාසලට නායකත්වය සපයමින් පාසල මෙහෙයවන ප්‍රධානියා විදුහලපතිවරයා වන බැවින් ගුණාත්මකබවෙන් ඉහළ පාසලක් කරා යාමට විදුහල්පතිවරයා ප්‍රධාන සාධකයක් ලෙස බලපායි. පාසල්වල ගුණාත්මක තත්වය පිළිබඳව පාසල් අභ්‍යන්තර හා බාහිර ඇගයීම් මගින් අනාවරණය කරගන්නා කරුණු අනුව පාසලේ නායකත්වය සහ කළමනාකරණය සම්බන්ධ ගුණාත්මක තත්වය විවිධ මට්ටම්වල පවත්නා බව පැහැදිලිවේ. එහිදී එක් එක් පාසල නායකත්වය හා කළමනාකරණය ක්ෂේත්‍රයට මෙන්ම වෙන් වෙන්ව සැලකූ විට එහි ප්‍රධාන දර්ශකයන්ට ලබාගන්නා ලකුණු ප්‍රමාණයද විවිධ පරාසයන්හි විහිදී පවතී. පාසලේ භෞතික පිහිටීම මෙන්ම විදුහල්පති හා සම්බන්ධ සාධක පාසලේ නායකත්වය හා කළමනාකරණයට බලපෑමක් එල්ලකරයිද යන්න විමසා බැලීම වැදගත් වේ.

## 1.2 පර්යේෂණ අරමුණ

පාසලේ නායකත්වය හා කළමනාකරණ ක්ෂේත්‍රයහි ගුණාත්මක තත්වය සඳහා බලපාන සාධක හඳුනා ගැනීම

### 1.2.1 සුවිශේෂී අරමුණු

- නායකත්වය සහ කළමනාකරණය ක්ෂේත්‍රයෙහි ගුණාත්මක බව වර්ධනය සඳහා විදුහල්පතිගේ පුද්ගල සාධකවල බලපෑම හඳුනා ගැනීම.
- නායකත්වය සහ කළමනාකරණය ඇගයීම් ක්ෂේත්‍රය සඳහා පාසලේ පිහිටීමෙහි බලපෑම හඳුනාගැනීම
- පාසල් නායකත්වය ශක්තිමත් කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම

# 2. සාහිත්‍ය විමර්ශනය

පාසල මගින් සැමට සාධාරණ අධ්‍යාපන අවස්ථා ලබා දීමට හා පාසල ඵලදායී ආයතනයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා කාර්යක්ෂම නායකත්වයක් අත්‍යාවශ්‍ය වේ (Improving School Leadership, 2009). විදේශීය රටවල සිදු කරන ලද අධ්‍යයනයන්ට අනුව විදුහල්පතිවරයා යනු පරිපාලකයෙකු ලෙස පමණක් ම නොව පාසලේ ගුණාත්මක බව ඉහළ නැංවීම පිණිස කටයුතු කරන උපදේශන නායකයෙකු වශයෙන් ද කටයුතු කළ යුතු වේ (OECD, 2009).

පාසලෙහි කළමනාකරු වශයෙන් 1950 දශකයට පෙර හැඳින්වූ සම්ප්‍රදායික විදුහල්පති භූමිකාව වර්තමානය වන විට විශාල පරිවර්තනයකට ලක් වී ඇත. Wallas foundation (2009) දක්වන

ආකාරයට විදුහල්පතිවරයාට පාසල සමබන්ධයෙන් පවතින ප්‍රධාන වගකීම් 5 ක් පහත සඳහන් පරිදි හඳුනා ගත හැකිය.

- ඉහළ ප්‍රමිතීන් මත පදනම්ව සිසුන්ගේ අධ්‍යාපනික කාර්ය සාධනය සඳහා දැක්මක් සහිතව කටයුතු කිරීම.
- පාසල තුළ ආරක්ෂිත, සහයොගී හා මිත්‍රශීලී ඵලදායී අන්තර්ක්‍රියා සහිත වාතාවරණයක් නිර්මාණය කිරීම.
- ගුරුවරුන් ඇතුළු පාසල් ප්‍රජාව තුල නායකත්වය වර්ධනය කිරීම තුලින් පාසලේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කිරීම.
- ගුරුභවතුන්ගේ ඉගැන්වීම් ක්‍රියාවලිය හා සිසුන්ගේ ඉගෙනීම් ක්‍රියාවලියෙහි උපරිම සාර්ථකත්වයට ළගාවීම සඳහා අවශ්‍ය උපදේශාත්මක නායකත්වය සැපයීම.
- පාසලේ සංවර්ධනය සඳහා පුද්ගලයින්, දත්ත හා ක්‍රියාවලි කළමණාකරණය කිරීම.

එහි දී පාසල්වල නායකත්වය සඳහා සුදුසු ම පුද්ගලයන් තෝරා ගැනීම මෙන්ම සෑම විදුහල්පතිවරයකුටම ඵලදායී නායකත්වයක් සඳහා නිවැරදි මඟපෙන්වීමක් ලබා දීම ද ඉතාමත් ම වැදගත් වේ (Thomson & whitely, 2009).

පාසලෙහි සංවර්ධන ක්‍රියාදාමය පාසල විසින්ම ස්වයං විනිශ්චයකට ලක් කිරීම මෙන්ම බාහිර උපදේශන මට්ටමෙන් පාසල් කළමනාකාරිත්වය සුසාධ්‍යකරණය කිරීම පාසල් ඇගයීම තුළින් සිදු වන අතර එමගින් පාසල තුළ සමස්ත ගුණාත්මකභාවය තහවුරු කිරීමට හැකියාව ලැබේ. එමෙන්ම පාසලෙහි නිමැවුම වන සිසුන්ගේ අධ්‍යාපනික ඉලක්ක සාක්ෂාත්කරණයට මෙන්ම ගුරුවරුන්ගේ ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය සඳහා සහාය දක්වන ක්‍රියාකාරකමක් ලෙස පාසල් ඇගයීම් ක්‍රියාවලිය හැඳින්විය හැකි වේ (Suryosubroto, 2010).

පාසලක අපේක්ෂිත ගුණාත්මකභාවය සාක්ෂාත් කර ගැනීමේ දී එහි නායකත්වය අත්‍යාවශ්‍ය අංගයකි(Chow & Learning, 2013). එමෙන්ම අඛණ්ඩව මනා කළමනාකරණ කුසලතා සහිතව පාසල මෙහෙයවීමට අවධානය යොමු කරන විදුහල්පතිවරයකුට පාසල ඉහළ ගුණාත්මක තත්ත්වයක් කරා ගෙන යා හැකි වේ (Krug, 2004). කාර්යක්ෂම, ඵලදායී සහ විනිවදභාවයකින් යුත් කළමනාකරණ ක්‍රියාවලියක් හා නායකත්වයක් ප්‍රදර්ශනය කිරීම පාසලෙහි අපේක්ෂිත ප්‍රමිති මට්ටම වන අතර එහි දී ඵලදායී පස් අවුරුදු හා වාර්ෂික සැලසුම් සකස් කිරීම, කාලසටහන ඵලදායීව ක්‍රියාත්මක කිරීම, පාසලෙහි මූල්‍ය කලමනාකරණය විධිමත් ලෙස සිදු කිරීම, විධිමත් අභ්‍යන්තර හා බාහිර ඇගයීම් ක්‍රියාවලියක් මගින් පාසලේ ගුණාත්මක තත්වය ඉහළ නැංවීම මෙන්ම පාසල තුළ උසස් විනයක් පවත්වා ගෙන යාම වැනි නිර්ණායක පාසලෙහි ගුණාත්මක තත්වය වර්ධනයෙහිලා ඉතාමත් වැදගත් වේ (අධ්‍යාපන අමාත්‍යාංශය, 2014).

පසුගිය දශක දෙකක කාලය තුල රජයේ පාසල් ප්‍රධානීන් ලෙස කටයුතු කරන පුද්ගලයන් සම්බන්ධව සිදුව ඇති වෙනස්කම් පිළිබඳ ඇමරිකා එක්සත් ජනපදයේ රජයේ පාසල් ඇසුරින් කරන ලද අධ්‍යයනයක දී පසුගිය දශක දෙක තුළ ඇතිවී තිබෙන ප්‍රධාන ප්‍රවණතා තුනක් අනාවරණය කර ඇත.

ඇත. ඒවා නම් රජයේ පාසල්වල විදුහල්පතිනියන්ගේ ප්‍රමාණය සංඛ්‍යාත්මකව වැඩිවීම, පාසල්වල ඉහළ ගුණාත්මක සංවර්ධනය සඳහා විදුහල්පතිවරුන්ගේ සේවා අත්දැකීම සහිත බව ධනාත්මක ආකාරයට බලපෑම මෙන්ම විදුහල්පතිවරුන් ලෙස පත්වීමේ දී වාර්ගික සමානාත්මතාවයෙහි වර්ධනයක් සිදුව තිබීම එම ප්‍රවනතා වේ. එමෙන්ම සේවා පලපුරුද්ද වැඩි පාසල් නායකයන් තරුණ වයසෙහි පාසල් ප්‍රධානීන්ට සාපේක්ෂව වඩාත් සහයෝගීව කටයුතු කරන බව අනාවරණය වී ඇත (Oshagbmi, 2008).

ඒ අනුව පාසල්වල නායකත්වය හා කළමනාකරණ කටයුතු සම්බන්ධව ඉහත විවිධතාවල බලපෑමක් පවතීදැයි අධ්‍යයනය කිරීම කාලීන අවශ්‍යතාවක් වේ.

## 3. පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ සිදු කරන ලද අතර අධ්‍යාපන අමාත්‍යාංශය මගින් 31/2014 චක්‍රෙල්ඛය සහ "අපේ පාසල කොතරම් ගුණාත්මකද" මාර්ගෝපදේශය අනුව සිදු කරන ලද පාසල් බාහිර ඇගයීම්වලදී නායකත්වය හා කළමනාකරණය ක්ෂේත්‍රයෙහි තෝරාගත් නිර්ණායක 05 ක් සඳහා පාසල් ලබාගත් ලකුණු සහ ඇගයීම් වාර්තාවල තොරතුරු පදනම් කරගෙන මෙම අධ්‍යයනය සිදු කරන ලදී. එමෙන් ම විදුහල්පතිගේ සේවය, ස්ත්‍රී පුරුෂභාවය සහ සේවා කාලය සම්බන්ධ තොරතුරු අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පාසල් බාහිර ඇගයීම් වැඩසටහන්වල දී ලබා ගන්නා ආකෘති පත්‍රයක දත්ත මගින් ලබා ගන්නා ලදී. විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම භාවිතයෙන් දත්ත විශ්ලේෂණය කරන ලද අතර වගු සහ ප්‍රස්තාර මගින් දත්ත නිරූපනය කරන ලදී.

### 3.1 නියැදිය

අධ්‍යාපන අමාත්‍යාංශය මගින් 2019 වර්ෂයෙහි බාහිර ඇගයීමට ලක්කරන ලද ජාතික පාසල් 30කින් සරල අහඹු නියැදියක් ලෙස පාසල් 12ක් මෙම අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදී.

## 3.2 දත්ත ඉදිරිපත් කිරීම

වගුව 1 - පාසල් නායකත්වය සහ කළමනාකරණය ඇගයීම් ක්ෂේත්‍රයේ තෝරා ගත් නිර්ණායක සඳහා ලබා ගත් ලකුණු, විදුහල්පතිගේ තොරතුරු සහ පාසලේ පිහිටීම පිළිබඳ තොරතුරු

| පාසල | 6.2 සැලසුම් සකස් කිරීම | | 6.5 කාලසටහන ක්‍රියාත්මක කිරීම | | 6.7 මූල්‍ය කළමනාකරණ කටයුතු | | 6.8 ඇගයීම් ක්‍රියාත්මක කිරීම | | 6.14 විනය පවත්වා ගැනීම | | ස්ත්‍රී පුරුෂ භාවය | සේවා කාලය | සේවාව | පාසලේ පිහිටීම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ලකුණු | % | ලකුණු | % | ලකුණු | % | ලකුණු | % | ලකුණු | % | | | | |
| A | 25 | 83 | 10 | 83 | 20 | 83 | 16 | 67 | 10 | 83 | ස්ත්‍රී | 2 | SLEAS | නාගරික |
| B | 19 | 63 | 6 | 50 | 8 | 33 | 9 | 38 | 8 | 67 | ස්ත්‍රී | 9 | SLPS | ග්‍රාමීය |
| C | 12 | 40 | 7 | 58 | 16 | 67 | 13 | 54 | 8 | 67 | පුරුෂ | 3 | SLPS | නාගරික |
| D | 13 | 43 | 6 | 50 | 15 | 63 | 12 | 50 | 9 | 75 | ස්ත්‍රී | 9 | SLPS | නාගරික |
| E | 10 | 33 | 6 | 50 | 9 | 38 | 8 | 33 | 5 | 42 | පුරුෂ | 1. 5 | SLEAS | ග්‍රාමීය |
| F | 12 | 40 | 5 | 42 | 11 | 46 | 10 | 42 | 8 | 67 | පුරුෂ | 3 | SLEAS | නාගරික |
| G | 18 | 60 | 8 | 67 | 20 | 83 | 13 | 54 | 8 | 67 | පුරුෂ | 10 | SLPS | නාගරික |
| H | 14 | 47 | 7 | 58 | 10 | 42 | 15 | 63 | 10 | 83 | පුරුෂ | 13 | SLPS | ග්‍රාමීය |
| I | 20 | 67 | 6 | 50 | 13 | 54 | 5 | 21 | 8 | 67 | පුරුෂ | 3 | SLPS | ග්‍රාමීය |
| J | 10 | 33 | 5 | 42 | 14 | 58 | 6 | 25 | 6 | 50 | පුරුෂ | 3 | SLPS | ග්‍රාමීය |
| K | 23 | 77 | 8 | 67 | 19 | 79 | 14 | 58 | 7 | 58 | ස්ත්‍රී | 6 | SLEAS | නාගරික |
| L | 16 | 53 | 6 | 50 | 13 | 54 | 12 | 50 | 7 | 58 | පුරුෂ | 4 | SLPS | නාගරික |

SLEAS - ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය SLPS - ශ්‍රී ලංකා විදුහල්පති සේවය


ඉහත වගුව මගින් එක් එක් ඇගයීම් ක්ෂේත්‍රය සඳහා ලබා ගත් ලකුණු සහ ඊට අදාළ ප්‍රතිශත වෙනම නිරූපණය කර ඇත. අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද අධ්‍යාපන ගුණාත්මක තහවුරුව සඳහා වූ ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳ 31/2014 චක්‍රලේඛය අනුව එක් එක් ඇගයීම් ක්ෂේත්‍රය සඳහා ලකුණු 60%ට වැඩි ප්‍රතිශතයක් ලබා ගෙන ඇත් නම් "හොඳයි " යන මට්ටමට ළඟා වී ඇති බව සඳහන් කර ඇත.

ඒ අනුව මෙම අධ්‍යයනයේ දී එක් එක් නිර්ණායකය සඳහා 60% වැඩි ලකුණු ලබා ගත් පාසල් පමණක් "හොඳයි" මට්ටමට ලඟා වී ඇති බව උපකල්පනය කරමින් මෙම දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී.

ඒ අනුව එක් එක් නිර්ණායකය සඳහා 60%ට වැඩි ලකුණු ලබා ගත් පාසල් පහත වගු අංක 02හි දක්වා ඇත.

වගුව 2 - තෝරා ගත් නිර්ණායක සඳහා 60%ට වැඩි ලකුණු ලබා ගත් පාසල් නිරූපණය

| පාසල | සැලසුම් සකස් කිරීම | කාලසටහන ක්‍රියාත්මක කිරීම | මූල්‍ය කළමනාකරණය | ඇගයීම් ක්‍රියාත්මක කිරීම | විනය පවත්වා ගැනීම |
|---|---|---|---|---|---|
| A | 83 | 83 | 83 | 67 | 83 |
| B | 63 | 50 | 33 | 38 | 67 |
| C | 40 | 58 | 67 | 54 | 67 |
| D | 43 | 50 | 63 | 50 | 75 |
| E | 33 | 50 | 38 | 33 | 42 |
| F | 40 | 42 | 46 | 42 | 67 |
| G | 60 | 67 | 83 | 54 | 67 |
| H | 47 | 58 | 42 | 63 | 83 |
| I | 67 | 50 | 54 | 21 | 67 |
| J | 33 | 42 | 58 | 25 | 50 |
| K | 73 | 67 | 79 | 58 | 58 |
| L | 53 | 50 | 54 | 50 | 58 |




රූපය 1 - නායකත්වය සහ කළමනාකරණය ඇගයීම් ක්ෂේත්‍රයේ තෝරා ගත් නිර්ණායක සඳහා පාසල් ලබා ගත් ලකුණු ප්‍රතිශත

ඉහත ප්‍රස්ථාරය අනුව පාසල් ඇතැම් නිර්ණායක සඳහා 60% ට වැඩි ලකුණු ලබා ගෙන තිබුන ද ඇතැම් නිර්ණායක සඳහා 60%ට අඩු ලකුණු ප්‍රමාණයක් ලබා ගෙන ඇති බව පෙනේ.

## 3.3 දත්ත විශ්ලේෂණය කිරීම

1. විදුහල්පතිගේ සේවා කාලය නායකත්වය හා කළමනාකරණය ඇගයීම් ක්ෂේත්‍රයේ තෝරා ගත් නිර්ණායක සඳහා බලපාන ආකාරය විශ්ලේෂණය කිරීම

වගුව 03 - විදුහල්පතිගේ සේවා කාලය සමඟ එක් එක් නිර්ණායකය දක්වන සම්බන්ධතාව

| | සැලසුම් සකස් කිරීම | කාලසටහන ක්‍රියාත්මක කිරීම | මූල්‍ය කළමනාකරණය | ඇගයීම් ක්‍රියාත්මක කිරීම | විනය පවත්වා ගැනීම |
|---|---|---|---|---|---|
| සහසම්බන්ධතා සංගුණකය | 0.0762031 | 0.094799 | -0.08697 | 0.377563 | 0.467658 |
| සහසම්බන්ධතාවය | නැත | නැත | නැත | ධන සම්බන්ධතාවයක් ඇත | ධන සම්බන්ධතාවයක් ඇත |

එක් එක් නිර්ණායකය සඳහා ලබා ගත් ලකුණු ප්‍රතිශත සහ විදුහල්පතිගේ සේවා කාලය අතර සහ සම්බන්ධතා සංගුණකය (correlation coefficient) ගණනය කිරීමේ දී ඇගයීම් ක්‍රියාත්මක කිරීම සහ විනය පවත්වාගෙන යාම යන නිර්ණායක සඳහා පමණක් ධන සහ සම්බන්ධතාවයක් පවතී. එනම් විදුහල්පතිගේ සේවා කාලය වැඩි වීමත් සමඟ එම නිර්ණායක සඳහා ලබා ගන්නා ලකුණු ද වැඩි වන අතර සේවා කාලය අඩු වන විට එම නිර්ණායක සඳහා ලබා ගන්නා ලකුණු ද අඩු වේ.

2. විදුහල්පතිගේ ස්ත්‍රී පුරුෂභාවය නායකත්වය හා කළමනාකරණය ඇගයීම් ක්ෂේත්‍රයේ තෝරා ගත් නිර්ණායක සඳහා බලපාන ආකාරය විශ්ලේෂණය කිරීම

ස්ත්‍රී විදුහල්පතිවරුන් අතරින් එක් එක් නිර්ණායකය සඳහා 60%ට වැඩියෙන් ලකුණු ලබා ගත් ප්‍රතිශතය සහ පිරිමි විදුහල්පතිවරුන් අතරින් එක් එක් නිර්ණායකය සඳහා 60%ට වඩා වැඩියෙන් ලකුණු ලබා ගත් ප්‍රතිශතය පහත දැක්වේ.

වගුව 4 - එක් එක් නිර්ණායකය සඳහා ලකුණු 60%ට වැඩියෙන් ලබා ගත් ස්ත්‍රී විදුහල්පතිවරුන් සහ පිරිමි විදුහල්පතිවරුන්ගේ ප්‍රතිශත

| | සැලසුම් සකස් කිරීම | කාලසටහන ක්‍රියාත්මක කිරීම | මූල්‍ය කළමනාකරණය | ඇගයීම් ක්‍රියාත්මක කිරීම | විනය පවත්වා ගැනීම |
|---|---|---|---|---|---|
| ස්ත්‍රී | 75 % | 50% | 75% | 25% | 75% |
| පුරුෂ | 25% | 12.5% | 25% | 12.5% | 62.5% |

වගු අංක 04 හි දත්ත විශ්ලේෂණය කිරීමේ දී ස්ත්‍රී විදුහල්පතිවරුන් සිටින පාසල්වල සැලසුම් සකස් කිරීම, කාල සටහන ක්‍රියාත්මක කිරීම,මූල්‍ය කළමනාකරණය සහ විනය පවත්වා ගැනීම යන නිර්ණායක සඳහා 60%ට වැඩියෙන් ලකුණු ලබා ගැනීමේ ප්‍රවණතාවය සාපේක්ෂව ඉහල මට්ටමක පවතී. එමෙන්ම ඇගයීම් ක්‍රියාත්මක කිරීම යන නිර්ණායකය සඳහා ස්ත්‍රී විදුහල්පතිවරුන් පිරිමි විදුහල්පතිවරුන්ට සාපේක්ෂව ඉහළ ලකුණු ලබා ගෙන තිබුන ද ස්ත්‍රී සහ පිරිමි විදුහල්පතිවරු දෙපිරිසම ඒ සඳහා දක්වන ප්‍රවීණතාවය පහළ මට්ටමක පවතී.

3. විදුහල්පති අයත්වන සේවාව නායකත්වය හා කළමනාකරණය ඇගයීම් ක්ෂේත්‍රයේ තෝරා ගත් නිර්ණායක සඳහා බලපාන ආකාරය විශ්ලේෂණය කිරීම

වගුව 05 - එක් එක් නිර්ණායක සඳහා 60%ට වැඩියෙන් ලකුණු ලබා ගත් පාසල්වල සිටින ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයෙහි සහ ශ්‍රී ලංකා විදුහල්පති සේවයෙහි විදුහල්පතිවරුන් ප්‍රතිශත

| | සැලසුම් සකස් කිරීම | කාලසටහන ක්‍රියාත්මක කිරීම | මූල්‍ය කළමනාකරණය | ඇගයීම් ක්‍රියාත්මක කිරීම | විනය පවත්වා ගැනීම |
|---|---|---|---|---|---|
| ලකුණු 60 % ට වඩා වැඩියෙන් ලබා ගත් පාසල් ප්‍රතිශතය | 42 | 25 | 42 | 17 | 67 |
| ශ්‍රී ලංකා අ.ප.සේ. විදුහල්පතිවරුන් සිටින පාසල් ප්‍රතිශතය | 40 | 67 | 40 | 100 | 38 |
| ශ්‍රී ලංකා .වි.සේ. විදුහල්පතිවරුන් සිටින පාසල් ප්‍රතිශතය | 60 | 33 | 60 | _ | 62 |

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ විදුහල්පතිවරුන් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විදුහල්පතිවරුන්ට සාපේක්ෂව පාසලේ සැලසුම් සකස් කිරීමේ කාර්යය සඳහා වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගෙන ඇති බව දත්ත විශ්ලේෂණය අනුව පෙනී යයි. තවද කාල සටහන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා වැඩි දක්ෂතාවයක් දක්වා ඇත්තේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විදුහල්පතිවරුන් බව පෙනේ. මූල්‍ය කළමනාකරණය කාර්යය සඳහා වැඩි ලකුණු ප්‍රමාණයක් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ විදුහල්පතිවරුන් විසින් ලබා ගෙන ඇත. ඇගයීම් ක්‍රියාත්මක කිරීම යන නිර්ණායකය සඳහා ලකුණු 60%ට වැඩියෙන් ලබා ගත් පාසල් සංඛ්‍යාව සාපේක්ෂව අඩු අගයක් ගෙන ඇති අතර ඒ අනුව කුමන සේවාවේ විදුහල්පතිවරයෙකු වුවත් ඒ පිලිබඳ පවතින දැනුවත්භාවය පහළ මට්ටමක පවතින බව පෙනේ. එම නිර්ණායකය සඳහා ලකුණු 60%ට වඩා වැඩියෙන් ලබා ගත් පාසල් සියල්ලෙහි ම විදුහල්පතිවරුන් සියලු දෙනාම ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට අයත් වී ඇත. විනය පවත්වා ගෙන යාම යන නිර්ණායකය සඳහා ලකුණු 60%ට වැඩියෙන් ලබා ගත් පාසල් සංඛ්‍යාව සාපේක්ෂව වැඩි අගයක් ගෙන ඇති අතර ඒ අතරින් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ විදුහල්පතිවරුන් වැඩි ප්‍රමාණයක් ඉහළ ලකුණු ලබා ගැනීමට සමත්වී ඇති බව දත්ත විශ්ලේෂණය අනුව පෙනී යයි.

4. පාසලේ පිහිටීම නායකත්වය හා කළමනාකරණය ඇගයීම් ක්ෂේත්‍රයේ තෝරා ගත් නිර්ණායක සඳහා බලපාන ආකාරය විශ්ලේෂණය කිරීම

වගුව 06 - එක් එක් නිර්ණායක සඳහා 60%ට වැඩියෙන් ලකුණු ලබා ගත් පාසල්වල පිහිටීම ප්‍රතිශතයක් ලෙස දැක්වීම

| | සැලසුම් සකස් කිරීම | කාලසටහන ක්‍රියාත්මක කිරීම | මූල්‍ය කළමනාකරණය | ඇගයීම් ක්‍රියාත්මක කිරීම | විනය පවත්වා ගැනීම |
|---|---|---|---|---|---|
| ලකුණු 60%ට වඩා වැඩියෙන් ලබා ගත් පාසල් ප්‍රතිශතය | 42 | 25 | 42 | 17 | 67 |
| ග්‍රාමීය පාසල් ප්‍රතිශතය | 40 | __ | _ | 50 | 37 |
| ග්‍රාමීය පාසල් ප්‍රතිශතය | 60 | 100 | 100 | 50 | 63 |

ඉහත දත්ත විශ්ලේෂණය කිරීමේ දී සැලසුම් සකස් කිරීමේ කාර්යය සඳහා නාගරිකව පිහිටා ඇති පාසල් ග්‍රාමීයව පිහිටා ඇති පාසල්වලට සාපේක්ෂව ඉහල ලකුණු ලබා ගැනීමට සමත්වී ඇත. කාල සටහන ක්‍රියාත්මක කිරීම සහ පාසලේ මූල්‍ය කළමනාකරණය යන කාර්යය සඳහා නාගරික පාසල් වැඩි ලකුණු ලබා ගෙන ඇත. කුමන ස්ථානයක පිහිටි පාසලක් වුව ද අභ්‍යන්තර ඇගයීම් ක්‍රියාත්මක කිරීම යන නිර්ණායකය සඳහා ඉහළ ලකුණු ලබා ගැනීමේ ප්‍රවණතාවය අඩු මට්ටමක පවතින බව පෙනේ. තවද ග්‍රාමීය සහ නාගරික බව අනුව එම නිර්ණායකය සඳහා ලකුණු ලබා ගැනීමේ වෙනසක් සිදු වී නොමැති බව ඉහත දත්ත විශ්ලේෂණය අනුව පෙනී යයි. පාසලේ පිහිටීම කවරක් වුවත් අනෙකුත් නිර්ණායකවලට සාපේක්ෂව විනය පවත්වාගෙන යාම යන නිර්ණායකය සඳහා බොහෝ පාසල් ඉහළ ලකුණු ලබා ගැනීමට සමත් වී ඇති බව පෙනේ. එම නිර්ණායකය සඳහා නාගරික පාසල් ග්‍රාමීය පාසල්වලට සාපේක්ෂව වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමට සමත් වී ඇත.

## 4. නිගමන

1. අභ්‍යන්තර ඇගයීම් ක්‍රියාත්මක කිරීම සහ විනය පවත්වාගෙන යාම යන නිර්ණායක සඳහා විදුහල්පතිගේ සේවා කාලය ධන සහසම්බන්ධතාවයක් දක්වන බැවින් එම නිර්ණායක සඳහා විදුහල්පතිගේ සේවා කාලය බලපාන අතර අනෙකුත් නිර්ණායකවල විචලනයන් කෙරෙහි විදුහල්පතිගේ සේවා කාලය බලපෑමක් නොදක්වයි.

2. විදුහල්පතිගේ ස්ත්‍රී පුරුෂ භාවය, විදුහල්පති අයත්වන සේවාව සහ පාසලේ පිහිටීම කුමක් වුව ද ඇගයීම් ක්‍රියාත්මක කිරීම යන නිර්ණායකය සඳහා ඉහළ ලකුණු ලබා ගැනීම කෙරෙහි විදුහල්පතිවරුන්ගේ දායකත්වය අඩු ය.

3. ස්ත්‍රී පුරුෂභාවය කුමක් වුව ද විනය පවත්වා ගෙන යාම යන නිර්ණායකය සඳහා විදුහල්පතිවරු ඉහළ දායකත්වයක් ලබා දී ඇත.

4. අභ්‍යන්තර ඇගයීම් ක්‍රියාත්මක කිරීම යන නිර්ණායකය සඳහා ලකුණු ලබා ගැනීමට පාසලේ පිහිටීම බලපෑමක් නොමැති අතර නාගරික පාසල් අනෙකුත් නිර්ණායක සඳහා ඉහළ ලකුණු ලබා ගැනීමට සමත් වී ඇත.

## 5. යෝජනා

1. අභ්‍යන්තර ඇගයීම් ක්‍රියාත්මක කිරීම පිළිබඳව විදුහල්පතිවරුන්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීමට උපාය මාර්ග ගැනීම

2. ග්‍රාමීය පාසල්වලට එක් එක් නිර්ණායක සඳහා ඉහළ ලකුණු ලබා ගැනීමට අවශ්‍ය මග පෙන්වීම සහ දායකත්වය සැපයීම

3. පාසල් සැලසුම්කරණය සම්බන්ධ විදුහල්පතිවරුන්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා පියවර ගැනීම

4. පාසල් බාහිර ඇගයීම්වලදී මූල්‍ය කළමනාකරණ කටයුතු සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කරමින් ඒ සම්බන්ධ ගැටලු විසඳා ගැනීම සඳහා පාසල්වලට අවශ්‍ය සහාය සැපයීම

5. බාහිර ඇගයීම් අනාවරණ අනුව නායකත්වය හා කළමනාකරණය ක්ෂේත්‍රයට අදාළව සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන විදුහල්පතිවරුන සඳහා ධාරිතා සංවර්ධන අවස්ථා සැපයීම

### අනාගත පර්යේෂණ සඳහා යොමු කිරීම්

1. නායකත්වය සහ කළමනාකරණය යන ඇගයීම් ක්ෂේත්‍රයේ සඳහන් මෙම අධ්‍යයනය සඳහා යොදා නොගත් අනෙකුත් නිර්ණායක සඳහා ද විදුහල්පතිගේ ස්ත්‍රී පුරුෂභාවය, සේවා කාලය, අයත්වන සේවාව සහ පාසලේ පිහිටීම යන සංරචකවල බලපෑම අධ්‍යයනය කිරීම

2. "අපේ පාසල කෙතරම් ගුණාත්මකද" යන ඇගයීම් මාර්ගෝපදේශයේ සඳහන් අනෙකුත් ඇගයීම් ක්ෂේත්‍රවලට විදුහල්පතිගේ ස්ත්‍රී පුරුෂභාවය, සේවා කාලය, අයත්වන සේවාව සහ පාසලේ පිහිටීම යන සංරචකවල බලපෑම අධ්‍යයනය කිරීම

3. මෙම අධ්‍යයනය සඳහා යොදා ගත් නායකත්වය සහ කළමනාකරණය යන ඇගයීම් ක්ෂේත්‍රයේ ඇතුළත් නිර්ණායක සඳහා විදුහල්පතිගේ වයස, පාසලේ ගුරු ශිෂ්‍ය අනුපාතය වැනි වෙනත් සංරචකවල බලපෑම ද අධ්‍යයනය කිරීම

**ආශ්‍රිත ග්‍රන්ථ**


අධ්‍යාපන අමාත්‍යාංශය (2014), *අපේ පාසල කොතරම් ගුණාත්මකද?.* රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

ගුණසේකර, ඩබ්. පී. (2011), *සාර්ථක ගුරුවරයෙකු හා ඵලදායී විදුහල්පතිවරයෙකු වීමට,* දීපානි ප්‍රකාශන, නුගේගොඩ

Chow, B. A. S. and Learning, O. (2013). *Merging Design Principles , Systemic Change and Leadership Thinking. TechTrends,* 57(5).

NEASSP Foundation. (2009), *Leadership Matters, What the Research Says About the Importance of Principal Leadership,* NEASP Publication.

OECD. (2013). *PISA 2012 results: What makes schools successful (Volume IV) resources,*

Oshagbemi, T. (2008). The impact of personal and organisational variables on the leadership styles of managers. *The International Journal of Human Resource Management,*

Suryosubroto, B. (2010). *Manajemen Pendidikan di Sekolah. Jakarta:* PT. Rineka Cipta

The Wallace Foundation (2009). *Improving School Leadership,* RAND Publication

The Wallace Foundation,(2009). *Wallace Launches Major State-District Initiative to Strengthen School Leadership* http://www.wallacefoundation.org/NewsRoom/PressRelease/Pages/1-8-02-DistrictState.aspx

# පාසල් අධ්‍යාපනයේ තත්ත්ව සහතික කිරීමේ ව්‍යවහර : සංසන්දනාත්මක විශ්ලේෂණය, ශ්‍රී ලංකාව සහ එංගලන්තය

එස්.එම්.එල්.කේ. සෙනෙවිරත්න ( MSc, PGDE,PGDEM, PGDICT)
අධ්‍යාපන අධ්‍යක්ෂ, කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය
*0718322914 / kumarisenevirathne@yahoo.com*

මහාචාර්ය ටී.එම්.එස්.එස්.කේ.යටිගම්මන
අධ්‍යාපන දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
*syatigammana@yahoo.com*

## සංක්ෂිප්තය

තත්ත්ව සහතික කිරීම (Quality Assurance) යනු නිශ්චිත අවශ්‍යතා මාලාවක් සපුරාලීම සඳහා නිෂ්පාදනයක් හෝ සේවාවක් සංවර්ධනය කරන්නේද යන්න සොයා බැලීම සඳහා වූ ක්‍රමානුකූල ක්‍රියාවලියකි. ශ්‍රී ලංකාවේ පාසල්වල තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාවලිය අභ්‍යන්තර හා බාහිර ඇගයීම් ඔස්සේ සිදුකරනු ලබයි. අභ්‍යන්තර ඇගයීම පාසල් මට්ටමින් සිදු කරන අතර, කලාප, පළාත් සහ අධ්‍යාපන අමාත්‍යාංශය බාහිර ඇගයීම් සඳහා නායකත්වය ලබා දෙයි. පාසල් පද්ධතිය සඳහා මෙම ඇගයීම් ක්‍රියාවලිය වසර ගණනාවක් සිට හඳුන්වා දී ඇතත් ඇගයීම් ක්‍රියාවලිය අපේක්ෂිත මට්ටමට තවම පැමිණ නැති බවට සාක්ෂි ඇත. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ, එංගලන්තයේ පාසල් පද්ධතිය තුළ ඇගයීම් සඳහා යොදා ගන්නා ව්‍යවහාර පිළිබඳ අත්දැකීම් ලබාගෙන ශ්‍රී ලංකාවේ පාසල්වල ඇගයීම් සම්බන්ධ පවතින ව්‍යවහාර වැඩි දියුණු කරන්නේ කෙසේද යන්න යෝජනා කිරීම ය. මෙම පර්යේෂණය සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කරන ලද විවිධ චක්‍රලේඛ, මාර්ගෝපදේශ සහ අත්පොත් භාවිතයට ගෙන ඇත. එමෙන් ම එංගලන්තයේ ඇගයීම් සම්බන්ධ අත්දැකීම් ලබා ගැනීම සඳහා විවිධ ආකාරයේ මාර්ගගත සම්පත් භාවිත කරන ලදී. දැනට පවතින ඇගයීම් මාර්ගෝපදේශය හඳුන්වා දීම ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ නව ඇගයීම් සංස්කෘතියක් ස්ථාපිත කිරීමේ සන්ධිස්ථානයක් බවට පත් ව ඇති බව මෙම අධ්‍යයනයෙන් අනාවරණය විය. මෙම අධ්‍යයනයෙන් එංගලන්ත පාසල් ඇගයීම් ක්‍රියාවලියෙහි විශිෂ්ට ව්‍යවහාර කිහිපයක් හඳුනා ගැනුණි. එංගලන්තයේ පාසල් ඇගයීම් ක්‍රියාවලිය තුළ පාසල්වල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා ප්‍රමාණවත් ව්‍යුහයන්, පද්ධති සහ ප්‍රතිපත්ති ඇත. එංගලන්තයේ අත්දැකීම් සලකා බැලීමෙන් මෙම අධ්‍යයනයෙන් නිර්දේශ කරනුයේ පාසල්වල ක්‍රියාකාරිත්වයේ මට්ටම් අනුව අවශ්‍යතා පදනම් කරගත් ඇගයීම් ක්‍රියාවලියක් පැවැත්වීම සඳහා උපායමාර්ගික සැලැස්මක් සකස් කළ යුතු බවයි. ඇගයීම් ක්‍රියාවලියේ විවිධ අදියරයන් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඒකාබද්ධ කිරීම අවශ්‍ය වේ. ඇගයීම්කරුවන්ගේ කාර්යසාධනය ඇගයීමේ ක්‍රමයක් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් හඳුන්වා දිය යුතුය. එමෙන් ම ඇගයීමෙන් පසු පාසල්වල ශක්තීන්, දුර්වලතා සහ නිර්දේශ පිළිබඳ පැහැදිලි කිරීම් සහිතව ඵලදායී, ප්‍රයෝජනවත් සහ ශක්තිමත් වාර්තාවක් යැවීම අත්‍යවශ්‍ය වේ. එමෙන් ම ඇගයීමෙන් යෝජනා කෙරෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතුය.

**මූඛ්‍ය පදඃ ඇගයීම් ක්‍රියාවලිය, පාසල්, අභ්‍යන්තර ඇගයීම, බාහිර ඇගයීම**

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකා රජය පාසල් අධ්‍යාපනයේ භෞතික හා මානව සම්පත් සඳහා විශාල ආයෝජනයක් සිදු කරනු ලබන අතර මෙම ආයෝජනයන් ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීම සහතික කිරීම සඳහා ක්‍රමවේදයක් අවශ්‍ය වේ. පාසල් ඇගයීම් ක්‍රියාවලිය අඛණ්ඩව හා සංවිධානාත්මකව ක්‍රියාත්මක කිරීම තුළින් මෙම අරමුණු වඩාත් හොඳින් සාක්ෂාත් කර ගත හැකි වේ.

මෑත වසරවල දී සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් විසින් පාසල් පද්ධතියේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා පාසල් ඇගයීම් ක්‍රියාවලිය පුළුල් කිරීමට විවිධ පියවර ගෙන ඇත (European Commission, 2015). මෙහි දී පාසැල්වල ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා සිසුන්ගේ ජයග්‍රහණ, නායකත්වයේ ගුණාත්මකභාවය, පාසලේ කළමනාකරණය, ඉගැන්වීමේ ගුණාත්මකභාවය, සිසුන්ගේ තෘප්තිය වැනි විවිධ අංශ කෙරෙහි අවධානය යොමු කර ඇත. (European Commission, 2018; Olibie, Ofojebe & Ezusoh, 2015).

ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විවිධ යාන්ත්‍රණ භාවිත කොට ඇත. 2014 සිට නව ඇගයීම් ක්‍රමවේදයක් පාසල් පද්ධතියට හඳුන්වා දී ඇති අතර එය අභ්‍යන්තර හා බාහිර ඇගයීම් ක්‍රියාවලියකින් සමන්විත වේ. ශ්‍රී ලංකාවේ පාසල්වල අභ්‍යන්තර ඇගයීම පාසල් කළමනාකරණ කමිටු විසින් ස්වයං ඇගයීම් ආකාරයෙන් සිදු කරන අතර පාසල්වල ශක්තීන් හා දුර්වලතා කලාපීය, පළාත් හෝ ජාතික මට්ටමේ කණ්ඩායම් විසින් බාහිර ඇගයීම් මගින් හඳුනා ගනී (අධ්‍යාපන අමාත්‍යාංශය, 2014). මේ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිර්ණායක සහ දර්ශක ඇතුළත් මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ සකස් කර ඇත.

මෙවැනි ක්‍රමවේදයන් පාසල් පද්ධතියට හඳුන්වා දී තිබුන ද, පෙර අධ්‍යයනයන් සහ නිරීක්ෂණ මඟින් අභ්‍යන්තර හා බාහිර ඇගයීම් ක්‍රියාවලිය අපේක්ෂිත මට්ටමට ළඟා වී නැති බවට සාක්ෂි දක්නට ඇත. (සෙනවිරත්න, 2013; වීරසිංහ, 2013; පෙරේරා සහ හෙට්ටිආරච්චි, 2014), ඒ අනුව පහත සඳහන් ගැටලු හඳුනාගෙන ඇත.

(i) ප්‍රමාණවත් නීතිමය රාමුවක් නොපැවතීම

(ii) පාසලේ ගුණාත්මක සංවර්ධනයට වඩා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කිරීම

(iii) අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිලධාරීන්ට පැවරුණු නිශ්චිත විෂයයන්ට වැඩි අවධානයක් යොමු කළ යුතු බැවින් පාසල් ඇගයීම් ක්‍රියාවලිය සඳහා අඛණ්ඩව දායක වීමට අසමත් වීම.

(iv) අභ්‍යන්තර ඇගයීම් කිරීමට කාලය නොමැතිකම සහ පවතින ඇගයීම් ක්‍රියාවලිය තුළ වැඩිපුර කඩදාසිවල වැඩ කිරීමට සිදු වන බවට විදුහල්පතිවරු නිතරම පැමිණිලි කිරීම හා

(v) ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳ බොහෝ ගුරුවරුන් දැනුවත් නොවීම.

මේ අනුව පාසල් පද්ධතිය තුළ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා දැනට පවතින යාන්ත්‍රණය අපේක්ෂිත මට්ටමට ළඟා වී නැති බව අවබෝධ වී ඇත. එම නිසා පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක

බව ඉහළ නැංවීමට සහ මේ සම්බන්ධයෙන් සියලු පාර්ශවකරුවන්ගේ වගකීම සහ වගවීම ඇති කිරීම සඳහා වඩාත් විශ්වාසදායක විසඳුමක් සෙවීම අවශ්‍ය වේ. වෙනත් රටවල් තම අධ්‍යාපන ක්‍රමයේ ගුණාත්මකභාවය වර්ධනය කරන්නේ කෙසේදැයි සොයා බැලීම මේ සඳහා ඉතා වැදගත් වේ. එම නිසා මෙම අධ්‍යයනයන් එංගලන්තයේ පාසල් ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳ විමර්ෂණය කර ශ්‍රී ලංකාවේ පාසල්වල ක්‍රියාත්මක කරනු ලබන ඇගයීම් ක්‍රියාවලියෙහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා යෝජනා ලබා දීම මෙම අධ්‍යයනයෙන් අපේක්ෂා කෙරේ.

### 1.1 අධ්‍යයනයේ අරමුණ

මෙම අධ්‍යයනයෙන් ශ්‍රී ලංකාවේ සහ එංගලන්තයේ පාසල්වල ඇගයීම් ක්‍රියාවලියෙහි භාවිතයන් පිළිබඳ අධ්‍යයනය කර එමගින් ශ්‍රී ලංකාවේ පාසල් ඇගයීම් ක්‍රියාවලියට එංගලන්තයේ භාවිතයන් තුළින් ලබා ගත හැකි අත්දැකීම් මොනවාද යන්න පිළිබඳ විමර්ෂණයක් සිදු කිරීම ප්‍රධාන අරමුණ වේ. එම අරමුණට ළඟාවීම පිරිස පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

- ශ්‍රී ලංකාවේ පාසල් ඇගයීම් ක්‍රියාවලියෙහි භාවිතයන්, ක්‍රියාවලි සහ අත්දැකීම් මොනවාද?
- එංගලන්තයේ පාසල් ඇගයීම් ක්‍රියාවලියෙහි භාවිතයන්, ක්‍රියාවලි සහ අත්දැකීම් මොනවාද?
- එංගලන්තයේ පාසල් ඇගයීම් ක්‍රියාවලියෙහි භාවිතයන් තුළින් ශ්‍රී ලංකාවේ පාසල් ඇගයීම් ක්‍රියාවලිය සඳහා ලබා ගත හැකි අත්දැකීම් මොනවාද?

## 2. ක්‍රමවේදය

මෙම පර්යේෂණ සඳහා ලේඛන විශ්ලේෂණ ක්‍රමය අනුගමනය කරන ලදී. අධ්‍යාපනික පර්යේෂණ සඳහා වාර්තාමය තොරතුරු ලබා ගැනීම ඉතා වැදගත් වන අතර මෙම ක්‍රමයේ ඇති වාසි වනුයේ දත්තවලට පහසුවෙන් ප්‍රවේශ වීම, පිරිවැය අඩුවීම සහ දත්තවල ඵලදායිත්වය වැඩිවීමයි (Robson, 1993).

මෙම අධ්‍යයනයේ දී පාසල් ඇගයීම් ක්‍රියාවලියට සම්බන්ධ ප්‍රකාශයට පත් කර ඇති විවිධ ලේඛන පරීක්ෂා කරන ලදී. ලේඛන විශ්ලේෂණයේ පරමාර්ථය වූයේ පාසල් ඇගයීම් ක්‍රියාවලිය සඳහා ඇති ප්‍රතිපත්ති හා භාවිතාවන්ට අදාළ දත්ත රැස්කිරීමයි. ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කරන ලද විවිධ චක්‍රලේඛ, මාර්ගෝපදේශ සහ අත්පොත් විශ්ලේෂණය කරන ලදි. එංගලන්තයේ පාසල් ඇගයීම් සම්බන්ධ භාවිතයන් පිළිබඳ අත්දැකීම් ලබා ගැනීම සඳහා විවිධ ආකාරයේ මාර්ගගත සම්පත් භාවිත කරන ලදී.

එමගින් ශ්‍රී ලංකාවේ පාසල් ඇගයීම් ක්‍රියාවලියේ ආරම්භය, විකාශනය, ව්‍යුහය, ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ මඟපෙන්වීම, පාර්ශවකරුවන්ගේ කාර්යය සහ වගකීම් පිළිබඳ තොරතුරු ලබා ගැනීමට මෙම ලේඛන ඉතා වැදගත් විය. එමෙන් ම එංගලන්තයේ පාසල් ඇගයීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ දී භාවිත කරන උපාය මාර්ග පිළිබඳ මාර්ගගත මූලාශ්‍ර මගින් කරුණු අනාවරණය කර ගැනීමට හැකි විය.

# 3. විශ්ලේෂණය

## 3.1 ශ්‍රී ලංකා පාසල් පද්ධතියේ ඇගයීම් සම්බන්ධ ප්‍රතිපත්තීන්

දැනට පවතින ඇගයීම් ක්‍රියාවලිය "අපේ පාසල කොතරම් ගුණාත්මකද" මාර්ගෝපදේශය 2015 වර්ෂයේ දී අංක 31/2014 දරන චක්‍රලේඛය මගින් හඳුන්වා දී ඇත (අධ්‍යාපන අමාත්‍යාංශය, 2014). එම චක්‍රලේඛය මගින් පාසල්වල අභ්‍යන්තර හා බාහිර ඇගයීම් සිදු කිරීමේ ක්‍රියාවලිය පිළිබද විස්තර කෙරේ. මේ මගින් ඇගයීම් ක්‍රියාවලියේ යෙදවුම්, ක්‍රියාවලිය, ප්‍රතිඵල සහ පාසල්, කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල, කලාප අධ්‍යාපන කාර්යාල, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යයභාරය ඇතුළත් වේ.

සියලුම රජයේ පාසල්වල අභ්‍යන්තර හා බාහිර ඇගයීම් කිරීමේ දී මෙම මාර්ගෝපදේශය අනුගමනය කළ යුතු අතර මාර්ගෝපදේශය සකස් කිරීම සඳහා ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, විදුහල්පතිවරුන් සහ අධ්‍යාපන නිලධාරින් සහභාගී වූහ.

ඇගයීම් ක්‍රියාවලිය ප්‍රධාන වශයෙන් අභ්‍යන්තර ඇගයීම සහ බාහිර ඇගයීම් ලෙස ක්‍රම දෙකකට සිදුකෙරේ. අභ්‍යන්තර ඇගයීම් පාසල් තුළ පාසල් කළමනාකරණ කමිටු මඟින් සිදු කෙරෙන අතර එය ස්වයං ඇගයීම ලෙස හැඳින්වේ. බාහිර ඇගයීමේ දී කලාප, පළාත් සහ ජාතික මට්ටමේ කණ්ඩායම් විසින් පාසල් වල ශක්තීන් හා දුර්වලතා හඳුනා ගනු ලබයි.

## 3.2 එංගලන්ත පාසල් පද්ධතියේ ඇගයීම් සම්බන්ධ ප්‍රතිපත්තීන්

එංගලන්තයේ පාසල්වල ඇගයීම් ක්‍රියාත්මක කරනු ලබන්නේ Office for Standards in Education (Ofsted) ආයතනය මගිනි. 1992 දී පනතක් යටතේ Ofsted ආයතනය පිහිටුවන ලදී. මෙය පාසල්වල ඇගයීම් ක්‍රියාත්මක සඳහාම පිහිටුවන ලද ස්වාධීන ආයතනයකි (Wilcox, 2000; Hutchinson, 2016). Abreu (2016) දහන් කළ පරිදි, Ofsted ආයතනය සෘජුවම පාර්ලිමේන්තුවට වාර්තා කරන අමාත්‍යාංශයකට අයත් නොවන දෙපාර්තමේන්තුවකි.

Ofsted හි ප්‍රධාන අරමුණු වනුයේ (i) පාසලක් කෙතරම් හොඳින් ක්‍රියාත්මක වේද යන්න පිළිබඳව දෙමාපියන්ට තොරතුරු ලබා දීම, (ii) අධ්‍යාපන ලේකම්වරයාට සහ පාර්ලිමේන්තුවට පාසල්වල වැඩ කටයුතු පිළිබඳ තොරතුරු ලබා දීම, (iii) එක් එක් පාසල් වැඩි දියුණු කිරීම ප්‍රවර්ධනය කිරීම තුළින් සමස්ත අධ්‍යාපන ක්‍රමය වැඩි දියුණු කිරීම (Ofsted, 2013).

ඊට අමතරව Ofsted (2011, 4 පි.) සිය කාර්යයන් මෙසේ පැහැදිලි කර ඇත; (i) ඇගයීම් රාමුව සකස් කිරීම, (ii) ඇගයීම් වැඩසටහන් පැවැත්වීම, (iii) ප්‍රගතිය පරීක්ෂා කිරීම, (iv) ඉදිරි ක්‍රියාමාර්ග සඳහා ප්‍රමුඛතා නිර්දේශ කිරීම, (v) ස්වයං ඇගයීම සම්බන්ධ සංවාද පැවැත්වීම.

### 3.3 ශ්‍රී ලංකා පාසල් ඇගයීම් රාමුව

"අපේ පාසල කොතරම් ගුණාත්මක ද" ඇගයීම් මාර්ගෝපදේශය පාසලක සමස්ත ක්‍රියාකාරකම් පදනම් කරගත් තේමාවන් අටක් කෙරෙහි අවධානය යොමු කර ඇත. ශිෂ්‍ය සාධනය, ඉගෙනුම ඉගැන්වීම හා ඇගයීම, විධිමත් විෂයමාලා කළමනාකරණය, විෂය සමගාමී ක්‍රියාකාරකම්, සුභසාධනය, නායකත්වය හා කළමනාකරණය, භෞතික හා මානව සම්පත් කළමනාකරණය හා පාසැල හා ප්‍රජාව මෙම තේමා අට වේ. ශ්‍රී ලංකාවේ පාසල් ඇගයීමේ ක්‍රියාවලිය පහත පරිදි පියවර කිහිපයකින් සමන්විත වේ.

- **අදාළ පාර්ශවකරුවන් දැනුවත් කිරීම**

31/2014 චක්‍ර ලේඛයට අනුව පළමු පියවර වනුයේ පාසලේ ඇගයීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්නේ කෙසේද යන්න පිළිබඳව සියලුම කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමයි (අධ්‍යාපන අමාත්‍යාංශය, 2014).

- **ඇගයීම් කමිටු පිහිටුවීම**

ඇගයීමේ තේමාවන් 08 ට අදාළ කමිටු පිහිටුවීම අභ්‍යන්තර ඇගයීම් ක්‍රියාවලියේ ඊළඟ පියවරයි. සියලුම ගුරුවරුන් කමිටුවක් නියෝජනය කළ යුතු අතර කණ්ඩායමෙන් එක් අයෙකු ඇගයීම් තේමාවේ නායකයා ලෙස පත් කළ යුතුය (අධ්‍යාපන අමාත්‍යාංශය, 2014).

- **ඇගයීම් සැලැස්ම සකස් කිරීම**

අභ්‍යන්තර ඇගයීම් සැලැස්ම ඇගයීම් කමිටුව විසින් සකස් කළ යුතු අතර තේමා අටම ආවරණය වන පරිදි ඇගයීම් සැලැස්ම සකස් කළ යුතු වේ (අධ්‍යාපන අමාත්‍යාංශය, 2014). වසර ආරම්භයේ දී කලාප, පළාත් හා අමාත්‍යාංශය විසින් බාහිර ඇගයීම් සැලැස්ම සකස් කළ යුතුය.

- **ඇගයීම් වැඩසටහන් පැවැත්වීම**

ඇගයීම් මාර්ගෝපදේශයට අනුව, අභ්‍යන්තර හා බාහිර ඇගයීම්කරුවන් විසින් පෙර ඇගයීම් වැඩ-සටහන් වල සොයා ගැනීම් සලකා බැලිය යුතුය. චක්‍රලේඛයේ උපදෙස් පරිදි පාසලක වසරකට වරක්වත් අභ්‍යන්තර ඇගයීම් සිදු කළ යුතුය. ඇගයීමේ ක්‍රියාවලිය සාක්ෂි මත පදනම් විය යුතු අතර අදාළ ලියකියවිලි හෝ සාක්ෂි පරීක්ෂා කිරීම අවශ්‍ය වේ. ඊට අමතරව අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡා කිරීම අවශ්‍ය වේ. රැස් කරන ලද සාක්ෂි මත පදනම්ව, ඇගයීම්කරුවන් එක් එක් දර්ශකය සඳහා ලකුණු ප්‍රදානය කර පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය (SEQI) සකස් කළ යුතුය (අධ්‍යාපන අමාත්‍යාංශය, 2014).

- **ප්‍රගති සමාලෝචන පැවැත්වීම**

ඇගයීම් කණ්ඩායම සාමාන්‍යයෙන් ඇගයීම් වැඩසටහනෙන් පසු පාසලේ කාර්ය මණ්ඩලය සමඟ ප්‍රගති සමාලෝචන රැස්වීමක් පවත්වයි. මෙම ප්‍රගති සමාලෝචන රැස්වීමට සියලුම නිලධාරීන් සහභාගී විය යුතු අතර ඔවුන්ගේ සොයා ගැනීම් ඉදිරිපත් කළ යුතුය. ප්‍රගති සමාලෝචන රැස්වීම පාසල සහ ඇගයීම් කරුවන් අතර ඉතා වැදගත් සංවාදයක් බවත් එකිනෙකාගේ වගකීම අවබෝධ කර ගැනීමට එය අවස්ථා සලසා දෙන බවත් European Commission (2015) පැහැදිලි කරයි.

- **ඇගයීම් වාර්තාවක් සකස් කර යැවීම**

අභ්‍යන්තර හා බාහිර ඇගයීම්කරුවන් විසින් ඇගයීම් අනාවරණ මත පදනම්ව වාර්තාවක් සකස් කළ යුතු ය. බාහිර ඇගයීම් වැඩසටහනෙන් පසු සති දෙකක් ඇතුළත ඇගයීම් වාර්තාව පාසල වෙත යැවීම අවශ්‍ය වේ.

- **ප්‍රතිපෝෂණ වැඩසටහන් පැවැත්වීම**

පාසල්, කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල, කලාප අධ්‍යාපන කාර්යාල , පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු සහ අධ්‍යාපන අමාත්‍යාංශය වාර්තාවේ සඳහන් නිර්දේශයන්ට අනුකූලව ප්‍රතිපෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.

- **විශිෂ්ට ව්‍යවහාර හඳුනාගැනීම**

ඇගයීම් ක්‍රියාවලිය තුළින් පාසල්වල විශිෂ්ට ව්‍යවහාර හඳුනාගන්නා අතර එම විශිෂ්ට ව්‍යවහාර වාර්ෂිකව ඇගයීමට ලක් කෙරේ. තවද, ඇගයීම් ක්‍රියාවලිය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණ සිදු කිරීම අවශ්‍ය වේ.

- **ඇගයීම්කරුවන්**

අභ්‍යන්තර ඇගයීම්කරුවන් වශයෙන් පාසලේ විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පතිවරුන් සහ කාර්ය මණ්ඩලය සහභාගී වන අතර බාහිර ඇගයීම්කරුවන් වශයෙන් ගුරු උපදේශකවරුන් කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල, කලාප අධ්‍යාපන කාර්යාල, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු සහ අධ්‍යාපන අමාත්‍යාංශය ඇගයීම් වැඩසටහන් සඳහා සහභාගී වේ.

### 3.4 එංගලන්ත පාසල් පද්ධතියේ ඇගයීම් රාමුව

Ofsted විසින් පාසල් ඇගයිම සඳහා රාමුව සකස් කරන අතර Steel (2000) ; Abreu (2016); Ofsted (2019) ට අනුව එම රාමුවට, ඇතුළත් වනුයේ: සිසුන්ගේ ඉගෙනීම, විභාග හා විභාග ප්‍රතිඵල, පාසල් නායකත්වය හා කළමනාකරණය, සිසුන්ගේ ආකල්ප හා හැසිරීම්, සිසුන්ගේ රැකවරණය, දෙමාපියන් සමඟ සබඳතා, ඉගැන්වීමේ ගුණාත්මකභාවය යන කරුණුය. ඊට අමතරව, ඇගයීම් ක්‍රියාවලිය හඳුන්වා දීම, ඇගයිම් සිදු කරන කාල සීමාව, පරීක්ෂණ මූලධර්ම, ඇගයීම් කාලසටහන සහ නිර්ණායක මෙම රාමුවට ඇතුළත් ය. සියලුම ඇගයුම්කරුවන් ඇගයීම් රාමුවට අනුව කටයුතු කළ යුතුය. European Commission (2015) සඳහන් කළ පරිදි එංගලන්තයේ පාසල් මට්ටමේ වගවීම ප්‍රවර්ධනය කරමින් තමන්ගේම අභ්‍යන්තර ඇගයීම් රාමුවක් සකස් කර ගැනීමට පාසල් දිරිමත් කෙරේ.

එංගලන්තයේ පාසල් පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය බාහිර හා ස්වයං ඇගයීම් ලෙස ක්‍රම දෙකකින් සමන්විත වේ.

**ස්වයං ඇගයීම්**

ස්වයං ඇගයිම සිදු කරනු ලබන්නේ පාසලේ කාර්ය මණ්ඩලය විසිනි. ස්වයං ඇගයීමෙන් පසු

ඉදිරිපත් කළ යුතුය. මෙම ස්වයං ඇගයිම පාසලක් වැඩි දියුණු කිරීමේ සැලැස්මේ කොටසක් ලෙස ක්‍රියාත්මක කළ යුතු අතර ස්වයං ඇගයීම පාසල් සඳහා අතිරේක ක්‍රියාවලියක් ලෙස නොසලකනු ලබයි.

ඇගයීම් සඳහා දත්ත සාකච්ඡා, ප්‍රශ්නාවලීන් සහ අනෙකුත් අදාළ මූලාශ්‍ර වලින් තොරතුරු රැස් කරනු ලබයි. අනාවරණ මත පදනම්ව පාසල් ඔවුන්ගේ ශක්තීන් හා දුර්වලතා හඳුනා ගනී. Whitby (2010) ට අනුව පාසල් විසින් හඳුනාගත් අනාවරණ සහිත වාර්තාවක් අදාළ යෝජනා ද සහිතව Ofsted ආයතනයට ඉදිරිපත් කරනු ලබයි.

**බාහිර ඇගයීම්**

එංගලන්තයේ බාහිර ඇගයීම් ක්‍රියාවලිය Ofsted ආයතනය විසින් හසුරුවයි. Ofsted (2019) සඳහන් කරන පරිදි බාහිර ඇගයීමේ දී සාක්ෂි රාශියක් එකතු කිරීමෙන් පාසලේ වැඩිදියුණු කළ යුතු දේ හඳුනා ගනු බවයි. සෑම පාසලකම අධ්‍යාපනයේ ප්‍රමිතියක් සපුරාලන බවට මෙම ඇගයීම් මඟින් මහජනයාට සහ රජයට සහතික කරනු ලබයි.

Ofsted (2017) සඳහන් කළ පරිදි, බාහිර ඇගයීම්/ කෙටි ඇගයිම් හා පුළුල් ඇගයීම් ලෙස කොටස් දෙකකට බෙදේ. පාසලේ යම් විෂයයක් හෝ ක්‍රියාකාරකමක් පරීක්ෂා කිරීම සඳහා /කෙටි ඇගයිම් සිදුකරන අතර, පුළුල් පරීක්ෂණයක දී පාසලක සෑම අංශයක්ම ආවරණය කෙරේ. Wilcox (2000) පැහැදිලි කරන පරිදි එක් පරීක්ෂකවරයෙක් එක් දිනක් හෝ දින දෙකක් කෙටි ඇගයීම් සිදුකරන අතර සතියක් හෝ ඊට වැඩි කාලයක් කණ්ඩායමක් විසින් පුළුල් ඇගයීම් සිදුකරනු ලබයි. ඇගයීම් කණ්ඩායමේ ප්‍රමාණය, පාසලේ ප්‍රමාණය හා ස්වභාවය අනුව වෙනස් වේ. Steel (2000) පැහැදිලි කළ පරිදි, පසුගිය ඇගයීමෙන් පාසලට ධනාත්මක වාර්තාවක් තිබේ නම් සහ එහි ක්‍රියාකාරිත්වය වැඩි දියුණු වෙමින් පවතී නම් සහ විභාග ප්‍රතිඵල ඉහළ නම් කෙටි පරීක්ෂණයකට පාසල තෝරා ගනු ඇත. එංගලන්තයේ පාසල් ඇගයීම් ක්‍රියාවලිය අදියර 3ක් යටතේ සිදුකෙරේ. එනම් ඇගයීමට පෙර ක්‍රියාවලිය, ඇගයීම අතරතුර ක්‍රියාවලිය හා ඇගයීමෙන් පසු ක්‍රියාවලිය පහත පරිදි වේ.

**ඇගයිමට පෙර ක්‍රියාවලියේදී :-**

i) අවදානම් තක්සේරුවක් පැවැත්වීම

ii) එම තක්සේරු දත්ත ඇගයීම් ක්‍රියාවලිය සැලසුම් කිරීම

iii) වෙනත් මූලාශ්‍ර මගින් අදාල තොරතුරු රැස්කිරීම සිදුකරනු ලබයි

ඇගයීම් වැඩසටහන් සැලසුම් කිරිමේ දී පාසලේ මෑත කාලීන කාර්ය සාධනය සහ අවසාන ඇගයිමෙන් පසු සිදු වූ වෙනස්කම් පිළිබඳව සමාලෝචනයක් ලබා ගනියි. එමෙන්ම පෙර ඇගයීම් වාර්තාව දෙමාපියන්ගේ අදහස්, මෑත සමීක්ෂණයකින් සොයාගත් කරුණු, පැමිණිලි, පාසල් සඳහා නිකුත් කළ අනතුරු ඇඟවීම්, පාසැල් වෙබ් අඩවියේ තොරතුරු, සැලකිල්ලට ගනු ලැබේ.

සැලසුම් කිරිමේන් පසුව ඇගයීම් සිදු කරන දිනය Ofsted ආයතනය විසින් පාසල්වලට දැනුම් දෙයි. මෙම දැනුම් දීමේ ප්‍රධාන අරමුණ වන්නේ පාසල දැනුවත් කිරීම සහ ඇගයීමට අදාළ තොරතුරු රැස්කිරීම කාර්ය මණ්ඩලයෙහි පීඩනය අඩු කිරීමයි.

ඇගයීම් දිනට පෙර පරීක්ෂකවරුන් අවම වශයෙන් එක් වරක් හෝ පාසලට පූර්ව චාරිකාවක් සඳහා සහභාගී වේ. මෙම පූර්ව චාරිකාවේ ප්‍රධාන අරමුණු පහක් ඇතː i) ඇගයීම් කණ්ඩායම සහ පාසල අතර සබඳතාවක් ඇති කර ගැනීම, ii) පාසල ගැන අවබෝධයක් ලබා ගැනීම, iii) කුමන අංශ කෙරෙහි අවධානය යොමු කළ යුතුදැයි සලකා බැලීම iv) ඇගයීම් කරන ආකාරය පිළිබඳව කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම හා v) ඇගයීම් සඳහා අවශ්‍ය පසුබිම සකස් කර ගැනීම.

එපමණක් නොව, Wilcox (2000) ; Steel (2000) සඳහන් කරන පරිදි ඇගයීමට පෙර Ofsted ආයතනය විසින් දෙමාපියන්ගේ, සිසුන්ගේ, ආදී ශිෂ්‍යයින්ගේ සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ අදහස් එකතු කරනු ලබයි. දෙමව්පියන්ගෙන් තොරතුරු රැස් කිරීම සඳහා දෙමාපියන්ගේ අදහස් ලෙස Ofsted වෙබ් අඩවියේ පිටුවක් වෙන් කර ඇත. ඊට අමතරව, කෙටි පණිවුඩ සහ විද්‍යුත් තැපෑල වැනි ක්‍රම මගින් දෙමාපිය අදහස් ලබා ගනියි. මීට අමතරව, පාසල පිළිබඳ දෙමව්පියන්ගේ, පාසලේ කාර්ය මණ්ඩලයේ හා සිසුන්ගේ අදහස් ප්‍රශ්නාවලියක් මගින් තොරතුරු ලබාගනියි.

ඇගයිම් දිනයේ දී ඇගයීමට පෙර ප්‍රධාන පරීක්ෂකවරයා විසින් පාසලේ ජ්‍යෙෂ්ඨ කණ්ඩායම සමඟ රැස්වීමක් පවත්වනු ලබයි. එහි ප්‍රධාන අරමුණ වන්නේ පරීක්ෂකවරුන් හඳුන්වා දීම, පාසලේ ස්වයං ඇගයීම හෝ ඊට සමාන හා වෙනත් අදාළ කරුණු සාකච්ඡා කිරීම. රැස්වීම් මගින් කාර්ය මණ්ඩලය නොමැතිකම සහ වෙනත් ප්‍රායෝගික ගැටලු පිළිබඳ තොරතුරු රැස් කරන අතර නිරීක්ෂණ සඳහා යොදාගන්නා සාක්ෂි, ගුරුවරුන් හෝ ප්‍රදේශයක් නිරීක්ෂණය නොකිරීමට හේතු පිළිබඳ විස්තර කරයි.

Steel (2000) විසින් පැහැදිලි කළ පරිදි, ඇගයීමේ දී පරීක්ෂකවරුන් වැඩි කාලයක් ගත කරන්නේ විනිශ්චය සඳහා සාක්ෂි රැස් කිරීමට ය. ඔවුන් සිසුන්, ගුරුවරුන්, දෙමාපියන් සමඟ සාකච්ඡා කර පාසැලේ වාර්තා සහ ලිපි ලේඛන පරීක්ෂා කරමින් සාක්ෂි එකතු කරති. ඇගයීම් අනාවරණ මත පදනම්ව පරීක්ෂකවරුන් කණ්ඩායම් වශයෙන් ප්‍රතිචාර ලබා දෙන අතර වෘත්තීය සංවර්ධන වැඩ සටහන් සකස් කිරීම ගැන සාකච්ඡා කරති.

Ofsted (2019) සඳහන් කරන පරිදි පරීක්ෂකවරුන් විසින් සියලුම ගුරුවරුන් ඇගයීමට ලක් නොකරයි. අංශ ප්‍රධානින්, විෂය ප්‍රධානීන්, ගුරුවරුන් සහ සිසුන් සමඟ සාකච්ඡා කර යම් යම් විනිශ්චයන්ට එළඹෙයි.

Ofsted (2017) පැහැදිලි කරන පරිදි ඇගයිමෙන් පසු ප්‍රධාන පරීක්ෂකවරයා සවිස්තර වාර්තාවක් සකස් කර වාර්තාව ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරයි. වාර්තාවේ තීන්දු පැහැදිලි කරන අතර සාක්ෂි පිළිබිඹු කරයි. Ofsted වෙබ් අඩවියේ අවසාන වාර්තාව ප්‍රකාශයට පත් කරන අතර අදාළ

පාසලට ද අවසාන වාර්තාවේ ඉලෙක්ට්‍රෝනික පිටපතක් ලැබේ. පරීක්ෂණ කණ්ඩායම විසින් ඉදිරිපත් කරනු ලබන අදහසක් සමග එකග නොවන්නේ නම් පාසල්වලට පැමිණිලි කළ හැකිය. වාර්තාවේ අන්තර්ගතයේ නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට පාසල්වලට ඉඩ ලබා දේ. ඒ සඳහා, පැමිණිලි කළ යුතු ආකාරය පිළිබඳව දැනුම් දීමේ පැමිණිලි පටිපාටියක් Ofsted විසින් හඳුන්වා දී ඇත.

එපමණක් නොව, පරීක්ෂකවරුන් සිය පළමු ඇගයීමෙන් වසර දෙකකට පමණ පසු බරපතල දුර්වලතා ඇති සියලුම පාසල් පරීක්ෂා කරති. පාසල ප්‍රමාණවත් ප්‍රගතියක් ලබා නොමැති නම් එම පාසල් සඳහා විශේෂ ක්‍රියාමාර්ග ගනු ලබයි. එම පාසල්වල තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පාසල් වැඩි දියුණු කිරීම් වලට අදාළ මුදල් ප්‍රදානය ලැබේ. මෙම පාසල්වලට නොකඩවා සංචාරය කිරීම, පසු විපරම් කටයුතු සංවිධානය කිරීම සහ බරපතල දුර්වලතා ඇති පාසල් සඳහා වැඩිදුර පරීක්ෂා කිරීම සිදුකරනු ලබයි. Ofsted විසින් විශේෂයෙන් එම පාසල්වල නායකයින් සඳහා පුහුණු පාඨමාලාවක් සකස් කර ඇත ( Steel, 2000; Wilcox, 2000). නිර්දේශ ලැබීමෙන් පසු ඒ සඳහා ප්‍රමුඛතාවය දිය යුතු අතර පාසල් සංවර්ධන සැලැස්මට ඇතුළත් කළ යුතුය. පාසැල් වෙත ලබා දුන් නිර්දේශ පාසල් විසින් ක්‍රියාත්මක කරන්නේද යන්න පිළිබඳව පසු විපරම් කිරීම පරීක්ෂකවරුන්ගේ වගකීම වේ. නිර්දේශ ක්‍රියාත්මක කෙරෙනවාද නැද්ද යන්න දැන ගැනීම සඳහා ඔවුහු පසුව පැමිණ පසු විපරමක් සිදු කරති. සමහර විට පරීක්ෂකවරු නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන්ගේ උපදෙස් හා සහයෝගය ලබා දෙති.

යම් පාසලක් පරීක්ෂා කිරීමේ වාර ගණන රඳා පවතින්නේ පාසලක පෙර පරීක්ෂණ ශ්‍රේණිගත කිරීම මත ය. පරීක්ෂණ වාර ගණන තීරණය වන්නේ පාසල්වල කාර්යසාධනය සහ තත්වයන් අනුව ය. පෙර පරීක්ෂණයේ දී පාසලක් හොඳ යැයි තීන්දු කළ හොත් සාමාන්‍යයෙන් පාසලට එක් දින කෙටි පරීක්ෂණයක් සිදුකරනු ලබයි. විනය පිළිබඳ ගැටලුවක් පැමිණි විට හෝ පැමිණිලි ලැබුන විට සහ යම් සැලකිල්ලක් දැක්වීමට අවශ්‍ය විටක පාසලේ පරීක්ෂණය ඉදිරියට ගෙන එනු ලබයි. පාසැල්වලට අතිරේක පරීක්ෂණයක් සඳහා පාසල් පාලක මණ්ඩලය හරහා Ofsted වෙතින් ඉල්ලීමක් කළ හැකිය. එවැනි ඉල්ලීමක් කරන විට පාසලේ පාලක මණ්ඩලය විසින් පරීක්ෂණ පිරිවැය ගෙවිය යුතුය.

එංගලන්තයේ ස්වාධීන කණ්ඩායම් විසින් පාසල් පරීක්ෂණය සිදු කරන අතර ඔවුන් පරීක්ෂකවරුන් ලෙස හැඳින්වේ. ඇගයුම්කරුවකු වීමට ගුරුවරයෙකු ලෙස අත්දැකීම් අනිවාර්ය වේ. කොන්ත්‍රාත් පදනම මත Ofsted විසින් පරීක්ෂකවරුන් පත් කර ඇත. සියලුම පරීක්ෂකවරුන් පුහුණු කරනු ලබන්නේ Ofsted ආයතනය හෝ Ofsted ආයතනයේ අනුමත පුහුණුකරුවන් විසිනි.

පරීක්ෂා කරන විෂයයන් හෝ අධ්‍යාපනයේ සෑම අංශයක්ම පිළිබඳව පරීක්ෂකවරුන්ට පළපුරුද්දක් තිබිය යුතුය (ස්ටීල්, 2000). සියලුම පරීක්ෂකවරුන්ගේ වැඩවල ගුණාත්මකභාවය පිළිබඳ Ofsted ආයතනය සොයා බලයි. සෑම පරීක්ෂණ කණ්ඩායමක් සඳහාම එක් පරීක්ෂකවරයෙක් "ප්‍රධාන පරීක්ෂක" ලෙස පත් කෙරේ. පරීක්ෂණ මූලධර්ම හා ආචාර ධර්ම පද්ධතියට අනුකූලව පරීක්ෂණ සිදු කරන බවට ප්‍රධාන පරීක්ෂකවරයා සහතික විය යුතුය. මෙම පරීක්ෂකවරුන්ගෙන් 70%ක්ම ගුරුවරුන් සහ පාසල් නායකයින් ය.

## 4. අනාවරණ

### 4.1. ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහතික කිරීමේ භාවිතයන්, ක්‍රියාවලි සහ අත්දැකීම් මොනවාද?

ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහතික කිරීමේ ක්‍රියාවලිය අංක 31/2014 චක්‍රලේඛය සහ "අපේ පාසල කොතරම් ගුණාත්මක ද?" යන මාර්ගෝපදේශය යටතේ 2015 වර්ෂයේ දී හඳුන්වා දී ඇත. එම මාර්ගෝපදේශ අනුගමනය කරමින් අභ්‍යන්තර හා බාහිර ඇගයීම් වැඩසටහන් ක්‍රියාත්මක වේ.

දැනට පවතින ඇගයීම් මාර්ගෝපදේශය අනුව ශ්‍රී ලංකාවේ පාසල් ඇගයීමේ ක්‍රියාවලියට පියවර කිහිපයක් ඇත. ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳව 'සියළුම පාර්ශවකරුවන් දැනුවත් කිරීම' පළමු පියවරයි. මෙම දැනුවත් කිරීම ඉතාමත් වැදගත් වන අතර වර්තමාන හා පූර්ව පර්යේෂණවල සොයාගැනීම් මගින් අදාළ පාර්ශවකරුවන්ට නිසි අවබෝධය සහ පුහුණුව තිබේ නම් ඔවුන්ට අවශ්‍ය කාර්යයන් නිසි පරිදි නියුක්ත කළ හැකි බවට සාක්ෂි සපයයි (Geda, 2014). Hessen - Talib (2013) හඳුන්වා දී ඇත්තේ අදාළ පාර්ශවකරුවන් නිසි ලෙස පුහුණු කළ විට ඔවුන් කරන්නේ කුමක්ද යන්න සහ ඔවුන් එය කරන්නේ ඇයිද යන්න අවබෝධ වන බව යි.

සෑම පාසලකම 'අභ්‍යන්තර ඇගයීම් කමිටු පිහිටුවීම ' ශ්‍රී ලංකාවේ පාසල් ඇගයීමේ ක්‍රියාවලියේ දෙවන පියවරයි. Kalule and Bouchamma (2013) පෞද්ගලික උත්සාහයට වඩා සහයෝගීතාවයෙන් සම්බන්ධ වීමේ වාසි ගැන සඳහන් කරයි . ඔවුන් අවධාරණය කරන්නේ සෙසු කාර්ය මණ්ඩලය සඳහා වගකීම පැවරෙන්නේ නම්, එය සහයෝගී කළමනාකරණයක්, පුද්ගල කාර්ය සාධනයක් ඇති කරන අතර සියලුම කාර්ය මණ්ඩලය මෙම ක්‍රියාවලියේ මාර්ගෝපදේශ හා අවශ්‍යතා පිළිබඳව හුරුපුරුදු විය යුතු බවයි. Alam (2015) පැහැදිලි කරන පරිදි, ඇගයීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම පාසල් කළමණාකරුවන්ගේ වගකීමක් වුවද, සහභාගී වීමේ ප්‍රවේශයක් අනුගමනය කරමින් එය පාසලක අනෙකුත් කාර්ය මණ්ඩලය සමඟ බෙදා ගත යුතු බව පැහැදිලි කරයි. Kalule and Bouchamma (2013) තවදුරටත් කණ්ඩායමක් වශයෙන් සහයෝගයෙන් ඕනෑම ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීමේදී ඒකාධිපති හැසිරීම පාලනය කිරීමට එය උපකාරී වන බව හෙළි කරති.

තවද, පාසල් ඇගයීමේ ක්‍රියාවලියේ ප්‍රධාන අංශය වනුයේ ඇගයීම් ක්‍රියාවලිය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමයි. ඇගයීම් වැඩසටහන සැලසුම් කිරීම ඉතා වැදගත් වන අතර එමගින් ඇගයීම්කරුවන්ට සහ පාසල්වලට පහසුකම් සැලසේ. Kalule සහ Bouchamma (2013) ඉස්මතු කරන පරිදි පාසැලකට සැලැස්මක් නොමැතිව සහ පූර්ව දැනුම් දීමකින් තොරව ඇගයීම සිදු කිරීමේ දී එය ඇගයීමේ සංකල්පයට අභියෝග කළ හැකි අතර එය වෘත්තීය දියුණුවට ආධාරකයක් ලෙස නොව ඇගයීමට පමණක් සීමා වූ සාම්ප්‍රදායික ක්‍රමයක් විය හැකි බවයි.

අභ්‍යන්තර හා බාහිර ඇගයීම් වැඩසටහන් අවසන් කිරීමෙන් පසු පාසලේ කාර්ය මණ්ඩලය සමඟ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම  අවශ්‍ය වන අතර ඇගයීම් වැඩසටහනේ සොයා ගැනීම් ඉදිරිපත් කිරීම ඉතා වැදගත් කාරණයකි. ප්‍රගති සමාලෝචන රැස්වීම්වල සංවාදය එකිනෙකාගේ වගකීම් අවබෝධ කර ගැනීමට අවස්ථා ලබා දීම සඳහා ඉතා වැදගත් බව යුරෝපා කොමිසම (2015) සඳහන් කරයි.

ඇගයිම් වාර්තාව සකස් කිරීම හා ඇගයීම වාර්තාව සන්නිවේදනය පාසලක ඉදිරි කටයුතු සඳහා හොඳ මගපෙන්වීමක් ලෙස හඳුනාගෙන ඇති අතර ඇගයීම් වාර්තාව පාසැල් දියුණුවේ එක් අපේක්ෂාවක් ලෙස (Gustafasson, et al,2015) දක්වයි.

දැනට පවතින ඇගයීම් ක්‍රියාවලියේ අවසාන පියවර වන්නේ  සොයා ගැනීම් හා නිර්දේශ මත පදනම්ව ප්‍රතිපෝෂණ වැඩසටහන් පැවැත්වීමයි.  මෙය වැදගත් වනුයේ සොයා ගන්නා අඩුපාඩු සඳහා විසඳුම් ලබාදීමට අවශ්‍ය කටයුතු කිරීමයි. Reddy et.al (2017) දක්වන පරිදි ඇගයීමේ ක්‍රියාවලියේ දී ඇගයීමේ ප්‍රතිපෝෂණය වඩාත් උපකාරී වන අංශය බව සඳහන් කරන අතර එය ඉහළ මට්ටමේ නිළධාරීන් වැඩි අවධානයක් යොමු කලයුතු බව දන්වයි.

### 4.2 එංගලන්තයේ පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහතික කිරීමේ භාවිතයන්, ක්‍රියාවලි සහ අත්දැකීම් මොනවාද?

එංගලන්තයේ පාසල් පරීක්ෂණ ක්‍රියාවලිය ස්වාධීන ආයතනයක් විසින් හසුරුවන අතර එය පනතක් මඟින් ස්ථාපිත කර ඇත . ඊට අමතරව, Ofsted ආයතනය පාර්ලිමේන්තුවට සෘජුවම වගකිව යුතුය. සංවිධානය වූ පාසල් පරීක්ෂණ රාමුවක් එංගලන්තයේ ඇත. පාසල් කළමනාකරණය සහ පරිපාලන ක්‍රියාවලිය මෙන්ම සිසුන්ට අදාළ වෙනත් ක්‍රියාකාරකම් සඳහා වැඩි ප්‍රමුඛතාවක් ලබා දී ඇති බව (Steel, 2000; Ofsted, 2019) සඳහන් කරයි. පාසල් මට්ටමේ වගවීම ප්‍රවර්ධනය කරමින් තමන්ගේම අභ්‍යන්තර ඇගයීම් රාමුවක් සකස් කර ගැනීමට පාසල් දිරිමත් කිරිම තවත් වැදගත් කරුණකි.

එංගලන්තයේ පාසල් ස්වයං ඇගයීම් ක්‍රියාවලිය සහ පාසල් වැඩිදියුණු කිරීමේ සැලැස්ම ඒකාබද්ධ වී ඇත. එම නිසා විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් ස්වයං ඇගයීම පාසල් සඳහා අතිරේක ක්‍රියාවලියක් ලෙස නොසලකති. මීට අමතරව, සාක්ෂි පදනම් කරගත් ස්වයං ඇගයීම් ක්‍රියාවලියක් එංගලන්තයේ පාසල් තුළ ක්‍රියාත්මක වන බව මෙම අධ්‍යයනයෙන් සොයාගෙන ඇත. එංගලන්තයේ ස්වයං ඇගයීමේදී ජාතික මට්ටමේ දත්ත, සාකච්ඡා සහ පාසල් ප්‍රජාවගේ ප්‍රශ්නාවලිය තුළින් තොරතුරු රැස් කෙරේ.

පරීක්ෂණ දිනය, පරීක්ෂකවරුන් සංඛ්‍යාව, පරීක්ෂා කරන කාලය ආදිය තීරණය කිරීම සඳහා අවදානම් තක්සේරුව ඉතා වැදගත් බව මෙම අධ්‍යයනයෙන් සොයාගෙන ඇත. ඊට අමතරව, බාහිර පරීක්ෂණ සැලැස්ම සකස් කිරීමේ දී පසුගිය අධ්‍යයනයෙන් පසු පාසැලේ මෑත කාලීන ක්‍රියාකාරිත්වය සහ සිදු වූ වෙනස්කම් විශ්ලේෂණය කරයි.

තවද, පරීක්ෂණය පැවැත්වීමට පෙර, පාසල පිළිබඳ මූලික චිත්‍රයක් ලබා ගැනීම සඳහා Ofsted ආයතනය විවිධ ප්‍රභවයන්ගෙන් තොරතුරු රැස් කරන අතර එම තොරතුරු පූර්ව පරීක්ෂණ වාර්තාවක් සකස් කිරීමට පහසුකම් සලසයි.

එංගලන්ත පාසල් බාහිර පරීක්ෂණයෙන් සොයා ගත හැකි හොඳම ක්‍රමය නම් පරීක්ෂණයට පෙර දින ප්‍රධාන පරීක්ෂකවරයා පාසල් නායකයින් සමඟ දුරකථන සංවාදයක් පැවැත්වීමයි. පරීක්ෂා කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට එය උපකාරී වේ. තවද, මෙම සාකච්ඡාව පාසල් නායකයින්ට තම පාසලේ නිශ්චිත සන්දර්භයන් සහ අභියෝග පැහැදිලි කිරීමට හොඳ අවස්ථාවක් ලෙස හඳුනාගෙන ඇත (Ofsted, 2019).

පරීක්ෂා කිරීමේ වාර ගණන තීරණය කරනු ලබන්නේ අදාළ පාසලේ කාර්ය සාධනය සහ තත්වයන් අනුව වන අතර අඩු කාර්යසාධනය ඇති පාසල් සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබා දෙනු ඇත.

එංගලන්තයේ පාසල් පරීක්ෂණයේදී විශිෂ්ට ව්‍යවහාර ගණනාවක් පාසල් තුළ ක්‍රියාත්මක කෙරේ. පරීක්ෂණ දිනයේ දී ප්‍රධාන පරීක්ෂකවරයා පාසලේ සියලුම පරීක්ෂකවරුන් හා ජ්‍යෝෂ්ඨ නායකයින් සමඟ රැස්වීමක් පවත්වයි. පරීක්ෂකවරුන් හා පාසල් අතර හොඳ සම්බන්ධතාවක් ගොඩ නැගීමට මෙය ඉතා වැදගත් ය.

කෙසේ වෙතත්, මෙම අධ්‍යයනයෙන් හෙළි වූයේ එංගලන්තයේ පරීක්ෂණ ක්‍රියාවලියේ දී පරීක්ෂකවරුන් විසින් සියලුම ගුරුවරුන් පරීක්ෂා නොකරන බවයි. විෂය මාලාවේ නායකයින්, තෝරාගත් ගුරුවරුන් සහ ශිෂ්‍යයින් සමඟ සාකච්ඡා කිරීමෙන් ඔවුන් ඉගැන්වීම සඳහා සාක්ෂි එකතු කරති. පාඩම් වල සිදුවන්නේ කෙසේද සහ කුමක් සිදුවේද යන්න සහ පාසැලේ විෂයමාලාවේ අභිප්‍රායයන් සඳහා පාඩම් දායක වන්නේ කෙසේද යන්න මෙහි දී අනාවරණය කර ගනියි.

පාසල් පරීක්ෂණ ක්‍රියාවලියේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය වැදගත් මෙවලමක් බව ද අවධාරණය කෙරේ. ඔවුන් පරීක්ෂණ ක්‍රියාවලියේ දී අදියර කිහිපයකදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කරයි. එය දෙමාපියන්ගෙන් තොරතුරු රැස් කිරීම සඳහා Ofsted වෙබ් අඩවියේ පිටුවක් වෙන් කර ඇත. මීට අමතරව කෙටි පණිවුඩ සහ විද්‍යුත් තැපැල වැනි විද්‍යුත් පද්ධති භාවිතා කර දෙමාපියන්ට දැනුම් දෙන ලෙස ඔවුහු පාසල් දිරිමත් කරති. තවද, දෙමාපියන්ගේ කාර්ය මණ්ඩලයේ සහ සිසුන්ගේ අදහස් හා යෝජනා එකතු කරනු ලබන්නේ මාර්ගගත ප්‍රශ්නාවලියෙනි.

පරීක්ෂණ වාර්තාව පිළිබඳව නොගැලපීම් හෝ පැමිණිලි ඉදිරිපත් කිරීමට පාසලට අවස්ථාව ලබාදීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී ඇත. වාර්තාව Ofsted වෙබ් අඩවියෙන් පල කරන අතර වාර්තාව පිළිබඳව දැන ගැනීමට උනන්දු සියලුම පාර්ශ්වකරුවන්ට පිටපතක් ගත හැකිය. ඊට අමතරව, පාසලකට එහි අවසන් වාර්තාව ලැබීමෙන් පසු සෑම දෙමව්පියෙකුම සහ අනෙකුත් අදාළ පාර්ශවකරුවන් ඒ පිළිබඳව දැනුවත් කිරීම අවශ්‍ය වේ. තවත් වැදගත්ම කරුණක් නම් වාර්තාවේ සම්පූර්ණ පිටපත් දේශීය මාධ්‍ය වෙත සහ පුස්තකාල වෙත යැවීමයි. වාර්තාව බැලීමට යමෙකු උනන්දුවක් දක්වන්නේ නම් ඒ සඳහා සුළු මුදලක් ගෙවිය යුතුය. තවදුරටත් මෙම අධ්‍යයනයෙන් සොයා ගනු ලැබුවේ වාර්තාව ලැබීමෙන් පසු පාසල වාර්තාවට ප්‍රතිචාර දැක්විය යුතු අතර එහි ක්‍රියාකාරී සැලැස්ම Ofsted ආයතනය වෙත ඉදිරිපත් කළ යුතු බවයි.

එංගලන්ත පාසැල් පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියේ දී සොයා ගත් තවත් වැදගත් කරුණක් නම් පාසලේ ගුණාත්මක තත්ත්වය පිළිබඳ තොරතුරු දෙමාපියන්ගෙන් සහ පාර්ලිමේන්තුවෙන් ලබා දීමයි. එම නිසා පාසල්වල කාර්යසාධන මට්ටම පිළිබඳව බාහිර පාර්ශවයන් ද දැනුවත් වන බැවින් පාසල්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට පාසල් පෙළඹවිය හැකි බව පෙනේ.

මෙම අධ්‍යයනයෙන් එංගලන්තයේ පරීක්ෂකවරුන් සම්බන්ධයෙන් කරුණු කිහිපයක් ඉස්මතු විය;

i) ස්වාධීන කණ්ඩායම් විසින් පාසල් පරීක්ෂණය සිදු කරන අතර සියළුම පරීක්ෂකවරුන් සෘජුවම මෙහි සේවය කරති

(ii) පරීක්ෂකවරුන් කොන්ත්‍රාත් පදනම මත පත් කරනු ලබන අතර කාර්යසාධන මට්ටම අනුව ඔවුන්ගේ සේවය දීර්ඝ කෙරේ

(iii) සියලුම පරීක්ෂකවරුන් පුහුණු කරනු ලබන්නේ Ofsted ආයතනය හෝ ඔවුන් නම් කරන ආයතනයක පුහුණුකරුවන් විසිනි.

(iv) පරීක්ෂකවරුන්ට ඉගැන්වීමේ පළපුරුද්ද තිබිය යුතු ය.

## 4.3- ශ්‍රී ලංකාව සහ එංගලන්ත පාසල් QA ක්‍රියාවලිය අතර සමානකම් හා වෙනස්කම් මොනවාද?

| තොරතුර | ශ්‍රී ලංකාව | එංගලන්තය |
|---|---|---|
| පාසල් ඇගයීම මෙහෙයවන්නේ කවුද | අධ්‍යාපන අමාත්‍යංශය, පළාත් හා කලාප කාර්යාල | Ofsted ආයතනය |
| වාර්තා කරන්නේ කාටද | අධ්‍යාපන අමාත්‍යංශයට | පාර්ලිමේන්තුවට |
| ප්‍රධාන ආයතනයේ කාර්යයන් මොනවාද | ඇගයීම් රාමුව හා මාර්ගෝපදේශ සකස් කිරීම<br>ඇගයීම් කරුවන්ගේ සහ විදුහල්පතිවරුන්ගේ ධාරිතා සංවර්ධනය<br><br>නියාමන වැඩසටහන පැවැත්වීම<br>පර්යේෂණ සිදුකිරීම | • ඇගයීම් රාමුව සංවර්ධනය කිරීම<br>• පරීක්ෂණ පැවැත්වීම<br>• වාර්තා සකස් කිරීම<br>• පාසල් පරීක්ෂණය සඳහා වෙබ් අඩවියක් පවත්වා ගැනීම<br>ඇගයීම් රාමුව සංවර්ධනය කිරීම<br>පරීක්ෂණ පැවැත්වීම<br>වාර්තා සකස් කිරීම<br>පාසල් පරීක්ෂණය සඳහා වෙබ් අඩවියක් පවත්වා ගැනීම<br>පරීක්ෂකවරුන් ප්‍රතීතනය කිරීම<br>පරීක්ෂණ වල ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම<br>ධාරිතා සංවර්ධනය |
| පාසල් ඇගයීම් රාමුවේ නම | අපේ පාසල කොතරම් ගුණාත්මක ද? | පාසල් පරීක්ෂණ අත්පොත |
| රාමුව සකස් කළේ කවුද | අධ්‍යාපන අමාත්‍යංශයේ, පළාත්, කලාප වල නිලධාරීන්, ගුරු උපදේශකවරුන්, විදුහල්පතිවරුන් සහ ගුරුවරුන්. | Ofsted ආයතනය |
| රාමුවේ අන්තර්ගතය | • හැඳින්වීම,<br>• ඇගයීම් ක්ෂේත්‍ර හඳුන්වා දීම,<br>• ලකුණු,ප්‍රදානය කිරීම<br>• ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාපටිපාටි<br>• ඒ ඒ අංශවල වගකීම් හා කාර්යයන් | • පරීක්ෂණ හඳුන්වා දීම,<br>• පරීක්ෂා කිරීම සඳහා කාල සීමාව,<br>• පරීක්ෂණ මූලධර්ම,<br>• ඇගයීම් කාලසටහන සහ නිර්ණායක |
| පාසල් ඇගයීම් ක්‍රමවේද | අභ්‍යන්තර ඇගයීම සහ බාහිර ඇගයීම | ස්වයං පරීක්ෂණය සහ බාහිර පරීක්ෂණය |
| ඇගයීම සඳහා සම්බන්ධ වන්නේ කවුද | • අභ්‍යන්තර ඇගයීම - පාසල් කළමනාකරණ කමිටුව සහ අනෙකුත් කාර්ය මණ්ඩලය<br>• බාහිර ඇගයීම - අධ්‍යාපන අමාත්‍යංශ, පළාත්, කලාප හා කොට්ඨාශ නිලධාරින් සහ ගුරු උපදේශකවරුන් | අභ්‍යන්තර ඇගයීම - පාසල්<br>බාහිර ඇගයීම -පරීක්ෂකවරුන් කොන්ත්‍රාත් පදනම මත Ofsted විසින් පරීක්ෂකවරුන් පත් කෙරේ.<br>ඔවුන් ලියාපදිංචි පරීක්ෂකවරුන් ය |

| තොරතුර | ශ්‍රී ලංකාව | එංගලන්තය |
|---|---|---|
| පාසල් ඇගයීමේ අවධානය වන කරුණු | • නායකත්වය සහ කළමනාකරණය,<br>• භෞතික සම්පත් කළමනාකරණය,<br>• විෂය මාලා කළමනාකරණය,<br>• ඉගැන්වීම ඉගෙනීම සහ ඇගයීම,<br>• විෂය සමගාමී ක්‍රියාකාරකම්<br>• ශිෂ්‍ය සාධනය,<br>• ශිෂ්‍ය සුභසාධනය,<br>• පාසල් ප්‍රජාව | • සිසුන් ඉගෙනීම,<br>• සිසුන් තම පාඩම්වලදී සාක්ෂාත් කර ගන්නා දේ<br>• පරීක්ෂණ සහ විභාග ප්‍රතිඵල,<br>• පාසල් නායකත්වය සහ කළමනාකරණය,<br>• සිසුන්ගේ ආකල්ප හා හැසිරීම්,<br>• සිසුන් රැකබලා ගැනීම,<br>• දෙමාපියන් සමග සබඳතා,<br>• ඉගෙනීමේ ගුණාත්මකභාවය සහ ශිෂ්‍යයින් සඳහා අවස්ථා සලසා ඇත. |
| ඇගයීමේ ක්‍රියාවලිය | • ඇගයීම් සැලැස්ම සකස් කිරීම<br>• ඇගයීම් වැඩසටහන පැවැත්වීම<br>• වාර්තාව සකස් කිරීම<br>• වාර්තාව පාසල් වෙත යැවීම<br>• ප්‍රතිපෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>• වාර්ෂික වාර්තා සකස් කිරීම | • ඇගයීමේ දිනය පාසලට දැනුම් දීම<br>• දෙමාපියන් සමග පූර්ව රැස්වීමක් පැවැත්වීම<br>• පාසල ගැන අදහස් පිළිබඳ ප්‍රශ්නාවලියක් සම්පූර්ණ කරන දෙමාපියන්ගෙන් ලබා ගැනීම<br>• පූර්ව පරීක්ෂණ වාර්තාවක් නිකුත් කිරීම |
| පාසල් පරීක්ෂා කිරීමේ වාර ගණන | අර්ථ දක්වා නැත | පාසල්වල කාර්යසාධනය සහ තත්වයන් මත |
| පාසල් ඇගයීමේ දිනය පිළිබඳව පාසල් වෙත දැනුම් දීම | ඇතැම් අවස්ථාවල | සෑම විටම |
| පාසල් පරීක්ෂණ කාලය | එක දිනයක් | පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව,ගුරුවරුන් සහ භෞතික සම්පත්, සාධන මට්ටම් අනුව තීරණය වේ. |
| තොරතුරු රැස් කරන ක්‍රමවේද | විදුහල්පතිවරුන්,නියෝජ්‍ය විදුහල්පතිවරුන්, ගුරුවරුන්, අනධ්‍යයන කාර්ය මණ්ඩලය සහ ලිපි ලේඛන | විදුහල්පතිවරුන්, ගුරුවරුන්, දෙමාපියන්, සිසුන් අනෙකුත් පාර්ශවකරුවන් සහ විවිධ මූලාශ්‍ර මත |
| ඇගයීම් කරුවන්ගේ ධාරිතා සංවර්ධනය කරන ආයතන | අධ්‍යාපන අමාත්‍යංශය, පළාත් දෙපාර්තමේනතුව සහ කලාප කාර්යාලය | සියලුම පරීක්ෂකවරුන් පුහුණු කරනු ලබන්නේ Ofsted ආයතනය විසින් හෝ එම ආයතනයේ අවසර ලත් පුහුණුකරුවන් විසිනි. |
| ඇගයීම් වාර්තාව | ඇගයීම් වාර්තාවේ සොයාගැනීම් පාසල් හා කලාප අධ්‍යාපන කාර්යාලයට පමණක් සීමාවේ. | ඇගයීම් වාර්තාව පාසල්, දෙමාපියන්, ප්‍රාදේශීය මාධ්‍ය සහ ප්‍රාදේශීය පුස්තකාල වෙත යැවිය යුතු අතර ඕනෑම අයෙකුට වාර්තාව බැලීමට එහි වෙබ් අඩවියේ වාර්තාව ප්‍රකාශයට පත් කළ යුතුය. |
| ඇගයීමේ ප්‍රතිපෝෂණය | • ඇගයීම් වල ප්‍රතිඵල මත පාසල් ශ්‍රේණිගත කෙරේ<br>• පළාත් සහ කලාප සමඟ ඇගයීම් වැඩසටහන් පිළිබඳව ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | • පාසල් ප්‍රතීතනය කර ඇත.<br>• පාසල ප්‍රමාණවත් ප්‍රගතියක් ලබා නොමැති නම් එයට විශේෂ ක්‍රියාමාර්ග ගනු ලබයි. |

# 5. නිර්දේශ

1. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිලධාරීන්ට වෙනත් රාජකාරි වගකීම් පැවරී ඇති බැවින් පාසල් ඇගයීමේ ක්‍රියාවලිය, ඇගයීම් සඳහාම වෙන් වූ කණ්ඩායම් මගින් සිදුකිරීම.
2. පාසල් වාර්ෂික ක්‍රියාත්මක කිරිමේ සැලැස්ම සමඟ ඇගයීම් අනාවරණය ඒකාබද්ධ කිරීම.
3. ඇගයීමේ ක්‍රියාවලිය ලේඛන මත පමණක් සිදු නොකර විවිධ ක්‍රම (සාකච්ඡා, නිරීක්ෂණ, ප්‍රශ්නාවලිය, ලේඛන, හඩ වාර්තා සහ පෙර දත්ත) භාවිතා කිරීම. ඇගයීම සිදු කිරීමට පෙර, විවිධ ප්‍රභවයන්ගෙන් තොරතුරු රැස් කිරීම, පූර්ව පරීක්ෂණ වාර්තා සකස් කිරීම සහ පාසල් වල පූර්ව සංචාරයන් පැවැත්වීම
4. සෑම පාසලක්ම නිශ්චිත කාල සීමාවක් තුළ ඇගයීමට ලක් කරන බවට සහතික වන පාසල් ඇගයීම සඳහා උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීම මෙන්ම  අඩු සාධන මට්ටම් සහිත පාසල් නිතර ඇගයීමට ලක් කිරීම. තවද, පාසල්වල කාර්යසාධන මට්ටම අනුව අවශ්‍යතා පදනම් කරගත් ඇගයීම් ක්‍රියාවලියක් පැවැත්වීම.
5. ඇගයීම් වාර්තාව පාසල් සඳහා පමණක් සීමා නොකර අදාළ සියලුම පාර්ශවකරුවන් අතර බෙදා හැරීම එමෙන්ම ඇගයීම් අනාවරණ කෙරෙහි නායකයින්ගේ අවධානය යොමු කර, නිර්දේශයන්ට අනුව ක්‍රියාකාරී සැලැස්ම සකස් කර එහි ක්‍රියාත්මක තත්ත්වය බැලීම අධීක්ෂණය කළ යුතුය.
6. පාසල් ඇගයීම් ක්‍රියාවලියෙහි විවිධ අදියර සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ඒකාබද්ධ කිරීම.
7. අපේක්ෂිත කාර්ය සාධන මට්ටම ලබා නොගත් පාසල්වල විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් සඳහා වෘත්තීය සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම.
8. පාසල් ඇගයීම් ක්‍රියාවලිය තුළ දැඩි ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක් එනම් ඇගයීම් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට සහ ඉහළ බලධාරීන් විසින් ඇගයීම් ප්‍රතිඵල සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට පාසල්වලට උපකාර වන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.
9. ඇගයීම් ක්‍රියාවලිය සඳහා සහභාගී වන ඇගයීම්කරුවන්ගේ කාර්යසාධනය මැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම. ඇගයීම්කරුවෙකු වීමට ඇගයීම්කරුවන්ට ඉගැන්වීමේ පළපුරුද්ද තිබිය යුතු අතර ඇගයීමේ දී ඉවහල් වන අචාරධර්ම ඔවුන් තුළ තිබිම.
10. ඇගයීම්කරුවන් සඳහා නිසි නීති හා මාර්ගෝපදේශයන් ඔවුන්ගේ යුතුකම් හා වගවීම් සහිතව සකස් කිරීම. ඇගයීම්කරුවන්ගේ කාර්යසාධනය මැනීමට හා ඔවුන් ප්‍රතීතනය කිරීමට නිශ්චිත ආයතනයක් පිහිටුවීම හා සුදුසුකම් ලත් ඇගයීම්කරුවන් පත් කිරීම ක්‍රමානුකුල ක්‍රියාවලියක් තිබිය යුතුය.

## ආශ්‍රිත ග්‍රන්ථ

Abreu, N. R. (2016, September 26). *School inspections in England: Ofsted.* https://dera.ioe.ac.uk/27530/2/SN07091 Redacted.pdf.

Alam, M. (2015). Quality Assurance in School Education. *Learning Community-An International Journal of Edu-tional and Social Development, 6*(1), 163-169.

European Commission. (2015). *Comparative study on quality assurance in EU school education systems: Policies, procedures and practices: final report.* Comparative study on quality assurance in EU school education systems - Publications Office of the EU (europa.eu).

European Commission. (2018). *Quality assurance for school development; Guiding principles for policy develop-ment on quality assurance in school education.* https://www.schooleducation gateway.eu/downloads/ Governance/2018-wgs2-quality-assurance-school_en.pdf

Geda, A. G. (2014,). *Quality assurance policy and practice in higher education institutions in Ethiopia.* http:// uir.unisa.ac.za/bitstream/handle/10500/18676/thesis_abeya%20geleta%20geda.pdf?sequence=1

Gustafsson, J. E., Ehren, M., Conyngham, G., McNamara, G., Altrichter, H., & O'Hara, J. (2015). From inspection to quality: Ways in which school inspection influences change in schools. *Studies in Educational Evaluation,* 47–57.

Hassan, M. A., & Talib, R. (2013). *Perception towards SBA implementation among teachers in Malaysian schools. 2nd International Seminar on Quality and Affordable Education.* https://www.researchgate.net/publication/ 309385461Perction_Towards_SBA_Implementation_Among_ Teacers_ in_Malaysian_Schools

Hutchinson, J. (2016). *School Inspection in England; Is there room to improve?* London: Education Policy Insttute.

Kalule, L., & Bouchamma, Y. (2013). Teacher supervision practices and characteristics of in-school supervisors in Uganda. *Educ Asse Eval Acc*, 1-22.

Ofsted. (2017, October). *School inspection handbook.* Retrieved May 15, 2019, from https://dera.ioe.ac.uk/30206/1/ School_inspection_handbook_section_5.pdf

https://www.gov.uk/government/publications/school-inspection-update-academic-year-2019-to-2020

Olibie, E. I., Ofojebe, W. N., & Ezugoh, T. C. (2015). Rationales, Mechanisms and Challenges of Quality Assurance in Teachers' Professional Practices at the Primary Education Sector. *International Journal of Education*, 7(2), 160-175.

Perera , K., & Hettiarachchi, S. (2014). *Study on quality assurance and accreditation in general education in Sri Lanka.* National Education Commission. Research Series (4), Colombo.

Reddy , L. A., Dudek , C. M., Peters, S., Alperin, A., Kettler, R. J., & Kurz, A. (2017). Teachers' and school admin- istrators' attitudes and beliefs of teacher evaluation: a preliminary investigation of high poverty school districts. *Educ Asse Eval Acc*, 1-24.

Robson, C. (1993). *Real world research, A Resource for Social Scientists and Practitioner- Researchers.* Oxford: Blackwell Publishers.

Steele, A. (2000). *Understanding the Ofsted schools inspection process.* London: FEDA publication.

Wilcox, B. (2000, March). *Making schools inspection more effective:The english experience.* http://www.iiep. unesco.org/fr/publication/making-school-inspection-visits-more-effective-english-experience

අධ්‍යාපන අමාත්‍යාංශය. (2014). අපේ පාසල කොතරම් ගුණාත්මකද? අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව සඳහා ඇගයීමේ ක්‍රියාවලිය. කොළඹ, ශ්‍රී ලංකාවː රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

සෙනෙවිරත්න එස්.එම්.එල්.කේ. (2013). පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය 111 මාර්ගෝපදේශ සංග්‍රය පිළිබඳ විශ්ලේෂණය. *Education perspectives, 2*(2), 59-69.

වීරසිංහ අයි. (2013). පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය 111 මාර්ගෝපදේශ සංග්‍රය පිළිබඳ විශ්ලේෂණය. *Education perspectives, 2*(2), 91-104